Civil Aviation Authority
Sri Lanka

" Safe skies for all "

# ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය

# වාර්ෂික වාර්තාව
# 2014

# ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය

# වාර්ෂික වාර්තාව
# 2014

2002 අංක 34 දරන ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරි පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

# ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ තේමා ගීතය

ශ්‍රී ලංකා,
සිවිල් ගුවන් සේවා අධිකාරිය
කිත් යසසින් සුදිලේ
හෙලි කොටැ හේළි  හෙළේ //

සක්විති රාවණ ආදි යුගෙන් දඬු
මොණරින් ගුවන දිනා //
වික්මැති ලක්දන වා - රිය පොලිනුත්
පෑ විදු නුවණ මනා //

"උවදුරු තොර බව සඳහා මුල් වෙමු //
වෙයි පෙර වැකිය අපේ //
"ඉක්මන් අය මග නැගුමෙහි මුල් වෙමු //
මේ වෙයි දැකුම අපේ //

රට වැසි යුතුකම් ඉටුවන අයුරින්
මව් බිම හා බැඳෙමු //
සමාජ මෙහෙවර සාර දහම් රැක
වගකීමෙන් පුදමු //

පද රචනය : කලාශූරී අරිසෙන් අහුබුදු ශූරීන්
ගායනය : කලාකීර්ති දේශමාන්‍ය ආචාර්ය පණ්ඩිත් ඩබ්.ඩී. අමරදේව
සංගීතය : කලාකීර්ති දේශමාන්‍ය ආචාර්ය පණ්ඩිත් ඩබ්.ඩී. අමරදේව

**ගරු වරාය, නාවික කටයුතු හා ගුවන් සේවා අමාත්‍යතුමා,**

2002 අංක 34 දරණ ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය පනතේ 15 වන වගන්තිය යටතේ නියම කර ඇති අවශ්‍යතාවය ඉටු කිරීම සඳහා මෙම වාර්ෂික වාර්තාව සම්පාදනය කරනු ලැබූ අතර 2014 ජනවාරි 01 දිනෙන් ආරම්භව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය තුළ ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය විසින් ඉටු කරන ලද කාර්යයන් මෙමගින් ආවරණය කෙරේ.

**ෂිබ්ලි අසිස් පී.සී**
සභාපති,
ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය

2015 පෙබරවාරි 28 වනදා

# පටුන


ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ තේමා ගීතය 03
සංක්ෂිප්ත යෙදුම් 06
නාමාවලිය 08
සභාපතිතුමාගේ සමාලෝචනය 09
අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ සමාලෝචනය 12
ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියේ සැකැස්ම 17
ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ පාලනය හා වගකීම 24
අධිකාරියේ කාර්යභාරය 24
අධ්‍යක්ෂ මණ්ඩලය 24
අධිකාරියේ විධායක බලතල 24
අධිකාරියේ කමිටු 25
පාර්ශ්වකරුවන් සමඟ සම්බන්ධතා පැවැත්වීම 26
අධිකාරියේ සහ ජ්‍යෙෂ්ඨ කළමනාකරණයේ වගකීම 26
වගකීම 27
බැඳියා පිළිගැටුම් 27
අභ්‍යන්තර විගණනය 27
ව්‍යවස්ථාමය අවශ්‍යතාවලට අනුකූලවීම 27
ආචාර ධර්ම 27
ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය 29
නියාමන විෂය පථය 32
අනතුරු විමර්ශන ඒකකය 34
අභ්‍යන්තර විගණන අංශය 36
ගගන නාවික සේවා ශාඛාව 37
ගුවන් සේවා සුරක්ෂිතතා අංශය 37
ගගන යාත්‍රාංගන හා ගුවන් සංතරණ සේවා අංශය 37
විශේෂ ව්‍යාපෘති අංශය 38
පියසර නිරූපද්‍රිතතා ශාඛාව 41
මෙහෙයුම් අංශය 41
පුද්ගල බලපත්‍ර අංශය 42
ගුවන් යෝග්‍යතා අංශය 44
ඒකාබද්ධ ශාඛාව 45
ගුවන් ප්‍රවාහන සහ නීති කටයුතු අංශය 45
මානව සම්පත් හා කාර්යාල කළමනාකරණ අංශය 50
මූල්‍ය කළමනාකරණ අංශය 54
කාර්ය සාධනය පිළිබඳ සාරාංශය 55
ගුවන් ගමන් පිළිබඳ තොරතුරු 61
මූල්‍ය ප්‍රකාශන 67
විගණකාධිපති වාර්තාව 82
විගණකාධිපති වාර්තාවට සිවිල් ගුවන්සේවා අධිකාරියේ පිළිතුරු 97

# සංක්ෂිප්ත යෙදුම්

| | |
|---|---|
| A&NS | ගගන යාත්‍රාංගණ හා ගුවන් සංතරණ සේවා |
| AA | සහකාර ගණකාධිකාරී |
| AAI | සහකාර ගගන යාත්‍රාංගණ පරීක්ෂක |
| AA(i) | විගණන සහකාර (අභ්‍යන්තර) |
| AASI | සහකාර ගුවන් සේවා සුරක්ෂිතතා පරීක්ෂක |
| AASL | සී/ස ගුවන් තොටුපළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගම |
| AATO | සහකාර ගුවන් ප්‍රවාහන නිලධාරී |
| AAwE | සහකාර ගුවන් යෝග්‍යතා ඉංජිනේරු |
| Acct | ගණකාධිකාරී |
| AFM | සහකාර මූල්‍ය කළමනාකාර |
| AFTN | ස්තම්භ ගගන නාවික විදුලි සංදේශ ජාලය |
| AGOI | සහකාර භූමි මෙහෙයුම් පරීක්ෂක |
| AI | ගගන යාත්‍රාංගණ පරීක්ෂක |
| AIU | අනතුරු විමර්ශන ඒකකය |
| ALSO | ගගන නාවික තොරතුරු සේවා නිලධාරි |
| AME (BL) | ගුවන් යානා නඩත්තු ඉංජිනේරු (මූලික බලපත්‍රය) |
| AML | ගුවන් යානා නඩත්තු බලපත්‍රය |
| AMO | අනුමත නඩත්තු සංවිධානය |
| AMT | ගුවන් යානා නඩත්තු තාක්ෂණ ශිල්පි |
| ANR | ගුවන් සංතරණ රෙගුලාසි |
| ANS | ගුවන් සංතරණ සේවා |
| ANSI | ගුවන් සංතරණ සේවා පරීක්ෂක |
| AOC | ගුවන් යානා මෙහෙයුම්කරු සහතිකය |
| AS | ගගන නාවික සේවා |
| ASI | ගුවන් සේවා සුරක්ෂිතතා පරීක්ෂක |
| ASN | ගුවන් සේවා නිරුපද්‍රිතතා නිවේදනය |
| AT & LA | ගුවන් ප්‍රවාහන හා නෛතික කටයුතු |
| ATC | ගුවන් ගමන් පාලනය/ගුවන් ගමන් පාලක |
| ATO | ගුවන් ප්‍රවාහන නිලධාරී |
| AV SEC | ගුවන් සේවා සුරක්ෂිතතාව |
| AW | ගුවන් යෝග්‍යතාවය |
| BIA | බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළ |
| CAASL | ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය |
| CAO | සිවිල් ගුවන් සේවා නිලධාරී |
| CADEC | සිවිල් ගුවන් සේවා සංවර්ධන සහ අධ්‍යාපන කමිටුව |
| CEO | ප්‍රධාන විධායක නිලධාරි |
| CIA | ප්‍රධාන අභ්‍යන්තර විගණක |
| COSCAP -SA | මෙහෙයුම් නිරුපද්‍රිතතා සහ අඛණ්ඩ ගුවන් යෝග්‍යතාව වර්ධනය කිරීමේ දකුණු ආසියා සහයෝගිතා වැඩසටහන |
| CP | සංස්ථාපිත |
| CSI | මැදිරි නිරුපද්‍රිතතා පරීක්ෂක |
| C of R | ලියාපදිංචි කිරීමේ සහතිකය |
| DCA | සිවිල් ගුවන් සේවා දෙපාර්තමේන්තුව |

| | |
|---|---|
| D | අධ්‍යක්ෂ |
| DD | නියෝජ්‍ය අධ්‍යක්ෂ |
| DGCA | සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල් |
| DO | ලේඛන සම්පාදන නිලධාරි |
| FIR | පියසර තොරතුරු කලාපය |
| FOI | පියසර මෙහෙයුම් පරීක්ෂක |
| FS | පියසර නිරුපද්‍රිතතාව |
| GOI | භූමි මෙහෙයුම් පරීක්ෂක |
| GSA | පොදු වෙළඳ නියෝජිත |
| HR&OM | මානව සම්පත් හා කාර්යාල කළමනාකරණය |
| HR&OMA | මානව සම්පත් හා කාර්යාල කළමනාකරණ සහකාර |
| HR&OMO | මානව සම්පත් හා කාර්යාල කළමනාකරණ නිලධාරි |
| IA | අභ්‍යන්තර විගණනය |
| ICAO | අන්තර්ජාතික සිවිල් ගුවන් සේවා සංවිධානය |
| NOTAM | ගුවන් සේවාවන්හි නිරතවූවන්ට දැනුම් දීම |
| OA | කාර්යාල සහායක |
| OPS | මෙහෙයුම් |
| PA | පෞද්ගලික සහකාර |
| PEL | පුද්ගල බලපත්‍ර නිකුත් කිරීම |
| PLO | පුද්ගල බලපත්‍ර නිකුත් කිරීමේ නිලධාරී |
| PA-AAI | වැඩසටහන් සහකාර - ගුවන් යානා අනතුරු විමර්ශන |
| PA-AE | වැඩසටහන් සහකාර - ගුවන් සේවා විභාග |
| PA-IT | වැඩසටහන් සහකාර - තොරතුරු තාක්ෂණ |
| PA-SP | වැඩසටහන් සහකාර - විශේෂ ව්‍යාපෘති |
| S/CAASL | ලේකම්/සිවිල් ගුවන් සේවා අධිකාරිය |
| SD | ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂ |
| SAFA | විදේශ ගුවන් යානා - නිරුපද්‍රිතතා තක්සේරුව |
| SAISO | ජ්‍යෙෂ්ඨ ගගන නාවික තොරතුරු සේවා නිලධාරි |
| SARPs | ප්‍රමිති හා නිර්දේශිත පරිචයන් |
| SARI | දකුණු ආසියා කලාපීය ආරම්භනය |
| SATO | ජ්‍යෙෂ්ඨ ගුවන් ප්‍රවාහන නිලධාරී |
| SFOI | ජ්‍යෙෂ්ඨ පියසර මෙහෙයුම් පරීක්ෂක |
| SLAS | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති |
| SLCAP | ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා ප්‍රකාශනය |
| SLFRS | ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති |
| SP | විශේෂ ව්‍යාපෘති |
| SMS | නිරුපද්‍රිතතා කළමනාකරණ ක්‍රමය |
| USAP | විශ්ව සුරක්ෂිතතා විගණන වැඩසටහන |
| USOAP | විශ්ව නිරුපද්‍රිතතා අධීක්ෂණ විගණන වැඩසටහන |

# නාමාවලිය

| | | |
|---|---|---|
| ප්‍රධාන කාර්යාලය | : | ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය<br>අංක 04, හුණුපිටිය පාර,<br>කොළඹ 02.<br>දුරකථනය: 94-11-2304632,94-11-2358800<br>ෆැක්ස්: 94-11-2304644<br>විද්‍යුත් තැපැල: info@caa.lk<br>වෙබ් අඩවිය: www.caa.lk<br>තැපැල් ලිපිනය: තැපැල් පෙට්ටිය 535, කොළඹ<br>ටෙලිග්‍රාප් ලිපිනය: AIRCIVIL<br>AFTN තැපැල: VCCCYAYX |
| කටුනායක කාර්යාලය | : | ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය<br>"හිල්ටොප්", නයිකන්ද,<br>මිනුවන්ගොඩ පාර, කටුනායක.<br>දුරකථනය:- 94-11-2251076<br>ෆැක්ස්:- 94-11-2251076 |
| මත්තල කාර්යාලය | : | ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය<br>මත්තල රාජපක්ෂ අන්තර්ජාතික ගුවන් තොටුපොළ, මත්තල.<br>දුරකථනය:- 94-47-7510530<br>ෆැක්ස්:- 94-47-2031133 |
| ගුවන් යෝග්‍යතා උප කාර්යාලය | : | ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය<br>කොළඹ ගුවන් තොටුපොළ,<br>රත්මලාන.<br>දුරකථනය:- 94-11-3135828<br>ෆැක්ස් :- 94-11-2635756 |
| ගණන් පරීක්ෂකවරු | : | විගණකාධිපති, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය |
| නීතිඥවරු | : | නීතිපති, ශ්‍රී ලංකා ප්‍රජාත්‍රාන්තික සමාජවාදී ජනරජය |
| බැංකුකරු | : | ලංකා බැංකුව |
| රක්ෂණකරු | : | සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සමාගම<br>සීමාසහිත සෙලින්කෝ රක්ෂණ සමාගම |

# සභාපතිතුමාගේ සමාලෝචනය



2014 වර්ෂය තුළ දී, ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ මෙන්ම ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා ක්ෂේත්‍රයේ ද කැපී පෙනෙන ජයග්‍රහණ අත් පත් කර ගැනීමට අපට හැකියාව ලැබුණු අතර මගී සහ ගුවන් භාණ්ඩ සංචලන සම්බන්ධයෙන් ද අතිශයින්ම වැදගත් වැඩි දියුණු කිරීම් සිදු කිරීමට ද සමාලෝචිත වර්ෂය තුළ දී හැකි විය. 2014 වසරේ මැයි මාසයේදී, ශ්‍රී ලංකා එයාර්ලයින්ස් සමාගමට "එක් ලොවක් *(One World)* ගුවන් ප්‍රවාහන සන්ධානය සමඟ ඒකාබද්ධ වීමට හැකියාව ලැබීම ගුවන් සේවා ක්ෂේත්‍රයේ සුවිශේෂී සන්ධිස්ථානයක් වෙත පිවිසීමක් ලෙස සැලකිය හැකි අතර එම ගුවන් ප්‍රවාහන සන්ධානයේ අනෙකුත් හවුල්කාර ගුවන් ප්‍රවාහන සේවා සමාගම් සමඟ සහයෝගීතාවෙන් කටයුතු කර ගුවන් මාර්ග ජාලය තවදුරටත් පුළුල් කර ගැනීමේ අවස්ථාව උදා කර ගැනීමට ද මෙම සන්ධානයට හැකි විය. තවද, ප්‍රධාන පෙළේ අන්තර්ජාතික මාධ්‍යගත මෙහෙයුම්කරුවන් බොහෝ දෙනෙකු ශ්‍රී ලංකාව තුළ ගුවන් යානා ආසන වෙන් කර ගැනීමේ මෙහෙයුම් කටයුතු ද කැපී පෙනෙන අන්දමින් ඉහළ නංවා තිබුණි.

අන්තර්ජාතික සිවිල් ගුවන් සේවා සම්මුතියට අත්සන් තබන ලද පාර්ශ්වකරුවෙකු වශයෙන්, ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය අන්තර්ජාතික සිවිල් ගුවන් සේවා (ICAO) සංවිධානය මගින් අනුගමනය කරනු ලබන අන්තර්ජාතික ප්‍රමිති හා නිර්දේශිත පරිචයන් ශ්‍රී ලංකාව තුළ දේශීය වශයෙන් ක්‍රියාත්මක කර එලදායි අන්දමින් බලාත්මක කර ඇති බව තහවුරු කිරීම සඳහා අනිවාර්ය වගකීමකින් බැඳී සිටියි. තීරණාත්මක ගුවන් සේවා නිරුපද්‍රිතතා කාර්යයන්වල නිරතව සිටින පිරිස් වෙත ලබා දීමට නියමිත පුහුණුව එම පුද්ගලයන් විසින් සාර්ථකව අවසන් කිරීමෙන් අනතුරුව, එම පුද්ගලයන් සඳහා පුද්ගල බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාවලිය ගුවන් සේවා නිරුපද්‍රිතතාව තහවුරු කිරීමේ ක්‍රියාවලියේ ප්‍රධාන පරාමිතිවලින් එකක් බවට පත් වී තිබේ. බලපත්‍රධාරීන්ට මෙන්ම ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියටද යන දෙපාර්ශ්වයටම එකසේ ප්‍රතිලාභ සලසන ගුවන් නියමු බලපත්‍ර, ගුවන් යානා නඩත්තු බලපත්‍ර, ගුවන් ගමන් පාලක බලපත්‍ර, මැදිරි සේවක පිරිස් සාමාජික සහතික පත් නිකුත් කිරීම හා අළුත් කිරීම සඳහා මෙම වසර තුළ දී පරිගණකගත කළ පද්ධතියක් හඳුන්වා දීමට පුද්ගල බලපත්‍ර නිකුත් කිරීමේ අංශයට හැකි විය. ගුවන් ප්‍රවාහන ක්‍රියාකාරකම්වල නිරුපද්‍රිතතාව හා සුරක්ෂිතතාව ප්‍රවර්ධනය කිරීම සඳහා සිවිල් ගුවන් සේවයට අදාළ නිරුපද්‍රිතතා හා සුරක්ෂිතතා සංවේදී ක්‍රියාකාරකම්වල නිරතව සිටින බලපත්‍රධාරී, වර්ග ප්‍රමාණනලාභී හෝ සහතිකපත්‍රලාභී පිරිස් සඳහා මධ්‍යසාර හෝ මනස් ක්‍රියාකාරී ද්‍රව්‍ය භාවිතය තහනම් කර ඇති බව පුද්ගල බලපත්‍ර අංශය මගින් මේ වන විට ප්‍රකාශයට පත් කර තිබේ.

අන්තර්ජාතික ගුවන් ගමන් මෙහෙයවනු ලබන සියළු ගුවන් තොටුපලවල් සහතිකකරණ ක්‍රියාවලියට ලක් කිරීම අන්තර්ජාතික සිවිල් ගුවන් සේවා සංවිධානයේ (ICAO) අවශ්‍යතාවයකි. ඒ අනුව, බණ්ඩාරනායක අන්තර්ජාතික ගුවන් තොටුපල 2010 වසරේ දී පළමු වරට සහතිකකරණයට ලක් කරන ලද අතර එම ගුවන් තොටුපල සහතිකය නිකුත් කළ දිනයේ සිට වසර දෙකක කාලයක් සඳහා වලංගු වේ. එබැවින්, ගුවන්තොටුපල සහතිකය අළුත් කිරීමේ දෙවන විගණනය 2014 මාර්තු මාසයේ දී පවත්වනු ලැබූ අතර විගණනයේ දී නිරීක්ෂණය කළ ඌනතා නිවැරදි කිරීම සඳහා අවශ්‍ය වූ පියවර ගැනීමෙන් අනතුරුව, බණ්ඩාරනායක අන්තර්ජාතික ගුවන් තොටුපල සඳහා ලබා දී තිබූ ගුවන් තොටුපල සහතිකය තවත් වසර දෙකක් සඳහා අළුත් කරනු ලැබීය.

අවශ්‍ය තක්සේරු කිරීම් සිදු කිරීමෙන් අනතුරුව ගුවන් යානා නඩත්තු සංවිධාන දහයක් සඳහා මුල්වර අනුමතීන් ලබා දෙනු ලැබීය. විදේශීය රටවල් මත පාදක වූ ගුවන් මාර්ග නඩත්තු කිරීමේ සංවිධාන පනස් හතරක සහ දේශීය ගුවන් මාර්ග නඩත්තු කිරීමේ සංවිධාන 13ක අනුමත කිරීම් 2014 වසර තුළදී අළුත් කරනු ලැබීය.

සමාලෝචිත කාල පරිච්ඡේදය තුළ, ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය ගුවන් යානා දහහතක් සඳහා මුල් වර ලියාපදිංචි කිරීම් සිදු කළ අතර ගුවන් යානා පනස් එකක ලියාපදිංචි කිරීමේ සහතික අළුත් කිරීම් ද සිදු කරනු ලැබීය. එමෙන්ම, සීමාසහිත ශ්‍රී ලංකන්

එයාර්ලයින්ස් (පුද්.) සමාගමේ ගුවන් මෙහෙයුම්කරු සහතිකය යටතේ මෙහෙයුම් කටයුතු සිදු කිරීම සඳහා ගුවන් යානා තුනක අයිතිය හිමිකරුගේ ඉල්ලීම පරිදි මාරු කරනු ලැබීය.

අනුමැතිය ලද ජාතික සෝදිසි සැලැස්ම - 2014 අනුකූලව සිවිල් ගුවන් සේවා කර්මාන්තයේ සිවිල් ගුවන් සේවා සුරක්ෂිතතා පද්ධති පිළිබඳ සෝදිසි කිරීමේ කටයුතු සිදු කරනු ලැබීය. සීමාසහිත ගුවන් තොටුපල හා ගුවන් සේවා (පුද්.) සමාගම සහ ශ්‍රී ලංකන් එයාර්ලයින්ස් සමාගම්වල ගුවන් සේවා සුරක්ෂිතතා පරීක්ෂකයින්, උපදේශකයින් හා කළමනාකරුවන් සහතික කිරීමේ හා නැවත සහතික කිරීමේ කටයුතු ද සිදු කරනු ලැබීය.

කටුනායක නයිකන්ද ප්‍රදේශයේ ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ ප්‍රධාන කාර්යාලය ඉදි කිරීමේ කටයුතු ආරම්භ කර ඇති අතර අදාළ රාජ්‍ය සංවිධානවලින් මේ සම්බන්ධයෙන් අවශ්‍ය අනුමති ලබා ගෙන ඇත. 2016 වර්ෂයේදී ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලේ ඉදි කිරීම් කටයුතු අවසන් කිරීමට සැලසුම් කර තිබේ.

මත්තල රාජපක්ෂ අන්තර්ජාතික ගුවන් තොටුපලේ නිරුපද්‍රිතතා ක්‍රියාකාරකම්වල නිරතව සිටින ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ සේවකයින් සඳහා නවාතැන් පහසුකම් සැපයීමේ අවශ්‍යතාවක් පවතින බව හඳුනාගෙන තිබේ. එම නිසා, නිදන කාමර හතර බැගින් වූ දෙමහල් ගොඩනැගිලි දෙකක් 2014 ඔක්තෝබර් මාසයේදී වීරවිල ප්‍රදේශයේ ඉදි කරන ලදී.

බැංකොක් නගරයේදී පැවැත් වූ 50 වන සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල්වරුන්ගේ (DGCA) සම්මන්ත්‍රණයේ දී ගනු ලැබූ තීරණය අනුව, ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය 2014 මැයි 20 සිට 23 දක්වා කොළඹ දී පවත්වනු ලැබූ 7 වන සිවිල් ගුවන් සේවාවේ මහජන සෞඛ්‍ය ගැටළු වැළැක්වීම හා කළමනාකරණය සඳහා වන සහයෝගීතා සංවිධානයේ - ආසියා ශාන්තිකර කලාපීය (CAPSCA-AP) හමුව සඳහා සත්කාරක ආයතනය වශයෙන් කටයුතු කරන ලදී. මහජන සෞඛ්‍යය පිළිබඳ හදිසි අවස්ථා තුළින් ගුවන් සේවා අංශයට සිදුවිය හැකි අවදානම අඩු කිරීම සඳහා සිවිල් ගුවන් සේවා ක්ෂේත්‍රයට හා මහජන සෞඛ්‍ය අංශයට අදාළවන සියලුම පාර්ශ්වකරුවන් එකම ස්ථානයක දී මුණ ගැසීමට සැලසීම මෙම 7 වන (CAPSCA - AP) හමුවේ අරමුණ විය.

අන්තර්ජාතික සිවිල් ගුවන් සේවා සංවිධානයට අයත් ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ ඉල්ලීම පරිදි, අන්තර්ජාතික සිවිල් ගුවන් සේවා සංවිධානයේ ආසියා ශාන්තිකර පියසර කාර්ය පටිපාටි වැඩසටහන යටතේ, 2014 ඔක්තෝබර් 17 සිට නොවැම්බර් 05 වන දා දක්වා කොළඹදී වැඩසටහනක් පවත්වනු ලැබීය. පියසර කාර්යපටිපාටි සැලසුම්කරුවන් විසින් වැඩි දියුණු කරන ලද කාර්ය සාධනය පාදක වූ ගුවන් සංතරණ (PRN) පියසර කාර්ය පටිපාටිවල දී පියසර තහවුරු කිරීම් සිදු කිරීම පිළබඳව ගුවන් නියමුවන් පුහුණු කිරීම මෙම වැඩසටහනේ අරමුණ විය. අන්තර්ජාතික සිවිල් ගුවන් සේවා සංවිධානයේ (ICAO) අවශ්‍යතාව පරිදි, කලාපීය කාර්ය සාධනය පාදක වූ ගුවන් සංතරණ (PBN) පියසර කාර්ය පටිපාටි ක්‍රියාත්මක කිරීමේ සැලසුම්වලට සමගාමීව එම සංවිධානයේ සාමාජික රාජ්‍යයන් මගින් ද කාර්ය සාධනය පාදක වූ ගුවන් සංතරණ පියසර කාර්ය පටිපාටි ක්‍රියාත්මක කළ යුතු වන අතර 2016 වසර වන විට අදාළ රාජ්‍යයන් විසින් මෙම කාර්ය පටිපාටි ක්‍රියාත්මක කර තිබිය යුතුය.

එසේම, අන්තර්ජාතික සිවිල් ගුවන් සේවා සංවිධානයේ (ICAO) අවශ්‍යතාව පරිදි, (ICAO) මගින් ලබා දී ඇති මාර්ගෝපදේශ යටතේ, ඒ ඒ සාමාජික රාජ්‍යය මගින් සිවිල් ගුවන් සේවාවේ නිරුපද්‍රිතතාව වැඩි දියුණු කිරීමේ අරමුණින් රාජ්‍ය නිරුපද්‍රිතතා වැඩසටහන් (SSP) ක්‍රියාත්මක කිරීම ද අවශ්‍ය වේ. ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය මගින් මෙම කලාපයට අයත් රටවල් සඳහා වන අන්තර්ජාතික සිවිල් ගුවන් සේවා සංවිධානයේ තාක්ෂණික සහයෝගිතා කාර්යාංශයේ (ICAO - TCB) විශේෂඥ සහාය ඇතිව රාජ්‍ය නිරුපද්‍රිතතා වැඩසටහන පවත්වනු ලැබීය. මෙම පුහුණු වැඩසටහන තුළින් ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ තාක්ෂණික කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයන් සඳහා රාජ්‍ය නිරුපද්‍රිතතා වැඩසටහන පිළිබඳව පුහුණුවක් ලබා දෙන ලදී. 2014 වසරේ පුහුණු වැඩසටහන තුළින් හඳුනා ගත් පරිදි වාර්ෂික අයවැය ප්‍රතිපාදන වෙන්කිරීම්වලට අනුකූලව මෙම සේවකයන් සඳහා පුහුණුවීම් ලබා දෙනු ලැබීය.

විශේෂයෙන්ම පාසැල් දරුවන් ද ඇතුළු මහජනතාව වෙත ගුවන් සේවා ක්ෂේත්‍රය පිළිබඳ මූලික දැනුමක් ලබා දීමේ අරමුණින්, 2010 වසරේදී ආරම්භ කරන ලද අධ්‍යාපන වැඩසටහන් සාර්ථකව පවත්වාගෙන යෑමට ද ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියට හැකි විය. සමාලෝචිත කාල පරිච්ඡේදය තුළ, ගුවන් සේවා ක්ෂේත්‍රය පිළිබඳ පාසැල් දරුවන්ගේ දැනුම වැඩි දියුණු කිරීමේ අරමුණින් ''ගුවන්සර'' ත්‍රෛමාසික අධ්‍යාපනික සඟරාව ප්‍රකාශයට පත් කරනු ලැබේ. මෙම සඟරා පාසැල් 3100 කට නොමිලයේ බෙදා හරිනු ලැබීය.

ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය මගින් සේවකයන් සහ ඔවුන්ගේ පවුල්වල ආසන්න සාමාජිකයන් සඳහා පිරිනමන ලද වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය වැනි සුභසාධන පහසුකම් අඛණ්ඩව පවත්වාගෙන යන ලදී. ඒ අනුව, එකසිය හතළිස් හයක් වූ මුළු සේවක පිරිසක් වෛද්‍ය රක්ෂණ

යෝජනා ක්‍රමයේ ප්‍රතිලාභ ලැබූහ. තවද, සුබසාධනය ඇති කිරීමේ පියවරක් ලෙස සමාලෝචිත කාල පරිච්ඡේදය තුළ අධිකාරියේ සේවකයන් සඳහා ආපදා ණය, දේපළ ණය හා වාහන ණය ද ලබා දෙනු ලැබීය.

සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා ඇතුළු අධිකාරියේ සෑම තරාතිරමකම සේවකයන් විසින් ඉටු කරන ලද අති විශිෂ්ට කාර්යභාරය මේ අවස්ථාවේ දී කෘතවේදීව සිහිපත් කරමි. සෑම අවස්ථාවකදීම තම වගකීම් නොපිරිහෙලා ඉටු කරමින් මා වෙත ලබා දුන් සහයෝගය හා මඟපෙන්වීම පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලයට ද ස්තූතිවන්ත වෙමි. ගරු සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා ද, සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයේ ලේකම්තුමා ඇතුළු නිලධාරීන් විසින් මා වෙත ලබා දුන් සහය හා මඟ පෙන්වීම් පිළිබඳව ද මගේ ස්තූතිය පිරිනැමීමට මෙය අවස්ථාවක් කර ගනිමි.



ජෙනරාල් රොහාන් ද සිල්වා දළුවත්ත

සභාපති

(09.01.2013 සිට 13.01.2015 දක්වා)

# සිවිල් ගුවන්සේවා අධ්‍යක්ෂ ජනරාල් හා ප්‍රධාන විධායක නිලධාරීතුමාගේ සමාලෝචනය



## ගෝලීය තත්වය

වාණිජ පියසැරිය පිළිබඳ ශත සංවත්සරය හා 1944 චිකාගෝ සම්මුතියේ 70 වන සංවත්සරය ද සැමරීමේ අවස්ථාව 2014 වසරේදී ලෝකවාසීන්ට හිමි විය.

ගුවන් ප්‍රවාහණ සමාගම් මඟින් දේශ සීමා මායිම් හරහා ගුවන් ප්‍රවාහණ මෙහෙයුම් කටයුතු ඉටු කරමින් වසරින් වසර මිනිසුන් හා භාණ්ඩ ප්‍රවාහණ කටයුතු ඉටු කරන වාතාවරණයක් තුළ, ගුවන් ප්‍රවාහණ කර්මාන්තය ගෝලීයකරණය නැමති සංකල්පයේ ප්‍රධාන සංරචකයක් බවට වර්තමානයේ දී පත්ව තිබේ. වාර්ෂිකව බිලියන 3 කට අධික මඟීන් පිරිසක් ප්‍රවාහණය කිරීම තුළින් ද, පුද්ගලයන් මිලියන 58කට රැකියා ලබා දීමට සහාය වෙමින් ද, ඇ.ඩො. ට්‍රිලියන 2.4ක දළ දේශීය නිෂ්පාදිතයක් උත්පාදනය කරමින් ද, ගෝලීය සම්බන්ධතා හා ආර්ථික සෞභාග්‍යය ඇති කරලීම සම්බන්ධයෙන් කැපී පෙනෙන කාර්යභාරයක් ඉටු කිරීමට ගුවන් ප්‍රවාහණ කර්මාන්තයට වර්තමානයේ දී හැකියාව ලැබී තිබේ. දිනපතා 100,000 කට අධික ගුවන් යානා ප්‍රමාණයක් උපයෝගී කර ගනිමින් ගුවන් මගීන් හා භාණ්ඩ ඒවායේ ගමනාන්තවලට ප්‍රවාහණය කරනු ලබන අතර මිලියන 4.4ක මගී පිටත්ව යාම් සඳහා එක් හදිසි අනතුරක් පමණක් වාර්තා කරමින් ලෝකයේ භාවිත වන වඩාත් නිරුපද්‍රිත මෙන්ම අතිශයින්ම කඩිනම් ප්‍රවාහණ ක්‍රමය බවට ද ගුවන් ප්‍රවාහණය පත්ව තිබෙන අතර වත්මන් විශ්ව ආර්ථිකයේ 3.4%ක් ද ගුවන් සේවා මත රඳා පවතී.

මේ අයුරින්, ගුවන් ප්‍රවාහණ අංශය සමාජ ආර්ථික සංදර්භය තුළ වඩාත් කැපී පෙනෙන මට්ටමකට ළඟා වී තිබෙන අතර නූතන ගුවන් යානා 80% ක පමණ ඉන්ධන කාර්යක්ෂමතාවක් (මගීකිලෝමීටර් 100 කට ඉන්ධන ලීටර් 3) ද, ජෙට් යුගයේ (ඩෙසිබල් 127) උදාවට සාපේක්ෂව ඩෙසිබල් 82 ක ඉහළ නිශ්ශබ්දතාවක් ද පවත්වා ගනිමින් පාරිසරික වශයෙන් ඉහළ මට්ටමේ සංවේදීතාවක් ගොඩ නඟා ගනිමින් පවතී.

2014 වර්ෂයේ දී වාර්තා වී ඇති හදිසි අනතුරු සංඛ්‍යාව 73ක් වූ අතර 2013 වසරේ වාර්තා ගත වූ ගුවන් යානා හදිසි අනතුරු සංඛ්‍යාව වූ 81ට සාපේක්ෂව එය අඩු අනතුරු ප්‍රමාණයකි. මෙම හදිසි අනතුරු 73ම ගුවන් යානා සම්බන්ධ අනතුරු බව සඳහන් කළ යුතුය. එමෙන්ම, 2009 - 2013 වසර පහක කාල සීමාව තුළදී වසරකට මාරක ගුවන් අනතුරු 19ක් හා ජීවිතක්ෂයට පත් වීම් 517ක් සිදු වීමට සාපේක්ෂව 2014 වර්ෂයේ සිදු වූ මාරක අනතුරු 12 (සියල්ල ගුවන් යානා සම්බන්ධ අනතුරුය) සමඟ ජීවිතක්ෂයට පත් වීම් 614ක් වාර්තා වී තිබුණි. 2014 වසරේදී ගෝලීය ජෙට් ගුවන් යානා අනතුරු අනුපාතය (මිලියන 1ක ගුවන් යානා අතරින් ගුවන් යානා බඳට සිදුවූ හානි ප්‍රමාණය මගින් තක්සේරු කරනු ලබයි) 0.23ක් වූ අතර 2013 වසරේ ගෝලීය ගුවන් යානා මිලියනයක් අතරින් බඳට හානි වීමේ අනුපාතය 0.41ක් විය. 2009 - 2013 වසර පහක කාල සීමාව තුළදී ජෙට් ගුවන් යානා මිලියනයක් අතරින් ගුවන් යානා බඳට හානි වීමේ අනුපාතය වූ 0.58 සාපේක්ෂව ද, මෙය වඩාත් යහපත් තත්ත්වයක් ලෙස සැලකිය හැකිය.

2014 වසර පිළිබඳව ආවර්ජනය කිරීමේ දී, MH 370 සහ MH 17 යන ගුවන් යානාවලට මුහුණ පෑමට සිදු වූ ඉතාමත් අසාමාන්‍ය මෙන්ම ඛේදජනක සිදුවීම් පිළිබඳ තොරතුරු අප මතකයට නැඟේ. MH 370 ගුවන් යානය අතුරුදහන් වීම හා නැති වී යාම සම්බන්ධ හේතු අනාවරණය කර ගත නොහැකි වුවද, 2014 වසර තුළ සිදු වූ මාරක ගුවන් අනතුරු 12න් එකක් ලෙස මෙම අනතුර වර්ගීකරණය කරන ලදී. මෙම සිදුවීම පදනම් කර ගනිමින්, වාණිජ ගුවන් යානා පිළිබඳව ගෝලීය වශයෙන් තොරතුරු සොයා බැලීමේ දී, ගෝලීය බලපෑම තක්සේරු කිරීම සඳහා ද, ක්‍රියාත්මක කිරීමේ දී මඟ පෙන්වීම සඳහා ද, උපයෝගී කර ගත හැකි බහු ජාතික මෙහෙයුම් තක්සේරුවල සහාය ලබා ගනිමින් කාර්ය සාධනය මත පදනම් වූ ප්‍රමිති අනුගමනය කිරීමට අන්තර්ජාතික සිවිල් ගුවන් සේවා සංවිධානයේ සහයෝගීතාවෙන් යුක්තව සමස්ත ගුවන් සේවා කර්මාන්තය කටයුතු කරයි.

MH 17 ගුවන් යානය කිසිදු ආකාරයකින් අනුමත කළ නොහැකි ප්‍රචණ්ඩකාරී ක්‍රියාවක ප්‍රතිඵලයක් වශයෙන් ගුවන් යානා නාශක අවි උපයෝගි කරගෙන විනාශ කරන ලැබුව ද, ගෝලීය වශයෙන් පිළිගනු ලබන හදිසි අනතුරු වර්ගීකරණය කිරීමේ නිර්ණායක යටතේ එම අනතුර හදිසි අනතුරක් ලෙස වර්ගීකරණය කර නොමැත. සුරක්ෂිතතාව සම්බන්ධයෙන් සිවිල් ගුවන් සේවා ක්ෂේත්‍රය තුළ පවතින අවදානම පිළිබඳ තීරණාත්මක තොරතුරු සම්බන්ධයෙන් වඩාත් හොඳින් දැනුවත් වීමේ අවශ්‍යතාව මෙම අනතුර තුළින් නැවත

වතාවක් අවධාරණය කරනු ලැබීය.

වසරින් වසර අන්තර්ජාතික හා දේශීය ගුවන් මගීන්ගේ 5.6%ක වර්ධනයක් වාර්තා කරමින් 2014 වර්ෂයේ දී, පුද්ගලයින් බිලියන 3.3කට අධික පිරිසක් මිලියන 38 ක ගුවන් ගමන් ප්‍රමාණයක් උපයෝගී කර ගනිමින් ගුවන් ගමන්වල නිරත වූහ. 2013 හා 2014 වර්ෂවල දී, බොහෝ රටවල ආර්ථික සංවර්ධනය පවා අඩපණ කර දැමීමට සමත් වූ ගෝලීය අවිනිශ්චිතතා හේතුවෙන් මඳක් පසු බෑමකට ලක්ව ඇති මගී ගුවන් ප්‍රවාහණ කටයුතු එම ගෝලීය අවිනිශ්චිතතා පහව යෑමෙන් අනතුරුව නැවතත් යථා තත්වයට පත් වනු ඇතැයි අපේක්ෂා කළ හැකිය. නැගෙනහිර යුරෝපා රටවල් හා මැද පෙරදිග රටවල් වැනි ලෝකයේ ඇතැම් ස්ථානවල පැවතුණ භෞමික දේශපාලන අවදානම හේතු කොටගෙන 2014 වසරේ දී ලෝක සංචාරක කර්මාන්තයට ද නොවැළැක්විය හැකි හානියක් සිදු විය. ඉබෝලා වසංගතය පැතිරී යාම තුළින් ද බරපතල අභියෝග රැසකට මුහුණ පෑමට ගුවන් සේවා ක්ෂේත්‍රයට සිදු විය.

සමස්තයක් වශයෙන් සැලකීමේදී, සිදුවිය හැකි මෙවැනි හානිවලින් ආරක්ෂා වීමේ හැකියාව ද 2014 අන්තර්ජාතික සංචාරකයා සතුව පැවති බව ද පැහැදිලිව නිරීක්ෂණය කළ හැකි විය. ගෝලීය ආර්ථිකය අසමාන ලෙස ප්‍රකෘතිමත් වීම මධ්‍යයේ වුවද, 2014 වසරේ දී, විදේශීය භාණ්ඩ හා පාරිභෝගිකභාණ්ඩ සඳහා ගෝලීය ඉල්ලුමේ ශුද්ධ වර්ධනයක් පැවතුණි. ආර්ථික වර්ධනයක් සිදු නොවී ගෙවී ගිය වසර ගණනාවකට පසුව 2013 වර්ෂයේ අවසන් කාර්තුවේ දී සහ 2014 වසරේ දී ගුවන් භාණ්ඩ ප්‍රවාහන වෙළඳපොළ වැඩි දියුණු වීමට මෙම තත්වය මහෝපකාරී විය. ලෝක වෙළඳ භාණ්ඩ පරිමාව වශයෙන් තක්සේරු කරනු ලබන මුහුදු, ගොඩබිම් හා ගුවන් මගින් රැගෙන යන අපනයන හා ආනයන භාණ්ඩවල සමස්ත ප්‍රවාහය ඉහළ වර්ධන ප්‍රවණතාවක් සනිටුහන් කර තිබේ. සමාලෝචිත වර්ෂය අවසානයේ දී, ගුවන් භාණ්ඩ ප්‍රවාහණ පරිමාව සමස්තයක් වශයෙන් 4.7% වර්ධනයක් පවත්වා ගෙන යෑමට සමත්ව තිබේ.

සමස්ත ගෝලීය ගුවන් සේවා කර්මාන්තය සඳහා මග පෙන්වනු ලබන ගුවන් සේවා පද්ධතිය ඒකකයක් ලෙස වැඩි දියුණු කිරීමේ (ASBU) වසර 15ක සැලසුම්කරණ චක්‍රයක් අන්තර්ජාතික සිවිල් ගුවන් සේවා සංවිධානය මගින් හඳුන්වා දෙනු ලැබීය. නිරුපද්‍රිතතාව, මෙහෙයුම් කටයුතු සහ ආර්ථික කරුණු පිළිබඳව සැලකිලිමත් වෙමින්, සෑම වසර 15කට වරක්ම දෙගුණයක් බවට පත් වන ගුවන් මගී සහ භාණ්ඩ ප්‍රවාහණය සඳහා පවතින ඉහළ ඉල්ලුම ගෝලීය වශයෙන් අනුකූලතාවක් ඇති වන පරිදි ද, පරිසර හිතකාමී සහ පිරිවැය ඵලදායි ලෙස ද සපුරාලීමට ගුවන් සේවා පද්ධතිය ඒකකයක් ලෙස වැඩි දියුණු කිරීමේ (ASBU) ක්‍රියාවලිය තුළින් හැකියාව ලැබෙනු ඇත. 2013 - 2028 (ICAO) ගෝලීය ගුවන් සංතරණ ධාරිතාව හා කාර්යක්ෂමතා සැලසුම මගින් ගෝලීය වශයෙන් අනුකූල වූ ගුවන් සංතරණ පද්ධතියකට උපයෝගී කර ගත හැකි සවිස්තරාත්මක සැලසුම්කරණ මෙවලමක් සිය (ICAO) සාමාජික රාජ්‍යයන්වලට ඉදිරිපත් කරනු ඇත. වර්තමානයේ භාවිත වන සියලුම කාර්ය සාධන වැඩි දියුණු කිරීම් මෙමගින් හඳුනා ගත හැකි වන අතර ලොව පුරා භාවිතයට ගනු ලබන බිම් මට්ටමේ ඉලෙක්ට්‍රොනික් තාක්ෂණික පද්ධතිවල සහ ගුවන් යානා හැසිරවීමේ ඉලෙක්ට්‍රොනික් තාක්ෂණික පද්ධතිවල ඊළඟ සංවර්ධන අදියර පිළිබඳව දැනුවත් වීමට ද මෙමගින් අවකාශ සැලසෙන අතර තනි පුද්ගල සැලසුම් සම්පාදනය කිරීමේ දී, ක්‍රමෝපායික තීරණ ගැනීම සඳහා (ICAO) සාමාජික රාජ්‍යයන්වලට අවශ්‍ය වන ආයෝජන පිළිබඳ තහවුරු කිරීම් සැපයීමට ද මෙමගින් අවස්ථාව සැලසේ.

ගුවන් සේවා පද්ධතිය ඒකකයක් ලෙස වැඩි දියුණු කිරීමේ සැලසුම්කරණ ප්‍රවේශය (ASBU) යනුවෙන් හඳුන්වනු ලබන මෙම ගෝලීය සැලසුම මගින් භාවිතා කරන්නන්ගේ අවශ්‍යතා, නියාමන අවශ්‍යතා හා ගුවන් සංතරණ සේවා ප්‍රතිග්‍රාහකයන්ගේ අවශ්‍යතා හා ගුවන්තොටුපළවල අවශ්‍යතා පිළිබඳව ද අවධානය යොමු කෙරේ. බොහෝ (ICAO) සාමාජික රාජ්‍යයන් ගුවන් සේවා යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ දී, (ASBU) රාමුව වෙත ප්‍රවේශ වෙමින් පවතින බව පැහැදිලිව නිරීක්ෂණය කළ හැකිය.

එක් එක් (ICAO) සාමාජික රාජ්‍යය තුළ නිරුපද්‍රිතතා වැඩසටහනක් (SSP) ක්‍රියාත්මක කිරීම සඳහා පූර්ව අවශ්‍යතාවක් වශයෙන් සැලකෙන වැඩි දියුණු කළ නිරුපද්‍රිතතා අධීක්ෂණ පද්ධතියක් ස්ථාපනය කළ හැකි වන පරිදි ගෝලීය ගුවන් සේවා නිරුපද්‍රිතතා සැලසුමක් (GASP) ක්‍රියාත්මක කිරීමට සහාය ලබා දෙන ලෙස (ICAO) සංවිධානය මගින් එහි සාමාජික රාජ්‍යයන්වලට උපදෙස් දෙනු ලැබීය. ගුවන් යානා ධාවන පථයේ නිරුපද්‍රිතතාව වැඩි දියුණු කිරීම, පාලිත ගුවන් ගමන්වලදී භූමියේ සිදුවන හදිසි අනතුරු සංඛ්‍යාව අඩු කිරීම (CFIT) සහ ගුවනේ ගමන් කිරීමේ දී, පාලනයෙන් මිදීම නිසා සිදුවන හදිසි අනතුරු හා සිදුවීම් සංඛ්‍යාව අඩු කිරීම යන ගුවන් සේවා නිරුපද්‍රිතතාව පිළිබඳ ක්ෂේත්‍ර තුනක් සඳහා ගෝලීය ප්‍රමුඛත්වය ලබා දී තිබේ. අන්තර් ජාතික සිවිල් ගුවන් සේවා සංවිධානය මගින් විවිධ කලාපවල රාජ්‍යයන් සමඟ සමීප සහයෝගීතාවෙන් කටයුතු කරමින් ගෝලීය ගුවන් සේවා ආරක්ෂක සැලසුම් සංකල්ප වඩාත් හොඳින් මෙහෙයවීමේ හැකියාව ලබා දීම සඳහා කලාපීය ගුවන් සේවා නිරුපද්‍රිතා කණ්ඩායම් ස්ථාපනය කිරීමට ද මූලික පියවර ගෙන තිබේ.

2014 වර්ෂයේ දී, ලෝකයේ විශාලතම ගුවන් යානා නිෂ්පාදකයින් පාරිභෝගික ගුවන් ප්‍රවාහණ සමාගම් සඳහා ගුවන් යානා සැපයීම පිණිස අතිශය කාර්ය බහුලතාවකින් යුතුව කටයුතු කළහ. 2014 වර්ෂයේ දී, බෝයිං සමාගම සැපයූ වාණිජ ජෙට් ගුවන් යානා 723 අතරින් 114 ක්, B - 787 ඩ්‍රීම්ලයිනර් ගුවන් යානා වූ අතර 485ක්, B - 737 තනි - ආසන මාර්ග ගුවන් යානා විය. එයාර් බස් සමාගම මගින් සැපයූ ගුවන් යානා 629 අතරින් 30 ක්, A - 380 ගුවන්යානා වූ අතර ගුවන්යානා 306 ක්, A - 320 ගුවන් යානා විය.

### කලාපීය වශයෙන් පවතින තත්වය

2014 වසරේ දී ලෝකයේ විශාලතම ගුවන් ප්‍රවාහණ වෙළඳපොළ ලෙස ශ්‍රේණිගත කරන ලද්දේ ලෝක ආදායම් මගී කිලෝමීටර් තක්සේරු කිරීම්වලට අනුව, 31%ක වෙළඳපොළ කොටසක් ලබා ගැනීමට සමත් වූ ආසියා-ශාන්තිකර කලාපයයි. පූර්ව වර්ෂයේ දී, එම කලාපය 58%ක අනුපාතයකින් වර්ධනය වී 27% ක වෙළඳපොළ කොටසක් ලබා ගනිමින් ලෝකයේ දෙවන විශාලතම වෙළඳපොළ කොටස හිමි කර ගැනීමට සමත් විය. ප්‍රධාන වශයෙන්ම කලාපයේ මුළු දේශීය ගුවන් ගමන් ප්‍රමාණයෙන් දළ වශයෙන් 60% ක කොටසකට හිමිකම් කියන චීන ගුවන් ප්‍රවාහන සමාගම් හේතුකොටගෙන 2013 වසරට සාපේක්ෂව 7.9%ක ඉහළම වර්ධනයක් ලබා ගැනීමට ආසියා-ශාන්තිකර දේශීය වෙළඳපොළ සමත් විය. 2014 වසරේ ලෝකයේ විශාලතම ගුවන් භාණ්ඩ ප්‍රවාහණ වෙළඳපොළ වූයේ ලෝක ආදායම් මගී කිලෝමීටර් තක්සේරු කිරීම්වලට අනුව, 40%ක වෙළඳපොළ කොටසක් හිමි කර ගැනීමට සමත් වූ ආසියා- ශාන්තිකර වෙළඳපොළයි.

2014 වර්ෂයේදී ගුවන් යානා පිටත්ව යාමේ ප්‍රමාණය අනුව ලෝකයේ ඉතාම කාර්ය බහුල ගුවන් තොටුපලවල් වශයෙන් වර්ගීකරණය කරන ලද ගුවන් තොටුපලවල් 30 අතරින් ගුවන් තොටුපලවල් 15කට අධික ප්‍රමාණයක් ආසියා-ශාන්තිකර කලාපය තුළ පිහිටා ඇති අතර චීනය මිලියන 3.2ක ගුවන් යානා පිටත්ව යාමේ ප්‍රමාණයක් වාර්තා කර තිබේ. ආසියා-ශාන්තිකර කලාපීය ගුවන් තොටුපලවල් මෙම වසරේ දී, සමස්ත මගී ගුවන් ප්‍රවාහණය සම්බන්ධයෙන් 6%කට ඉතා ආසන්න වර්ධනයක් වාර්තා කිරීමට සමත් විය. ඇතැම් වාණිජ ගුවන් තොටුපලවල ධාරිතාව පිළිබඳ සීමා කිරීම් හා ඉල්ලුම අඩු වීම යන කරුණු දෙකම හේතුවෙන් ද, ඇතැම් වාණිජ ගුවන් තොටුපළවල ධාරිතාව පිළිබඳ සීමා කිරීම් හෝ ඉල්ලුම අඩු වීම හේතුවෙන් ද කලාපයේ ප්‍රධාන පෙළේ වාණිජ ගුවන් තොටුපලවල් බොහොමයක් ගුවන් තොටුපල වර්ධනයේ පහත බැසීමක් අත් විඳිති. මෙම කලාපයේ ඉතාම කාර්ය බහුල ගුවන් තොටුපළ වන බීජිං (PEK) ගුවන් තොටුපල 29%කින් වර්ධනය වෙමින් පවතින අතර කලාපයේ දෙවන විශාලතම ගුවන් තොටුපල වන ජපානයේ හනීඩා (HND) ගුවන් තොටුපල 2014 වර්ෂයේ 5.3%කින් වර්ධනය විය.

2014 වසරේදී ආසියා-ශාන්තිකර කලාපයේ සිදු වූ ගුවන් අනතුරු 20 අතරින් එක් අනතුරක් මාරක අනතුරක් වූ අතර එම අනතුරින් පුද්ගලයින් 162 දෙනෙකු ජීවිතක්ෂයට පත් විය.

නිරුපද්‍රිතතාව අඛන්ඩව ඉහළ නැංවීම, පිරිවැය ඵලදායි යටිතල පහසුකම් හා පාරිසරික වගකීම ආසියා-ශාන්තිකර ගුවන් සේවා කර්මාන්තය සඳහා බලපාන වඩාත් තීරණාත්මක සාධක බවට පත්ව තිබේ. ආසියා-ශාන්තිකර කලාපය හරහා පවතින ගුවන් සේවා කටයුතු හා ගුවන් සේවා තුළින් පහසුකම් සලසනු ලබන සංචාරක කර්මාන්තය මගින් මිලියන 24 කට අධික රැකියා ප්‍රමාණයක් උත්පාදනය වී ඇති අතර ආර්ථික ක්‍රියාකාරකම් තුළින් ඇ.ඩො. බිලියන 500 කට අධික ආදායමක් ද උත්පාදනය කිරීමට සමත් ව තිබේ. එබැවින්, මෙම ආසියා-ශාන්තිකර කලාපය තුළ වර්ධනය සඳහා අති විශාල විභවයක් පවතී. ඉදිරි වසර 20 තුළදී, ආසියා-ශාන්තිකර කලාපය ගෝලීය වර්ධනයෙන් තුනෙන් දෙකක පමණ ප්‍රමාණයකට හිමිකම් කියනු ඇතැයි අපේක්ෂා කෙරේ.

ඉදිරි දශක දෙක තුළ ආසියා-ශාන්තිකර කලාපයේ ගුවන් ප්‍රවාහණ සමාගම් අඩු පිරිවැය ගුවන් ප්‍රවාහන සමාගම් ලෙස විශාල වශයෙන් ඇණවුම් ලබා ගනිමින් ශීඝ්‍රයෙන් පුළුල් වීමට සමත් වනු ඇත. විශේෂයෙන්ම ගිනිකොණදිග ආසියාවේ චීනය ලෝකයේ විශාලතම ගුවන් සේවා වෙළඳපොළ බවට පත් වෙමින් පවතින අතර ඉන්දියාවේ පුළුල් වෙමින් පවතින මධ්‍යම පාංතික ජනතාව ගුවන් ගමන්වල නිරත වනු ඇත.

### දේශීය වශයෙන් පවතින තත්වය

ශ්‍රී ලංකා ගුවන් සේවා අධිකාරියේ නියාමන විෂය පථයට අයත් සෑම ක්ෂේත්‍රයකම කැපී පෙනෙන වර්ධනයක් නිරීක්ෂණ කිරීමට 2014 වසරේදී අපට හැකි විය. සිවිල් ගුවන් සේවා ලේඛණයේ ලියාපදිංචි වී ඇති ගුවන් යානා සංඛ්‍යාව 63 සිට 71 දක්වා වැඩි වෙමින් සිවිල් ගුවන් සේවා ක්ෂේත්‍රයේ 13%ක වඩාත් සුබවාදි වර්ධනයක් සනිටුහන් කර තිබේ. එහි ප්‍රතිඵලයක් ලෙස, ජල ගුවන් තොටුපලවල්, දේශීය ගුවන් ගමන් මෙහෙයුම්කරුවන්, පියසර පාසැල්, සංචාරක නියෝජිතයන් හා සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් නිකුත් කරන ලද බලපත්‍රධාරීන්ගේ සංඛ්‍යාත්මක වශයෙන් කැපී පෙනෙන වර්ධනයක් වාර්තා විය.

2014 වර්ෂයේ අවසානය වන විට ශ්‍රී ලංකාව වෙත මෙහෙයුම් කටයුතු සිදු කරනු ලබන විදේශීය ගුවන් ප්‍රවාහන සමාගම් ප්‍රමාණය 24 සිට 26 දක්වා වැඩි විය. මෙම ගුවන් සේවා තුළින් ලෝකයේ විවිධ රටවල නගර 45ක් බණ්ඩාරනායක අන්තර්ජාතික ගුවන්තොටුපළට ඍජුව සම්බන්ධ වී තිබේ. මාලේ, චෙන්නායි, ඩුබායි, සිංගප්පූරුව, හා ඩෝහා යන නගර කොළඹ නගරය හැරුණු විට වඩාත්ම ජනප්‍රිය නගර පහ වේ. බණ්ඩාරනායක අන්තර්ජාතික ගුවන් තොටුපලේ ගුවන් යානා සංචලන ප්‍රමාණය පසුගිය වසරට සාපේක්ෂව 2014 වසරේදී 9%ක වර්ධනයක් වාර්තා කරමින් 55,228 දක්වා ඉහළ ගොස් තිබේ. 2013 වසරට සාපේක්ෂව මිලියන 7.8ක මගී සංචලන මෙහෙයුම් කටයුතු සිදු කර 7%ක වර්ධනයක් ද, මෙට්‍රික් ටොන් 192,000 ක ගුවන් භාණ්ඩ ප්‍රමාණයක මෙහෙයුම් කටයුතු සිදු කර 1%ක වර්ධනයක් ද අත්පත් කර ගැනීමට බණ්ඩාරනායක අන්තර්ජාතික ගුවන් තොටුපොල සමත්ව තිබේ.

බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපොළේ මගී ගුවන් ගමන් සම්බන්ධයෙන් 53.5%ක සාමාන්‍යයක් වාර්තා කිරීමටද, රටින් පිටතට ගුවනින් ප්‍රවාහණය කරනු ලබන භාණ්ඩ 46%ක් ද, රට වෙත ගුවනින් ප්‍රවාහණය කරන භාණ්ඩ 55%ක් ද මෙහෙයවනු ලැබීමට

ද ශ්‍රී ලංකන් එයාර්ලයින්ස් සමාගම සමත් ව තිබේ.

බණ්ඩාරනායක අන්තර්ජාතික ගුවන්තොටුපළ හරහා සංක්‍රමණය වූ මිලියන 1.2ක් වූ මගීන් පිරිසක් අතරින් මගීන් 9,25000 ක ප්‍රමාණයක්, එනම් 82ක් ශ්‍රී ලංකන් එයාලයින්ස් සමාගම මගින් ප්‍රවාහණය කරනු ලැබීය.

2014 වසරේදී, මත්තල රාජපක්ෂ අන්තර්ජාතික ගුවන් තොටුපල මගින් අන්තර්ජාතික මගීන් 20,474ක් ද, භාණ්ඩ මෙට්‍රික් ටොන් 60ක් ද මෙහෙයවනු ලැබීය. 2014 වසරේදි මත්තල රාජපක්ෂ අන්තර්ජාතික ගුවන් තොටුපල වෙත පැමිණි හා පිටව ගිය මුළු ගුවන් යානා සංචලන ප්‍රමාණය 2984ක් විය. මත්තල රාජපක්ෂ අන්තර්ජාතික ගුවන් තොටුපල වැඩි දියුණු කිරීමේ අභිලාශයෙන් ගුවන් යානා ගොඩ බෑම හා නවතා තැබීම සඳහා සහනදායි ගාස්තු අය කිරීමට අමතරව මත්තල රාජපක්ෂ අන්තර්ජාතික ගුවන් තොටුපල තුළ ක්‍රියාත්මක වන තෙවන, සිව්වන හා පස්වන ගුවන් ගමන් අයිතිවාසිකම්වලින් විදේශ ගුවන් යානා නිදහස් කිරීම සඳහා ''විවෘත ගුවන් තල' ප්‍රතිපත්තිය අනුග මනය කරනු ලැබීය.

දේශීය ගුවන් ප්‍රවාහණය පිළිබඳව සලකා බැලීමේ දී, ගුවන් ප්‍රවාහණ මෙහෙයුම්කරුවන් විසින් විවිධ මෙවලම් භාවිතා කරමින් 5,445ක මුළු ගුවන් ගමන් ප්‍රමාණයක් මෙහෙයවනු ලැබ තිබේ. 2013 වසරට සාපේක්ෂව 2014 වසරේදි දේශීය ගුවන් ගමන් සඳහා පැවති ඉල්ලුම 16% කින් වැඩි වී තිබෙන අතර 2014 වසරේදි දෙශීය ගුවන් ගමන්වල නිරත වූ මගීන් ප්‍රමාණය 31,527 දක්වා වැඩි වී තිබේ. එමෙන්ම, සමාලෝචිත වර්ෂය තුළ දී ස්තම්භ තටු භූමි ගුවන් යානා භාවිතය 33%කින් අඩු වී ඇති අතර ඉපිලි ගුවන් යානා භාවිතය හතර ගුණයකින් ද, හෙලිකොප්ටර් යානා භාවිතය 26%කින් ද වැඩි වී තිබේ. දේශීය ගුවන් සේවාව පිළිබඳව සලකා බැලීමේ දී, සමාලෝචිත වර්ෂය තුළ දී මගීන් 67%ක් ස්තම්භ තටු ගුවන් යානා භාවිත කළ අතර මගීහු 18%ක් ඉපිලි ගුවන් යානා භාවිත කරනු ලැබූහ. හෙලිකොප්ටර් යානා භාවිත කළ මගීන් ප්‍රමාණය 5%ක් විය. විනෝද උයන්වල ගුවන් ගමන් සඳහා උණුසුම් වායු බැලුන් භාවිතය ද සංචාරකයන් අතර ප්‍රචලිත වෙමින් පවතියි.

2009 වසරේ සිට ගුවන් ගමන් සම්බන්ධයෙන් කිසිදු ජීවිත හානියක් සිදු නො වී ගෙවී ගිය පස්වන අනුගාමී වසර වූයේ 2014 වසරය.

2014 වසරේදි ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ අනිවාර්ය වාර්තාකරණ පද්ධතිය යටතේ එම අධිකාරියට වාර්තා වූ ගුවන් යානා සම්බන්ධ විවිධ සිදුවීම් 243 අතරින් සිදුවීම් 222 ක් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි ගුවන් යානා සම්බන්ධ සිදුවීම් වූ අතර ශ්‍රී ලංකා භූමිය තුළ ක්‍රියාත්මක වන විදේශ රටවල ලියාපදිංචි කරන ලද ගුවන් යානා සම්බන්ධයෙන් ඉතිරි සිදුවීම් වාර්තා වී තිබේ. බණ්ඩාරනායක අන්තර්ජාතික ගුවන් තොටුපොළේ දී හා මත්තල රාජපක්ෂ අන්තර්ජාතික ගුවන්තොටුපොළේ දී පක්ෂීන් ගුවන් යානා සමඟ ගැටීම වැඩි වන අනුපාතයකින් සිදුවීම 2014 වසරේදි නිරුපද්‍රිතතාව පිළිබඳ ප්‍රධාන වශයෙන්ම වැදගත් වූ ගැටළුව විය.

2014 වසරේදීද, ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ නියාමන කර්තව්‍යය ඉටු කිරීම සඳහා ද, මෙහෙයුම්කරු සහතිකකරණය හා සෞඛ්‍යය සම්බන්ධ කාර්යය ඉටු කිරීම සඳහා ද අත්‍යවශ්‍ය වන සුදුසුකම් සහිත පුහුණු තාක්ෂණික කාර්ය මණ්ඩලය පත් කර ගැනීම හා ඔවුන් සේවයේ රඳවා ගැනීම පිළිබඳ ප්‍රධාන අපහසුතාවට මුහුණ දීමට අධිකාරියට සිදු විය. ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය විසින් එවැනි කාර්ය මණ්ඩලයක් පත් කර ගැනීම හා ඔවුන් සේවයේ රඳවා ගැනීම සඳහා වැඩි දියුණු කළ විශේෂ වෘත්තීය දිමනාවක් ඔවුන්ට ලබා දීම සඳහා මහා භාණ්ඩාගාරයේ එකඟතාව ලබා ගැනීමේ අභිප්‍රායෙන් නැවත නැවතත් ඉල්ලීම් සිදු කළ ද මේ වන තෙක් ඒ සඳහා පිළිතුරු ලබා දී නොමැත. ඒ හේතුවෙන් පුහුණු කාර්ය මණ්ඩලයේ සාමාජිකයින් සංඛ්‍යාවක් ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියෙන් ඉවත්ව ගිය අතර 2014 වර්ෂය තුළ එකම පරීක්ෂකයෙකු හෝ බඳවා ගැනීමට හැකි වී නොමැත. අන්තර්ජාතික ප්‍රමිති හා නිර්දේශිත පරිචයන්වලට අනුකූලව කටයුතු කිරීම තහවුරු කිරීම සඳහා සිවිල් ගුවන් සේවා කර්මාන්තය නියාමනය කිරීමේ වගකීම දරන රාජ්‍ය යාන්ත්‍රණය ලෙස සිවිල් ගුවන් සේවා ක්ෂේත්‍රයේ ක්‍රියාත්මක වන අනෙකුත් රාජ්‍යයන්වලට සමාන ව එහි කර්තව්‍යය සහ කාර්යය ඵලදායි ලෙස ඉටු කිරීම සඳහා සුදුසුකම් ලත් පුහුණු තාක්ෂණික කාර්ය මණ්ඩලයක් බඳවා ගැනීමට, පුහුණු කිරීමට හා ඔවුන්ව අධිකාරිය තුළ රඳවා ගැනීම සඳහා කටයුතු කිරීමේ හැකියාව ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය සතු විය යුතු බව විශේෂයෙන්ම සඳහන් කිරීම අවශ්‍ය වේ.

2014 වර්ෂයේ ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ මුළු වියදමින් 49%ක් කාර්ය මණ්ඩල පිරිවැය වූ අතර 3%ක් කාර්ය මණ්ඩල පුහුණු කිරීම සඳහාද, 4%ක් ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ කාර්යයන් හා කර්තව්‍යවලට ඉතා සමීප සම්බන්ධතාවක් පැවති විවිධ රැස්වීම් හා වැඩමුළු සඳහා සහභාගි වීම සඳහා ද වැය කරනු ලැබීය.

ගුවන්තොටුපලවල නිරුපද්‍රිතතාව සහ සුරක්ෂිතතාව නියාමනය කරන රාජ්‍ය යාන්ත්‍රණය වශයෙන් ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ නියෝජනය මත්තල රාජපක්ෂ අන්තර්ජාතික ගුවන්තොටුපළට ඉතා අත්‍යවශ්‍ය වූ බැවින් මෙම අවශ්‍යතාව ඉටු කිරීම සඳහා ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය විසින් රුපියල් මිලියන 39 ක පිරිවැයක් දරමින් මත්තල අන්තර්ජාතික ගුවන් තොටුපලේ දී කාර්යාලයක් ඉදි කරන ලද අතර එය 2014 ජූනි මාසයේ දී විවෘත කරනු ලැබීය. ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ කාර්ය මණ්ඩලය දකුණු, නැගෙනහිර හා සබරගමුව පළාත්වල සිවිල් ගුවන් සේවයට අදාළ කාර්යය සහ කර්තව්‍යය ඉටු කිරීමේ දී

කාර්ය මණ්ඩලයට නවාතැන් පහසුකම් සැපයීම සඳහා රු. මිලියන 42 ක පිරිවැයක් දරමින් වීරවිල ප්‍රදේශයේ නිල නිවාසය ඉදි කිරීමේ කටයුතු අවසන් කිරීමට ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියට හැකි විය. මෙම නිල නිවාසය එක් නිවසක ඒකක දෙක බැගින් වූ නිවාස 4 කින් සමන්විත වේ.

ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය මගින් එහි ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීමේ කටයුතු කටුනායක නායිකන්ද ප්‍රදේශයේ දී මේ වන විට සිදු කරමින් පවතී. මෙම ඉදිකිරීම සඳහා කොන්ත්‍රාත්කරුවෙකු රජයේ ප්‍රසම්පාදන කාර්ය පටිපාටියට අනුකූලව විවෘත ලංසු කැඳවීමේ ක්‍රියාවලියක් මගින් තෝරා ගෙන තිබේ. ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල ඉදි කිරීමේ කටයුතු සඳහා භාවිත කිරීමට ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ ඉතිරි කිරීම්වලින් රුපියල් මිලියන 1150 ක මුල්‍ය සංචිතයක් ඇති කිරීම සඳහා මහා භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීමට ද අධිකාරිය සමත්ව තිබේ.


2014 වසර සඳහා ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ ආදායම රුපියල් මිලියන 1,473 ක් වූ අතර එහි වියදම රුපියල් මිලියන 347 ක් විය. මුල්‍ය ප්‍රතිඵලය වශයෙන් රුපියල් මිලියන 813 ක ශුද්ධ ලාභයක් ලබා තිබේ. 2014 වසරේ දී ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය විසින් රුපියල් මිලියන 250 ක මුදලක් මහා භාණ්ඩාගාරයට ප්‍රේෂණය කර තිබේ.

2014 වසරේ දී හොංකොං දේශයේ පැවැත් වූ 51 වන සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල්වරුන්ගේ සමුළුවේ දී (DGCA), ආසියා ශාන්තිකර කලාපයේ කලාපීය සිවිල් ගුවන් සේවා නිරුපද්‍රිතතා කණ්ඩායමේ මුලසුන දැරීම සඳහා ශ්‍රී ලංකාව තෝරා පත් කර ගන්නා ලදී.

2016 වසරේ කොළඹ දී පැවැත්වීමට නියමිත ආසියා ශාන්තිකර කලාපයේ 53 වන සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල්වරුන්ගේ සමුළුව (DGCA) සඳහා ද, 2017 වසරේ කොළඹ දී පැවැත්වීමට නියමිත අන්තර්ජාතික සිවිල් ගුවන් සේවා සංගමයේ (ICAO) ගෝලීය ගුවන් සේවා සාකච්ඡා පිළිබඳ 10 වන සමුළුව සඳහා ද සත්කාරක දේශය වශයෙන් ක්‍රියා කිරීමට ශ්‍රී ලංකාවට ඉඩකඩ සැලැසීම සඳහා අන්තර්ජාතික සිවිල් ගුවන් සේවා සංගමය (ICAO) මගින් එහි අනුමැතිය ලබා දී තිබේ.

ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ කාර්යයන් හා කර්තව්‍යයන් ඉටු කිරීමේදී, ගරු සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා ද, සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයේ ලේකම්තුමා ඇතුළු නිලධාරීන් විසින් මා වෙත ලබා දුන් සහාය මෙන්ම මා වෙත දක්වන ලද සහයෝගය පිළිබඳව ද මගේ ස්තුතිය පිරිනැමීමට මෙය අවස්ථාවක් කර ගනිමි.

එමෙන්ම, මෙම රාජකාරි ඉටු කිරීමේදී සහාය ලබා දීම හා මඟපෙන්වීම පිළිබඳව සභාපති, උප සභාපති හා අධිකාරියේ කාර්ය මණ්ඩලයට ද ස්තුති වන්ත වෙමි. භාර දුන් කාර්යයන් ඉතා උද්යෝගිමත්ව, ඉහළම තෘප්තියකින් යුක්තව මනාව ඉටු කිරීම පිළිබඳව අධිකාරියේ කාර්ය මණ්ඩලයට ද අතිශයින්ම ස්තුතිවන්ත වෙමි.



එච්.එම්.සී. නිමල්සිරි

සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල් සහ

ප්‍රධාන විධායක නිලධාරී.

# ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ සැකැස්ම

## සමාලෝචනය

ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය (CAASL) 2002 අංක 34 දරන සිවිල් ගුවන් සේවා අධිකාරිය පනත යටතේ 2002 දෙසැම්බර් 22 වන දින ස්ථාපනය කරනු ලැබීය. එමෙන්ම, ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ ගිණුම් විගණනය කිරීමේ අරමුණින් මෙම අධිකාරිය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාව යටතේ පොදු ව්‍යවසායක් ලෙස සලකනු ලැබේ.

ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ ප්‍රධාන කාර්යය වන්නේ 2002 අංක 34 දරණ සිවිල් ගුවන් සේවා අධිකාරි පනත සහ 2010 අංක 14 දරණ සිවිල් ගුවන් සේවා පනත මගින් ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය සඳහා නියම කර ඇති ව්‍යවස්ථාදායක විධිවිධාන යටතේ අන්තර්ජාතික සිවිල් ගුවන් සේවා සංවිධානය (ICAO) මගින් අනුගමනය කරනු ලබන අදාළ අන්තර්ජාතික ප්‍රමිති හා නිර්දේශිත පරිචයන්ට අනුකූලව සිවිල් ගුවන් සේවය පිළිබඳව මෙන්ම සිවිල් ගුවන් සේවය මගින් පරිසරය මත සිදු වන බලපෑම පිළිබඳව ද, නිරුපද්‍රිතතාව, සුරක්ෂිතතාව, කාර්යක්ෂමතාව හා විධිමත්බව නියාමනය කිරීම සහ ශ්‍රී ලාංකික පුරවැසියන්ගේ ජීවන තත්වය නගා සිටුවමින් ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අංශය ජාතික ආර්ථික වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් දායක වන අංශයක් බවට පත් කරවීමයි.

ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය සාමාජිකයින් අට (08) දෙනෙකුගෙන් සමන්විත වේ. ඒ අතරින් සාමාජිකයින් පස් (05) දෙනෙකු සිවිල් ගුවන් සේවා විෂය භාර අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබේ. ආරක්ෂක අමාත්‍යංශයේ ලේකම්, මුදල් විෂය භාර අමාත්‍යවරයාගේ නියෝජිතයෙකු සහ සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා නිල බලයෙන් ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියට පත් වන අනෙකුත් සාමාජිකයින් වේ.

සිවිල් ගුවන් සේවා විෂය භාර ගරු අමාත්‍යවරයා විසින් ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ සභාපතිවරයා හා උප සභාපතිවරයා පත් කරනු ලබයි. අමාත්‍ය මණ්ඩලය විසින් සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා පත් කරනු ලබන අතර ව්‍යවස්ථාවට අනුව ඔහු ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ ප්‍රධාන විධායක නිලධාරියා ද වන්නේය.

පත් කරනු ලැබූ සාමාජිකයින්ගේ ධූර කාලය පත් කරනු ලැබූ දිනයේ සිට වසර තුනක් ගත වන තුරු බල පැවැත්වේ. මෙම අධිකාරිය සිවිල් ගුවන් සේවා විෂය භාර අමාත්‍යවරයාගෙන් සාමාන්‍ය විධානයට හා පාලනයට යටත් වේ.

### ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ සාමාජිකයින්

පහත දක්වා ඇති සාමාජිකයින් 2014 වසරේ දී අමාත්‍යවරයා විසින් පත් කළ සාමාජිකයින් ලෙස ධූර දැරූහ.

ජෙනරාල් රොහාන්ද සිල්වා දළුවත්ත (සභාපති)
ජේ.එම්.එස්.ඩබ්.ජයසුන්දර (උප සභාපති)
සාකී අලිෆ් මහතා (සාමාජික)
එල්.ඩී.එස්.බාලසූරිය (සාමාජික)
ඒ.ඩබ්.සාඩිකුල් අමීන් මහතා (සාමාජික)

### නිල බලයෙන් පත් වූ සාමාජිකයින්

ගෝඨාභය රාජපක්ෂ මහතා, ආරක්ෂක ලේකම් පී. අල්ගම මහතා, අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුව එච්.එම්.සී. නිමල්සිරි මහතා, සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල් සහ ප්‍රධාන විධායක නිලධාරී.

ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ සභාපතිවරයා වන ජනරාල් රොහාන් ද සිල්වා දළුවත්ත WWV, RWP, RSP, VSV, USP, LOM, ndc, psc පන්නිපිටිය ධර්මපාල විද්‍යාලයෙන් මූලික අධ්‍යාපනය ලබා කොළඹ ආනන්ද විද්‍යාලයේ දී ඔහුගේ ද්විතීයික අධ්‍යාපන කටයුතු සම්පූර්ණ කළේය. පාසැලේ අධ්‍යාපන කටයුතු වලදී මෙන්ම ක්‍රීඩා කටයුතු වල දී ද විශිෂ්ට දස්කම් දැක්වීමට ජෙනරාල් රොහාන් ද සිල්වා දළුවත්ත මහතා සමත් විය.

1961 වසරේදි ඔහු ශ්‍රී ලංකා යුධ හමුදාවට එක් වූ අතර කැඩෙට් නිලධාරිවරයෙකු වශයෙන් නිලධාරි පුහුණුව ලබා ගැනීම සඳහා එක්සත් රාජධානියේ සැන්ඩ්හර්ස්ට් රාජකීය හමුදා ඇකඩමියට ඇතුළත් විය. ශ්‍රී ලාංකික කැඩෙට් නිලධාරින් අතර ප්‍රථම ස්ථානය ලබා පුහුණුව අවසන් කළ ඔහු සන්නාහ සන්නද්ධ බලකායේ දෙවන ලුතිනන් නිලයට පත් කරනු ලැබූ අතර යොවුන් නිලධාරි පාඨමාලාව සඳහා එක්සත් රාජධානියේ බෝවිංටන් හි රාජකීය සන්නාහ සන්නද්ධ බලකා මධ්‍යස්ථානයට ඇතුළත් විය. එතැන් පටන් ඉන්දියාවේ වෙලිංටන්හි සුප්‍රසිද්ධ මාණ්ඩලික විද්‍යාල පාඨමාලාව ද, නවදිල්ලියේ ජාතික ආරක්ෂක පාඨමාලාව ඇතුළු බොහෝ පුහුණු පාඨමාලා ද සම්පූර්ණ කිරීමට ඔහු සමත් විය. වසර 41ක ඔහුගේ කීර්තිමත් වෘත්තීය ජීවිතය තුළ, ඒකාබද්ධ මෙහෙයුම් අණදෙන නිලධාරි, මාණ්ඩලික ප්‍රධානි, සේනාංකාධිපති, බලසේනාධිපති සහ හමුදා පුහුණු මධ්‍යස්ථානයේ සේනා විධායක වැනි ඉතා වැදගත් අණ දෙන, මාණ්ඩලික සහ පුහුණු කිරීමේ තනතුරුවල වගකීම් ඉටු කර තිබේ.

උතුරු හා නැගෙනහිර ඒකාබද්ධ මෙහෙයුම් අණ දෙන නිලධාරි ලෙස 1995 වසරේදි යාපනය අර්ධද්වීපය මුදවා ගත් රිවිරැස මෙහෙයුම වැනි අතිශයින් වැදගත් මෙහෙයුම් ද ඇතුළත්ව මෙහෙයුම් ගණනාවකට ඔහු විසින් නායකත්වය ලබා දෙනු ලැබීය. ජනරාල් දළුවත්ත මහතා ඇමෙරිකා එක්සත් ජනපදයේ ශාන්තිකර යුධ හමුදා ආරක්ෂක නිලධාරින් සමඟ ඔහු සම සත්කාරකත්වය දරන ලද ශාන්තිකර යුධ හමුදා කළමනාකරණ සම්මන්ත්‍රණය ඇතුළු තවත් අන්තර්ජාතික සම්මන්ත්‍රණ ගණනාවකට සහභාගී විය. ජෙනරාල් දළුවත්ත මහතා විසින් ඉටු කළ කැපී පෙනෙන මෙහෙවර විශේෂයෙන් ඇගයීම සඳහා ඇමෙරිකා එක්සත් ජනපදයේ ජනාධිපතිවරයා විසින් ශාන්තිකර යුධ හමුදා කළමනාකරණ සම්මන්ත්‍රණය අතරතුර LEGION OF MERIT යන ගෞරව නාමය ජෙනරාල් රොහාන් ද සිල්වා දළුවත්ත මහතාට ප්‍රදානය කරනු ලැබීය.

ශ්‍රී ලංකා යුධ හමුදාවේ හමුදාපතිවරයා ලෙස කටයුතු කරමින් වෘත්තිය ජීවිතයේ කූට ප්‍රාප්තියට පත් වූ එතුමා 1998 දෙසැම්බර් මාසයේ යුධ හමුදා සේවයෙන් විශ්‍රාම ගනු ලැබීය. ඔහු විසින් ඉටු කළ ඉතා වටිනා සේවය ඇගයීමක් ලෙස ඔහු ජෙනරාල් නිලයට උසස් කර ඒකාබද්ධ මෙහෙයුම් කාර්යාංශයේ සභාපතිවරයා ලෙස පත් කරනු ලැබීය. වන්නි ප්‍රදේශයේ දී භූමිය යුධ හමුදාවන් වෙතින් ගිලිහී ගොස් යාපනය අර්ධද්වීපය යුධ හමුදාවට අහිමි වීමට ආසන්නව තිබිය දී ඔහු ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානි ලෙස පත් කරන ලදුව උතුරේ තත්වය පාලනය කිරීම සඳහා යාපනය යුධ හමුදා සේවයේ නියුක්ත කරනු ලැබිය. මෙම කර්තව්‍යය මැනවින් ඉටු කිරීමෙන් අනතුරුව 2002 වසරේදි එතුමා යුධ හමුදා සේවයෙන් නිශ්චිත වශයෙන්ම විශ්‍රාම ගැනීමට තීරණය කළේය. ඉන් අනතුරුව බ්‍රසීලයේ ශ්‍රී ලංකා තානාපතිවරයා ලෙස පත් කරනු ලැබූ ඒ මහතා බ්‍රසීලයේ ශ්‍රී ලංකා දූත මණ්ඩලයක් ඒ වන තෙක් ස්ථාපනය කර නොතිබූ හෙයින් එරට ශ්‍රී ලංකා තානාපති කාර්යාලයක් පිහිටුවීමට ද පුරෝගාමීව කටයුතු කළේය. තානාපති ධූර කාලය අවසානයේදි බ්‍රසීලය හා ශ්‍රී ලංකාව අතර සම්බන්ධතා ශක්තිමත්ව පවත්වාගෙන යෑම සම්බන්ධයෙන් ඔහු ලබා දුන් විශිෂ්ට දායකත්වය අගය කරමින් බ්‍රසීල ජනාධිපතිතුමා විසින් "GRAND CROSS OF THE NATIONAL ORDER OF THE SOUTHERN CROSS" යන ගෞරව නාමය ජනරාල් රොහාන් ද සිල්වා දළුවත්ත මහතා වෙත පිරිනමනු ලැබීය.

ශ්‍රී ලංකාවට නැවත පැමිණීමෙන් අනතුරුව, 2011 වසරේදී ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ සභාපති/ප්‍රධාන විධායක නිලධාරි ලෙස පත් කරනු ලැබීය. 2012 වසරේදි ඔහු ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ සභාපතිවරයා ලෙස රාජකාරී කටයුතු ආරම්භ කරනු ලැබීය. මෙයට අමතරව, කොතලාවල



# සභාපති,
## ජෙනරාල් රොහාන් ද සිල්වා දළුවත්ත,
WWV,RWP,RSP,VSV,USP, LOM, ndc, psc

ආරක්ෂක විශ්ව විද්‍යාලයේ කුලපති පදවිය ද ඔහු වෙත පිරිනමනු ලැබීය.

බොහෝ ක්‍රීඩා පිළිබඳව නිපුණතාවක් දැක් වූ ඔහු මලල ක්‍රීඩා, පැසිපන්දු, ක්‍රිකට්, බැඩ්මින්ටන් හා ටෙනිස් යන ක්‍රීඩා සඳහා වර්ණ දිනා ගන්නා ලදී. වසර 20ක කාලයක් ජාතික පැසිපන්දු කණ්ඩායම නියෝජනය කරමින් ක්‍රීඩා කළ ඔහු එම කණ්ඩායමේ නායකත්වය දැරීමට ද සමත් විය. බ්‍රිතාන්‍ය යුධ හමුදා ශූරතා තරඟාවලියේදී තුන් පිම්ම ක්‍රීඩා ඉසව්ව ජයග්‍රහණය කිරීමට ලැබුණු අවස්ථාව මලල ක්‍රීඩා ක්ෂේත්‍රයේ ඔහු ලබාගත් විශිෂ්ටතම ජයග්‍රහණය විය. බ්‍රිතාන්‍ය ජාතික මලල ක්‍රීඩා තරගයේ දී, බ්‍රිතාන්‍ය ඒකාබද්ධ සේවා නියෝජනය කරනු ලැබූ ඔහු මලල ක්‍රීඩා සඳහා බ්‍රිතාන්‍ය ඒකාබද්ධ සේවා වර්ණ දිනා ගැනීමට ද සමත් විය.

ජෙනරාල් දළුවත්ත මහතාගේ වෘත්තීය ජීවිතය මුළුල්ලේ ඔහු භාරගත් සෑම කාර්යයක්ම අති විශිෂ්ට අන්දමින් ඉටු කරමින් ඔහු තුළ පවතින විශිෂ්ට කළමනාකරණ කුසලතා මැනවින් සනාථ කිරීමට සමත්ව තිබේ.



# උප සභාපති
## ජේ.එම්.එස්.ඩබ්.ජයසුන්දර මහතා

මහනුවර ධර්මරාජ විද්‍යාලයෙන් මූලික අධ්‍යාපනය ලබා ගත් ජේ.එම්.එස්.ඩබ්. ජයසුන්දර මහතා විශිෂ්ට ක්‍රීඩකයෙකු විය. 1971 වසරේ පොලිස් දෙපාර්තමේන්තුවේ සේවයට බැඳුණු ඒ මහතා වසර 37 ක නොකැළැල් සේවා කාලයකින් පසුව නියෝජ්‍ය පොලිස්පතිවරයෙකු ලෙස විශ්‍රාම ලැබීය. ඔහුගේ කීර්තිමත් සේවා කාලය තුළ පුහුණු කටයුතු සඳහා ජපානය, මැලේසියාව, ස්කොට්ලන්ඩ්යාර්ඩ් පොලීසියට සහ , ඇමෙරිකා එක්සත් ජනපදය හා ප්‍රංශය වැනි රටවල ද සංචාරය කර තිබේ. ඔහු ජාත්‍යන්තර පොලිස් සම්මේලනයේ යාවජීව සාමාජිකයෙකු ද වේ. ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ උප සභාපති ලෙස සහ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයකු ලෙස රාජකාරී භාර ගැනීමට පෙර ඔහු සී/ස ගුවන්තොටුපල හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගමේ විශේෂ කාර්ය පිළිබඳ අධ්‍යක්ෂවරයා ලෙස ද සේවය කළේය.



## ආරක්ෂක ලේකම් - ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය - (නිල බලයෙන් පත් වූ සාමාජික)

# ගෝඨාභය රාජපක්ෂ මහතා RWP, RSP

ගෝඨාභය රාජපක්ෂ මහතා **RWP, RSP** කොළඹ ආනන්ද මහා විද්‍යාලයෙන් මූලික අධ්‍යාපනය ලබා ගත්තේය. දියතලාව යුධ හමුදා පුහුණු මධ්‍යස්ථානයේදී පුහුණුව ලබා ගත් ඒ මහතා 1972 මැයි 26 වන දින ශ්‍රී ලංකා සංඥා බලකායේ අධිකාරිය ලත් නිලධාරියෙකු විය.

1974 දී ඔහු ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවට මාරු කරන ලදී. ඔහු රජරට රයිෆල්ස් (1980 දී) බලකායේ සේවය කළ අතර 1991 වසරේදී නියමිත කාලයට පෙර විශ්‍රාම ගන්නා තුරු ගජබා රෙජිමේන්තුවේ (1983 දී) ලුතිනන් කර්නල්වරයෙකු ලෙස සේවය කරනු ලැබීය. යුධ හමුදාවේ ඔහුගේ කීර්තිමත් සේවය අතරතුර ඉන්දියාවේ වෙලින්ටන් ආරක්ෂක සේවා මාණ්ඩලික විද්‍යාලයේ පාඨමාලාවක්ද, ඇමෙරිකා එක්සත් ජනපදයේ පාබල හමුදා නිලධාරින් සඳහා වූ උසස් පාඨමාලාව ද ඇතුළු ඉතා වැදගත් පුහුණු පාඨමාලා ගණනාවක් හදාරනු ලැබීය. ගෝඨාභය රාජපක්ෂ මහතා වඩමාරච්චි මෙහෙයුම පිළිබඳ බොහෝ අත්දැකීම් සහිත යුධ හමුදා නිලධාරියකු විය. මෙම මෙහෙයුම අතරතුර ගජබා රෙජිමේන්තුවේ 1 වන බල ඇණියේ අණ දෙන නිලධාරියා ද විය.

1990 වසරේදී ත්‍රිවිධ බලය හා ජයශක්ති මෙහෙයුම් අතරතුර එම බල ඇණියේ අණදෙන නිලධාරියා ලෙස ඉතා සාර්ථකව රාජකාරී කටයුතු ඉටු කළේය. ගෝඨාභය රාජපක්ෂ මහතා ආරක්ෂක විද්‍යා පීඨයේ නියෝජ්‍ය සේනා විධායක වශයෙන් ද සේවය කළේය. රාජපක්ෂ මහතාගේ කීර්තිමත්, කැපී පෙනෙන සාර්ථක හමුදා සේවය අගයමින් ඔහු "රණවික්‍රම" හා "රණශූර" පදක්කම්වලින් ද පිදුම් ලබා ඇත.



## සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල් සහ ප්‍රධාන විධායක නිලධාරි (නිල බලයෙන් පත් වූ සාමාජික)

# එච්.එම්.සී නිමල්සිරි මහතා

නිමල්සිරි මහතා ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ සමාරම්භය සනිටුහන් කළ 2002 වසරේ සිටම එම අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් හා ප්‍රධාන විධායක නිලධාරි ලෙස කටයුතු කරයි. 1987 සිට සිවිල් ගුවන් සේවා දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂ (මෙහෙයුම්) තනතුර දැරූ අතර ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය ස්ථාපනය කිරීම සඳහා නව ව්‍යවස්ථාපිත රාමුව සැලසුම් කිරීම සඳහා ද, 1950 අංක 50 දරන ගුවන් සංතරණ පනත වෙනුවට 2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනත කෙටුම්පත් කිරීම සඳහා ද පුරෝගාමී වූ නිලධාරින් කීප දෙනා අතර එක් නිලධාරියෙකු වූයේ **H.M.C.** නිමල්සිරි මහතාය.

ඔහුගේ වෘත්තිය ප්‍රගමනයේදී පුද්ගල බලපත්‍ර ලබා දීම, ගුවන් ප්‍රවාහනය, ගුවන් සේවා නිරුපද්‍රිතතාව හා සුරක්ෂිතතාව, ගුවන් සංතරණ සේවා, නිරුපද්‍රිතතාව විගණනය කිරීම, නිරුපද්‍රිතතා කළමනාකරණ පද්ධති, ගුවන් යානා අනතුරු විමර්ශනය යනාදී ක්ෂේත්‍රවලට අදාළ බොහෝ පාඨමාලා හැදෑරීමට ද නිමල්සිරි මහතාට හැකි වූ අතර එබැවින් සිවිල් ගුවන් සේවා ක්ෂේත්‍රය පිළිබඳ පෘථුල දැනුමක් හා අත්දැකීම් ඒ මහතා සතුව පවති. එමෙන්ම, අන්තර්ජාතික සිවිල් ගුවන් සේවා සංවිධානය මගින් පැවැත් වූ විශ්ව නිරුපද්‍රිතතා අධීක්ෂණ විගණන පාඨමාලාව, නිරුපද්‍රිතතා කළමනාකරණ පද්ධති හා රාජ්‍ය නිරුපද්‍රිතතා වැඩසටහන යනාදි පුහුණු පාඨමාලා ද ඒ මහතා විසින් හදාරනු ලැබීය.

ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය හා කලින් පැවැති සිවිල් ගුවන් සේවා දෙපාර්තමේන්තුව නියෝජනය කරමින් සිවිල් ගුවන් සේවා ක්ෂේත්‍රය පිළිබඳව පැවැත්වූ කලාපීය හා අන්තර්ජාතික සම්මන්ත්‍රණවලට ද, විදේශ රාජ්‍යයන් සමග ද්විපාර්ශ්වික ගුවන් සේවා සාකච්ඡා සඳහා ද නිමල්සිරි මහතා සහභාගී වී තිබේ. එමෙන්ම, 2007 වසරේදී කලාපීය සහයෝගිතාව තුළින් අදාළ රාජ්‍යයන්වල නිරුපද්‍රිතතා අධීක්ෂණ ධාරිතා සංවර්ධනය සඳහා දකුණු ආසියානු රාජ්‍යයන් හතක් මගින් ස්ථාපනය කරන ලද කලාපීය වැඩ සටහනේ වැඩසටහන් සමායෝජක ලෙස කටයුතු කිරීම සඳහා

ශ්‍රී ලංකා රජය විසින් නිමල්සිරි මහතාව නොපැමිණීම සඳහා නිවාඩු ලබා දීමට යටත්ව තෙවසරක කාල සීමාවක් සඳහා අන්තර්ජාතික සිවිල් ගුවන් සේවා සංවිධානයට ද්විතීයනය කිරීමේ පදනම මත මුදා හරිනු ලැබීය.

නිමල්සිරි මහතා කොළඹ විශ්වවිද්‍යාලයෙන් විද්‍යාවේදි උපාධිය ලබා ගත් අතර එම විශ්ව විද්‍යාලය වෙතින්ම පරිඝණක විද්‍යාව පිළිබඳ විද්‍යාපති උපාධිය ද සම්පූර්ණ කරනු ලැබීය. රුසියාවේ යිලිනොස්ක් නගරයේදී සුදුසුකම් ලැබීමේ පාඨමාලාවක් හැදෑරීමෙන් අනතුරුව පියසර මෙහෙයුම් නිලධාරි බලපත්‍රය ද ලබා ගැනීමට ඔහු සමත් විය. 2004 වසරේදි ඇමෙරිකා එක්සත් ජනපදයේ ජෝර්ජ් වොෂින්ටන් විශ්ව විද්‍යාලය මගින් පවත්වනු ලැබූ ගුවන් සේවා නිරුපද්‍රිතතා හා සුරක්ෂිතතා කළමනාකරණ සහතිකපත්‍ර පාඨමාලාවද ඒ මහතා විසින් හදාරනු ලැබූ අතර 2006 වසරේදි එම විශ්වවිද්‍යාලය මගින්ම පැවැත් වූ ගුවන් සේවා නිරුපද්‍රිතතාව හා සුරක්ෂිතතාව පිළිබඳ අන්තර්ජාතික සමුළුවකට ද සහභාගි විය.

ගුවන් සේවාව එක් විෂය ධාරාවක් වන ප්‍රවාහණය හා සැපයුම් සේවා කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදි විශේෂ උපාධිය පිරිනමනු ලබන මොරටුව විශ්ව විද්‍යාලයේ බාහිර කථිකාචාර්යවරයෙකු ලෙස ද ඒ මහතා කටයුතු කරයි.

ආසියා-ශාන්තිකර කලාපයේ කලාපීය ගුවන් සේවා නිරුපද්‍රිතතා සංසදයේ සභාපතිවරයා ලෙස නිමල්සිරි මහතා තේරී පත් විය. ආසියා-ශාන්තිකර කලාපයේ ගුවන් සංතරණ සම්බන්ධ කරුණු සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම සඳහා අන්තර්ජාතික සිවිල් ගුවන් සේවා සංවිධානය යටතේ මෙහෙයවනු ලබන ආසියා-ශාන්තිකර ගුවන් සංතරණ සැලසුම් සහ ක්‍රියාත්මක කිරීමේ සංසදයේ දෙවන සභාපතිවරයා වශයෙන් ද ඒ මහතා තේරී පත් විය.



## සාමාජික
## සාකි අලිෆ් මහතා

සාමාජික සකි අලිෆ් මහතා ස්ටැසන් සමුහ ව්‍යාපාරයේ අධ්‍යක්ෂවරයා වන අතර දඹදෙණිය සංවර්ධන පදනමේ සභාපතිවරයා ද වේ. එයට අමතරව, හම්බන්තොට සංවර්ධන පදනමේ කළමනාකරණ භාරකරු වශයෙන් ද ඒ මහතා කටයුතු කරයි.



## සාමාජික
## ඒ.ඩබ්.සැඩිකුල් අමීන් මහතා

සාමාජික ඒ.ඩබ්. කුඩිකුල් අමින් මහතා හලාවත නස්රියා මධ්‍ය මහා විද්‍යාලයෙන් ප්‍රාථමික අධ්‍යාපනය ලැබූ අතර කොළඹ විශ්ව විද්‍යාලයේ නීති පීඨයේ දී හා ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ දී උසස් අධ්‍යාපන කටයුතු සම්පූර්ණ කරනු ලැබීය. එස්.ඩී.ආර්. ජයරත්න පදනමේ අධ්‍යක්ෂ (නීති) ලෙස කටයුතු කරන අමීන් මහතා නස්රියා මධ්‍ය මහා විද්‍යාලයීය ආදි ශිෂ්‍ය සංගමයේ උප සභාපතිවරයා ද වේ.



## සාමාජික
## එල්.බී.එස් බාලසූරිය මහතා

එල්.බී.එස්! බාලසූරිය මහතා විශ්‍රාමික සිවිල් ඉංජිනේරුවරයෙකු වන අතර ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල සමාගමක් වන සීමාසහිත හිට්වෙයාර් පුද්ගලික සමාගමේ හා සීමාසහිත සැම්සිකෝ ඇපරල්ස් (පුද්) සමාගමේ ආරම්භක සභාපතිවරයා වන්නේ ද ඒ මහතාය.

පොල් කෙඳි හා ඒ ආශ්‍රිත නිෂ්පාදන අපනයනය සම්බන්ධව කටයුතු කරන සැම්සිකෝ එක්ස්පෝර්ටස් සමාගමේ කළමනාකරණ අධ්‍යක්ෂකවරයා ලෙස බාලසූරිය මහතා කටයුතු කරයි.



## මුදල් අමාත්‍යාංශයේ නියෝජිත (නිල බලයෙන් පත් වූ සාමාජික)
## ප්‍රියංග අල්ගම මහතා

මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා ලෙස ප්‍රියංග අල්ගම මහතා කටයුතු කරයි. ඒ මහතා ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂවරයා/අධ්‍යක්ෂවරයා (2000.-2007) ලෙස ද, පොදු ව්‍යවසාය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා (2012) ලෙස ද, ක්වීන්ස්ලන්ඩ් රජයේ හවුල්කාර සේවා පිළිබඳ ජ්‍යෙෂ්ඨ මූල්‍ය නිලධාරි ලෙස ද විවිධ තනතුරුවල සේවය කර තිබේ.

සිංගප්පූරුවේ නැන්යන්ග් තාක්ෂණික විශ්ව විද්‍යාලය හා ඇමෙරිකා එක්සත් ජනපදයේ එම්අයිටී බොන්ස්ටන් යන ආයතනවලින් ලබාගත් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විද්‍යාපති උපාධියක් ලබා ගැනීමට ප්‍රියංග අල්ගම මහතා සමත් වූ අතර ඕස්ට්‍රේලියාවේ CPA හි ආශ්‍රිත සාමාජිකයෙකු ලෙස ද ඒ මහතා කටයුතු කරයි.

2013 ඔක්තොම්බර් මස 08 වන දා සිට බල පැවැත්වෙන පරිදි මහා භාණ්ඩාගාරයේ ලේකම් විසින් ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ ස්වාධීන නොවන සහ විධායක නොවන අධ්‍යක්ෂවරයකු ලෙස ප්‍රියංග අල්ගම මහතාව පත් කර තිබේ.

# ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ පාලනය හා වගකීම

## අධිකාරියේ කාර්යභාරය

අධිකාරියේ ප්‍රධාන කාර්යභාරයට අයත් කාර්යයන් අතර පහත සඳහන් කාර්යය ප්‍රමුඛත්වයක් ගනී.

- රටේ සිවිල් ගුවන් සේවා අංශයේ කටයුතු සැලසුම් කිරීමේ දී, ගරු අමාත්‍යවරයාගේ හා රාජ්‍ය අංශයේ අනෙකුත් පාර්ශ්වකරුවන්ගේ අදහස් එම සැලසුම් තුළින් පිළිබිඹු වන බව තහවුරු කර ගැනීම සඳහා අදාළ පාර්ශවකරුවන් සමඟ අදහස් හුවමාරු කර ගැනීම;
- සිවිල් ගුවන් සේවා ක්ෂේත්‍රයේ ප්‍රතිපත්ති හා ඉලක්ක පිහිටුවීම සහ ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා සංවිධානමය කාර්ය සාධනය අධීක්ෂණය කිරීම සහ සිවිල් ගුවන් සේවා අංශය පිළිබඳ රජයේ අරමුණු පිළිබිඹු වන පරිදි ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ සංයුක්ත සැලැස්ම අදාළ වන පරිදි යාවත්කාලීන කිරීම;
- තිළ බලයෙන් ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ ප්‍රධාන විධායක නිලධාරියා වන සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ සුවිශේෂී වූ අරමුණු මුදුන් පමුණුවා ගැනීම සඳහා වගකීම් පැවරීම;
- ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ කාර්යය හා කර්තව්‍යය ඉටු කළ හැකි වන පරිදි සුදුසුකම් සහ නිපුණතා සහිත පුද්ගලයන් සේවයට බඳවා ගැනීම සහ ඔවුන්ගේ වේතන ඇතුළු සේවා කොන්දේසි නිශ්චය කිරීම;
- ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ සංයුක්ත සැලැස්ම ක්‍රියාත්මක කිරීම පිළිබඳ සැලසුම් හා ප්‍රගතිය පිළිබඳව ගරු අමාත්‍යවරයාට වගවීම සහ;
- අභ්‍යන්තර පාලනයට අදාළ පද්ධති පවත්වාගෙන යනු ලබන බව තහවුරු කිරීම.

## අධ්‍යක්ෂ මණ්ඩලය

ප්‍රතිපත්තිමය ගැටළු සම්බන්ධයෙන් අදාළ කර ගත හැකි පුළුල් පරාසයක වූ අදහස් ලබා ගැනීමේ අභිලාෂයෙන් විවිධාකාර කුසලතාවලින් පරිපූර්ණ වූ ව්‍යාපාරික, නෛතික හා සිවිල් ගුවන් සේවා ක්ෂේත්‍රවල ඉහළම අත්දැකීම් ලබා ගත් සාමාජිකයින්ගෙන් අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය සමන්විත වේ. අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් පත් කරනු ලැබීමෙන් අනතුරුව, සියලුම සාමාජිකයින් ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ පරම යහපත වෙනුවෙන් කටයුතු කිරීම අවශ්‍ය වන අතර අධ්‍යක්ෂ මණ්ඩල තීරණ සම්බන්ධයෙන් සාමූහිකව වගකීම් දරමින් අධිකාරිය එක්සත්ව සහ එකමුතුව කටයුතු කළ යුතු වන අතර අධිකාරියෙන් පරිබාහිර වූ පාලන කාර්යභාරයක් තනි පුද්ගල සාමාජිකයින් සතුව නොපවතින බව ද අධ්‍යක්ෂ මණ්ඩලය මේ අනුව පිළිගත යුතු වේ.

ප්‍රතිපත්ති සම්පාදනය කිරීම තුළින් ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ අරමුණු මුදුන් පමුණුවා ගැනීම සඳහා අධිකාරිය විසින් ප්‍රධාන විධායක නිලධාරිවරයාට බලතල හා කාර්යයන් පැවරීම තුළින් ඔහුට විධාන නිකුත් කරනු ලබයි. අධිකාරියේ ඉදිරි සැලසුම් එහි ත්‍රෛවාර්ෂික සංයුක්ත සැලැස්මේ ඇතුළත් කර තිබෙන අතර සෑම වසරකම ආරම්භයේ දී, අධිකාරිය මගින් අනුමත කරනු ලබන වාර්ෂික කාර්ය වැඩසටහන, පුහුණු වැඩසටහන හා වැඩසටහන් අයවැය තුළින් ඉදිරි සැලසුම් පිළිබඳව ඵලදායි අන්දමින් අධීක්ෂණය කරනු ලැබේ. මේ වන විට විශේෂිත විධිවිධාන සලසා නොමැති අනෙකුත් සියළුම කටයුතු සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරන ලද යෝජනා තුළින් ද අධිකාරිය ප්‍රධාන විධායක නිලධාරිවරයාට විධාන කරනු ලබයි. අධ්‍යක්ෂ මණ්ඩලය මගින් සම්මත කරනු ලබන එවැනි යෝජනා ක්‍රියාත්මක කිරීම ප්‍රධාන විධායක නිලධාරියාගේ කර්තව්‍යය වේ.

## අධිකාරියේ විධායක බලතල

2002 අංක 34 වන ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය පනතේ විධිවිධාන ප්‍රකාරව කැබිනට් මණ්ඩලය විසින් ව්‍යවස්ථාවට අනුකූලව සිවිල් ගුවන් සේවා අධිකාරියේ ප්‍රධාන විධායක නිලධාරියා ද වන සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා පත් කරනු ලබයි. අමාත්‍ය මණ්ඩලය විසින් නිර්ණය කරනු ලබන සේවා නියම හා කොන්දේසි අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අනුගමනය කළ යුතු වන අතර ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය පනත හෝ වෙනත් අදාළ වන ලිඛිත නීතියක් මගින් හෝ යටතේ හෝ ඔහු වෙත පවරනු ලබන සියළුම කර්තව්‍යය හා කාර්යය ඉටු කළ යුතු වන අතර අධිකාරියේ කටයුතුවල සාමාන්‍ය පරිපාලනය ද අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත පවරා තිබේ.

## අධිකාරියේ කමිටු

විශේෂිත ගැටළු පිළිබඳව ඉහළ අවධානයක් යොමු කිරීම සඳහා ද, සංවර්ධන අරමුණු සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම උදෙසා ද කාර්යය මණ්ඩල කමිටුව, මූල්‍ය කමිටුව, සැලසුම් කමිටුව, විගණන කමිටුව හා සිවිල් ගුවන් සේවා සංවර්ධන සහ අධ්‍යාපන කමිටුව වශයෙන් හඳුන්වනු ලබන ස්ථාවර කමිටුව පහ (05) මෙම අධිකාරිය මගින් ස්ථාපනය කර තිබේ. අධිකාරියේ අරමුණු ඉටුකර ගැනීම සහ ස්ථාපිත ඉලක්ක හා පරමාර්ථ සාක්ෂාත් කර ගැනීම තුළින් සංවිධානයේ ප්‍රගතිය තහවුරු කර ගැනීම හා අධීක්ෂණය කිරීම සඳහා මෙම එක් එක් කමිටුවට බලතල පවරා දී ඇත. පහත සඳහන් කර ඇති යම් කමිටුවකට බලතල හා කාර්යය පවරා තිබියදී වුවද, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අවශ්‍ය යැයි සලකනු ලබන යම් කරුණක් හෝ සියළුම කරුණු සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ බලතල ක්‍රියාත්මක කරනු ලැබිය හැකිය.

## කාර්යය මණ්ඩල කමිටුව

කාර්යය මණ්ඩල කමිටුව පහත සඳහන් කරුණු ඉටු කිරීම සම්බන්ධයෙන් අධිකාරිය වෙත වගකීමෙන් බැඳී තිබේ.

- සංවිධාන ව්‍යුහයක් සම්මත කිරීම හා එම සංවිධාන ව්‍යුහය සඳහා අවශ්‍ය පරිදි සංශෝධන සිදු කිරීම.
- වැටුප් හා සේවක සංඛ්‍යාව නිශ්චය කිරීම.
- තෝරා ගැනීම, බඳවා ගැනීම, පත් කිරීම, උසස් කිරීම්, තනතුරෙන් පහත දැමීම්, විශ්‍රාම ගැන්වීම/සේවය අවසන් කිරීම ආදී කාර්යය මණ්ඩලයට අදාළ කරුණු.
- කාර්යය මණ්ඩලය සඳහා විනයානුකූල ක්‍රියාමාර්ග ගැනීම.
- ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ සංයුක්ත සැලැස්ම යාවත්කාලීන කිරීම.
- සිවිල් ගුවන් සේවා අධිකාරියේ වාර්ෂික කාර්යය වැඩසටහන හා පුහුණු වැඩසටහන අධීක්ෂණය කිරීම.
- ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ පරිපාලනය රීති හා කාර්ය පටිපාටි සංවර්ධනය කිරීම.
- සිවිල් ගුවන් සේවා අධිකාරියේ සේවකයින් සඳහා විනය කාර්ය පටිපාටි සංවර්ධනය කිරීම.
- ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ කාර්යාල කාර්ය පටිපාටිය සංවර්ධනය කිරීම.
- විදේශ පුහුණුවීම් සඳහා සේවකයන්ට අනුමැතිය ලබාදීම හා ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ සේවකයින් සඳහා ශිෂ්‍යත්ව ලබා දීම.
- චංචල හා නිශ්චල දේපළ අත්පත් කර ගැනීම සඳහා අනුමැතිය ලබාදීම සහ/හෝ එවැනි දේපළ සැලසුම් කිරීම හා සංවර්ධනය කිරීම.
- සිවිල් ගුවන් සේවා දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය සඳහා කාල පූර්ව විශ්‍රාම ගැනීම හෝ ඔවුන් වෙන් කර ඉවත් කිරීම වෙනුවෙන් වන්දි ගෙවීමේ යෝජනා ක්‍රම සංවර්ධනය කිරීම.
- සිවිල් ගුවන් සේවා අධිකාරියේ සේවකයින් සඳහා සමාජ හා සුබසාධන යෝජනා ක්‍රම සංවර්ධනය කිරීම.

සිවිල් ගුවන් සේවා අධිකාරියේ කාර්යය මණ්ඩල කමිටුව පහත සඳහන් සාමාජිකයින්ගෙන් සමන්විත වේ.

1 ජෙනරාල් රොහාන් ද සිල්වා දළුවත්ත, සභාපති
2 සරත් ජයසුන්දර මහතා, උප සභාපති
3 එච්.එම්.සී. නිමල්සිරි මහතා, අධ්‍යක්ෂ ජනරාල්/ප්‍රධාන විධායක නිලධාරි
4 එල්.ඩී. බාලසූරිය මහතා, සාමාජික

## මූල්‍ය කමිටුව

මූල්‍ය කමිටුව පහත සඳහන් කරුණු ඉටු කිරීම සම්බන්ධයෙන් අධිකාරිය වෙත වගකීමෙන් බැඳී ඇත.

- වාර්ෂික අයවැය වැඩසටහන සකස් කිරීම.
- ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය සඳහා මූල්‍ය රීති හා කාර්ය පටිපාටි සංවර්ධනය කිරීම.
- දේපළ, උපකරණ, පහසුකම් හෝ සේවා මිලදී ගැනීම අධීක්ෂණය කිරීම.
- ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ ආදායම් ඉපයීමේ මාර්ග අධීක්ෂණය කිරීම.
- එවැනි කරුණු ප්‍රසම්පාදනය කිරීම හා අධීක්ෂණය කිරීම සඳහා අදාළ වන රීති හා කාර්ය පටිපාටි සංවර්ධනය කිරීම.
- රුපියල් මිලියන 10,000,000 ඉක්මවන ගෙවීම් සඳහා අනුමතිය ලබා දීම.
- යම් අයිතමයක් ලියා හැරීම සඳහා අනුමතිය ලබා දීම හා
- ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ සකසුරුවම් කළමනාකරණය.

ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ මූල්‍ය කමිටුව පහත සඳහන් සාමාජිකයන්ගෙන් සමන්විත වේ.

1 ජෙනරාල් රෝහාන් ද සිල්වා දළුවත්ත මහතා - සභාපති
2 එච්.එම්.සී.නිමල්සිරි මහතා - අධ්‍යක්ෂ ජනරාල්/ප්‍රධාන විධායක නිලධාරි
3 ප්‍රියංග අල්ගම මහතා - සාමාජික/මුදල් අමාත්‍යාංශයේ නියෝජිත

## සැලසුම් කමිටුව

සැලසුම් කමිටුව පහත සඳහන් කරුණු ඉටු කිරීම සම්බන්ධයෙන් අධිකාරිය වෙත වගකීමෙන් බැඳී ඇත.

- ජාතික සිවිල් ගුවන් සේවා ප්‍රතිපත්තිය සංවර්ධනය කිරීම.
- ජාතික සිවිල් ගුවන් සේවා සංවර්ධන සැලසුමක් විකාශය කිරීම.
- සිවිල් ගුවන් සේවයට අදාළමූලික සහ උපකාරක නීති සමාලෝචනය කිරීම හා අවශ්‍ය අවස්ථාවලදී ඒවාට සංශෝධන හඳුන්වා දීම.
- ජාතික සිවිල් ගුවන් සේවා සුරක්ෂිතතා වැඩසටහන ක්‍රියාත්මක කිරීම හා අධීක්ෂණය කිරීම.
- ජාතික ගුවන් ප්‍රවාහන සුසාධන වැඩසටහන ක්‍රියාත්මක කිරීම හා අධීක්ෂණය කිරීම.

- සිවිල් - යුධ හමුදා සහයෝගීතාව අධීක්ෂණය කිරීම.
- සිවිල් ගුවන් සේවා මෙහෙයුම් අධීක්ෂණය කිරීම.
- ගගන නාවික සේවා සැපයුම්කරුවන්ගේ කටයුතු අධීක්ෂණය කිරීම.

අධිකාරියේ සාමාජිකයින් අට දෙනාගෙන්ම සැලසුම් කමිටුව සමන්විත වේ.

## විගණන කමිටුව

විගණන කමිටුව පහත සඳහන් කරුණු ඉටු කිරීම සම්බන්ධයෙන් අධිකාරිය වෙත වගකීමෙන් බැඳී ඇත.

- අභ්‍යන්තර විගණන ඒකකයේ වගකීම නිශ්චය කිරීම හා වාර්ෂික විගණන සැලැස්ම සමාලෝචනය කිරීම.
- සංවිධානයේ සියලුම ක්‍රියාකාරකම් සඳහා වන අභ්‍යන්තර පාලන ක්‍රම සමාලෝචනය කිරීම හා ඇගයීම.
- පිරිවැය ඵලදායිතාවය තහවුරු කිරීම හා සකසුරුවම් නොවන වියදම් ආදිය නවතාලීමේ අරමුණින් සමාන කාල අන්තරවල දී ක්‍රමානුකූලව කාර්ය සාධනය සමාලෝචනය කිරීම.
- බාහිර ගණන් පරීක්ෂකයින් සමග සම්බන්ධීකරණ කටයුතු ඉටු කිරීම හා විගණකාධිපතිගේ කළමනාකරණ ලිපි පිළිබඳ පසු විපරම් කටයුතු කිරීම.
- ව්‍යවස්ථා, රෙගුලාසි, රීති සහ චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කරන බව තහවුරු කිරීම.
- ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව කටයුතු කරන බව තහවුරු කිරීම සඳහා මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කිරීම.
- නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගැනීම සඳහා අභ්‍යන්තර විගණන/බාහිර විගණන වාර්තා හා කළමණාකරණ ලිපි සමාලෝචනය කිරීම.
- පොදු ව්‍යවසාය පිළිබඳ කාරක සභාවේ නිර්දේශ/නියෝග ක්‍රියාත්මක කිරීම පිළිබඳ සමාලෝචනය කිරීම.
- වාර්ෂික වාර්තාවට ඇතුළු කිරීම සඳහා කමිටුවේ තීරණ පිළිබඳ වාර්තාවක් සකස් කිරීම.
- අධිකාරියේ ඉල්ලීම පරිදි සියළුම විගණන කරුණු අධිකාරිය වෙත වාර්තා කිරීම.

පහත සඳහන් සාමාජිකයින්ගෙන් විගණන කමිටුව සමන්විත වේ.

1 ප්‍රියංග අල්ගම, සභාපති, (මුදල් අමාත්‍යාංශයේ නියෝජිත)
2 සරත් විජේසුන්දර මහතා, උප සභාපති
3 එල්.ඩී.එස්. බාලසූරිය මහතා, සාමාජික
4 එස්.අමීන් මහතා, සාමාජික
5 රොහාන් සෙනෙවිරත්න මහතා, සමාජික
6 එස්.එම්.චන්ද්‍රපාල මහතා, සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයේ නියෝජිත

## සිවිල් ගුවන් සේවා සංවර්ධන සහ අධ්‍යාපන කමිටුව(CADEC)

සිවිල් ගුවන් සේවා ක්‍රියාකාරකම් පිළිබඳව මහජනතාවගේ දැනුවත්බව වැඩි දියුණු කිරීමේ අරමුණින් සම්පාදනය කරන ලද විශේෂ වැඩසටහනක් සැලසුම් කිරීම, සංවර්ධනය කිරීම හා ක්‍රියාත්මක කිරීම සඳහා 2010 අගෝස්තු මාසයේ දී සිවිල් ගුවන් සේවා අධිකාරියේ පහත සඳහන් සේවකයින්ගෙන් සමන්විත වන සිවිල් ගුවන් සේවා සංවර්ධන හා අධ්‍යාපන කමිටුව ස්ථාපනය කරන ලදී. සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල් හා ප්‍රධාන විධායක නිලධාරියා මෙම කමිටුවේ සභාපති ධුරය දරන අතර ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂවරයා හා අධ්‍යක්ෂ (ඒකාබද්ධ) ඒ සඳහා ඔහුට සහාය ලබා දෙයි.

| | | |
|---|---|---|
| දේව් කෝසල සමරජීව මහතා | - | උප සභාපති |
| නිලන්ත තෙන්නකෝන් මහතා | - | ලේකම් |
| මංජුලා වික්‍රමනායක මහත්මිය | - | භාණ්ඩාගාරික |

## සාමාජිකයෝ

1. එස්.පී.බී. වත්තේවැව මහතා
2. එම්.එච්.අයි.කේ. ගුණවර්ධන මහතා
3. ජී.ඊ. මිල්ලවිතානාච්චි මහත්මිය
4. සී.එච්. කොඩිතුවක්කු මහත්මිය
5. ජී.සී.ජී.පී. දබරේරා මහතා
6. දුලාංජලී මාපිටියගේ මහත්මිය
7. ආර්.එල්. තලගල මහතා
8. ටී.එම්.වයි.බී. තෙන්නකෝන් මහතා

## පාර්ශ්වකරුවන් සමග සම්බන්ධතා පැවැත්වීම

විශේෂයෙන්ම සිවිල් ගුවන් සේවා විෂය භාර ගරු අමාත්‍යවරයාගේ අපේක්ෂා පිළිබඳව විචක්ෂණශීලී විය යුතු බව ද, පාර්ශ්වකරුවන් සමග නිරන්තරයෙන්ම සමීප සම්බන්ධතා පවත්වා ගත යුතු බව ද, අධිකාරිය පිළිගනියි.

## අධිකාරියේ සහ ජ්‍යෙෂ්ඨ කළමනාකරණයේ වගකීම

අධිකාරියේ කාර්යභාරය සහ ප්‍රධාන විධායක නිලධාරියා විසින් මූලිකත්වය දරන ජ්‍යෙෂ්ඨ කළමනාකරණයේ කාර්යභාරය ඉතා පැහැදිලිව වෙන් කර තිබීම හේතුකොටගෙන ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ කාර්යක්ෂමතාව ඉතා ඉහළ මට්ටමකින් පවත්වාගෙන යාමට හැකි වී තිබේ.

අධිකාරිය ඉහළ මට්ටමේ ප්‍රතිපත්ති සහ ක්‍රමෝපාය සම්පාදනය කිරීම පිළිබඳව අවධානය යොමු කරන අතර ඉන් අනතුරුව අරමුණු කරා ළඟා වීමේ ප්‍රගතිය පිළිබඳව ද අධීක්ෂණය කරයි. දැනට බල පැවැත්වෙන රීතිවල විශේෂ විධිවිධාන සළසා නොමැති කරුණු පිළිබඳව ද අධිකාරිය මගින් උපදෙස් ලබා දෙයි.

මෙම ඉහළ මට්ටමේ ප්‍රතිපත්තීන් හා ක්‍රමෝපාය ක්‍රියාත්මක කිරීම සම්බන්ධ වගකීම ප්‍රධාන විධායක

නිලධාරියාගේ මූලිකත්වයෙන් යුත් ජ්‍යෙෂ්ඨ කළමනාකරණයට පැවරී තිබේ.

2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනත ප්‍රකාරව ද, ඒ යටතේ සම්පාදනය කරන ලද ගුවන් සංතරණ රෙගුලාසි හෝ වෙනත් ලිඛිත නීතියක් මගින් සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත විශේෂයෙන්ම පවරන ලද විශේෂිත නියාමන වගකීම් ඉටු කිරීම සම්බන්ධයෙන් අධිකාරිය බැහැරව සිටින අතර ඒ සම්බන්ධයෙන් අධිකාරියට වගකීමක් පවරා නොමැත. කෙසේවුවත්, එවැනි නියාමන වගකීම් හා රාජ්‍යය මත පවරන ලද වගකීම් ඉටු කිරීමේදී සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල්ට අවශ්‍ය වන පිරිස්, උපකරණ, පහසුකම් සහ සේවා යනාදියට ඇතුළත් වූ එහෙත් එමගින් සීමා නොවූ සියලුම සම්පත් ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය මගින් සපයනු ලැබේ. සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල් හා ප්‍රධාන විධායක නිලධාරියාට බලතල හා කාර්යයන් පැවරීම පිළිබඳ සංක්ෂිප්තබව හා සම්පූර්ණබව තහවුරු කිරීම තුළින් අධිකාරිය විසින් මෙම කාර්යභාරයන් ඉටු කිරීම පිළිබඳව පැහැදිලිවම ප්‍රදර්ශනය කරයි.

## වගකීම

සිවිල් ගුවන් සේවා අධිකාරියේ ක්‍රමෝපායික අරමුණුවල ප්‍රගතිය අධීක්ෂණය කිරීමට හා අධිකාරියේ සංයුක්ත සැලැස්මේ දක්වා ඇති ප්‍රතිපත්ති, ක්‍රමෝපායික විධාන හා අපේක්ෂාවලට අනුව සිවිල් ගුවන් සේවා අධිකාරියේ කටයුතු කළමනාකරණය කරනු ලබන බව හා පවත්වනු ලබන බව තහවුරු කර ගැනීම සඳහා අධිකාරිය හා එහි කමිටු නිරන්තරයෙන් රැස් වේ.

## බැඳියා පිළිගැටුම්

අධිකාරිය පක්ෂපාතීත්වය පිළිබඳ ලේඛනයක් පවත්වා ගන්නා අතර එමගින් අධිකාරියේ සාමාජිකයින් ඔවුන්ගේ පක්ෂපාතීත්වය පිළිබඳව ප්‍රකාශයට පත් කිරීමේ වගකීම පිළිබඳව දැනුවත් ව සිටින බව තහවුරු කෙරේ. අධ්‍යක්ෂක මණ්ඩල සාමාජිකයින් හා විධායක ශ්‍රේණියේ සියළුම සේවකයින් සඳහා බැඳියා පිළිගැටුම් ලේඛනයක් පවත්වා ගැනීම මගින් ද මෙම ප්‍රවේශය පිළිබිඹු කෙරේ.

## අභ්‍යන්තර විගණනය

අධිකාරියේ බොහෝ කාර්යයන් පවරා දී තිබුණ ද, සංවිධානාත්මක පාලනය පිළිබඳ සඵලදායක ක්‍රම පවත්වාගෙන යාමේ සමස්ත වගකීම අධිකාරිය විසින් දැරිය යුතුය. අධිකාරියේ සුවිශේෂී අරමුණු සාක්ෂාත් කර ගන්නා බව තහවුරු කර ගැනීම සඳහා ස්ථාපනය කරන ලද ප්‍රතිපත්ති ක්‍රම හා කාර්ය පටිපාටි අභ්‍යන්තර පාලනයට ඇතුළත් වේ. මෙම වාර්තාවේ ඇතුළත් කර ඇති වගකීම පිළිබඳ ප්‍රකාශය අත්සන් තැබීම මගින් අධිකාරිය හා ජ්‍යෙෂ්ඨ කළමනාකරණය ඔවුන්ගේ වගකීම පිළිගෙන තිබේ.

ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ එක් එක් අංශවල අභ්‍යන්තර පාලනය පිළිබඳ සවිස්තරාත්මක සූක්ෂ්ම පරීක්ෂණය හා අධීක්ෂණ ක්‍රම අනුගමනය කිරීම සම්බන්ධයෙන් වගකීම දරන අභ්‍යන්තර විගණන ඒකකයක් අධිකාරිය සතුව පවතී. ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය මගින් ලබා දෙන සමස්ත සේවා වල ගුණාත්මකභාවය පවත්වා ගැනීම හා සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල් හා ප්‍රධාන විධායක නිලධාරියා මගින් අධිකාරියට වාර්තා කරනු ලබන මූල්‍ය හා වෙනත් තොරතුරුවල විශ්වසනීය බව පිළිබඳව මෙම ඒකකය වගකිව යුතුය.

අභ්‍යන්තර විගණන ඒකකය ජ්‍යෙෂ්ඨ කළමනාකරණයේ බලපෑමෙන් තොරව ස්වාධීනව ක්‍රියාකරයි. සම්පාදිත රීතිවලට අනුව ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ ප්‍රධාන විධායක නිලධාරියා ද වන සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයාට විගණන කමිටුව ඔවුන්ගේ තීරණ සෘජුව වාර්තා කරයි.

## ව්‍යවස්ථාමය අවශ්‍යතාවලට අනුකූලවීම

අධිකාරිය සියලුම ව්‍යවස්ථාමය අවශ්‍යතාවලට අනුකූලව කටයුතු කරන බව තහවුරු කිරීම අධිකාරියේ වගකීම වන බව අධිකාරිය මගින් පිළිගෙන තිබේ. අනුකූලතාව පිළිබඳ ගැටළු ක්‍රමවත්ව හඳුනා ගැනීම සඳහා වැඩසටහන් සංවර්ධනය කිරීම හා ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම සහ අධිකාරියේ සියලුම සේවකයින් ඔවුන්ට විශේෂයෙන්ම අදාළ වන ව්‍යවස්ථාමය අවශ්‍යතා පිළිබඳව දැනුවත්ව සිටින බව තහවුරු කිරීමේ වගකීම අධිකාරිය විසින් එහි ජ්‍යෙෂ්ඨ කළමනාකරණය වෙත පවරා තිබේ. රාජ්‍ය ආයතන මගින් නිකුත් කරනු ලබන සාමාන්‍ය හෝ සුවිශේෂී චක්‍රලේඛ හා/හෝ නියම අධිකාරිය සඳහා අදාළ කර ගැනීම අවස්ථානුකූල ලෙස අධිකාරිය මගින් නිශ්චය කරනු ලබන ප්‍රමාණයට පමණක් සීමා විය යුතු බව අධිකාරිය තීරණය කර තිබේ. එම නිසා අධිකාරියේ නීත්‍යානුකූල බලතල, කාර්යයන් හා කර්තව්‍යවල ඵලදායි ක්‍රියාකාරීත්වය හා ඒවා ඉටු කිරීම මත චක්‍රලේඛවල බලපෑම අධිකාරිය මගින් පරීක්ෂා කර බලා එවැනි චක්‍රලේඛ අදාළ වන ස්වභාවය හා විෂය පථය තීරණය කිරීමෙන් අනතුරුව පමණක් රජයේ දෙපාර්තමේන්තු මගින් නිකුත් කරන ලද එක් එක් චක්‍රලේඛය ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ කළමනාකාරීත්වයට අදාළ කර ගනු ලබන අතර එසේ නොමැතිව එවැනි චක්‍රලේඛ ස්වයංක්‍රීයව මෙම අධිකාරියට අදාළ කර නොගනියි. ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ ආයතනික අංශය මගින් රජයේ චක්‍රලේඛ අධිකාරියේ ක්‍රියාකාරීත්වයට අදාළ වන ප්‍රමාණය සම්බන්ධයෙන් යාවත්කාලීන කරන ලද ලැයිස්තුවක් පවත්වාගෙන යනු ලැබේ.

## ආචාර ධර්ම

මෙම අධිකාරිය කාර්ය මණ්ඩල සාමාජිකයින් සඳහා ආචාර ධර්ම සංග්‍රහයක් වැඩි දියුණු කර තිබෙන අතර ඒ අනුව, ආචාර ධර්මවලට අනුකූල වූ උසස් ප්‍රමිතියක හැසිරීම් රටාවක් සියලුම කාර්ය මණ්ඩල සාමාජිකයින් විසින් පවත්වා ගෙන යනු ලබන බව ද, "යහපත් සංස්ථාපිත පාලන" මූලධර්ම ක්‍රියාවෙහි යොදවනු ලබන බව ද විධිමත්ව අධීක්ෂණය කරනු ලැබේ. කාර්ය

මණ්ඩල සාමාජිකයින්ට විරුද්ධව ලැබෙන පැමිණිලි හා ඔවුන්ට එරෙහිව සිදු කරනු ලබන විනයානුකූල කටයුතු පිළිබඳ උපනතීන්, විගණන වාර්තා හෝ ආචාරධර්ම සංග්‍රහයේ ඇතුළත් වන ප්‍රතිපත්තිවලට අනුකූලව කටයුතු නොකරන බව දැක්වෙන වාර්තා හා ඒ සම්බන්ධ සංඥා අධීක්ෂණය කිරීම වැනි ආකාර මගින් ආචාර ධර්ම ප්‍රමිතිවලට අනුකූලවීම පිළිබඳ අධීක්ෂණ කටයුතු සිදු කෙරේ.

අධිකාරියේ සේවයේ නියුක්තව සිටින සේවකයන් ද ඇතුළත් වූ අධිකාරිය ද, අධිකාරියේ විෂය පථයට ඇතුළත් වන කර්මාන්තය ද, ඒවාට පරිබාහිරව පවතින බොහෝ ප්‍රජාවලට අයත් එක් සාමාජිකයෙකු බව පිළිගැනීම සහ එම ප්‍රජාවලට අයත් වන සියළු පුරවැසියන් සතු සදාචාර සම්පන්න බවට ගරු කරමින් සියළු පුරවැසියන් එක්ව පිළිගත් අයිතිවාසිකම් හා වගකීම් සම්බන්ධයෙන් පාරදෘශ්‍ය අන්දමින් ද, ස්ථාවරව හා වගකීමෙන් ද යුක්තව කටයුතු කිරීම සඳහා කැපවීම යහපත් සංස්ථාපිත පුරවැසිභාවය යන සංකල්පයෙන් අදහස් කෙරේ.

# ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය

## දැක්ම

ජාතික ආර්ථික වර්ධනය සම්බන්ධයෙන් ප්‍රධාන උත්ප්‍රේරකයකු ලෙස කටයුතු කිරීම.

## මෙහෙවර

අන්තර්ජාතික ප්‍රමිති හා නිර්දේශිත පරිචයන්වලට ද, ජාතික ව්‍යවස්ථාමය අවශ්‍යතාවලට ද අනුකූලව කටයුතු කරන්නා වූ, නිරුපද්‍රිත, සුරක්ෂිත හා කාර්යක්ෂම ජාතික සිවිල් සේවා පද්ධතියක් මෙහෙයවීම සඳහා ක්‍රමෝපායික සැලසුම්කරණය හා ඵලදායි නියාමනය තුළින් පහසුකම් සැලසීම.

## ආදර්ශ පාඨය

සැමට නිරුපද්‍රිත ගුවන් තලයක්

## අපගේ දර්ශනය

ශ්‍රී ලංකාව සතුව අපට ඉහළින් පවතින ගුවන් ප්‍රදේශය රටේ ප්‍රගතිය හා සෞභාග්‍යය සඳහා ද, ජාතියේ මතු පරපුර සඳහා ද කළමනාකරණය කළ යුතු පොදු වත්කමකි.

## පරමාර්ථ

- නිරුපද්‍රිතතා හා සුරක්ෂිතතා ප්‍රතිඵල ලබා ගැනීම සඳහා කලින් නියම කළ ඉලක්ක මුදුන් පමුණුවා ගැනීම හෝ ඒවා අභිබවා යෑම;
- යෝග්‍ය පරිදි සම්පත් සපයා ගැනීම;
- වෘත්තීයභාවයට සහ නිපුණත්වයට පත් වීම;
- පුළුල් විශ්වසනීයත්වයක් සහ පිළිගැනීමක් ලබා ගැනීම;
- අධිකාරියේ කාර්ය සාධනය තිරසාර ලෙස පවත්වා ගැනීම හා වැඩි දියුණු කිරීම;
- සෑම ක්‍රියාවක්ම ඉහළම මට්ටමේ ඵලදායිතාවකින් යුක්තව ඉටු කිරීම;
- අන්තර්ජාතික ප්‍රමිති හා නිර්දේශිත පරිචයන් සඳහා ඉහළම අනුකූලතාවක් දැක්වීම; සහ
- සිවිල් ගුවන් සේවා කටයුතු සැලසුම්කරණය හා සංවිධානය කිරීම සඳහා ශක්තිමක් පහසුකම් සපයන්නෙකු වීම.

## ක්‍රමෝපාය

- අදාළ වන අන්තර්ජාතික ප්‍රමිති හා නිර්දේශිත පරිචයන්ට අනුකූලව ව්‍යවස්ථාපිත කටයුතු වැඩිදියුණු කරන ලද ස්ථාවර පදනමකින් ක්‍රියාත්මක කිරීම හා සමාජ වගකීම් ඉෂ්ඨ කිරීම.
- වැදගත් සිවිල් ගුවන් සේවා ගැටළුවලට විසඳුම් හඳුනා ගැනීම හා ක්‍රියාත්මක කිරීම.
- සංස්කෘතික වෙනස්වීම් පිළිබඳ සුවිශේෂී මුල් පියවර හඳුන්වා දීම.
- ගුවන් සේවා කර්මාන්තය සමඟ සහයෝගීතාවෙන් හා හවුලේ කටයුතු කිරීම.
- විනිවිද පෙනෙන ආකාරයෙන් සහ ස්ථාවරව ක්‍රියා කිරීම හා බාහිර හා අභ්‍යන්තර සන්නිවේදනය සඵලදායි ලෙස සිදු කිරීම.
- සියළුම ලේඛන, ද්‍රව්‍ය හා අභ්‍යන්තර කාර්ය පටිපාටිවල ඵලදායිතාව සහ ස්ථාවරබව පවත්වාගෙන යෑම.

## සාරධර්ම

- ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය හා එහි සේවකයින්;
- ගුවන් සේවා නිරුපද්‍රිතතාව සඳහා ඉහළම ප්‍රමුඛත්වයක් හා වැදගත්කමක් ලබා දීම හා නිරුපද්‍රිතතා සංස්කෘතියක් ප්‍රවර්ධනය කිරීම;
- ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ සේවාදායකයන් සඳහා සේවා සැපයීම තුළින් විශිෂ්ටත්වයට පත් වීම;
- භාර ගන්නා සෑම කාර්යයක් සම්බන්ධයෙන්ම ''කළ හැකියි'' යන ආකල්පයෙන් කටයුතු කිරීම;
- විශ්වසනීය, යථාර්ථවාදී හා ස්ථාවර පෞරුෂත්වයක් සහිත පුද්ගලයන් බවට පත් වීම අරමුණු කිරීම;
- අඛණ්ඩව සිදුවන වැඩි දියුණුකිරීම්වලට අනුව වෙනස් වීමට පවතින කැමැත්ත හා හැකියාව වර්ධනය කිරීම;
- සාර්ථකත්වය ළඟා කර ගැනීම සඳහා සියලු දෙනා එක්ව කටයුතු කිරීම;
- විවෘතව, අවංකව හා විනිවිද භාවයෙන් යුක්තව කටයුතු කිරීම;
- සිදු කරනු ලබන සියළු කාර්යයන්වල දී කාර්යක්ෂමතාව, ඵලදායිතාව සහ විධිමත්බව ප්‍රවර්ධනය කිරීම;
- වෘත්තීය සගයන් විශ්වාස කිරීම හා ඔවුන්ට ගරු කිරීම තුළින් කණ්ඩායමක් ලෙස කටයුතු කිරීම දිරි ගැන්වීම;

- සෑම දෙනාගේම දායකත්වය අගය කිරීම;
- සමාජ වගකීම් හා බැඳීම් හඳුනා ගැනීම;
- ඉටු කරන කාර්යයන් පිළිබඳව තෘප්තිමත් වීම;
- වෘත්තිය ප්‍රවේශය පිළිබඳ අභිමානයක් ඇති කර ගැනීම;
- නිවසේ පරිසරය හා රැකියා පරිසරය අතර සමතුලිත බවක් ඇතිකර ගැනීම.

## ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ ආසන්න ඉලක්ක

- වාණිජ ගුවන් සේවා අංශයේ මාරක අනතුරු වැළැක්වීම;
- ගුවන් යානා පැහැර ගැනීම හා සිවිල් ගුවන් සේවා ක්‍රියාකාරකම්වලදී නීතිවිරෝධී මැදිහත්වීම් වැළැක්වීම;
- සාමාන්‍ය ගුවන් සේවා අනතුරු වැළැක්වීම;
- ගුවන් තොටුපොළ භූමිය මත සිදුවන ගුවන් සේවාවලට අදාළ මාරක අනතුරු වැළැක්වීම;
- ඉංජිනේරු/නඩත්තු කිරීමේ වැඩපොළවල සිදුවන අනතුරු අඩු කිරීම;
- වාණිජ ගුවන් ගමන් සම්බන්ධ අනපේක්ෂිත සිදුවීම් අනුපාතය පියාසර පැය 10,000 ක් සඳහා 1 කට වඩා අඩු අනුපාතයකින් පවත්වා ගැනීම;
- සාමාන්‍ය ගුවන් ගමන් සම්බන්ධ අනපේක්ෂිත සිදුවීම් අනුපාතය පියාසර පැය 5,000 ක් සඳහා 1 කට වඩා අඩු අනුපාතයකින් පවත්වා ගැනීම;
- පියසර පාසල්වල ගුවන් ගමන් සම්බන්ධ අනපේක්ෂිත සිදුවීම් අනුපාතය පියසර 10,000 ක් සඳහා 1 කට වඩා අඩු අනුපාතයකින් පවත්වා ගැනීම;
- භූමි සහාය සහිත වාණිජ ගුවන් ගමන් සම්බන්ධ අනපේක්ෂිත සිදුවීම් අනුපාතය පියසර පැය 20,000 ක් සඳහා 1 කට වඩා අඩු අනුපාතයකින් පවත්වා ගැනීම;
- භූමි සහාය සහිත සාමාන්‍ය ගුවන් ගමන් සම්බන්ධ අනපේක්ෂිත සිදුවීම් අනුපාතය පියසර 10,000 ක් සඳහා 1 ක් දක්වා අඩු කිරීම;
- ගුවන් ගමන් සේවා සහාය සහිත ගුවන් ගමන් සම්බන්ධ අනපේක්ෂිත සිදුවීම් අනුපාතය පියසර 50,000 ක් සඳහා 1 කට වඩා අඩු අනුපාතයකින් පවත්වා ගැනීම;
- ගුවන් යානා නියමිත වේලාවට පිටත්ව යෑම සම්බන්ධ ප්‍රමාදයන් අවම කිරීමට සහය වීම;
- සාමාන්‍ය පන්තියේ පුද්ගලයින්ට ද ගමන් ප්‍රවාහන පහසුකම් ලබා ගැනීමේ හැකියාව ඇති කිරීම;
- ගුවන් ප්‍රවාහන සේවාවල ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම සඳහා දිරි ගැන්වීම් ලබා දීම;
- සුරක්ෂිතතා අවශ්‍යතා පිළිබඳව සැලකිලිමත් වන අතරතුර ගුවන් තොටුපලවල පවතින තදබදය අවම කිරීම සඳහා ද, ගුවන් තොටුපලවල මගී දත්ත සැකසීමේ කටයුතු කඩිනමින් ඉටු කිරීම සඳහා ද පහසුකම් සැලසීම;
- ගුවන් ප්‍රවාහණයේ මෙහෙයුම් පිරිවැය අවම කිරීම හා අපතේ යෑම් අවම කිරීමට සහාය ලබා දීම;
- ගුවන් සේවාවලින් පරිසරය මත සිදු වන අහිතකර බලපෑම් අවම කිරීමට සහය ලබා දීම;
- සිවිල් ගුවන් සේවාවේ ප්‍රතිලාභ පිළිබඳව පාසැල් ශිෂ්‍ය ශිෂ්‍යාවන් දැනුවත් කිරීම.

## ප්‍රතිඵල

- සිවිල් ගුවන් සේවා ක්ෂේත්‍රය තුළ ශ්‍රී ලංකාව වෙත පැවරී ඇති අන්තර්ජාතික වගකීම් ඉටු කිරීම හා ඉහළම මට්ටමේ ඵලදායිතාවෙන් යුක්තව අන්තර්ජාතික ප්‍රමිති හා නිර්දේශිත පරිචයක් නිරන්තරයෙන් ක්‍රියාත්මක කිරීම හා බලාත්මක කිරීම;
- සම්බාධක/සීමාකිරීම්වලින් නිදහස් ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා පද්ධතිය පිළිබඳව ජාත්‍යන්තර වශයෙන් පිළිගැනීමට ලක්වීම හා රාජ්‍යයේ ගුවන් සේවා පද්ධතියේ නිරුපද්‍රිතතාව සම්බන්ධයෙන් ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානය (ඉකාඕ) විසින් විශේෂයෙන් කරුණු සොයා බැලීමේ අවස්ථා මඟහරවාලීම සඳහා කටයුතු කිරීම;
- සිවිල් ගුවන් සේවාවේ නිරුපද්‍රිතතාව, සුරක්ෂිතතාව, කාර්යක්ෂමතාව හා විධිමත්බව වැඩි දියුණු කිරීම හා එහි ප්‍රතිඵලයක් ලෙස ගුවන් ප්‍රවාහණ පද්ධතිය පිළිබඳව මහජන විශ්වාසය වැඩි දියුණු කිරීම;
- ශ්‍රී ලාංකික මහජනතාවගේ සුබ සිද්ධිය සඳහා ශ්‍රී ලංකාවේ පාලනයට නතුව පවතින ගුවන් ප්‍රදේශය ප්‍රශස්ත අන්දමින් භාවිතා කිරීම;
- රටේ සාමාජීය ආර්ථික සංවර්ධනය ඇති කිරීම;
- අයුක්ති සහගත තරගය හේතුකොටගෙන ඇතිවන ආර්ථික වශයෙන් සිදු වන අපතේ යෑම් වැළැක්වීම;
- ගුවන් මගින් සිදුවන මිනිසුන් හා භාණ්ඩ සඳහා වැඩිදියුණු කළ ප්‍රවේශය සහ සංචලතාව;
- සිවිල් ගුවන් සේවා ක්ෂේත්‍රය තුළ විශ්වසනීය සේවා සැපයීම;
- සිවිල් ගුවන් සේවා ක්ෂේත්‍රය පිළිබඳව පාසැල් දරුවන්ට අධ්‍යාපනය ලබා දීම;
- සිවිල් ගගන නාවික කටයුතු පිළිබඳ සියළු අංශ ප්‍රවර්ධනය කිරීම;
- මහජන සෞඛ්‍ය ආරක්ෂා කිරීම හා ප්‍රවර්ධනය කිරීම;
- ඵලදායක නියාමනය හා බලාත්මක කිරීම සඳහා උචිත නෛතික රාමුවක් නිර්මාණය කිරීම;
- පාරිසරික තිරසාරභාවය.

# ප්‍රතිදාන

| ප්‍රතිදාන වර්ගය | ප්‍රතිදාන |
|---|---|
| ප්‍රතිපත්ති උපදෙස් | ▪ රජයට සහ වෙනත් සංවිධානවලට උපදෙස් ලබා දීම<br>▪ ව්‍යවස්ථාමය ප්‍රතිසංස්කරණ<br>▪ රීති සංවර්ධනය කිරීම<br>▪ ක්‍රියාත්මක කරනු ලබන ප්‍රමිති සංවර්ධනය කිරීම හා ප්‍රවර්ධනය කිරීම<br>▪ ගුවන් සේවා ප්‍රතිපත්ති සංවර්ධනය කිරීම<br>▪ කාර්ය පටිපාටි පිළිබඳ අත්පොත් වැඩි දියුණු කිරීම<br>▪ ගුවන් සේවා යටිතල පහසුකම් පිළිබඳ ප්‍රධාන සැලැස්ම සකස් කිරීම |
| නිරුපද්‍රිතාව ඇගයීම සහ සහතිකකරණය | ▪ පහත සඳහන් කරුණුවලට අදාළ අවදානම කළමනාකරණය<br>▪ ගුවන් තොටුපොළ/ගුවන් පිටිය අංශයේ නිරුපද්‍රිතතාව<br>▪ ගුවන් සමාගම් අංශයේ නිරුපද්‍රිතතාව<br>▪ පොදු ගුවන් සේවා අංශයේ නිරුපද්‍රිතතාව<br>▪ පුද්ගල බලපත්‍ර නිකුත් කිරීමේ නිරුපද්‍රිතතාව<br>▪ පියාසර පුහුණු නිරුපද්‍රිතතාව<br>▪ ගුවන් යානා නඩත්තු නිරුපද්‍රිතතාව<br>▪ ගුවන් සේවා අංශයේ නිරුපද්‍රිතතා අවදානම කළමනාකරණය |
| නිරුපද්‍රිතතා විශ්ලේෂණය, තොරතුරු හා ප්‍රවර්ධනය | ▪ නිරුපද්‍රිතතා විමර්ශනය<br>▪ නිරුපද්‍රිතතා විශ්ලේෂණය<br>▪ නිරුපද්‍රිතතා තොරතුරු, අධ්‍යාපනය හා ප්‍රවර්ධනය<br>▪ ගුවන් යානා අනතුරු සහ සිදුවීම් විමර්ශනය සහ නිරුපද්‍රිතතා නිර්දේශ ක්‍රියාත්මක කිරීම |
| බලය පැවරීම | ▪ ගුවන් සමාගම්වල උපලේඛන අනුමත කිරීම<br>▪ ගුවන් ගමන් ගාස්තු අනුමත කිරීම<br>▪ සංචාරක නියෝජිතයන් සහතික කිරීම<br>▪ ගුවන් යානා ලියාපදිංචි කිරීම<br>▪ ගුවන් යානා අමතර කොටස් ආනයනය සඳහා බලය දීම<br>▪ උස් ගොඩනැගිලි ඉදි කිරීම සඳහා අවසර දීම<br>▪ පොදු අලෙවි නියෝජිතයන්ට බලය පැවරීම<br>▪ අන්තර්ජාතික මෙහෙයුම් සඳහා දේශිය ගුවන් ප්‍රවාහන සමාගම් නම් කිරීම |
| සුරක්ෂිතතා | ▪ සිවිල් ගුවන් සේවා අංශයේ සුරක්ෂිතතා අවදානම කළමනාකරණය |
| බලාත්මක කිරීම | ▪ නියාමන උල්ලංඝනය කිරීම්වලට ප්‍රතිචාර දැක්වීම<br>▪ මහජන සෞඛ්‍යය හා සනීපාරක්ෂක අවශ්‍යතා බලාත්මක කිරීම |
| රජයට සහාය වීම | ▪ ගුවන් සමාගම්වලින් විගමන බදු අය කිරීම |

# නියාමන විෂයපථය

**2014 වසර අවසානය විට සිවිල් ගුවන් සේවා ක්ෂේත්‍රයේ නියාමන විෂය පථය පහත දක්වා තිබේ.**

| නියාමනය කළ ක්ෂේත්‍රය | 2014 | 2013 | වෙනස % |
|---|---|---|---|
| ගුවන් තොටුපලවල් | | | |
| දේශීය භූමි ගුවන් තොටුපලවල් | 12 | 12 | - |
| දේශීය ජලාශ ගුවන් තොටුපලවල් | 14 | 12 | +16.6% |
| අන්තර්ජාතික ගුවන් තොටුපලවල් (RMP සමඟ) | 03 | 03 | - |
| ගුවන් සමාගම් | | | |
| දේශීය ගුවන් සේවාවල නිරතව සිටින දේශිය ගුවන් සමාගම් | 08 | 06 | +33% |
| අන්තර්ජාතික ගුවන් සේවාවල නිරතව සිටින දේශීය ගුවන් සමාගම් | 03 | 03 | - |
| අන්තර්ජාතික විදේශීය ගුවන් සමාගම් | 24 | 24 | - |
| පුහුණු කිරීමේ සංවිධාන | | | |
| පියසර පාසැල් | 08 | 05 | +60% |
| ඉංජිනේරු/නඩත්තු පාසැල් | 05 | 05 | - |
| ගුවන් ප්‍රවාහන සේවා ආශ්‍රිත | 01 | 01 | - |
| ගගන නාවික සේවා ප්‍රතිපාදකයන් | | | |
| ගුවන් තොටුපොළවල් | 01 | 01 | - |
| ගුවන් ප්‍රවාහන සේවා | 01 | 01 | - |
| ගගන නාවික සේවා භූමි ආධාරක | 01 | 01 | - |
| ගගන නාවික විදුලි සංදේශන සේවා | 01 | 01 | - |
| ගුවන් සේවා සුරක්ෂිතතා සේවා | 01 | 01 | - |
| බිම් මෙහෙවර සේවා | 01 | 01 | - |
| ආහාර පාන සැපයුම් සේවා | 01 | 01 | - |
| ගුවන් යානා සඳහා නැවත ඉන්ධන පිරවීම හා ලිහිසි තෙල් සැපයුම | 01 | 01 | - |
| නඩත්තු හා අලුත්වැඩියා කටයුතු | 01 | 01 | - |
| ගුවන් යානා | | | |
| එච් (බර) ගුවන් යානා වර්ග කි.ග්‍රෑ. 136,000 (රාත්තල් 300,000) හෝ ඊට වැඩි | 16 | 14 | +14% |
| එම් (මධ්‍යම) ගුවන් යානා වර්ග කි.ග්‍රෑ. 136,000 (රාත්තල් 300,000) ට වඩා අඩු සහ කි.ග්‍රෑ. 7000 (රාත්තල් 15.500) ට වඩා වැඩි | 22 | 18 | +22% |
| එල් (සැහැල්ලු) ගුවන් යානා වර්ග කි.ග්‍රෑ. 7000 (රාත්තල් 15.500) හෝ ඊට අඩු | 33 | 31 | +4% |
| පියාසර පුහුණු උපක්‍රම | | | |
| දේශීය පූර්ණ පියාසර අනුකාරක - A320 | 03 | 01 | +200% |
| විදේශ පාදක පූර්ණ පියාසර අනුකාරක | 03 | 05 | -40% |

නියාමන විෂය පථය

| | | | |
|---|---|---|---|
| පුද්ගලයින් | | | |
| ආධුනික ගුවන් නියමු බලපත්‍රධාරීන් | 211 | 231 | -9% |
| පුද්ගලික ගුවන් නියමු බලපත්‍රධාරීන් | 151 | 23 | +23% |
| වාණිජ ගුවන් නියමු බලපත්‍රධාරීන් | 394 | 339 | +16% |
| ගුවන් ප්‍රවාහන ගුවන් නියමු බලපත්‍රධාරීන් | 350 | 498 | -30% |
| ගුවන් ගමන් පාලක බලපත්‍රධාරීන් | 85 | 74 | +5% |
| ගුවන් යානා නඩත්තු ඉංජිනේරු බලපත්‍රධාරීන් | 5 | 5 | - |
| ගුවන් යානා නඩත්තු බලපත්‍රධාරීන් | 436 | 474 | -8% |
| පියසර පිටත් කරන්නාබලපත්‍රධාරීන් | 190 | 189 | +0.5% |
| ගගන නාවික ස්ථාන මෙහෙයුම්කරු බලපත්‍රධාරීන් | 04 | 04 | - |
| මැදිරි සේවක පිරිස් සාමාජික සහතික දරන්නන් | 1198 | 1186 | 1% |
| පියසර උපදේශකවරුන් | 12 | 05 | +77% |
| සහකාර පියසර උපදේශකවරුන් | 24 | 09 | +166% |
| භූමි උපදේශකවරුන් | 22 | 23 | -4% |
| පියසර පරීක්ෂකවරුන් | 12 | 12 | - |
| නම් කරන ලද පරීක්ෂක නියමුවන් | 34 | 34 | - |
| නම් කළ ගගන නාවික වෛද්‍ය පරීක්ෂකවරුන් | 06 | 05 | +20% |
| සහතික කරන ලද ගුවන් සේවා සුරක්ෂිතතා පරීක්ෂකවරුන් | 571 | 504 | +13% |
| ගුවන් ප්‍රවාහන සේවා සැපයුම්කරුවන් | | | |
| ගෝලීය බෙදාහැරීමේ සේවා සැපයුම්කරුවන් | 4 | 4 | - |
| ගුවන් ප්‍රවාහන සේවා සැපයුම්කරුවන් (බලපත්‍ර කාණ්ඩය ඒ) | 550 | 493 | +11% |
| ගුවන් ප්‍රවාහන සේවා සැපයුම්කරුවන් (බලපත්‍ර කාණ්ඩය බී) | 38 | 19 | +100% |
| පොදු වෙළඳ නියෝජිතයන් | 23 | 22 | +4% |
| උස් ගොඩනැගිලි ඉදි කිරීම | | | |
| විදුලි සංදේශන කුළුණු | 6126 | 6090 | 0.6% |

# අනතුරු විමර්ශන ඒකකය

ගුවන් සේවා නිරුපද්‍රිතතාව මෙහෙයවීම හා ඵලදායක කළමනාකරණය සඳහා මූලික අවශ්‍යතාවක් වන අත්‍යවශ්‍ය දත්ත හා තොරතුරු රැස් කිරීම ඉලක්ක කරමින් අනිවාර්ය සිදුවීම් වාර්තාකරණය හා ස්වේච්ඡා වාර්තාකරණය යනුවෙන් ගුවන් සේවා සිදුවීම් වාර්තා කිරීමේ ආකාර දෙකක් ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය මගින් ස්ථාපනය කර තිබේ.

ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ අනිවාර්ය වාර්තාකරණ ක්‍රමය යටතේ 2014 වසරේ දී අධිකාරියට වාර්තා වූ විවිධ ගුවන් සේවා සිදුවීම්වල එකතුව 243 ක් වූ අතර එයින් සිදුවීම් 222 ක්ම ශ්‍රී ලංකාව තුළ ලියාපදිංචි වූ ගුවන් යානාවලට සම්බන්ධ සිදුවීම් වූ අතර ඉතිරි සිදුවීම් ශ්‍රී ලංකාවේ භූමිය තුළ මෙහෙයවනු ලබන විදේශීය රටවල ලියාපදිංචි කළ ගුවන් යානාවලට අදාළ වූ සිදුවීම් විය.

2014 වසරේදී පක්ෂීන් ගුවන් යානාවල ගැටීමේ සිදුවීම් 86 ක් වාර්තා විය. එමෙන්ම, පද්ධති/සංරචක අක්‍රියවීම් හෝ ක්‍රමවත්ව ක්‍රියා නොකිරීම් 64 ක් වාර්තා විය. වාර්තා වූ සිදුවීම් අතරින් බණ්ඩාරනායක අන්තර්ජාතික ගුවන්තොටුපළ තුළ පක්ෂීන් ගුවන් යානාවල ගැටීම් 37 ක් වාර්තා වූ අතර මත්තල රාජපක්ෂ අන්තර්ජාතික ගුවන්තොටුපළ තුළ පක්ෂීන් ගුවන් යානාවල ගැටීම් 16 ක් වාර්තා විය.


සිදුවීම්වල බරපතල බව හා එවැනි සිදුවීම් නැවත සිදුවීමේ සම්භාවිතාව මත පදනම්ව, තෝරා ගත් සිදුවීම් කිපයක් සම්බන්ධව ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය මගින් සවිස්තරාත්මක විමර්ශන සිදු කරනු ලැබීය. ඒ අනුව සාමාන්‍ය වේගයෙන් ගමන් කළ එයාර්බස් වර්ගයේ A330 ගුවන් යානයක් මගින් මෙහෙයවනු ලැබූ UL503 යන ශ්‍රී ලංකන් එයාර්ලයින්ස් සමාගමේ ගුවන් ගමනකදී වාමුවාවේ ඉරි තැලීමක් පිළිබඳ සිදුවීමක් ද, මිලේනියම් ගුවන් ප්‍රවාහන සමාග මේ තනි ගුවන් මාර්ග පුහුණුවක් අතරතුර සිදු කරන ලද පුහුණු ගුවන් ගමනකදී සෙස්නා 152, 4R - DJD ගුවන් යානයේ ටයරයක් වැටීම යන සිදුවීම් විමර්ශනය කරනු ලැබූ අතර නිරුපද්‍රිතතා නිර්දේශ සමඟ වාර්තා පිළියෙළ කරමින් පවතී.

මෙයට අමතරව, බණ්ඩාරනායක අන්තර්ජාතික ගුවන් තොටුපොළේදී 2013 වසරේ ශ්‍රී ලංකා එයාර්ලයින්ස් සමාගමේ ගුවන් ගමනක් අතරතුර දී සිදු වූ බරපතල අනතුරක් පිළිබඳ ඉතිරි විමර්ශන කටයුතු අඛණ්ඩව සිදු කරමින් පවතින අතර එම කටයුතු කඩිනමින් අවසන් කිරීමට ද අපේක්ෂා කෙරේ.

ගුවන් අනතුරු විමර්ශන ධාරිතාව වැඩි දියුණු කිරීමක් ලෙස, ලියාපදිංචි විමර්ශකයන් දෙදෙනෙකු සඳහා සිංගප්පූරුවේදී ගුවන් යානා අනතුරු විමර්ශනය පිළිබඳව උසස් පුහුණු පාඨමාලාවක් හැදෑරීමට අවස්ථාව ලබා දෙනු ලැබීය. ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ ක්‍රියාත්මක කරනු ලබන වත්මන් ගුවන් සේවා සිදුවීම් වාර්තාකරණ පද්ධති සඳහා වූ යුරෝපීය සම්බන්ධීකරණ මධ්‍යස්ථානයේ (ECCIRS) දත්ත පදනම් පද්ධතිය 5 වන නව සංස්කරණය සමඟ යාවත්කාලීන කරන ලද අතර පසුව දේශීය මෙහෙයුම්කරුවන් වෙනුවෙන් ද එය යාවත්කාලීන කරනු ලැබීය. මේ අනුව 2010 වසරේදී ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ ස්ථාපනය කරන ලද (ECCIRS) පද්ධතිය තුළ 2014 වසර අවසානයේ දී සිදුවීම් 802 ක් සම්බන්ධ වාර්තා ඇතුළත් වේ.

2014 වසරේදී වාර්තා වූ සිදුවීම් පිළිබඳ ප්‍රධාන සවිස්තරාත්මක විශ්ලේෂණයක් පහත වගුවෙන් පිළිබිඹු කෙරේ.

## 2014 වසරේ ශ්‍රී ලංකාවේ සහ විදේශ රටවල ලියාපදිංචි ගුවන් යානා සම්බන්ධයෙන් ශ්‍රී ලංකා භූමිය තුළ දී වාර්තා වූ සියළු සිදුවීම්




| | | |
|---|---|---|
| ADRM | - | ගගන යාත්‍රාංගන |
| ATM/CNS | - | ගුවන් ප්‍රවාහන කළමනාකරණය/සන්නිවේදන, ගුවන් සංතරණ හෝ සෝදිසි සේවා ගැටළු |
| BIRD | - | පක්ෂි ගැටීම් |
| CABIN | - | මැදිරි නිරුද්‍රිතතා සිදුවීම් |
| FUEL | - | ඉන්ධන ආශ්‍රිත |
| LALT | - | පහත් උන්නතාංශ මෙහෙයුම් |
| MAC | - | ගුවනේදී සමීපවීම/ගැටුමකට ආසන්න/ගුවනේදී ගැටුම |
| MED | - | වෛද්‍ය |
| RE | - | ධාවන පථයේ ගමන් කිරීමේ දී |
| RAMP | - | භූමි මෙහෙවර |
| SCF - NP | - | පද්ධති/සංරචක අක්‍රියවීම හෝ ක්‍රමවත්ව ක්‍රියා නොකිරීම (බලෝත්පාදක නොවන) |
| SCF - PP | - | බලෝත්පාදක පද්ධති/සංරචක අක්‍රියවීම හෝ ක්‍රමවත්ව ක්‍රියා නොකිරීම |
| SEC | - | සුරක්ෂිතතාව ආශ්‍රිත |
| TURB | - | කැළඹුමකට මුහුණ පෑම |
| WSTRW | - | සුළං මාරුව සහ අකුණු කුණාටුව |
| WILD | - | වනජීවීන් ගැටීම් |
| OTHER | - | වෙනත් |

# අභ්‍යන්තර විගණන අංශය

අභ්‍යන්තර විගණන අංශය මගින් වාරානුවාර පදනම මත මූල්‍ය වාර්තාකරණ පද්ධතිය හා අභ්‍යන්තර පාලන පද්ධතිය පිළිබඳව සවිස්තරාත්මක හා විධිමත් සමාලෝචනයක් සිදු කිරීම හා අධීක්ෂණය කිරීම තුළින් ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ ගිණුම්කරණය සහ මූල්‍යමය වාර්තාකරණ පද්ධතියේ අවංකභාවය හා අභ්‍යන්තර පාලන පද්ධතියේ ඵලදායිතාවය තහවුරු කිරීම සඳහා අවශ්‍ය පියවර ගෙන තිබේ. ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ රීති සහ රෙගුලාසි මෙන්ම ස්ථාපිත ප්‍රතිපත්ති හා කාර්ය පටිපාටිවලට අනුකූලව අධිකාරිය කටයුතු කරන බව එමගින් තවදුරටත් තහවුරු වේ. 2014 වසර තුළදී, තාක්ෂණික විගණන 07 ක් ද මූල්‍ය විගණන 20 ක්ද ඇතුළුව අනුකූලතාව අධීක්ෂණය කිරීමේ විගණන 39 ක් පවත්වා තිබේ. තීරණ/අපගමන 148 ක එකතුවක් විගණනයේදී නිරීක්ෂණය වූ අතර ඒවා නිවැරදි කිරීම සඳහා ඒ සම්බන්ධව ජ්‍යෙෂ්ඨ කළමනාකරණය දැනුවත් කර තිබේ.

# ගගන නාවික සේවා ශාඛාව

## ගුවන් සේවා සුරක්ෂිතතා අංශය

2014 වසර සඳහා වූ වාර්ෂික කාර්ය සැලැස්මට අනුව ගුවන් සේවා සුරක්ෂිතතාව සම්බන්ධ ක්‍රියාකාරකම් පිළිබඳ මුල් සහතිකකරණ කටයුතුවල හා සෝදිසි කටයුතු අඛණ්ඩව පවත්වා ගැනීමේ කටයුතුවල ගුවන් සේවා සුරක්ෂිතතා අංශය නිරතව සිටියි.
ගුවන් සේවා සුරක්ෂිතතා සේවා සැපයුම්කරු ලෙස සීමාසහිත ගුවන් තොටුපල හා ගුවන් සේවා (ශ්‍රී.ලං) සමාගම විසින් විධිමත් සහතිකකරණ ක්‍රියාවලියක් ආරම්භ කරනු ලැබීය. ගුවන් සේවා සුරක්ෂිතතා කළමනාකරුවෝ 09 දෙනෙක් ද, ගුවන් සේවා සුරක්ෂිතතා පරීක්ෂකයෝ 87 දෙනෙක් ද, සහතික කරන ලද ගුවන් සේවා සුරක්ෂිතතා උපදේශකයෝ 04 දෙනෙක් ද එහි සේවය කළහ. සමාලෝචිත වසර තුළ ගුවන් සේවා සුරක්ෂිතතා පරීක්ෂකයෝ 490 දෙනෙකු නැවත සහතිකකරණයට ලක් කරනු ලැබූහ. පරීක්ෂණ 25 ක් ද, එක් පරීක්ෂාවක් ද, ප්‍රභූ පුද්ගලයින් සම්බන්ධ ගුවන් ගමන් 18 ක සුරක්ෂිතතාව පිළිබඳ අධීක්ෂණ කටයුතු ද සිදු කරනු ලැබීය.

ජාතික සිවිල් ගුවන් සේවා සුරක්ෂිතතා වැඩසටහනට අනුකූලවල අදාළ ගුවන් සේවා මෙහෙයුම්කරුවන් විසින් ගුවන් ගමන් සේවාවේ සුරක්ෂිතතාව සම්බන්ධ පාලන පියවර ක්‍රියාත්මක කිරීමේ තත්ත්වය පිළිබඳව තහවුරු කිරීම සඳහා ශ්‍රී ලංකන් එයාර්ලයින්ස් සමාගමේ හා විදේශිය ගුවන් සේවා සමාගම් 28 ක සුරක්ෂිතතා වැඩසටහන තක්සේරු කරනු ලැබීය.

මෙම වසරේදී වාණිජ සිවිල් ගුවන් යානාවල යුධෝපකරණ රැගෙන යාම සඳහා අනුමැති 160 ක් ලබා දෙනු ලැබීය.

## ගගන යාත්‍රාංගණ හා ගුවන් සංතරණ සේවා අංශය

**බණ්ඩාරනායක අන්තර්ජාතික ගුවන් තොටුපලේ ගගන යාත්‍රාංගණ සහතිකය අළුත් කිරීමේ විගණනය.**

අන්තර්ජාතික ගුවන් ගමන් මෙහෙයවනු ලබන සියලු ගුවන් තොටුපලවල් සහතිකකරණයට ලක් කිරීම අන්තර්ජාතික සිවිල් ගුවන් සේවා සංවිධානයේ අවශ්‍යතාවයකි. ගගන යාත්‍රාංගණ සංග්‍රහයන් හා වෙනත් අදාළ ලේඛන සමාලෝචනය කිරීම, ගගන යාත්‍රාංගණ නිරුපද්‍රිතතා කළමනාකරණ පද්ධතියක් ක්‍රියාත්මක කිරීම, ගුවන් තොටුපල පහසුකම්, සේවා, උපකරණ හා කාර්ය පටිපාටි පරීක්ෂා කිරීම සඳහා එම ගුවන් තොටුපලේදීම පවත්වනු ලබන විගණන ද ඇතුළත්ව නිරුපද්‍රිතතා විගණනයක් පැවැත්වීමෙන් අනතුරුව අදාළ රාජ්‍යයේ සිවිල් ගුවන් සේවා නියාමනය කරනු ලබන රාජ්‍ය ආයතනය මගින් අන්තර්ජාතික ගුවන් තොටුපලවල් සහතිකකරණයට ලක් කරනු ලබයි. 2010 වසරේ දී, බණ්ඩාරනායක අන්තර්ජාතික ගුවන් තොටුපල තුළ පුරා දින පහක කාලයක් පැවති විගණයකින් පසුව වසර 2 ක වලංගු කාල පරිච්ඡේදයක් සඳහා එම ගුවන් තොටුපල ප්‍රථම වතාවට සහතික කරනු ලැබීය. 2014 මාර්තු මාසයේ දින හතරක කාලයක් පුරා දෙවන ගුවන් තොටුපල සහතිකය අළුත් කිරීමේ විගණනය පවත්වනු ලැබීය. විගණනයේ දී නිරීක්ෂණය වූ ඌනතා නිවැරදි කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීමෙන් අනතුරුව තවත් වසර 2 ක කාලයක් සඳහා ගුවන් තොටුපල සහතිකය අළුත් කරනු ලැබීය.

### සෝදිසි ක්‍රියාකාරකම්

ගුවන් ගමන් පාලන මධ්‍යස්ථාන හා ගුවන් තොටුපල හා ගගන නාවික තොරතුරු සේවා මධ්‍යස්ථානවලදී සිදු කරනු ලබන මාසික පරීක්ෂාවන් ගගන යාත්‍රාංගණ හා ගුවන් සංතරණ සේවාවලට අදාළ සෝදිසි වැඩසටහන්වලට ඇතුළත් වේ.

රත්මලානේ පිහිටි ප්‍රාදේශය පාලන මධ්‍යස්ථානය, බණ්ඩාරනායක අන්තර්ජාතික ගුවන් තොටුපලේ ප්‍රවේශ පාලන මධ්‍යස්ථානය, බණ්ඩාරනායක අන්තර්ජාතික ගුවන් තොටුපලේ පාලන කුළුණ, මත්තල රාජපක්ෂ අන්තර්ජාතික ගුවන් තොටුපලේ පාලන කුළුණ, රත්මලාන ගුවන්තොටුපලේ පාලන කුළුණ යන ගුවන් ගමන් පාලන මධ්‍යස්ථානවලදී පරීක්ෂණ 35 ක් සිදු කරනු ලැබීය.

ගගන යාත්‍රාංගණ ක්ෂේත්‍රය සම්බන්ධයෙන් සැලකීමේ දී, බණ්ඩාරනායක අන්තර්ජාතික ගුවන් තොටුපල, මත්තල රාජපක්ෂ අන්තර්ජාතික ගුවන් තොටුපල හා රත්මලාන ගුවන් තොටුපල යන ශ්‍රී ලංකාවේ සියලුම සිවිල් ගුවන් තොටුපලවල් ආවරණය කරමින් සමාලෝචිත වසර තුළ ගගන යාත්‍රාංගණ පරීක්ෂණ 38 ක් සිදු කරනු ලැබීය. එයට අමතරව, දිය ගගන යාත්‍රාංගණ පිරික්සුම් 02 ක් ද, හෙලිකොප්ටර් යාත්‍රාංගණ පිරික්සුම් 05 ක් ද සිදු කරනු ලැබිය. රෝහල්වල ස්ථාපනය කරන ලද හෙලිකොප්ටර් යාත්‍රාංගණ 02 ක් ද මෙහෙයුම් කටයුතු සඳහා යොදවා ගැනීම සඳහා අනුමැතිය ලැබී තිබේ.

ගගන නාවික සේවා සම්බන්ධයෙන් සැලකීමේ දී, බණ්ඩාරනායක අන්තර්ජාතික ගුවන්තොටුපල, මත්තල රාජපක්ෂ අන්තර්ජාතික ගුවන් තොටුපල හා රත්මලාන ගුවන් තොටුපලවල් පිහිටි ගගන නාවික තොරතුරු සේවා මධ්‍යස්ථානවල දී පිරික්සුම් 27 ක් සිදු කරනු ලැබීය. මෙම පිරික්සුම්වල දී නිරීක්ෂණය කරනු ලැබූ ඌනතා ක්ෂණිකව නිවැරදි කිරීම සඳහා සේවා ප්‍රතිපාදකයා වන සීමාසහිත ගුවන් තොටුපල හා ගුවන් සේවා සමාගමට දැනුම් දී තිබේ. හඳුනාගත් ඌනතා නියමිත කාලය තුළදී නිවැරදි කළ බව තහවුරු කර ගැනීම සඳහා පසු විපරම් කටයුතු සිදු කරනු ලැබීය.

**කාර්ය සාධනය පාදක වූ ගුවන් සංතරණ කටයුතු (PBN) ක්‍රියාත්මක කිරීම**

කාර්ය සාධනය පාදක වූ ගුවන් සංතරණ කටයුතු (PBN) ක්‍රියාත්මක කිරීම ගෝලීය ගුවන් සංතරණ කටයුතු සම්බන්ධයෙන් වර්තමානයේ ඉහළම ප්‍රමුඛත්වයක් ලබා දී ඇති විෂය ක්ෂේත්‍රය වේ. කාර්ය සාධනය පාදක වූ ගුවන් සංතරණ කටයුතු (PBN) ක්‍රියාත්මක කිරීම තුළින් සිරස් මාර්ගෝපදේශනය, ගුවන් ප්‍රදේශයේ වැඩි කරන ලද ධාරිතාව, වැඩි දියුණු කළ ගුවන්තොටුපල ප්‍රවේශය, වඩාත් කාර්යක්ෂම මෙහෙයුම්, අඩු වූ යටිතල පහසුකම් පිරිවැය හා අඩු වූ පාරිසරික බලපෑම සමග වැඩි වූ උපකරණ ප්‍රවේශයක් තුළින් වැඩි දියුණු කළ නිරුපද්‍රිතතාව සහිතව වඩාත් වැදගත් ප්‍රතිලාභ පිරිනමා තිබේ.

සමුළුවේ 37 වන සැසි වාරයේ දී, අවම පාර්ශ්වික ගුවන් සංතරණ ප්‍රවේශයන් ඇතුළත් වූ සිරස් මාර්ගෝපදේශනය සහිත ප්‍රවේශ කාර්ය පටිපාටිය (APV) (Baro - VNAV) සහ/හෝ වැඩි දියුණු කළ (GNSS) ක්‍රියාත්මක කිරීමේ ප්‍රතිශතය ප්‍රකාරව මූලික ප්‍රවේශය ලෙස හෝ නිරවද්‍යතා ප්‍රවේශය සඳහා අතිරේක සහායක් ලෙස (2010 වන විට 30%, 2014 වන විට 70%, 2016 වන විට 100%) සියලුම උපකරණ ධාවන පථ අන්ත සඳහා ඉලක්ක අර්ථ දක්වා තිබුණි.

කෙසේ වුවද, උපකරණ ධාවන පථ 4 ක් සහිතව ශ්‍රී ලංකාවේ අන්තර්ජාතික ගුවන්තොටුපළ 2 ක මෙහෙයුම් කටයුතු සිදු කරන, ව්‍යවස්ථාපිත ගුවන් සංතරණ සේවා ප්‍රතිපාදක වන සීමාසහිත ගුවන් තොටුපල හා ගුවන් සේවා සමාගම කලාපීය ඉලක්ක කරා ළඟා වීමට අසමත් වූ අතර අන්තර්ජාතික සිවිල් ගුවන් සේවා සංවිධානයේ (ICAO) ගුවන් සේවා කලාපීය දත්ත අංශය මගින් කාර්ය සාධනය පාදක වූ ගුවන් සංතරණ කටයුතු (PBN) ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ ප්‍රගතිය 0% ක් ලෙස නිරූපණය කරනු ලැබුවද, සහාය අවශ්‍ය වන රාජ්‍යයන්වලට උපකාර කිරීම සඳහා අන්තර්ජාතික සිවිල් ගුවන් සේවා සංවිධානය මගින් ස්ථාපනය කර ඇති ආසියා ශාන්තිකර කලාපීය පියසර කාර්ය පටිපාටි වැඩසටහනේ සාමාජිකත්වය ලබා ගැනීමට අවශ්‍ය වන නියාමන සහාය සහ මූල්‍ය සහාය ලබා ගැනීම සඳහා අවස්ථා කීපයකදීම සිහි කැඳවීම් සිදු කළ ද මේ වන තෙක් ශ්‍රී ලංකාවට සාමාජිකත්වය පිරි නමා නොමැත.

**ඉහළින් පියාසර කිරීම හා ගුවන් යානා ගොඩ බැස්ස වීම සඳහා අවසර ලබා දීම.**

2014 වසර තුළ, ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය මගින් අන්තර්ජාතික ගුවන් යානා 37,818 කට කොළඹ පියසර තොරතුරු කලාපයට ඉහළින් පියාසර කිරීම සඳහා අවසර ලබා දී තිබුණි. මෙයට අමතරව, මෙම අධිකාරිය මගින් ගුවන් යානා 21,576 කට ශ්‍රී ලංකාව සතු ගුවන් ප්‍රදේශයට ඉහළින් පියාසර කිරීම සඳහා ද, ලේඛන ගත කර නොමැති අන්තර්ජාතික ගුවන් යානා 789 කට ශ්‍රී ලංකාවට ගොඩ බෑමේ අවසරය ද ලබා දී ඇත.

**හෙලිකොප්ටර් යානා මගින් ගුවනේ සිදු කරන ලද කටයුතු**

වාණිජ හෙලිකොප්ටර් යානා කිහිපයක් ගුවන් ඡායාරූපකරණය, ගුවන් වීඩියෝ චිත්‍රපටකරණය, මල් හෙළීම සහ කුඩා පත්‍රිකා හෙළීම්වල ඉලෙක්ට්‍රොනික් ප්‍රතිබිම්බනය සඳහා ගුවන් සමීක්ෂණ සිදු කිරීම සහ සංස්ථාපිත ආයතනවල වෙළඳ සන්නාම ප්‍රවර්ධන කටයුතුවලදී වෙළඳ දැන්වීම්කරණය වැනි ගුවන් මෙහෙයුම් කටයුතුවල නිරත විය. සමාලෝචිත වසර තුළදී, අනෙකුත් අදාළ නියෝජිතායතන සමග සම්බන්ධීකරණයෙන් එවැනි ගුවන් ගමන් අනුමැති 42 ක් ලබා දීමට කටයුතු කරන ලදී.

**වෙනත් ක්‍රියාකාරකම්**

අදාළ වන කලාපීය රෙගුලාසි ප්‍රකාරව, ඉහළට ඉදි කරනු ලබන උස් ගොඩනැගිලි සඳහා විශේෂ අවසරය ලබා දීම, වර්ග ප්‍රමාණන නිකුත් කිරීම සඳහා ගුවන් ගමන් පාලකයන් (AICS) පරීක්ෂා කිරීම, ගුවන් ගමන් පාලකයින් සඳහා ප්‍රමිති පවත්වා ගැනීමේ අරමුණින් ගුවන් ගමන් පාලකයන් සඳහා පරීක්ෂණ පැවැත්වීම හා ගගන නාවික තොරතුරු ප්‍රකාශන (AIP) පැකේජයන්වල මුල් ප්‍රකාශන හා ඒ සඳහා සිදු කරන ලද සංශෝධනවල සංරචක සඳහා අනුමැතිය ලබා දීම ගගන යාත්‍රාංගණ හා ගුවන් සංතරණ සේවා අංශය මගින් ඉටු කරනු ලබන අනෙකුත් ප්‍රධාන ක්‍රියාකාරකම් වේ.

## විශේෂ ව්‍යාපෘති අංශය

**යටිතල පහසුකම් සංවර්ධනය**

2014 වසරේ දී, යටිතල පහසුකම් සංවර්ධනය කිරීම මගින් සංවිධානයේ ඵලදායී ක්‍රියාකාරීත්වය ඉහළ නැංවීම සඳහා ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය අඛණ්ඩව ප්‍රයත්න දැරීය. ඒ අනුව, එම ඉදි කිරීම් සැලසුම් කිරීමේ හා අධීක්ෂණය කිරීමේ ප්‍රධාන කාර්යභාරය විශේෂ ව්‍යාපෘති අංශය මගින් භාර ගන්නා ලදී.

**ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ ප්‍රධාන කාර්යාලය ඉදි කිරීම**

කටුනායක නායිකන්ද ප්‍රදේශයේදී, ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල ඉදි කිරීමේ කටයුතු අඛණ්ඩව සිදු කරනු ලැබීය. ඉදි කිරීමේ

කටයුතු සඳහා කොන්ත්‍රාත්කරුවකු රජයේ ප්‍රසම්පාදන කාර්ය පටිපාටියට අනුකූල වන පරිදි විවෘත ලංසු කැඳවීමේ ක්‍රියාවලියක් තුළින් තෝරා ගන්නා ලදී. 2016 වසර වන විට ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල ඉදි කිරීමේ කටයුතු සම්පූර්ණ කිරීමට සැලසුම් කර තිබේ.

**ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ කාර්ය මණ්ඩලය සඳහා වීරවිල නිල නිවාස ඉදි කිරීම.**

ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ සේවකයින් සඳහා නිල නිවාස ලෙස වීරවිල ප්‍රදේශයේ කාමර 4 ක් බැගින් යුත් දෙමහල් ගොඩනැගිලි හතරක් ඉදි කිරීම සඳහා 2013 වසරේ ආරම්භ කරන ලද කටයුතු සමාලෝචිත වර්ෂයේ ද අඛණ්ඩව සිදු කරනු ලැබීය. රජයේ ප්‍රසම්පාදන කාර්ය පටිපාටිවලට අනුකූල වන පරිදි විවෘත ලංසු කැඳවීමේ ක්‍රියාවලියක් තුළින් ඉදි කිරීමේ කටයුතු සඳහා කොන්ත්‍රාත්කරුවකු තෝරා ගන්නා ලදී. 2014 වසරේ ඔක්තෝම්බර් මාසයේ දී ඉදිකිරීම් කටයුතු සම්පූර්ණ කරන ලද අතර 2014 වසරේ අවසානය වන විට/2015 ආරම්භය වන විට අවශ්‍ය ගෘහ භාණ්ඩ සැපයීමෙන් අනතුරුව කාර්ය මණ්ඩලයට නවාතැන් ගැනීම සඳහා සුදුසු තත්වයකට පත් කළ හැකි විය.

**මත්තල රාජපක්ෂ අන්තර්ජාතික ගුවන් තොටුපොළේ දී ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියට අයත් කාර්යාලයක් විවෘත කිරීම.**

ගුවන් තොටුපොළවල නිරුපද්‍රිතතා හා සුරක්ෂිතතා නියාමක ලෙස ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය මත්තල රාජපක්ෂ අන්තර්ජාතික ගුවන් තොටුපොළ නියෝජනය කරමින් එහි රැඳී සිටීම අත්‍යවශ්‍ය වේ. ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියට එහි කර්තව්‍යය ඉටු කිරීම සඳහා පහසුකම් සැලසීමට මත්තල රාජපක්ෂ අන්තර්ජාතික ගුවන්තොටුපොළේ දී අභිනවයෙන් ඉදි කරන ලද ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ කාර්යාලය 2014 ජූනි මාසයේ දී විවෘත කරනු ලැබීය.

**දැයට කිරුළ ජාතික ප්‍රදර්ශනය**

2014 වසරේ පෙබරවාරි මාසයේ දින 10 ක කාල සීමාවක් තුළ කුලියාපිටිය මධ්‍ය මහා විද්‍යාලයේ දී පැවැත්වූ දැයට කිරුළ ප්‍රදර්ශනය සඳහා ද, ඒ ඒ වසරේදී පැවැත්වූ දැයට කිරුළ ප්‍රදර්ශනය සඳහා සහභාගී වූ ආකාරයෙන්ම ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය මඟින් ප්‍රදර්ශන කුටියක් සංවිධානය කරනු ලැබීය. එයට අමතරව, ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ සමාජ වගකීමේ කොටසක් වශයෙන් 2014 වසරේ පැවැත් වූ දැයට කිරුළ සංවර්ධන ව්‍යාපෘතියට සමගාමීව මාදම්පේ කරුක්කුව සුගතානන්ද මහා විද්‍යාලයේ ක්‍රීඩාංගණය අළුත්වැඩියා කිරීමේ කටයුතු සිදු කරනු ලැබීය. බොරළුවැව වල්පොතුවැව මහා විද්‍යාලයේ 2014 ජනවාරි 21-23 දක්වා පවත්වනු ලැබූ ප්‍රදර්ශනයකට ද, මාතර මාකඳුර මහා විද්‍යාලයේදී 2014 ජනවාරි 27 සිට පෙබරවාරි 01 දින දක්වා පවත්වනු ලැබූ වෙළඳ ප්‍රදර්ශනයකට ද, එම ප්‍රදර්ශන සංවිධායකයන්ගේ ආරාධනය පරිදි ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය සහභාගි විය.

**වැඩමුළු/පුහුණු වැඩසටහන් පැවැත්වීම**
CAPSCA වැඩමුළුව

බැංකොක් නගරයේ පැවැත් වූ 50 වන සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල් සමුළුවේ දී එළඹුණු තීරණය ප්‍රකාරව, සිවිල් ගුවන් සේවය තුළ මහජන සෞඛ්‍යයට හානිකර විය හැකි සිදුවීම් වැළැක්වීම හා කළමනාකරණය සඳහා වූ සහයෝගිතා සැලසුම - ආසියා පැසිෆික් කමිටුවේ (CAPSCA-AP) 7 වන හමුව ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ සත්කාරකත්වය යටතේ 2014 මැයි මාසයේ 20-23 දිනවල ශ්‍රී ලංකාවේ කොළඹ දී පවත්වනු ලැබීය.

සිවිල් ගුවන් සේවා අංශයට බලපාන මහජන සෞඛ්‍ය පිළිබඳ අවදානම තුරන් කිරීමේ අරමුණ සාර්ථකව මුදුන් පමුණුවා ගැනීම සඳහා ගුවන් සේවයේ හා මහජන සෞඛ්‍ය අංශයේ පාර්ශ්වකරුවන් අතර සම්බන්ධීකරණය ඇති කිරීම තුළින් පහසුකම් සැලසීම 7 වන (CAPSCA - AP) සමුළුව පැවැත්වීමේ අභිප්‍රාය විය.

අන්තර්ජාතික සිවිල් ගුවන් සේවා සංවිධානය (ICAO), ලෝක සෞඛ්‍ය සංවිධානය (WHO), බංගලාදේශය, මහජන චීන සමූහාණ්ඩුව, හොංකොං චීනය, ඉන්දුනීසියාව, මැකාවෝ චීනය, මාල දිවයින, මැලේසියාව, පිලිපීනය, සිංගප්පූරුව, ශ්‍රී ලංකා සෞඛ්‍ය අමාත්‍යාංශය, ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය, ගුවන්තොටුපල මෙහෙයුම්කරු ලෙස සීමාසහිත ගුවන්තොටුපල හා ගුවන් සේවා සමාගම (AASL) ගුවන් සංතරණ සේවා ප්‍රතිග්‍රාහකයින්, ගුවන් තොටුපල වෛද්‍ය නිලධාරීන්, ගුවන් තොටුපළ සුරක්ෂිතතා කාර්ය මණ්ඩලය, ශ්‍රී ලංකා රේගුව, ආගමන හා විගමන දෙපාර්තමේන්තුව හා ගුවන් සමාගම්වල නියෝජිතයින්ගෙන් සමන්විත වූ 50 දෙනෙක් මෙම සමුළුව සඳහා සහභාගී වූහ.

### නියමුවන් සඳහා පියසර වලංගු කිරීමේ පාඨමාලාව

ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ ඉල්ලීම පරිදි, අන්තර්ජාතික සිවිල් සේවා සංවිධානයේ (ICAO) ආසියා ශාන්තිකර පියසර කාර්ය පටිපාටි වැඩසටහන මඟින් පියසර වලංගු කිරීමේ පාඨමාලාවක් 2014 ඔක්තෝම්බර් 17 සිට නොවැම්බර් 05 වන දින දක්වා කොළඹ දී පවත්වනු ලැබීය.

ගුවන් පියසර පටිපාටි සැලසුම්කරුවන් විසින් වැඩි දියුණු කරන ලද කාර්යසාධනය පාදක වූ ගුවන් සංතරණ කාර්ය පටිපාටිවල පියසර වලංගුතාව පිළිබඳව නියමුවන් පුහුණු කිරීම මෙම පාඨමාලාව පැවැත්වීමේ අරමුණ විය.

අන්තර්ජාතික සිවිල් සේවා සංවිධානයේ (ICAO) අවශ්‍යතාවලට අනුකූලව, කලාපයේ කාර්ය සාධනය පාදක වූ ගුවන් සංතරණ කටයුතු ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම හා සමගාමීව 2016 වසර වන විට සියලුම රාජ්‍යයන් මඟින් කාර්ය සාධනය පාදක වූ ගුවන් සංතරණ කටයුතු ක්‍රියාත්මක කර අවසන් කළ යුතුය. චීනය, තායිලන්තය, මැලේසියාව, පිලිපීනය හා

බංගලාදේශය වැනි රාජ්‍ය 5 ක විදේශීය නියෝජිතයෝ ද මෙම පුහුණු වැඩසටහනට සහභාගී වූහ. පියසර වලංගුතාව පිළිබඳව පවත්වනු ලැබූ මෙම පාඨමාලාවේ දී ශ්‍රී ලංකන් එයාලයින්ස් සමාගමේ නියමුවන් දෙදෙනෙකු ද, මිහින් ලංකා එයාලයින්ස් සමාගමේ එක් නියමුවකු ද පුහුණු කරනු ලැබූහ.

**රාජ්‍ය නිරුපද්‍රිතතා වැඩ සටහන් වැඩමුළුව (SSP)**

අන්තර්ජාතික සිවිල් ගුවන් සේවා සංවිධානයේ (ICAO) අවශ්‍යතාවලට අනුකූලව, එම සංවිධානය මගින් ලබා දෙන මාර්ගෝපදේශ යටතේ රාජ්‍ය සිවිල් ගුවන් සේවාවේ නිරුපද්‍රිතතාව වැඩි දියුණු කිරීම සඳහා එම සංවිධානයේ සාමාජික රාජ්‍යයන් මගින් රාජ්‍ය නිරුපද්‍රිතතා වැඩසටහන (SSP) ක්‍රියාත්මක කිරීම අවශ්‍ය වේ. කලාපයේ රටවල් සඳහා වූ අන්තර්ජාතික සිවිල් ගුවන් සේවා සංවිධානයේ තාක්ෂණික සහයෝගිතා කාර්යාංශයේ විශේෂඥ සහාය ද ලබා ගනිමින් ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය මගින් 2014 දෙසැම්බර් 15 - 19 දක්වා කාලය තුළ රාජ්‍ය නිරුපද්‍රිතතා වැඩසටහන පිළිබඳ පුහුණු වැඩසටහනේ දී, ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ තාක්ෂණික කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයින් සඳහා රාජ්‍ය නිරුපද්‍රිතතා වැඩසටහන පිළිබඳව පුහුණුවක් ලබා දෙනු ලැබීය.

**ප්‍රකාශන/වාර්තා**

2002 අංක 34 දරන ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරි පනත ප්‍රකාරව ගරු අමාත්‍යවරයාට ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ හැකි වන පරිදි 2013 වසර සඳහා වාර්ෂික වාර්තාව සම්පාදනය කරනු ලැබීය. වාර්තා ලබා දීම අවශ්‍ය වූ අවස්ථාවලදී, භෞතික හා ප්‍රගති වාර්තා, කමිටු අදියරේ අයවැය වාර්තාව සහ ව්‍යාපෘති සංවර්ධන වාර්තා ආදිය අදාළ රේඛීය අමාත්‍යාංශයට හා ශ්‍රී ලංකා මහ බැංකුවට ඉදිරිපත් කරනු ලැබීය.

**සිවිල් ගුවන් සේවාව පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන**

සිවිල් ගුවන් සේවා ක්ෂේත්‍රය සඳහා අනාගත මිනිස් බල අවශ්‍යතා වැඩි දියුණු කිරීමේ අරමුණින් ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය විසින් ව්‍යාපෘතියක් ආරම්භ කරන ලදී. මේ සම්බන්ධ ඉදිරි පියවරක් වශයෙන්, ගුවන් සේවාව පිළිබඳව පාසැල් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ දැනුවත් බව වැඩි දියුණු කිරීම සඳහා ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය මගින් විශේෂ ව්‍යාපෘති අංශය යටතේ කටයුතු කරන සිවිල් ගුවන් සේවා සංවර්ධන හා අධ්‍යාපන කමිටුවක් (CADEC) ස්ථාපනය කරනු ලැබීය.

සිවිල් ගුවන් සේවා සංවර්ධන හා අධ්‍යාපන කමිටුව (CADEC) මගින් ගුවන් සේවාව පිළිබඳව පාසැල් ශිෂ්‍ය ශිෂ්‍යාවන් දැනුවත් කිරීමේ වැඩසටහන් ද, පාසැල්වල ගගන නාවික සමාජ ස්ථාපනය කිරීම දිරිමත් කිරීම සහ ගුවන් සේවා ක්ෂේත්‍රය පිළිබඳව ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ දැනුම වැඩි දියුණු කිරීමේ අරමුණින් ''ගුවන්සර'' යන තේමාවෙන් තෛමාසික ගුවන් සේවා අධ්‍යාපන සඟරාවක් ප්‍රකාශයට පත් කිරීම ආදී වැඩසටහන් ද පවත්වනු ලැබේ.

2014 වසර තුළ පාසැල් වැඩසටහන් 2 ක් පවත්වනු ලැබූ අතර 2014 වසර අවසානය වන විට ගගන නාවික සමාජ 584 ක් පිහිටුවීමට සහාය ලබා දී ඇත. ''ගුවන්සර'' සඟරා 3 ක් නිකුත් කරන ලද අතර ඒවා පාසැල් 3100 කට නොමිලයේ බෙදා හරිනු ලැබීය.

# පියසර නිරුපද්‍රිතතා ශාඛාව

## මෙහෙයුම් අංශය

### ගුවන් යානා මෙහෙයුම්කරු සහතිකකරණය

අයි.ඩබ්ලිව්.එස්. ඒවියේෂන් හා ස්කයිලාර්ක් ඒවියේෂන් යන හෙලිකොප්ටර් යානා මෙහෙයුම් සඳහා ඉල්ලුම්පත් 2 කට අදාළව ගුවන් යානා මෙහෙයුම්කරු සහතිකකරණ කටයුතු සම්පූර්ණ කරන ලද අතර එම ගුවන් ප්‍රවාහණ සමාගම්වලට දේශිය වාණිජ ගුවන් මෙහෙයුම් කටයුතුවල නිරත වීම සඳහා අනුමැතිය ලබා දී තිබේ. එයට අමතරව, එෆ් - එයාර්වේස් සහ ෆ්ලයි සඳර්න් යන තවත් ගුවන් ප්‍රවාහණ සමාගම් දෙකක් සඳහා ද සහතිකකරණ ක්‍රියාවලියට අනුව කටයුතු කරන ලද අතර විශේෂිත මෙහෙයුමේ ස්වභාවය හා ප්‍රමාණයට අනුකූල වන පරිදි ගුවන් ගමන් මෙහෙයුම් කටයුතු පාලනය සහ අධීක්ෂණය, පුහුණු වැඩසටහන් මෙන්ම භූමි මෙහෙයුම් හා නඩත්තු සැලසුම් යනාදි කටයුතු පවත්වාගෙන යෑම සඳහා එම ගුවන් ප්‍රවාහණ ආයතනය ප්‍රමාණවත් පරිදි සංවිධානය වී ඇති බව තහවුරු කිරීම මත 2015 වසරේදී ගුවන් යානා මෙහෙයුම්කරු සහතිකය (AOC) නිකුත් කිරීමේ අපේක්ෂාවෙන් එම ගුවන් ප්‍රවාහණ සමාගම් සඳහා මෙහෙයුම්කරු සහතිකකරණ කටයුතු ලේඛන තක්සේරු කිරිමේ හා පරික්ෂා කිරිමේ අදියරට ප්‍රගමනය වී තිබේ.

ෆ්ලයි සඳර්න් ඒවියේෂන් ගුවන් ප්‍රවාහණ සමාගම ගුවන් යානා මෙහෙයුම්කරු සහතිකය (AOC) ලබා ගැනීමේ අරමුණින් අයදුම්පතක් ඉදිරිපත් කර ඇති අතර ඒ පිළිබඳව අවශ්‍ය කටයුතු සිදු කරනු ලැබේ. ගුවන් යානා මෙහෙයුම්කරු සහතිකය (AOC) ලබා දීම සඳහා අයදුම්කරුගේ නිපුණතා ඇගයීමේ අරමුණින් ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය මගින් අවම වශයෙන් සංවිධානය, කාර්ය මණ්ඩලය සැපයීම, උපකරණ සහ පහසුකම්, යෝජිත මාර්ග, සේවා හා මූල්‍ය මට්ටම හා වර්ගය ආවරණය කළ යුතු යෝජිත මෙහෙයුම පිළිබඳව සවිස්තරාත්මක තක්සේරු කිරීමක් කළ යුතුව තිබේ.

අන්තර්ජාතික මෙහෙයුම් කටයුතු පිළිබඳ ගුවන් යානා මෙහෙයුම්කරු සහතික (AOC) 03 ක් ද, දේශීය මෙහෙයුම් කටයුතු පිළිබඳ ගුවන් යානා මෙහෙයුම්කරු සහතික (AOC) 06 ක් ද අළුත් කිරීමේ කටයුතු සිදු වෙමින් පැවතුණි. එයට අමතරව, ගුවන් යානා මෙහෙයුම්කරු සහතිකකරණයේ මෙහෙයුම් පිරිවිතර සංශෝධනය කිරීම සඳහා අයදුම්පත් 26 ක් තක්සේරු කරනු ලැබූ අතර සවිස්තරාත්මක තක්සේරු කිරීමේ ක්‍රියාවලියකින් පසුව ඒ සඳහා අනුමතිය ලබා දෙනු ලැබීය. ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියට පැවරී ඇති සහතිකකරණ වගකීමක් ලෙස සලකා මෙම ගුවන් යානා මෙහෙයුම්කරුවන්ගේ පියසර මෙහෙයුම් සංග්‍රහ සඳහා ප්‍රතිශෝධන, පුහුණු වැඩසටහන් ආදිය ඇතුළත් ලේඛන ද සමාලෝචනය කර ඒ සඳහා ද අනුමැතිය ලබා දෙනු ලැබීය.

නව ගුවන් යානා මෙහෙයුම්කරුවන් සම්බන්ධයෙන්, රුසියාවේ ට්‍රාන්ස්ඒරෝ ගුවන් ප්‍රවාහණ සමාගම ආරම්භක වශයෙන් සහතිකකරණයට ලක් කරන ලද අතර අබුඩාබි රාජ්‍යයේ රොටානා ජෙට් ඒවියේෂන් ගුවන් ප්‍රවාහණ සමාගමට ශ්‍රී ලංකාව තුළ මෙහෙයුම් කටයුතු සිදු කිරීම සඳහා මූලික වශයෙන් තාවකාලික අනුමැතිය ලබා දෙන ලදී. තවද, විදේශිය ගුවන් යානා මෙහෙයුම්කරුවන් ලෙස ඉදිරිපත් වී ඇති සහතිකකරණ අළුත් කිරීම් 25 කට අදාළ අයදුම්පත් සම්බන්ධයෙන් අන්තර්ජාතික ගුවන් ප්‍රවාහණ බලපත්‍රය නිකුත් කිරීම මගින් හෝ ශ්‍රී ලංකාව තුළ බල පැවැත්වෙන අන්තර්ජාතික සිවිල් ගුවන් සේවා සංවිධානයේ 17 වන ඇමුණුමේ 13 වන සංශෝධනයට අනුකූල නොවන ගුවන් ප්‍රවාහණ සමාගම් සඳහා තාවකාලික අනුමතකිරීම් ලබා දීම මගින් ද අවශ්‍ය පියවර ගන්නා ලදී.

### අන්තරායකර භාණ්ඩ (DG) ගුවනින් ප්‍රවාහණය කිරීම සඳහා අවසරපත් නිකුත් කිරීම.

2014 වසරේ දී, ජෙට් එයාර්වේස් සමාගම සඳහා ගුවන් මගින් අන්තරායකර භාණ්ඩ (DG) ප්‍රවාහණය කිරීම සඳහා අවසරපත් නිකුත් කර ඇති අතර විදේශිය ගුවන් ප්‍රවාහණ සමාගම් 13 ක් සඳහා ද, දේශීය ගුවන් ප්‍රවාහණ සමාගම් 02 ක් ද සඳහා අන්තරායකර භාණ්ඩ (DG) ප්‍රවාහණය කිරීම සඳහා නිකුත් කර ඇති අවසරපත් අළුත් කරනු ලැබිය. එයට අමතරව, අන්තරායකර භාණ්ඩ (DG) ප්‍රවාහණය කිරීම සඳහා විශේෂ අනුමත කිරීම් ද ගුවන් ප්‍රවාහණ සමාගම් වෙත නිකුත් කරනු ලැබිණි.

### සෝදිසි කටයුතු

අන්තර්ජාතික සිවිල් ගුවන් සේවා සංවිධානයේ (ICAO) ප්‍රමිති හා නිර්දේශිත පරිචයන්වලට අනුකූලතාව තහවුරු කර ගැනීම සඳහා දේශිය හා විදේශිය ගුවන් මෙහෙයුම්

සමාගම් පිළිබඳව විධිමත් පරිදි සෝදිසි කටයුතු සිදු කරනු ලැබිණි. 2014 වසර තුළදී, රැම්ප් පරීක්ෂණ 48 ක් ද, ගුවන් ගමන් අතර (ඔන්-රූට්) පරීක්ෂණ 05 ක්ද, DCP අධීක්ෂණ කටයුතු 24 ක් ද, ප්‍රධාන මූලස්ථාන පරීක්ෂණ 07 ක් ද, පුහුණු වැඩසටහන් නිරීක්ෂණය ඇතුළත්ව වෙනත් පරීක්ෂා 26 ක් ද සමඟ මුළු සෝදිසි කටයුතු 115 ක් සිදු කරන ලදී.

2015 වසර සඳහා පරීක්ෂණ සහ විගණන ප්‍රමුඛතාකරණය ද ඇතුළත්ව අවදානම මත පදනම් වූ නිරුපද්‍රිතතා සෝදිසි ක්‍රියාවලි සංවර්ධනය කිරීම සඳහා ද පියවර ගන්නා ලදී. මෙම ප්‍රයත්නය තුළ ගුවන් නියමු ක්‍රියාකාරීත්වය සඳහා මෙහෙයුම්කරු අනුකූලතාව, පූර්ව පියසර ක්‍රියාකාරකම්, පියසර අතරතුර ක්‍රියාකාරකම් සඳහා මෙන්ම අදාළ අවදානම වර්ගීකරණය කිරීම සඳහා පශ්චාත් සිදුවීම්/අනතුරු පිළිබඳව සුදානමින් සිටීම පිළිබඳව ද දත්ත එක් රැස් කිරීමේ ක්‍රමවේදයක් වැඩි දියුණු කිරීම පිළිබඳව අවධානය යොමු කරනු ලැබීය. ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ අනාගත සෝදිසි සැලසුම්කරණය සඳහා අවදානම මත පාදක වූ වඩාත් සවිස්තරාත්මක සෝදිසි සංකල්පයක් ඇති කර ගැනීම සඳහා ද, ගුවන් මෙහෙයුම්කරු සහතිකපත්ලාභීන්ගේ නිරුපද්‍රිතතා කාර්ය සාධන තක්සේරු කිරීම්වලට අනුව සම්පත් වෙන් කිරීමේ පහසුකම් සැලසීම සඳහා ද මෙමගින් මඟ පෑදේ.

**නම් කළ පියසර මෙහෙයුම් පරීක්ෂකයින් (DFOIS)**

ශ්‍රී ලංකා ගුවන් සේවා කර්මාන්තයේ විෂය පථය තුළ කඩිනමින් සිදු වන සංවර්ධනයත් සමඟ ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ පියසර මෙහෙයුම් පරීක්ෂකවරුන් (FOIS) සඳහා පැවරී ඇති රාජකාරි ප්‍රමාණය කැපී පෙනෙන අන්දමින් වැඩි වී ඇත. ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ සේවයේ නියුතු සුදුසුකම් ලත් පියසර මෙහෙයුම් පරීක්ෂකවරුන් (FOIS) ගේ හිඟය හේතුකොටගෙන නියාමන කටයුතු ඉටු කිරීම සඳහා විශේෂයෙන්ම සෝදිසි කටයුතු ඉටු කිරීම සඳහා සේවයේ යොදවා ගැනීමට සිදු වී ඇති පියසර මෙහෙයුම් පරීක්ෂකවරුන් සංඛ්‍යාව ප්‍රමාණවත් නොවන බව තහවුරු වී තිබේ. එම නිසා, නම් කළ පියසර මෙහෙයුම් පරීක්ෂකයින් (DFOIS) පිරිසක් සේවයේ යෙදවීම සඳහා ක්‍රියාවලියක් ආරම්භ කරනු ලැබීය. සේවකයකු හෝ ගුවන් සේවා මෙහෙයුම්කරුවෙකු හෝ පරීක්ෂක තනතුරෙහි රාජකාරි ඉටු කිරීම සඳහා ගුවන් ගමන් මෙහෙයුම් කටයුතු පිළිබඳ මනා පළපුරුද්දක් සහිත පියාසර කිරීම පිළිබඳ සැලකිය යුතු මට්ටමේ අත්දැකීම් සහිත සුදුසුකම් ලත් තනි පුද්ගලයෙකු හෝ නම් කළ පියසර මෙහෙයුම් පරීක්ෂකයකු යනුවෙන් හැඳින්විය හැකිය. ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය සඳහා හෝ ඒ වෙනුවෙන් හෝ අවශ්‍ය වන ඇතැම් නියාමන කාර්යයන් හා කර්තව්‍යය ඉටු කිරීම සඳහා ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය විසින් නම් කළ පියසර මෙහෙයුම් පරීක්ෂකයින් වෙත බලතල පවරා තිබේ.

## පුද්ගල බලපත්‍රකරණ අංශය

**ක්‍රියාත්මක කිරීමේ 035 ප්‍රමිති නිකුත් කිරීම**

බලපත්‍රලාභී, වර්ග ප්‍රමාණනලාභී හෝ සහතිකපත් ලාභී, සිවිල් ගුවන් සේවාවට සම්බන්ධ නිරුපද්‍රිතතා සහ/හෝ සුරක්ෂිතතා සංවේදී ක්‍රියාකාරකම්වල නිරත වන පිරිස් සඳහා ඇල්කොහොල් හෝ මනස් ක්‍රියාකාරී ද්‍රව්‍ය භාවිතය තහනම් කිරීම ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිති සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් 2014 ජූලි මාසයේ දී නිකුත් කරනු ලැබීය. නියාමනය පිළිබඳව මේ වන තෙක් පැවැති බල රහිත තත්ත්වය ඉවත් කර ගුවන් ප්‍රවාහණයේ නිරුපද්‍රිතතාව හා සුරක්ෂිතතාව තවදුරටත් ප්‍රවර්ධනය කිරීමට මෙම අත්‍යවශ්‍ය ලේඛණය මහෝපකාරී වනු ඇත. එම අත්‍යවශ්‍ය ලේඛණයේ විශේෂයෙන් සඳහන් කර ඇති අවශ්‍යතා ගුවන් යානාවක් තුළ හෝ කිසියම් කෘත්‍රිම උපක්‍රමයක් තුළදී පුහුණු කිරීම් ද ඇතුළත්ව සිවිල් ගුවන් සේවයේ නිරුපද්‍රිතා හෝ සුරක්ෂිතතා සංවේදී ක්‍රියාකාරකම්වල නිරත වීම සඳහා ශ්‍රී ලංකාවේ හෝ වෙනත් ගිවිසුම්ගත රාජ්‍යයක සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂක ජනරාල් මගින් හෝ නිකුත් කරන ලද හෝ වලංගු බව පිළිගනු ලබන බලපත්‍ර ලාභී, වර්ග ප්‍රමාණනලාභී හෝ සහතිකලාභී සෑම ගුවන් සේවා ලේඛනධාරියකුටම අදාළ වන විශේෂිත කොන්දේසි ලෙස සලකනු ලැබේ.

**පරිගණකගත කළ බලපත්‍රකරණ පද්ධතිය ක්‍රියාත්මක කිරිම.**

බලපත්‍රලාභීන්ට මෙන්ම ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියට ද ප්‍රතිලාභ සලසන ගුවන් නියමු බලපත්‍ර, ගුවන් යානා නඩත්තු බලපත්‍ර, ගුවන් ගමන් පාලක බලපත්‍ර හා මැදිරි සේවක පිරිස් සාමාජිකයන් සඳහා සහතික නිකුත් කිරීම හා අළුත් කිරීම සඳහා පුද්ගල බලපත්‍රකරණ අංශයේ නව්‍ය පරිගණකගත කළ බලපත්‍රකරණ පද්ධතියක් සවි කරනු ලැබීය.

ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියට නොපැමිණ යම් අයදුම්කරුවකුට මාධ්‍යගතව අයදුම්පතක් ඉදිරිපත් කිරීමේ පහසුකම මෙම නව්‍ය මාධ්‍යගත පද්ධතිය මගින් හඳුන්වා දී තිබේ. මාධ්‍යගත ආකෘතිය නිර්මාණය වීමෙන් අනතුරුව, ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය සමඟ පසු කාලයක දී හෝ සිදු කරනු ලබන සියලු ලිපි ගනුදෙනුවලදී භාවිතා කළ හැකි වන පරිදි එම අයදුම්කරුට පමණක් අනන්‍ය වූ යොමු අංකයක් ලබා දෙනු ලැබේ. අයදුම්කරුගේ පහසුව සඳහා එම ආකෘතිය මධ්‍යගතව නිරීක්ෂණය කිරීමේ හා සංශෝධනය කිරීමේ හැකියාව ද හඳුන්වා දී තිබෙන අතර එම නිසා පෞද්ගලික තොරතුරු නැවත නැවතත් ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාවක් ද ඇති නොවේ. අළුත් කිරීම් පිළිබඳ දැනුම් දීම් හා බලපත්‍රවල වලංගු කාල සීමාව ඉකුත්වීම් පිළිබඳව සිහි කැඳවීම් ද ස්වයංක්‍රීය ලෙස උත්පාදනය වේ. ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියට යම් අයදුම්පතක සැකසුම්කරණ අවධිය පිළිබඳව ඕනෑම අවස්ථාවක විමසා බැලීමට මෙම පද්ධතිය මගින් ඉඩකඩ සලසා තිබේ.

**නව පුහුණු පාසැල් සහතිකකරණයට ලක් කිරීම.**

සමාලෝචිත වර්ෂය තුළ දී, එක් පියාසර පුහුණු පාසැලක් සහතිකකරණයට ලක් කළ අතර තවත් පියාසර පුහුණු පාසැල් දෙකක් සහතිකකරණ ක්‍රියාවලියට භාජනය වෙමින් පවතී.
පුද්ගලික නියමු බලපත්කරණය, වාණිජ නියමු බලපත්කරණය, උපකරණ ප්‍රමාණනය කිරීම්, සහකාර ගුවන් ගමන් උපදේශක ප්‍රමාණනය කිරීම් හා ඉපිලි යානා ප්‍රමාණනය කිරීම් යන අරමුණු සඳහා පියසර පුහුණු කිරීම් පැවැත්වීමට මිලේනියම් පියසර ඇකඩමිය වෙත පියසර පුහුණු පාසල් බලපත්‍රය නිකුත් කර තිබේ. ෆෙයාර්වේස් ඒවියේෂන් ඇකඩමිය (FAA) සඳහා සහතිකකරණ ක්‍රියාවලිය 2014 වසරේ දී ආරම්භ කරනු ලැබූ අතර පාසලේ මූලික පහසුකම් සම්පාදනය කිරීම පිළිබඳ පරීක්ෂණ කටයුතු හා ප්‍රධාන තනතුරු දරන පුද්ගලයන් අනුමත කිරීම සම්බන්ධ කටයුතු මේ වන විට අවසන් කර තිබේ. වර්ග ප්‍රමාණනය කිරීමේ පුහුණු සංවිධානයක් ස්ථාපනය කිරීම සඳහා සදර්න් ඒවියේෂන් සංවිධානය අයදුම්පතක් ඉදිරිපත් කර තිබෙන අතර එම අයදුම්පත සම්බන්ධයෙන් විධිමත් හමුවක් පවත්වනු ලැබීය.

**පියසර පාසැල්/ගුවන් සේවා පුහුණු සංවිධාන/නම් කළ රෝහල්වල සෝදිසි කටයුතු ඉටු කිරීම**

2014 වසරේ දී ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය මගින් පියාසර මෙහෙයුම් පුහුණු පාසැල් 05 කද, ගුවන් ගමන් සංතරණ කාර්ය පටිපාටි පුහුණුකරුවකු ද, සහතිකරණයට ලක් ව ඇති පියාසර පුහුණු පාසලක් ද, ගුවන් සේවා පුහුණු සංවිධාන 02 කද, පුද්ගල බලපත්‍රකරණය සඳහා වන වෛද්‍ය පරීක්ෂණ හා විමර්ශන සිදු කිරීම සඳහා නියම කරන ලද රෝහල් 3 ක ද පුද්ගල බලපත්‍රකරණ ක්ෂේත්‍රය පිළිබඳ සෝදිසි කටයුතු ඉටු කරනු ලැබීය.
සමස්තයක් වශයෙන් සෝදිසි කටයුතු 14 ක් ඉටු කරනු ලැබීය.

**වෛද්‍ය පරීක්ෂණ/වෛද්‍ය මණ්ඩල හමුවීම්**

සමාලෝචිත වසර තුළදී, නියමුවන්, ගුවන් ගමන් පාලකයන්, මැදිරි සේවක පිරිස් කාර්ය මණ්ඩලය සඳහා බලපත්‍ර හා සහතිකපත්‍ර නිකුත් කිරීම සඳහා මූලික වෛද්‍ය පරීක්ෂණ 79 ක් හා අඛණ්ඩව සිදු කරනු ලබන වෛද්‍ය පරීක්ෂණ 793 ක් ද සිදු කරනු ලැබීය. ගුවන් වෛද්‍ය මණ්ඩලය මගින් වෛද්‍ය යෝග්‍යතාවය හා සම්බන්ධ අනුමාන කරුණු විසඳීමට මෙම වසර තුළ රැස්වීම් 04 ක් පවත්වනු ලැබීය.

**නම් කළ රෝහල් සමඟ පවතින ගිවිසුම්**

ගුවන් නියමුවන්, ගුවන් ගමන් පාලකයින් හා මැදිරි සේවක පිරිස් කාර්ය මණ්ඩලය සඳහා වෛද්‍ය විමර්ශන හා බැහැරින් සේවා ලබා ගැනීමේ පදනම මත වෛද්‍ය පරීක්ෂණ සිදු කරවා ගැනීම සඳහා නම් කළ රෝහල් වන ඩර්ඩන්ස් රෝහල, ආසිරි සර්ජිකල් රෝහල, හේමාස් රෝහල හා ලංකා හොස්පිට්ලස් සමඟ ඇතුළත් වූ ගිවිසුම් අළුත් කිරීමේ කටයුතු ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය මගින් ඉටු කරනු ලැබීය. ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය සීමාසහිත සෙන්ට්‍රල් හොස්පිට්ල් සමාගම සමඟ නව ගිවිසුමක් අත්සන් කළ අතර එමගින් එම රෝහල බැහැරින් සේවා ලබා ගැනීම සඳහා නම් කළ එවැනි රෝහලක් බවට පත් කරනු ලැබීය.

**සිවිල් ගුවන් සේවා වෛද්‍ය පරීක්ෂකයන් සඳහා නවක පුහුණුවීම් සැපයීම**

පුද්ගල බලපත්කරණ අංශයට අයත් ගුවන් වෛද්‍ය මධ්‍යස්ථානයට බඳවා ගත් සිවිල් ගුවන් සේවා වෛද්‍ය පරීක්ෂකයින් තිදෙනෙකු ඉන්දියාවේ (ISAM) මගින් කැඳවනු ලැබූ බැංගලෝරයේ පැවැත්වූ ඉන්ඩියන් සොසයිටි ඔෆ් ඒරොස්පේස් මෙඩිසින් (ISAM) හි 54 වන සමුළුවට සහභාගි වූ අතර පුද්ගල බලපත්කරණ වෛද්‍ය පරීක්ෂකයින් සඳහා ක්‍රමවත් කාල පරතර තුළ පැවැත්විය යුතු නවක පුහුණු අවශ්‍යතා සම්පූර්ණ කිරීම සඳහා එම සමුළුවට ඔවුහූ සහභාගී වූහ.

**නව බලපත් නිකුත් කිරීම**

සමාලෝචිත වසර තුළ ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය ගුවන් නියමු බලපත් 255 ක්ද, ගුවන් ගමන් පාලක බලපත් 12 ක්ද, ගුවන් යානා නඩත්තු බලපත් 32 ක් ද, පියසර මෙහෙයුම් නිලධාරි බලපත් 01 ක්ද, මැදිරි සේවක පිරිස් සාමාජික සහතික 77 ක්ද නිකුත් කරනු ලැබීය.

**විදේශීය ගුවන් නියමුවන් බඳවා ගැනීම**

අවශ්‍යතාව පිළිබඳ අවස්ථානුකූලව තක්සේරු කිරීමෙන් අනතුරුව අන්තර්ජාතික ගුවන් ප්‍රවාහණ සමාගම් හා දේශිය ගුවන් ප්‍රවාහණ සමාගම් සඳහා විදේශිය ගුවන් නියමුවන් බඳවා ගැනීම සඳහා අනුමති 24 ක් ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය විසින් නිකුත් කරනු ලැබීය.

**මාලදිවයිනේ ගුවන් නියමු බලපත්‍ර පරීක්ෂා කිරීමේ මධ්‍යස්ථාන ස්ථාපනය කිරීම**

ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය (CAASL) සහ මාලදිවයින් සිවිල් ගුවන් සේවා අධිකාරිය (MCAA) ලෙස පසුව හඳුන්වනු ලැබූ මාලදිවයිනේ සිවිල් ගුවන් සේවා දෙපාර්තමේන්තුව (CADM) අතර අවබෝධතා ගිවිසුමක් 2010 වසරේදී අත්සන් තබන ලැබූ අතර ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ පුද්ගල බලපත්කරණ කාර්යාලය මගින් මාලදිවයිනේ සිවිල් ගුවන් සේවා දෙපාර්තමේන්තුව වෙනුවෙන් ගුවන් නියමු බලපත්කරණ දැනුම පරීක්ෂා කිරීමේ විභාග පැවැත්වීම මෙම අවබෝධතා ගිවිසුම් අභිප්‍රායයි.

2014 වසරේදී, මාලදිවයිනේ සිවිල් ගුවන් සේවා අධිකාරිය (MCAA) විසින් ඉල්ලා සිටි පරිදි සුදුසුකම් ලත් ශිෂ්‍යයින් සඳහා මාලදිවයිනේ ගුවන් නියමු බලපත්කරණ පිළිබඳ දැනුම පරීක්ෂා කිරීමේ විභාගවලට මාලදිවයින තුළදීම පෙනී සිටීමට පහසුකම් සැලැසීම හා හැකියාව ලබා දීම සඳහා වර්තමානයේ ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය මගින් ලබා දෙන සේවා

පියසර නිරුපද්‍රිතතා ශාඛාව

ව්‍යාප්ත කරනු ලැබීය. ඒ අනුව, අන්තර්ජාලය උපයෝගී කරමින් ගනිමින් විභාග ප්‍රශ්න පත්‍ර මාලදිවයිනේ ගැන් දිවයිනට බාර දීම තුළින් එවැනි කාර්ය පටිපාටියක් ක්‍රියාත්මක කිරීමට ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය එකඟත්වය පළ කරනු ලැබීය.

විභාග ප්‍රශ්න පත්‍ර ශිෂ්‍යයින්ට ලබා දීමේ පරිපාලන, කළමනාකරණ හා බාරදීමේ වගකීම ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය මගින් රඳවා තබා ගනු ලබන අතර ගැන් දිවයිනේ විභාග මධ්‍යස්ථානයේ දී විභාගය නිරීක්ෂණය කිරීමේ වගකීම මාලදිවයින් සිවිල් ගුවන් සේවා අධිකාරියට පැවරී තිබේ.

මෙම සමාරම්භක පියවර තුළින්, අසල්වැසි රටවල් අතර ගුවන් සේවා විභාග පැවැත්වීම වැඩි දියුණු කිරීම පිළිබඳ ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ ක්‍රමෝපාය ඉහළ පිළි ගැනීමකට ලක් වන අතර එමගින් ශ්‍රී ලංකාව වෙත අමතර ආදායමක් ද උත්පාදනය කර ගැනීමට හැකි වේ. එමෙන්ම, ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ නිපුණතාව හා හැකියාව දේශසීමා මායිම්වලින් ඔබ්බට රැගෙන යාමට ද මෙමගින් විශාල පිටුබලයක් ලැබේ.

## ගුවන් යෝග්‍යතා අංශය

**අඛණ්ඩව පවත්වා ගත් ගුවන් යෝග්‍යතාව**

ඒ 320 එයාර් බස් වර්ගයේ ගුවන් යානා 09 ක් ද, ඒ 330 එයාර් බස් වර්ගයේ ගුවන් යානා 09 කින් ද, ඒ - 340 එයාර්බර් වර්ගයේ ගුවන් යානා 06 කින් ද සමන්විත වන ශ්‍රී ලංකන් එයාර්ලයින්ස් ගුවන් ප්‍රවාහණ සමාගමේ සම්පූර්ණ ගුවන් යානා ප්‍රමාණය වන ගුවන් යානා 24 නඩත්තු කිරීම පිළිබඳ සෝදිසි ක්‍රියාකාරකම් ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය මගින් ඉටු කරනු ලැබීය. එයට අමතරව, ඒ 320 එයාර්බස් වර්ගයේ ගුවන් යානා 03 කින් සමන්විත වූ මිහින් ලංකා ගුවන් සේවයේ ගුවන් යානාවල සෝදිසි කටයුතු ද අධිකාරිය මගින් අඛණ්ඩව ඉටු කරනු ලැබීය. 2014 වර්ෂයේ දී, ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය මගින් ගුවන් සේවා යෝග්‍යතාව පිළිබඳ මූලික සහතික 14 ක් නිකුත් කළ අතර ගුවන් යෝග්‍යතාව පිළිබඳ සහතික 52 ක් අලුත් කරනු ලැබීය. ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය මගින් දේශීය ගුවන් සේවා කටයුතුවල නිරතව සිටින සමාගම් පිළිබඳ සෝදිසි කටයුතු ද ඉටු කරනු ලැබීය.

**ගුවන් යානා ලියාපදිංචි කිරීම**

සමාලෝචිත කාල සීමාව තුළ, ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය මගින් ගුවන් යානා 16 ක් සඳහා මූලික ලියාපදිංචි කිරීමේ කටයුතු ඉටු කළ අතර ගුවන් යානා 54 ක් සඳහා ලියාපදිංචි කිරීමේ සහතිකය අලුත් කිරීමේ කටයුතු ද ඉටු කරනු ලැබීය. සීමාසහිත ශ්‍රී ලංකන් එයාර්ලයින්ස් සමාගමේ ගුවන් මෙහෙයුම්කරු සහතිකය යටතේ මෙහෙයුම් කටයුතු සිදු කිරීම සඳහා හිමිකරුගේ ඉල්ලීම පරිදි ගුවන් යානා 03 ක අයිතිය මාරු කරනු ලැබීය.

**නිරුපද්‍රිතතා ප්‍රමාද දෝෂ**

අනුමත රැම්ප් පරීක්ෂණ කාර්ය සටහනට අනුකූලව 2014 වසර තුළ රැම්ප් පරීක්ෂණ 187 ක් ද, ඒකාබද්ධ පරීක්ෂණ 45 ක් ද සිදු කරනු ලැබීය. රැම්ප් පරීක්ෂණ සිදු කරන අතරතුර දෝෂ 147 ක් හඳුනා ගන්නා ලද අතර ඒවා කඩිනමින් නිවැරදි කිරීම සඳහා ඒ පිළිබඳව අදාළ මෙහෙයුම්කරුවන්ට දැනුම් දෙනු ලැබිණි.

**ගමන් යානා නඩත්තු සංවිධාන**

අවශ්‍ය තස්සේරු කිරීම් සිදු කිරීමෙන් අනතුරුව ගුවන් යානා නඩත්තු සංවිධාන 10 ක් සඳහා මූලික අනුමති ලබා දී තිබූ අතර 2014 වසරේ දී, විදේශීය රටවල් පාදක වූ රේබිය නඩත්තු සංවිධාන 54 ක් සහ දේශීය නඩත්තු සංවිධාන 13 ක අනුමති නැවත අලුත් කරනු ලැබීය.

**තුන්වන පාර්ශ්වයේ නඩත්තු කටයුතු**

ශ්‍රී ලංකාව වෙත සහ ශ්‍රී ලංකාවෙන් පිටතට මෙහෙයුම් කටයුතු සිදු කරන විදේශීය ගුවන් ප්‍රවාහණ සමාගම්වලට අයත් ගුවන් යානා වෙනුවෙන් තෙවන පාර්ශ්වයේ නඩත්තු කටයුතු ඉටු කිරීම සඳහා එමිරේට්ස් සහ ජෙට් ගුවන් ප්‍රවාහණ සමාගම්වල නඩත්තු පහසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව, එම සමාගම් සඳහා ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය මගින් අනුමතිය ලබා දෙනු ලැබිණි.

**නඩත්තු ඉංජිනේරු බලපත්‍ර විභාග**

2014 ජූනි හා දෙසැම්බර් මාසවල දී AML විභාග දෙකක් පවත්වනු ලැබූ අතර පිළිවෙළින් විභාග අපේක්ෂකයෝ 228 දෙනෙක් සහ 293 දෙනෙක් ඔවුන් තෝරාගත් විභාග විෂය ප්‍රශ්න පත්‍ර සඳහා පෙනී සිටියහ.

**ගුවන් යානා අමතර කොටස් සඳහා ආනයන/අපනයන අනුමත කිරීම්**

ගුවන් යෝග්‍යතා අංශයේ නිර්දේශය මත සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් ගුවන් යානා අමතර කොටස් ආනයනය සහ අපනයනය කිරීම සඳහා අනුමතිය ලබා දෙනු ලැබීය. සමාලෝචිත වර්ෂය තුළ ෆිට්ස් ඒවියේෂන් සමාගමේ අයදුම් පත්‍ර 35 ක්ද, මිලේනියම් එයාර්ලයින්ස් සමාගමේ අයදුම් පත්‍ර 22 ක් ද, ඒෂියන් ඒවියේෂන් සෙන්ටර් සමාගමේ අයදුම් පත්‍ර 05 ක්ද, දයා ඒවියේෂන් සමාගමේ අයදුම්පත් 05 ක්ද, කොස්මොස් ඒවියේෂන් සර්විසස් සමාගමේ අයදුම් පත්‍ර 33 ක්ද, ස්කයිලයින් ඒවියේෂන් සමාගමේ අයදුම් පත්‍ර 08 ක්ද ඔපන් ස්කයිස් සමාගමේ අයදුම් පත්‍ර 45 ක්ද, සෙනොක් ඒවියේෂන් සමාගමේ අයදුම් පත්‍ර 24 ක් සහ සිනමන් එයාර් සමාගමේ අයදුම් පත්‍ර 55 ක්ද සඳහා නිර්දේශ ලබා දෙනු ලැබිණි.

## වීසා සඳහා නිර්දේශ

ශ්‍රී ලංකාවේ රාජකාරී කිරීම සඳහා පත් කළ හෝ ශ්‍රී ලංකාව තුළ සේවයේ නියුතු විදේශීය භූමි ඉංජිනේරුවරුන් සඳහා ගොඩ බැස්ස වීමේ අනුමතිය හා නේවාසික වීසා ලබා දීම සඳහා ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය නිර්දේශ ඉදිරිපත් කරනු ලැබීය. සමාලෝචිත වසර තුළ, ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය භූමි ඉංජිනේරුවරුන් සඳහා නිර්දේශ 28 ක් ද, නඩත්තු කටයුතු පුහුණු වන ශිෂ්‍යයින් සඳහා නිර්දේශ 72 ක් ද නිකුත් කරනු ලැබිණි.

# ඒකාබද්ධ ශාඛාව

## ගුවන් ප්‍රවාහන සහ නීති කටයුතු අංශය

2014 වර්ෂය තුළ, මගී, භාණ්ඩ හා ගුවන් යානා සංචලනවල වැඩි වීමත් සමග ශ්‍රී ලංකා ගුවන් ප්‍රවාහණ අංශය පූර්ණ වශයෙන් සාධනීය වර්ධනයක් අත් පත් කර ගැනීමට සමත් විය. එමෙන්ම, ද්වි පාර්ශ්වික ගුවන් සේවා සැලසුම් වැඩි දියුණු කර ගැනීමටද ශ්‍රී ලංකාවට හැකියාව ලැබී තිබේ.

**ගුවන් ප්‍රවාහන සමාගම්වල මෙහෙයුම් කටයුතු**

විදේශීය ගුවන් මෙහෙයුම්කරුවන් තිදෙනෙකු හැර, අනෙකුත් සියලුම විදේශීය ගුවන් ප්‍රවාහණ සමාගම් පසුගිය වර්ෂයේ දී මෙන්ම සමාලෝචිත වර්ෂය තුළ ද ඔවුන්ගේ මෙහෙයුම් කටයුතු ශ්‍රී ලංකාව තුළ සිදු කරනු ලැබූ අතර අබුඩාබි රාජ්‍යයේ ගුවන් ප්‍රවාහන සමාග මක් වන රොටානා ජෙට් සමාගම අප්‍රේල් මාසයේ දී කොළඹ සහ මත්තල අතර ඔවුන්ගේ ගුවන් මෙහෙයුම් කටයුතු ආරම්භ කරන ලදී.

ශ්‍රී ලංකන් එයාර්ලයින්ස් සමාගම සමඟ එමිරේට්ස්, බ්‍රිටිෂ් එයාර්වේස්, සිංගපෝර් එයාර්ලයින්ස්, තායි එයාර්වේස්, එටිහාඩ් එයාර්වේස්, කටාර් එයාර්වේස් හා කොරියන් එයාර් යනාදි ලෝකයේ ප්‍රධාන පෙළේ සියළු පහසුකම් සහිත ගුවන් ප්‍රවාහණ සමාගම් මගින් මෙම වසර තුළ ශ්‍රී ලංකාවේ මගී මෙහෙයුම් කටයුතුවල වර්ධනයට විශාල දායකත්වයක් සපයනු ලැබීය .

මිහින් ලංකා ගුවන් ප්‍රවාහණ සමාගම සමඟ එයාර් ඒෂියා එක්ස්, එයාර් ඇරබියා, ෆ්ලයි ඩුබායි හා ස්පයිස් ජෙට් යන ගුවන් ප්‍රවාහණ සමාගම් ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන අඩු පිරිවැය ගුවන් මෙහෙයුම්කරුවන් ලෙස ශ්‍රී ලංකා ගුවන් සේවා කර්මාන්තයට මගී සංචලන වැඩි ප්‍රමාණයක් එක් කරනු ලැබීය.

ඉහත සඳහන් උපලේඛනගත මෙහෙයුම්කරුවන්ට අමතරව, ලොට් පෝලිශ් (පෝලන්තයේ වෝර්සෝනග රයේ සිට) ඔරෙන්බර්ග් (රුසියාවේ මොස්කව් නගරයේ ශේරිමේටියෝවෝ සිට) ට්‍රාස්ඒරෝ (රුසියාවේ මොස්කව් නගරයේ ඩොමොඩෙඩෝවෝ සිට) ට්‍රැවල් සර්විස් (චෙක් ජනරජයේ ප්‍රාග් නගරයේ සිට) විම් එයාර්ලයින්ස් (රුසියාවේ මොස්කව් නගරයේ ඩොමොඩෙඩෝවෝ සිට) හා ට්‍රැවල් සර්විස් පොල්ස්කා (පෝලන්තයේ වෝර්සෝ නගරයේ සිට) සියළු පහසුකම් සහිත කුලී ගුවන් ප්‍රවාහන මෙහෙයුම්කරුවන් ලෙස 2013/2014 IAIA ශිශිර සෘතුවේ දී ශ්‍රී ලංකාව තුළ ඔවුන්ගේ කුලී ගුවන් ගමන් සේවා මෙහෙයුම් කටයුතු පවත්වාගෙන යනු ලැබීය. වසර 9 කට පසුව 2013/14 IAIA ශිශිර සෘතුව තුළ විම් එයාර්ලයින්ස් ගුවන් ප්‍රවාහණ සමාගම ශ්‍රී ලංකාව තුළ ඔවුන්ගේ කුලී ගුවන් ගමන් මෙහෙයුම් කටයුතු ආරම්භ කරනු ලැබීය.

සමාලෝචිත වර්ෂය තුළදී, උපලේඛනගත ගුවන් මෙහෙයුම්කරුවන් වන රෝයල් ජෝර්දානියන් (ජෝර්දානයේ අම්මාන් නගරයේ සිට) එයාර් ඉන්ඩියා එක්ස්ප්‍රස් (ඉන්දියාවේ චෙන්නායි නගරයේ සිට) හා මෝල්ඩිවියන් එයාර්ලයින්ස් (මාලදිවයිනේ සිට) ශ්‍රී ලංකාව තුළ ඔවුන්ගේ මෙහෙයුම් කටයුතු නවතාලනු ලැබූහ.

මෙම වසර තුළ, සංචාරකයන්ට ශ්‍රී ලංකාව වෙත පැමිණීමට හෝ ශ්‍රී ලංකාවෙන් පිටතට ගමන් කිරීම සඳහා ලබා ගත හැකි ගමනාන්ත ප්‍රමාණය තවදුරටත් පුළුල් කරමින්, ප්‍රමුඛ පෙළේ අන්තර්ජාතික මාර්ගගත මෙහෙයුම්කරුවන් විසින් ඔවුන්ගේ ගුවන් සේවා ගිවිසුම් ප්‍රකාරව එකම පාර්ශ්වයේ හා තෙවන පාර්ශ්වයේ ගුවන් ප්‍රවාහණ සමාගම් සමඟ ඒකාබද්ධව ශ්‍රී ලංකාව සම්බන්ධ ආසන වෙන් කිරීමේ කටයුතු කැපී පෙනෙන මට්ටමින් ඉහළ දමනු ලැබීය. ලෝකයේ එතරම් නොදන්නා පුරවර දැක බලා ගැනීම සඳහා මෙන්ම එම රටවල් සමඟ සම්බන්ධතා වැඩි දියුණු කර ගැනීම සඳහා මෙමගින් මාහැඟි සේවයක් ඉටු විය.

සමාලෝචිත වසර තුළදී, ශ්‍රී ලංකන් එයාර් ලයින්ස්, එටිහාඩ් එයාර්වේස්, මැලේෂියා එයාර්ලයින්ස් සහ එමිරේට්ස් යනාදි ගුවන් ප්‍රවාහණ සමාගම් මෙහෙයුම් ගුවන් ප්‍රවාහණ සමාගම් ලෙස ශ්‍රී ලංකාව තුළ ආසන වෙන් කර ගැනීමේ මෙහෙයුම් වැඩි වශයෙන්ම සිදු කරන ලද ප්‍රධාන පෙළේ මාර්ගගත ගුවන් ප්‍රවාහන සමාගම් විය.

ශ්‍රී ලංකන් එයාර්ලයින්ස් සමාගම "එක් ලොවක්" (One World) ගුවන් ප්‍රවාහණ සන්ධානය සමඟ මැයි මාසයේ දී ඒකාබද්ධ විය. අනෙකුත් ගුවන් ප්‍රවාහණ සමාගම් සමඟ සහයෝගීතාවෙන් මෙම සන්ධානයට අයත් රටවල් සමඟ ඒකාබද්ධව නව ගමනාන්ත කීපයක් හඳුන්වා දීම තුළින් එම ගුවන් මාර්ග ජාලය පුළුල් කර ගැනීමට "එක් ලොවක්" (One World) ගුවන් ප්‍රවාහණ

සන්ධානයට හැකියාව ලැබුණි. ශ්‍රී ලංකන් එයාර්ලයින්ස් ගුවන් ප්‍රවාහණ සමාගම චීනයේ කුන්මින්ග් (KMG) වෙත උපලේඛනගත ගුවන් මෙහෙයුම් කටයුතු ආරම්භ කළ අතර, චීනයේ චොංග්චින්ග් (One World) වෙත උපලේඛනගත කුලී ගුවන් මෙහෙයුම් කටයුතු ද ආරම්භ කිරීමට හැකි විය. 2015 මාර්තු මාසය දක්වා මෙම චොංග්කින්ග් මෙහෙයුම් කටයුතු අඛණ්ඩව සිදු වනු ඇත.

ශ්‍රී ලංකාව පාදක කරගත් එකම අඩු පිරිවැය ගුවන් ප්‍රවාහණ සමාගම වන මිහින් ලංකා සමාගම නව ගමනාන්තයක් ලෙස පකිස්ථානයේ ලාහෝර් නගරය (LHE) වෙත මෙහෙයුම් කටයුතු ආරම්භ කරනු ලැබීය. එමෙන්ම, මිහින් ලංකා ගුවන් ප්‍රවාහණ සමාගම ශ්‍රී ලංකන් ගුවන් ප්‍රවාහණ සමාගම සමඟ සහයෝගීතාවෙන් විවිධ ගමනාන්ත සඳහා ගුවන් යානා ආසන වෙන් කිරීම පිළබඳ මෙහෙයුම් කටයුතු ද අඛණ්ඩව සිදු කරනු ලබයි.

**මගී සහ ගුවන් භාණ්ඩ සංචලන**

2014 වසර තුළ දී, මගී සහ ගුවන් භාණ්ඩ සංචලනවල කැපී පෙනෙන වර්ධනයක් සනිටුහන් කිරීමට හැකියාව ලැබුණි. බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපලට පැමිණි මගීන් පිරිසේ එකතුව 3,893,400 ක් වූ අතර එම ගුවන් තොටුපලෙන් පිටත්ව ගිය මගීන් සංඛ්‍යාවේ එකතුව 3,926,447 ක් විය. ශ්‍රී ලංකන් එයාර්ලයින්ස් ගුවන් සමාගම ශ්‍රී ලංකාව වෙත පැමිණි මගීන් අතරින් 2,085,698 දෙනෙකු සඳහා ගුවන් ප්‍රවාහණ සේවා ලබා දෙමින් මෙම මගී වෙළඳපොළ කොටස් 54% ක් ද, ශ්‍රී ලංකාවෙන් පිටත්ව ගිය මගීන් අතරින් 2,083,694 දෙනෙකු සඳහා ගුවන් ප්‍රවාහණ සේවා ලබා දෙමින් මෙම මගී වෙළඳපොළ කොටස් 53% ක් ද නියෝජනය කිරීමට සමත් විය.

මත්තල රාජපක්ෂ අන්ර්ජාතික ගුවන් තොටුපල වෙත පැමිණි අන්තර්ජාතික මගීන් පිරිසේ එකතුව 10,837 වූ අතර එයින් පිටව ගිය මගීන් පිරිස 9637 ක් විය. එමෙන්ම, 2014 වසරේ පටවන ලද භාණ්ඩ තොගය මෙට්‍රික්ටොන් 4 ක් වූ අතර ගොඩ බාන ලද භාණ්ඩ ප්‍රමාණය මෙට්‍රික් ටොන් 65 ක් විය.

2014 වර්ෂයේ දී පටවනු ලැබූ මුළු භාණ්ඩ ප්‍රමාණය වූ මෙට්‍රික් ටොන් 115,400 න් මෙට්‍රික් ටොන් 53,584 ක භාණ්ඩ ප්‍රමාණයක් පටවා 46% ක වෙළඳපොළ කොටසක් හිමි කර ගැනීමට සමත් වූ ශ්‍රී ලංකන් එයාර්ලයින්ස් සමාගම විසින් 2014 වසරේ දී ගොඩ බාන ලද මුළු භාණ්ඩ ප්‍රමාණය වූ මෙට්‍රික් ටොන් 77,040 න් මෙට්‍රික් ටොන් 42,412 ක භාණ්ඩ ප්‍රමාණයක් ගොඩ බෑම මගින් 55% ක වෙළඳපොළ කොටසක් හිමි කර ගන්නා ලදී.

**සංක්‍රමණ මගීන්**

කලාපීය ගුවන් තොටුපල මධ්‍යස්ථානයක් ලෙස බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපල වැඩි දියුණු කිරීම සඳහා වැඩි දියුණු කළ යුතු හා සංවර්ධනය කළ යුතු වැදගත් ක්ෂේත්‍රයක් වන්නේ එම ගුවන්තොටුපල පසු කර යන සංක්‍රමණ ගුවන් මගීන් සංඛ්‍යාව වැඩි කිරීම සඳහා කටයුතු කිරීමයි. බණ්ඩාරනායක අන්තර්ජාතික ගුවන් තොටුපලේ මුළු සංක්‍රමණ මගීන් සංඛ්‍යාව

| | මගීන් | | | භාණ්ඩ ( මෙට්‍රික් ටොන් ) | | |
|---|---|---|---|---|---|---|
| | පැමිණීම් | පිටවීම් | එකතුව | පටවනු ලැබූ | ගොඩ බාන ලද | එකතුව |
| 2013 | 3,690,047 | 3,621,822 | 7,311,842 | 119,447, | 71,776 | 191,224 |
| 2014 | 3,893,400 | 3,926,447 | 7,819,847 | 115,400 | 77,040 | 192,440 |

1,194,270 ක් වූ අතර ශ්‍රී ලංකන් එයාර්ලයින්ස් ගුවන් සමාගම සංක්‍රමණ මගීන් 9,84,532 ක් සඳහා ප්‍රවාහන සේවා සපයා 82% ක් වූ වෙළඳපොළ කොටසක් හිමි කර ගන්නා ලදී.

**සාමාන්‍ය ගුවන් සේවා සංවර්ධනය**

උණුසුම් වායු බැලුන් මෙහෙයුම් කටයුතු ඉතා සාර්ථකව සිදු කිරීමට 2014 වසර තුළ දී හැකියාව ලැබුණි. සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීමට උපයෝගී කර ගත හැකි බැලුන් මෙහෙයුම් කටයුතු දඹුල්ල හා අහුංගල්ල යන ප්‍රදේශවල වර්තමානයේ සිදු කෙරෙමින් පවතී.

ස්කයි ක්ලබ් (පුද්) සමාගම විසින් 2011 වර්ෂයේ දී පැරා මෝටරින් සංකල්පය ප්‍රථම වතාවට ශ්‍රී ලංකාවට හඳුන්වා දෙනු ලැබීය. ස්කයි ක්ලබ්, සවුත් ඒෂියා ඒවියේෂන් ඇකඩමි, කුල් ඇඩවෙන්චර් ක්ලබ් සහ නිගම්බෝ ඒරො ක්ලබ් යන ආයතන ඒවායේ බලගැන්වූ පැරා මෝටරින් මෙහෙයුම් කටයුතු සමාලෝචිත වර්ෂය තුළ කොග්ගල, කල්පිටිය, පුත්තලම, බෙන්තොට හා මුන්දලම යන ප්‍රදේශවල ස්ථාපනය කරන ලද ස්ථානවල දී සිදු කරනු ලැබිණි.

ස්වදේශකයින්ට අයත් වූ ඉතා සැහැල්ලු ගුවන් යානා දෙකක් කටුකුරුන්ද ගුවන්තොට ප්‍රදේශයේ සිට පුද්ගලික මෙහෙයුම් කටයුතු අඛණ්ඩව සිදු කරනු ලැබීය. දුරස්ථ පාලක ආදර්ශ ගුවන් යානා සමාජ මගින් මීගමුව, කඩවත, කටුකුරුන්ද හා පානදුර යන ප්‍රදේශවල අනුමත කරනු ලැබූ ස්ථානවලදී දුරස්ථ පාලක ආදර්ශ ගුවන් යානා පියාසර කරවීමේ කටයුතු අඛණ්ඩව සිදු කරනු ලැබීය.

සිනමන් එයාර් ගුවන් ප්‍රවාහණ සේවය උපලේඛනගත දේශීය ස්තම්භ තටු/උභය මගී සේවා ගුවන් යානා මෙහෙයුම්කරුවකු ලෙස දිවයිනේ අනුමත ජල ගගන යාත්‍රාංගණ සඳහා ඔවුන්ගේ මෙහෙයුම් කටයුතු අඛණ්ඩව සිදු කරනු ලැබූ අතර ෆිට්ස් ඒවියේෂන් ගුවන් ප්‍රවාහණ සේවය 2014 අප්‍රේල් මාසය වන තුරු රත්මලාන හා යාපනය අතර ඔවුන්ගේ මෙහෙයුම් කටයුතු සිදු කරනු ලැබීය. එමෙන්ම දයා ඒවියේෂන් ලිමිටඩ් ගුවන් ප්‍රවාහණ සමාගමද ඔවුන්ගේ පුද්ගලික/වාණිජ ස්තම්භ තටු ගුවන් යානා මෙහෙයුම් කටයුතු සමාලෝචිත වර්ෂය තුළදී අඛණ්ඩව සිදු කරනු ලැබීය.

සීමාසහිත ඩෙකාන් ඒවියේෂන් (ලංකා) සමාගම ලෙස මුලින් හඳුන්වනු ලැබූ සීමාසහිත මිලේනියම් එයාර්ලයින්ස් (පුද්) සමාගම 2004 ජූනි මාසයේදී හෙලිකොප්ටර් මෙහෙයුම් කටයුතු ආරම්භ කිරීමෙන් අනතුරුව දිවයින තුළ ගමනාන්ත කිහිපයකට ඔවුන්ගේ මෙහෙයුම් සේවා පවත්වාගෙන යනු ලැබීය. එමෙන්ම කොස්මොස් ඒවියේෂන් සහ සෙනොක් ඒවියේෂන් ඔවුන්ගේ හෙලිකොප්ටර් මෙහෙයුම් කටයුතු මෙම වසර තුළ දී අඛණ්ඩව පවත්වා ගනු ලැබිණි. (IWS) ඒවියේෂන් සමාගම ඔවුන්ගේ දේශීය හෙලිකොප්ටර් සේවා 2014 ඔක්තෝබර් මාසයේදී ආරම්භ කරනු ලැබීය. ශ්‍රී ලංකන් එයාර්ලයින්ස් සමාගම කටුනායක හා මත්තල අතර උපලේඛනගත දේශීය ස්තම්භ තටු මගී ගුවන් ප්‍රවාහන සේවා ආරම්භ කරනු ලැබීය.

ප්‍රධාන වශයෙන්ම ශ්‍රී ලංකන් එයාර්ලයින්ස් සමාගම විසින් කටුනායක හා මත්තල අතර ගුවන් ගමන් මෙහෙයවීම හේතුවෙන් 2013 වසරේදී වාර්තාගත වූ මගී සංචලන 557 ට සාපේක්ෂව 2014 වසරේදී මගී සංචලන ප්‍රමාණය 26,909 ක් ලෙස වර්ධනය වීම මගින් දේශීය ස්තම්භ තටු ගුවන් යානා මෙහෙයුම් කටයුතු වල කැපී පෙනෙන ප්‍රගමනයක් සිදු විය. එසේ වුවද, දේශිය හෙලිකොප්ටර් මෙහෙයුම් කටයුතුවල කැපී පෙනෙන වෙනසක් සිදු නොවීය. හෙලිකොප්ටර් මගින් ප්‍රවාහණය කළ මගීන් සංඛ්‍යාව 2013 වසරේදී 1984 ක් ද, 2014 වසරේදී 1659 ක් ද විය.

දේශීය ගුවන් සේවාවේ කාර්යසාධනය පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

**සංචාරක නියෝජිතයින්**

1992 අංක 55 දරන ගුවන් සංතරණ (විශේෂ විධිවිධාන) පනත යටතේ දැක්වෙන රෙගුලාසිවලට අනුව ශ්‍රී ලංකාවේ සියලුම සංචාරක නියෝජිතයින් හා ශ්‍රී ලංකාවේ වෙනත් ගුවන් ප්‍රවාහණ සේවා ප්‍රතිග්‍රාහකයන් විසින් ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය මගින් නිකුත් කරනු ලබන බලපත්‍රය ලබා ගත යුතු වන අතර ව්‍යාපාරය අඛණ්ඩව පවත්වා ගැනීම සඳහා එම බලපත්‍ර වාර්ෂිකව අළුත් කළ යුතුය.

| ගුවන් යානා වර්ගය | ගුවන් ගමන් සංඛ්‍යාව | | ගමන් කළ මගීන් සංඛ්‍යාව | |
|---|---|---|---|---|
| | 2014 | 2013 | 2014 | 2013 |
| ස්තම්භ තටු (භූමි) | 1224 | 1842 | 21126 | 4239 |
| ස්තම්භ තටු (ඉපිලි යානා) | 1629 | 316 | 5783 | 1335 |
| හෙලිකොප්ටර් | 443 | 351 | 1659 | 1984 |
| බැලූන් | 135 | 156 | 945 | 1019 |

2014 වසර අවසානයේදී ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය මගින් ගුවන් ප්‍රවාහණ සේවා මෙහෙයුම්කරුවන් 588 ක් සඳහා බලපත්‍ර නිකුත් කරන ලද අතර අධිකාරිය මගින් පවත්වාගෙන යනු ලබන වෙබ් අඩවිය උපයෝගී කර ගනිමින් බලපත්‍රලාභීන්ගේ ලැයිස්තුවක් සෑම මාසයකදීම යාවත්කාලීන කරනු ලැබේ.

**ගුවන් ප්‍රවාහණ කර්මාන්තය නියාමනය කිරීම**

සංචාරක නියෝජිතායතන සඳහා වන බලපත්‍රකරණ ක්‍රියාවලියේ කොටසක් ලෙස තක්සේරුකරණ රැස්වීම් පවත්වනු ලැබූ අතර එම තක්සේරුකරණ රැස්වීම්වල දී සංචාරක නියෝජිතායතනවල යෝග්‍යතාව තහවුරු කරනු ලැබීය. තවද, කර්මාන්තය හා මහජනතාව සම්බන්ධයෙන් සංචාරක නියෝජිතයින් සතු වගකීම පිළිබඳව ද මෙහි දී අදාළ කළමනාකාරීත්වය දැනුවත් කරනු ලැබීය.

**ගුවන් ප්‍රවාහන කර්මාන්තයේ/වාණිජ දෙපාර්තමේන්තුවේ පාර්ශ්වකරුවන් සමග රැස්වීම් පැවැත්වීම**

ගුවන් ප්‍රවාහණ කර්මාන්තයේ ධනාත්මක සංවර්ධනයක් තහවුරු කිරීම සඳහා මෙම අංශය සිවිල් ගුවන් සේවා කර්මාන්තයට අදාළ ආයතන වන ගුවන් ප්‍රවාහණ සමාගම් නියෝජිත මණ්ඩලය, ගුවන් ප්‍රවාහණ සමාගම් නියෝජිතයන්ගේ ශ්‍රී ලංකා සංගමය ශ්‍රී ලංකා සංචාරක නියෝජිතයින්ගේ සංගමය හා IATA නියෝජිතවරුන්ගේ සංගමය හා වාණිජ දෙපාර්තමේන්තුව වැනි රාජ්‍ය ආයතන සමග රැස්වීම් පවත්වනු ලැබීය.

**අන්තර්ජාතික ගුවන් ප්‍රවාහණයේ ඇතැම් නියමයන් සම්බන්ධයෙන් එක්සත්ව කටයුතු කිරීම පිළිබඳ මොන්ට්‍රියල් සම්මුතිය අනුමත කිරීම.**

ලාභ අපේක්ෂාවෙන් ගුවන් ප්‍රවාහණ සමාගම් මගින් සිදු කරනු ලබන අන්තර්ජාතික මගීන්, ගමන් බඩු හා ගුවන් භාණ්ඩ තොග ප්‍රවාහණය සම්බන්ධව අන්තර්ජාතිකව පිළිගත් නියමයන් පිළිබඳ වර්තමාන ක්‍රමය තහවුරු කරන 1999 මොන්ට්‍රියල් සම්මුතිය පිළිගැනීම සඳහා ශ්‍රී ලංකාව විසින් පියවර ගෙන තිබේ. ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ දායකත්වය මත පදනම් වෙමින් නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව මගින් ''ගුවන් ප්‍රවාහණ පනත'' යනුවෙන් හඳුන්වනු ලබන නිතී කෙටුම්පතක් විධිමත්ව සකස් කරනු ලැබීය. 2014 අගෝස්තු මාසයේ දී මෙම පනත් කෙටුම්පත අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ඒ සම්බන්ධ කරුණු ඉදිරිපත් කිරීම සඳහා එය අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරනු ලැබූ අමාත්‍ය මණ්ඩල අනු කමිටුවකට යොමු කරනු ලැබීය. 2015 වසරේදී මෙම ගුවන් ප්‍රවාහණ පනත් කෙටුම්පත නීතියක් ලෙස සම්මත වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

**ද්විපාර්ශ්වික ගුවන් සේවා සාකච්ඡා**

ශ්‍රී ලාංකික නියෝජිත පිරිසේ සාමාජිකයකු ලෙස ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය විදේශීය ගගන නාවික අධිකාරීන් අතර පවත්වනු ලැබූ ද්විපාර්ශ්වික ගුවන් සේවා සාකච්ඡා කිහිපයක් සඳහා සහභාගී විය. තනි පුද්ගල රාජ්‍යයන් සමග සාකච්ඡා වට පහක් පවත්වා තිබේ. 2014 නොවැම්බර් මාසයේදී ඉන්දුනිසියාවේ බාලි නගරයේ පවත්වන ලද අන්තර්ජාතික සිවිල් ගුවන් සේවා සංවිධානයේ ගුවන් සේවා සාකච්ඡා පිළිබඳ සමුළුවට ද ශ්‍රී ලංකා ගුවන් සේවා අධිකාරිය සහභාගී විය. මෙම සාකච්ඡාවලින් ලබාගත් ප්‍රතිඵල පහත දක්වා තිබේ.

**සර්බියාව (බෙල්ග්‍රේඩ් නගරය - ජුනි මාසය)**

ශ්‍රී ලංකාව හා සර්බියාව අතර ප්‍රථම ද්විපාර්ශ්වික ගුවන් සේවා ගිවිසුම ආරම්භ කරනු ලැබීය. එකඟත්වය පළ කරන ලද සේවා ලබා දීම සඳහා සතියකට 07 වරක් මෙහෙයුම් කටයුතු සිදු කිරීමට දෙරටේම නම් කරන ලද ගුවන් සේවා සමාගම්වලට අවසර ලබා දීම පිණිස අවබෝධතා ගිවිසුමක් ද අත්සන් තබනු ලැබීය.

**බල්ගේරියාව (සොෆියා නගරය - ජුනි මාසය)**

1970 දී අත්සන් තබන ලද මුල් ගිවිසුම ඉවත් කරමින් ඒ වෙනුවට නව ගුවන් ප්‍රවාහණ ගිවිසුමක් ආරම්භ කරනු ලැබීය. කිසිදු සීමා කිරීමක් නොමැතිව 3 වන හා 4 වන නිදහස් ගුවන් භාණ්ඩ හා මගී ප්‍රවාහණ අයිතිවාසිකම් භාවිත කිරීමට ඒ ඒ දේශයේ නම් කරන ලද ගුවන් ප්‍රවාහන සමාගම්වලට අවසර ලබා දීම සඳහා අවබෝධතා ගිවිසුමක් ද අත්සන් තබනු ලැබීය.

**පෝලන්තය (වෝර්සෝ නගරය - ජුලි මාසය)**

නව ගුවන් ප්‍රවාහණ ගිවිසුමක් ආරම්භ කරනු ලැබූ අතර කිසිදු සීමා කිරීමක් නොමැතිව 3 වන හා 4 වන නිදහස් ගුවන් භාණ්ඩ හා මගී ප්‍රවාහණ අයිතිවාසිකම් භාවිත කිරීමට ඒ ඒ දේශයේ නම් කරන ලද ගුවන් ප්‍රවාහණ සමාගම්වලට අවසර ලබා දීම සඳහා අවබෝධතා ගිවිසුමක් ද අත්සන් තබනු ලැබීය.

**බ්‍රසීලය (රියෝ ද ජැනීරෝ - අගොස්තු මාසය)**

ශ්‍රී ලංකාව හා බ්‍රසීලය අතර ප්‍රථම ගුවන් ප්‍රවාහණ ගිවිසුම ලෙස ඒ ඒ දේශයේ නම් කරන ලද ගුවන් ප්‍රවාහණ සමාගම්වලට ඔවුන් තීරණය කරනු ලබන ආකාරයෙන් මෙහෙයුම් කටයුතු සිදු කිරීම සඳහා ඉහළ මට්ටමේ නිදහසක් ලබා දෙන අයිතිවාසිකම් සහිත ''විවෘත ගුවන් තල'' ගිවිසුමක් ආරම්භ කරනු ලැබීය.

**ඕමානය (කොළඹ - ඔක්තෝබර් මාසය)**

අවබෝධතා ගිවිසුමක් අත්සන් කරනු ලැබූ අතර මෙමගින් ගුවන් භාණ්ඩ හා මගී ප්‍රවාහණ අයිතිවාසිකම් පුළුල් කිරීමක් සිදු කරනු ලැබීය.

**අන්තර්ජාතික සිවිල් ගුවන් සේවා සංගමයේ ගුවන් සේවා සාකච්ඡා පිළිබඳ සමුළුවේදී පවත්වනු ලැබූ සාකච්ඡා**

2014 පැවැත්වූ සමුළුවේදී පහත සඳහන් නියෝජිත පිරිස් මුණ ගැසී සාකච්ඡා පැවැත්වීමට ශ්‍රී ලංකා නියෝජිත පිරිසට හැකි විය.

**නෝර්දික් රාජ්‍යයන්**

පැවැත් වූ සාකච්ඡා පිළිබඳ විස්තර සපයමින් දෙපාර්ශ්වයේ එකඟතාව පළ වූ වාර්තාවට ශ්‍රී ලංකාව හා නෝර්දික් රාජ්‍යය විසින් අත්සන් තබනු ලැබීය. නෝර්දික් නියෝජිත පිරිසට පැහැදිලි කර ගැනීමට අවශ්‍ය වූ ඇතැම් කරුණු පැවති බැවින් ශ්‍රී ලංකාව හා නෝර්වේ/ස්වීඩනය/ඩෙන්මාර්කය අතර පැවැති ගිවිසුම වෙනුවට අත්සන් තැබීමට නියමිත නව ගුවන් සේවා ගිවිසුමේ අන්තර්ගතය පිළිබඳව ශ්‍රී ලංකාව හා නෝර්වේ රාජ්‍යය සාකච්ඡාවක නිරත වූහ. නුදුරු අනාගතයේදී ඉදිරි ක්‍රියාමාර්ග වෙත අවතීර්ණ වීමේ අභිප්‍රාය පිළිබඳව දෙපාර්ශ්වයම කරුණු දක්වා සිටියහ.

**ඉරානය**

පවත්වන ලද සාකච්ඡා පිළිබඳව සවිස්තරාත්මකව සඳහන් කරමින් දෙපාර්ශ්වයේම එකඟතාව පළ වූ වාර්තාවට ශ්‍රී ලංකාව හා ඉරානය යන රාජ්‍යයන් අත්සන් තැබූහ. එක් එක් පාර්ශ්වයේ නම් කරන ලද ගුවන් ප්‍රවාහණ සමාගම්වලට සතියකට වරක් ගුවන් ගමන් වාර 07 ක් බැගින් මෙහෙය වීමේ හිමිකම ලබා දීමට දෙපාර්ශ්වයම එකඟ වූහ. ගුවන් යානා ආසන වෙන් කිරීම පිළිබඳ 3 වන පාර්ශ්වයේ කොන්දේසියකට ද මෙම පාර්ශ්ව දෙක එකඟ වූ අතර නම් කළ ගුවන් ප්‍රවාහණ සමාගම්වලට වාණිජමය හවුල්කාරීත්වයන් ස්ථාපනය කර ගැනීමට ද මෙම ගින් ඉඩකඩ සැලසී තිබේ. කුලී ගුවන් ගමන් මෙහෙයුම් කටයුතු ප්‍රවර්ධනය කිරීමට ද ශ්‍රී ලංකාව හා ඉරානය එකඟ වූ අතර එම රාජ්‍යයන් අතර ගුවන් භාණ්ඩ තොග ප්‍රවාහණය කිරීම සඳහා සීමාරහිත ගුවන් ගමන් වාර සංඛ්‍යාවක් මෙහෙයවීම සඳහා අවසර ලබා දීමටද මෙම රාජ්‍යයන් දෙක එකඟතාව පළ කර තිබුණි.

**ඔස්ට්‍රියාව**

සාකච්ඡාවල දී නියම කර ගත් කරුණු පිළිබිඹු වන පරිදි සකස් කරන ලද අවබෝධතා ගිවිසුමකට රාජ්‍යයන් දෙකම අත්සන් තබනු ලැබූහ. ගුවන් යානා ආසන වෙන් කිරීම පිළිබඳ 3 වන පාර්ශවයේ කොන්දේසියකට හා විවෘත ගුවන් මාර්ග කාර්ය සැලැස්මකට ද දෙපාර්ශ්වයේම එකඟතාව පළ කරනු ලැබීය. ඔස්ට්‍රියා නියෝජිත පිරිස ගුවන් සේවා ගිවිසුමේ අන්තර්ගතය ශ්‍රී ලංකා නියෝජිත පිරිසට ඉදිරිපත් කරනු ලැබූ අතර අන්තර්ගතය සමාලෝචනය කර එම ගිවිසුම නැවතත් ඔස්ට්‍රියා නියෝජිත පිරිසට භාර දීමට ශ්‍රී ලංකා නියෝජිත පිරිස එකඟ විය.

**හංගේරියාව**

පැවැත් වූ සාකච්ඡා පිළිබිඹු වන පරිදි පිළියෙළ කරන ලද අවබෝධතා ගිවිසුමකට දෙපාර්ශ්වයම අත්සන් තැබූහ. ශ්‍රී ලංකාව හා හංගේරියාව අතර නව ගුවන් සේවා ගිවිසුමක් සඳහා ද අත්සන් තබනු ලැබීය. ගුවන් සේවා ගිවිසුම යටතේ ලේඛනගත සේවා ක්‍රියාත්මක කිරීමට ශ්‍රී ලංකා පාර්ශ්වයෙන් ශ්‍රී ලංකන් එයාර්ලයින්ස් සමාගම හා මිහින් ලංකා සමාගම නම් කරනු ලැබූ අතර හංගේරියාව විසින් නම් කරනු ලබන ගුවන් ප්‍රවාහණ සමාගම්වල නම් පසුව දැනුම් දීමට නියමිතය. දෙපාර්ශ්වයේ නම් කරන ලද ගුවන් ප්‍රවාහණ සමාගම් සඳහා සතියකට ගුවන් ගමන් වාර 14 ක් ලබා දීමට ද දෙරට අතර එකඟත්වය පළ විය.

**කෙන්යාව**

මෙම දෙපාර්ශ්වය අතර පැවැත් වූ සාකච්ඡා පිළිබිඹු වන පරිදි පිළියෙළ කරන ලද අවබෝධතා ගිවිසුමකට දෙපාර්ශ්වයම අත්සන් තබනු ලැබූ අතර සීශෙල්ස් දූපතේ මාහේ අන්තර්ජාතික ගුවන් තොටුපල අතරමැදි ගමනාන්තයක් ලෙස භාවිත කිරීමට දැනට පවතින ගුවන් සේවා ගිවිසුම යටතේ අවසර ලබා දෙන ලෙසට 2013 වසරේ පැවැත්වූ සමුළුවේ දී ශ්‍රී ලංකාව විසින් ඉදිරිපත් කරන ලද ඉල්ලීම නැවත වතාවක් ඉදිරිපත් කරනු ලැබූ අතර දැනට එම ඉල්ලීමට එකඟ විය හැකි තත්ත්වයක මේ වන විට එරට නොසිටින බව කෙන්යාව එම ඉල්ලීමට පිළිතුරු වශයෙන් සඳහන් කරනු ලැබීය. කෙන්යාව මගින් නම් කළ ගුවන් ප්‍රවාහණ සමාගම් සමඟ ආසන වෙන් කර ගැනීමේ පහසුකම් ලබා ගැනීම තුළින් වාණිජ සම්බන්ධතා ගොඩ නගා ගැනීමට කටයුතු කරන ලෙස ද කෙන්යා නියෝජිත පිරිස ශ්‍රී ලංකාවේ නම් කරන ලද ගුවන් ප්‍රවාහණ සමාගම්වලට ආරාධනා කරනු ලැබීය.

**ඉන්දියාව**

විවිධ අවස්ථාවලදී ඉල්ලා සිටි පරිදි, පවතින ගුවන් සේවා ගිවිසුම යටතේ 3 වන පාර්ශ්වයේ ආසන වෙන් කිරීමේ විධිවිධානය දෙපාර්ශ්වයම සඳහා ඇතුළත් කරන ලෙස මෙම අවස්ථාවේ දී ශ්‍රී ලංකා නියෝජිත පිරිස ඉල්ලා සිටි අතර එම ඉල්ලීම සටහන් කර ගත් ඉන්දියානු නියෝජිත පිරිස ඉන්දියාවේ අදාළ පාර්ශ්වකරුවන්ගේ උපදෙස් ලබා ගැනීමෙන් අනතුරුව එළැඹෙන ඉදිරි මාස කීපය තුළ මේ සම්බන්ධයෙන් වඩාත් යහපත් ප්‍රතිචාරයක් දැක්වීමට හැකි වනු ඇතැයි ශ්‍රී ලංකා නියෝජිත පිරිසට දැනුම් දුන්හ.

**ජැමෙයිකාව**

මෙම දෙපාර්ශ්වය අතර පැවැත් වූ සාකච්ඡාවල දී නියම කරනු ලැබූ කරුණු පිළිබිඹු වන පරිදි පිළියෙළ කරන ලද අවබෝධතා ගිවිසුමකට දෙපාර්ශවයම අත්සන් තබනු ලැබූ අතර නව ගුවන් සේවා ගිවිසුමක අන්තර්ගතයට දෙපාර්ශ්වයේම එකඟතාවය ප්‍රකාශ කරමින් අත්සන් තබනු ලැබීය. දෙරටේ නම් කරන ලද ගුවන් ප්‍රවාහණ සමාගම්වලට මෙහෙයුම් කටයුතු සිදු කිරීම සඳහා ''විවෘත ගුවන් තල'' ගිවිසුමක් ආරම්භ කිරීමට දෙපාර්ශ්වයේම එකඟතාව පළ කරනු ලැබූහ.

**එක්සත් අරාබි එමිරේට්ස් රාජ්‍යය**

සාකච්ඡාවලදී නියම කර ගත් කරුණු පිළිබිඹු වන පරිදි පිළියෙළ කරනු ලැබූ අවබෝධතා ගිවිසුමකට දෙපාර්ශ්වයම අත්සන් තබනු ලැබූහ. ගුවන් ප්‍රවාහණ සමාගම්වල ඉල්ලීම් මත පදනම් වෙමින් ගුවන් භාණ්ඩ හා මගී ප්‍රවාහන අයිතිවාසිකම් පුළුල් කරනු ලැබූ අතර පූර්ණ වශයෙන් නිදහස් කරන ලද 5 වන ප්‍රවාහණ අයිතිවාසිකම ද සමඟ මත්තල රාජපක්ෂ අන්තර්ජාතික ගුවන්තොටුපලේ සීමාරහිත වාර සංඛ්‍යාවක් ගුවන් ගමන් මෙහෙයුම් කටයුතු සිදු කිරීමේ අවස්ථාව එක්සත් අරාබි එමිරේට්ස් රාජ්‍යයේ සියලුම ගුවන් ප්‍රවාහණ සමාගම් සඳහා ලබා දීමට ශ්‍රී ලාංකික නියෝජිත පිරිස ඒක පාර්ශ්විකව තීරණය කළ අතර එක්සත් අරාබි එමිරේට්ස් රාජ්‍යයේ නියෝජිත පිරිස විසින් මෙම ප්‍රදානය පිළිගනු ලැබූහ.

**තායිලන්තය**

තායිලන්ත ගගන නාවික අධිකාරිය විසින් කිසිදු ගිවිසුමක් හෝ අවබෝධතා ගිවිසුමක් හෝ අත්සන් තැබීම සඳහා නිසි පරිදි බලතල පවරනු නොලැබූ අවිධිමත් නියෝජිත පිරිසක් තායිලන්තය නියෝජනය කළහ. එසේ වුවද, අනාගතයේ අවධානය යොමු කිරීමේ අභිප්‍රායෙන් නව ගුවන් සේවා ගිවිසුමක් පිළිබඳව දෙපාර්ශ්වය අතර සාකච්ඡා පවත්වනු ලැබීය. මෙම රටවල් අතර නව ගුවන් සේවා ගිවිසුමක් අත්සන් කර අවසන් කිරීම සඳහා ඉදිරි කාලයේදී සාකච්ඡා පැවැත්විය යුතු බව දෙපාර්ශයේම මතය විය.

**කොළොම්බියාව**

සාකච්ඡාවලින් නියම කර ගත් කරුණු අන්තර්ගත කරමින් පිළියෙළ කරනු ලැබූ අවබෝධතා ගිවිසුමකට දෙපාර්ශ්වයම අත්සන් තබනු ලැබීය. කොළොම්බියාව නියෝජනය කරන දූත පිරිස ගුවන් සේවා ගිවිසුම් කෙටුම්පතක අන්තර්ගතය ශ්‍රී ලංකා නියෝජිත පිරිසට ලබා දුන් අතර එය පරීක්ෂා කර නිරීක්ෂණ සමඟ ආපසු භාර දීමට ශ්‍රී ලංකා නියෝජිත පිරිස එකඟත්වය පළ කරනු ලැබීය. 5 වන නිදහස් ප්‍රවාහණ අයිතිවාසිකම් ප්‍රතිපත්තිය පිළිබඳව ද, නම් කරන ලද ගුවන් සේවා සමාගමක් ස්ථාපනය කිරීම සඳහා අවශ්‍ය ප්‍රමිති පිළිබඳව ද දෙපාර්ශ්වය අතර තවදුරටත් සාකච්ඡා පවත්වනු ලැබීය.

**අයිස්ලන්තය**

සාකච්ඡාවලින් නියම කර ගත් කරුණු අන්තර්ගත කරමින් පිළියෙළ කරනු ලැබූ අවබෝධතා ගිවිසුමකට දෙපාර්ශ්වය විසින්ම අත්සන් තබනු ලැබීය. සීමාකිරීමකින් තොරව 3 වන, 4 වන නිදහස් භාණ්ඩ හා මගී ප්‍රවාහණ අයිතිවාසිකම් ද, පූර්ණ වශයෙන් නිදහස් 5 වන භාණ්ඩ හා මගී ප්‍රවාහණ අයිතිවාසිකම ද ඇතුළත් වූ ගුවන් සේවා ගිවිසුමක අන්තර්ගතය පිළිබඳව ඔවුහු සාකච්ඡා පවත්වනු ලැබූ අතර එය පිළිග ැනීමට දෙපාර්ශ්වයම එකඟ වූහ. ගුවන් භාණ්ඩ සේවා සම්බන්ධයෙන් පමණක් වූ 7 වන නිදහස් ප්‍රවාහණ අයිතිවාසිකම පිළිබඳව ද දෙපාර්ශවයේම එකඟත්වය පළ විය.

## ආසන වෙන් කිරීමේ හා ගාස්තු ගණනය කිරීමේ පාඨමාලාව

2009 වසරේ ආරම්භ කරන ලද ගුවන් සේවා සමාග ම්වල ආසන වෙන් කිරීමේ හා ගාස්තු ගණනය කිරීමේ පාඨමාලාව මගින් ප්‍රවාහන කර්මාන්තයට පුහුණු මානව සම්පත් සැපයීම සම්බන්ධයෙන් ස්ථාවර ප්‍රගතියක් අත් පත් කර ගෙන තිබේ. 2014 වසර තුළදී, 8 වන හා 9 වන ශිෂ්‍ය කණ්ඩායම් ඔවුන්ගේ අධ්‍යයන කටයුතු සම්පූර්ණ කරනු ලැබූහ. 2015 වසරේ මුල් අදියරේදී 10 වන ශිෂ්‍ය කණ්ඩායම සඳහා පාඨමාලාව පැවැත්වීමට නියමිතව තිබේ.

මෙම පාඨමාලව ආරම්භයේ සිට මේ දක්වා ශිෂ්‍යයින් 161 දෙනෙකු මෙම පාඨමාලාව හදාරා ඇති අතර ඔවුන් අතරින් බොහෝ දෙනෙකු ශ්‍රී ලංකාවේ සහ එතෙර ගුවන් ප්‍රවාහණ සමාගම් හා සංචාරක නියෝජිතයින් යටතේ ඉහළම ප්‍රතිලාභ සහිත රැකියා ලබා ගැනීමට සමත්ව තිබේ.

## වාර සමායෝජනය

සමාලෝචිත වසර තුළ කටුනායක අන්තර්ජාතික ගුවන් තොටුපලේ හා මත්තල රාජපක්ෂ අන්තර්ජාතික ගුවන් තොටුපලේ ගමන් වාර වෙන් කර දීම වාර සමායෝජන කමිටුව මගින් එකඟ වූ නිර්නායකවලට අනුකූලව සිදු කරනු ලැබීය. දිවයිනේ දැනට පවත්නා මෙහෙයුම් පරිසරය තුළ, කටුනායක අන්තර්ජාතික ගුවන්තොටුපල මගීන් සඳහා මෙන්ම ගුවන් ප්‍රවාහණ සමාගම් සඳහාද අතිශයින්ම ප්‍රියමනාප ගමනාන්තයක් බවට පත් වෙමින් පවතින අතර අනාගතයේදි වඩාත් ඉහළ මෙහෙයුම් ධාරිතාවක් ඉටු කිරීම සඳහා එම ගුවන්තොටුපල වෙත ඉහළ ඉල්ලුමක් ඇති වනු ඇත.

**පාරිභෝගික පැමිණිලි සම්බන්ධව කටයුතු කිරීම**

සමාලෝචිත වසර තුළදී, ගුවන් ප්‍රවාහණ සමාග ම්/සංචාරක නියෝජිතයින්ට එරෙහිව ලැබුණු පැමිණිලි 18 ක් වෘත්තීය මට්ටමින් විසඳනු ලැබීය. මෙම මුල් පියවර පිළිබඳව ගුවන් සේවා කර්මාන්තයෙන් සහ හා මහජනතාව අතරින් සුබවාදී පසු විපරමක් ලැබී තිබුණි. තවද, 2014 වසරේදි ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ නව වෙබ් අඩවිය එළි දැක්වීමත් සමඟ මාධ්‍යගත පාරිභෝගික පැමිණිලි ඉදිරිපත් කිරීමේ යාන්ත්‍රණයක් හඳුන්වා දෙනු ලැබේ.

**මොරටුව විශ්ව විද්‍යාලයේ උපාධි අපේක්ෂකයින් සඳහා සේවාස්ථ පුහුණුව**

මොරටුව විශ්ව විද්‍යාලයේ ඉල්ලීමකට අනුව, ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය මගින් 2014 වර්ෂයේදි උපාධි අපේක්ෂකයින් දෙදෙනෙකුට සිවිල් ගුවන් සේවා අධිකාරිය තුළ හය මසක සේවාස්ථ පුහුණුවක් ලබා ගැනීමට පහසුකම් සලසනු ලැබීය. අධ්‍යාපනික චාරිකා සංවිධානය කිරීම හා සම්බන්ධීකරණය කිරීම තුළින් මෙම උපාධි අපේක්ෂකයින්ට මෙම කර්මාන්තය පිළිබඳව දැනුවත්බවක් සහ අවබෝධයක් ලබා දෙනු ලැබීය. සේවාස්ථ පුහුණුව ලබන විශ්ව විද්‍යාල උපාධි අපේක්ෂකයින් අධීක්ෂණය පිළිබඳ කාර්යභාරය ගුවන් ප්‍රවාහණ හා නෛතික කටයුතු අංශයේ ප්‍රධානියා වෙත පවරනු ලැබීය. ප්‍රවාහණ හා සැපයුම් කළමනාකරණ අධ්‍යයන අංශයෙන් මෙම ආයතනයේ සේවාස්ථ පුහුණුව සඳහා පැමිණි මෙවැනි සිසුන් 12 දෙනෙකුට මේ වන විට අධිකාරියේ දී සේවාස්ථ පුහුණු අවස්ථා සලසා දී තිබේ. මෙම ශිෂ්‍යයින් පුද්ගලික අංශයේ විධායක ශ්‍රේණියේ තනතුරු ලබා ගැනීමට ද සමත්ව තිබේ.

මොරටුව විශ්ව විද්‍යාලයේ නව උපාධි අපේක්ෂිකාවක් 2014 ඔක්තෝබර් මස වන විට සේවාස්ථ පුහුණු කටයුතු ආරම්භ කරනු ලැබූ අතර මේ වන විට අදාළ පුහුණුව ලබමින් සිටින්නීය.

## මානව සම්පත් හා කාර්යාල කළමනාකරණ අංශය

**කාර්ය මණ්ඩලයේ සැකැස්ම**

ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ අනුමත කාර්ය මණ්ඩලය තනතුරු 167 කින් සමන්විත වන අතර වර්තමාන අනුමත කාර්ය මණ්ඩලයට ප්‍රධාන විධායක නිලධාරියෙකු ද, ජ්‍යෙෂ්ඨ විධායක නිලධාරීන් 34 දෙනෙකු ද, විධායක නිලධාරීන් 43 දෙනෙකු ද, කාර්යය භාර නිලධාරීන් 55 දෙනෙකු සහ සහායක කාර්යය මණ්ඩලය 34 දෙනෙකු ද ඇතුළත් වේ. 2014 දෙසැම්බර් මාසය වන විට ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ නිලධාරීන් 143 දෙනෙකු සේවයේ නිරතව සිටි අතර සේවක ඇබෑර්තු 24 ක් පැවතුණි.

**ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ ප්‍රතිශෝධන**

සමාලෝචිත කාල පරිච්ඡේදය තුළ, සංවිධානය ප්‍රතිව්‍යුහගත කර අවසන් කිරීම පිළිබඳව ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය මගින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව හා වැටුප් කොමිෂන් සභාව සමඟ සාකච්ඡා වට කිහිපයක් පවත්වනු ලැබීය. ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ මුල් යෝජනාව 2012 වර්ෂයේ දී මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරන ලද අතර ඉන් අනතුරුව රජයේ ආයතනවල ව්‍යුහ පිළිබඳව රජයේ ප්‍රතිපත්තියට ගැළපෙන පරිදි

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් නියම කළ පරිදි ඒ පිළිබඳ ප්‍රතිශෝධනයක් ද 2013 වර්ෂයේ දී ඉදිරිපත් කරනු ලැබීය. කෙසේ වුවද, විවිධ සේවක ප්‍රභේද සඳහා වන බඳවා ගැනීමේ පටිපාටි සඳහා අනුමතිය ලබා දීමේ ක්‍රියාවලිය 2014 වසරේදි මේ සම්බන්ධයෙන් සිදු කරන ලද ප්‍රධාන ක්‍රියාකාරකම විය.

**ධාරිතා ගොඩනැගීම (පුහුණු, සමුළු, වැඩමුළු) සහ රැස්වීම් හා සමුළු**

ද්විපාර්ශ්වික රැස්වීම් ද ඇතුළුව පුහුණු වැඩසටහන්, සමුළු, වැඩමුළු හා රැස්වීම් සඳහා සහභාගි වීමේ අරමුණින් විදේශ සංචාරවල නිරත වීම සඳහා රු. 24,868,904.72 ක මුළු මුදලක් වැය කරනු ලැබීය. ඒ අනුව මිනිස් දින 72 ක් සඳහා මුදලින් රු. 11,761,532.17 ක් වැය කරනු ලැබීය. අවස්ථා 24 ක් ද, මිනිස් දින 141 ක් ද ඇතුළත් වූ එතෙර රටවල පැවති පුහුණු, වැඩමුළු හා සමුළු සඳහා සහභාගී වීම සඳහා රු. 13,107,372.55 ක මුදලක් වැය කරන ලදී.

එසේම ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ නිලධාරින් විසින් විදේශ රටවල පවත්වනු ලැබූ පරීක්ෂණ සඳහා රු. 4,251,216,28 ක මුදලක් වැය කිරීමට සිදු විය. 2014 පුහුණු වැඩසටහන මගින් හඳුනා ගන්නා ලද පුහුණු අවශ්‍යතා සඳහා 2014 වසරේ වැඩසටහන් අයවැය තුළින් වාර්ෂිකව වෙන් කරන ලද අයවැය සීමාව තුළ පහසුකම් ලබා දෙනු ලැබීය. 2013 වසරට සාපේක්ෂව 2014 වසරේ දී සේවකයින්ගේ ධාරිතාව ගොඩ නැගීම සඳහා ආයෝජනය කරන ලද මුදල් ප්‍රමාණය කැපී පෙනෙන පරිදි ඉහළ නැග තිබුණි.

මානව සම්පත් සඳහා ධාරිතාව ගොඩනැගීමේ ක්‍රියාකාරකම් වැඩි දියුණු කිරීමේ අරමුණින්, ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය මගින් විධායක හා කාර්ය භාර නිලධාරින් සඳහා පුහුණු, සමුළු හා වැඩමුළු සහිත දේශීය ක්‍රියාකාරකම් 148 ක් ඇතුළත් වූ සම්පූර්ණ මිනිස් දින 376 ක පුහුණු අවස්ථා පිරිනමනු ලැබීය. ඒ අනුව, විධායක නිලධාරින් සඳහා රු. 466,200.00 ක් ද, කාර්ය භාර නිලධාරින් සඳහා රු. 708,450.00 ක් ද වැය කරන ලදී. සමාලෝචිත වසර තුළ, සහායක කාර්ය මණ්ඩලය සඳහා ධාරිතා ගොඩනැගීමේ අරමුණින් රු. 176,200.00 ක පිරිවැයක් දරමින් මිනිස් දින 43 ක පුහුණු අවස්ථා පිරි නමා තිබුණි.

**කාර්ය මණ්ඩල සුභසාධනය**

සේවකයන් හා ඔවුන්ගේ පවුල්වල ආසන්නතම සාමාජිකයන් සඳහා පිරිනමනු ලබන සුබසාධන පහසුකමක් වශයෙන් රු. 6,584,640.00 ක පිරිවැයක් දරමින් ශ්‍රී ලංකා රක්ෂණ සමාගම සමඟ සහයෝගිතාවෙන් පවත්වාගෙන යනු ලබන වෛද්‍ය රක්ෂණ වැඩසටහන සමාලෝචිත වර්ෂය තුළ ද අඛණ්ඩව පවත්වාගෙන යෑමට ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියට හැකියාව ලැබුණි. 2014 වසර තුළදී වෛද්‍ය රක්ෂණයේ බාහිර රෝගී පහසුකම මගින් සේවකයින් 146 දෙනෙකු සඳහා ප්‍රතිලාභ ලබා දෙමින් ඔවුන්ගේ හිමිකම් ඉල්ලීම් 934 ක් ආවරණය කිරීම සඳහා රු. 2,873,890.86 ක පිරිවැයක් දරන ලදී.

සෞඛ්‍යය, නිරුපද්‍රිතතාව සහ සුරක්ෂිතතාව සම්බන්ධයෙන් හානි කර අවස්ථාවලට නිරාවරණය විය හැකි සිවිල් ගුවන් සේවා පරීක්ෂකයන් සඳහා විශේෂ රක්ෂණාවරණයක් පිරිනැමීමට සෙලින්කෝ ඉන්ෂුවරන්ස් පීඑල්සී සමාගම එකඟ වූ බැවින් එම සමාගම සමඟ අනතුරු රක්ෂණාවරණය අළුත් කරනු ලැබීය.

දුෂ්කර අවස්ථා මැඩ පවත්වා ගැනීම සඳහා සේවකයින් 40 දෙනෙකුට රු. 6,406,502.32 ක ආපදා ණය ලබා දීමට ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය මගින් සමාලෝචිත වසර තුළදි කටයුතු කරන ලද අතර එක් සේවකයෙකුට දේපළ ණය වශයෙන් රු. 23,406,17.72 ක් ලබා දෙනු ලැබිණි. මෙයට අමතරව, 2014 වසරේදි සේවකයින් 18 දෙනෙකු සඳහා වාහන, මෝටර් බයිසිකල් සහ පා පැදි මිලදී ගැනීම සඳහා රු. 5,221,200.00 ක ණය මුදලක්ද ලබා දී තිබුණි.
ලබා දෙනු ලබන තවත් ප්‍රයෝජනවත් සුබසාධන පියවරක් ලෙස ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ රියදුරෙකු ලෙස කටයුතු කළ සේවක මහතකුගේ අභාවයක දී ඔහුගේ යැපෙන්නන් සඳහා මරණාධාර දීමනාවක් ලබා දෙනු ලැබීය.

**තාක්ෂණික පුස්තකාලය**

පාඨකයින්ගේ දැනුම වැඩි දියුණු කිරීම හා යාවත්කාලීන කිරීම මෙම තාක්ෂණික පුස්තකාලය ස්ථාපනය කිරීමේ මුඛ්‍ය අරමුණ විය. ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ සේවය කරනු ලබන පුද්ගලයන් මෙන්ම ප්‍රධාන වශයෙන්ම ගුවන් සේවා කර්මාන්තයට අදාළව කටයුතු කරන පිටස්තර පුද්ගලයින් ද ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියට අයත් තාක්ෂණික පුස්තකාලයේ පාඨකයින් වශයෙන් කටයුතු කරයි.

සමාලෝචිත වර්ෂය තුළදි පිටස්තර පුද්ගලයින් හයසිය අනූ නවයක් පුස්තකාල පොත්පත් හා ලිපි ද්‍රව්‍ය පරිශීලනය කරනු ලැබූ අතර ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ තාක්ෂණික පුස්තකාලය ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා ක්ෂේත්‍රයේ සම්පත් හා දැනුම මධ්‍යස්ථානයක් ලෙස ක්‍රියාත්මක වේ. එයට අමතරව අඩුපාඩු සම්පූර්ණ කිරීමක් වශයෙන් ද, සේවකයින් අතර තොරතුරු බෙදා හැරීම වැඩි දියුණු කිරීම සඳහා ද, තාක්ෂණික පුස්තකාලය මගින් අධිකාරියේ එක් එක් අංශය සඳහා පුස්තකාල පවත්වාගෙනු යනු ලබයි.

2014 වර්ෂයේදි තාක්ෂණික පුස්තකාලය සඳහා නව ප්‍රකාශන මිලදී ගැනීම සඳහා රු. 154,262.00 ක මුදලක් වැය කරනු ලැබීය.

**ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ වෙබ් අඩවිය**

දත්ත ආරක්ෂා කර ගැනීම සඳහා අවශ්‍ය වන සුරක්ෂිතතා පියවර ගැනීමේ අනාගත අපේක්ෂාවෙන් යුක්තව ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය විසින් www.caa.lk යන වෙබ් අඩවිය පවත්වාගෙන යනු ලබයි. වෙබ් පාදක යෙදුමක් මගින් විභාග ප්‍රතිඵල ලබා ගැනීමේ පහසුකම් ද සලසා ඇති අතර සංස්ථාපිත අවශ්‍යතා සඳහා ද භාවිත කළ හැකි වන පරිදි තවත් තොරතුරු

මෙයට එක් කරනු ලැබීය. ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ වෙබ් අඩවිය ගුවන් ප්‍රවාහණ සමාගම්වල සංඛ්‍යාලේඛන සමඟ සම්බන්ධ කර ඇති අතර මෙම වෙබ් අඩවිය මගින් ලබා දෙන නව පහසුකමක් ලෙස මගීන්, ගුවන් භාණ්ඩ හා ගුවන් සංචලන පිළිබඳ යාවත්කාලීන කරන ලද සංඛ්‍යාලේඛන ද ලබා ගැනීමේ හැකියාව පවතී.

**ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ වාර්ෂික ක්‍රියාත්මක වැඩසටහන්**

දෛනික කාර්ය අයිතම ආවරණය වන එක් එක් අංශයේ/ඒකකයේ කාර්ය වැඩසටහන, ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ ත්‍රෛවාර්ෂික සංයුක්ත සැලැස්මේ අදාළ වන කොටස් සහ ක්‍රමයෙන් විකසනය වන අවශ්‍යතා හා වගකීම් පිළිබිඹු කරන වෙනත් අමතර කාර්ය අයිතම ද අන්තර්ගත කරමින් 2015 වසර සඳහා ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ සමස්ත වාර්ෂික කාර්ය වැඩසටහන පිළියෙළ කරනු ලැබීය.

**කාර්යාල හා දේපළ කළමනාකරණය හා නඩත්තුව සම්බන්ධ ක්‍රියාකාරකම්**

**ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ පරීක්ෂකයින් සඳහා නිල නිවාස - වීරවිල**

ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ නිලධාරීන් සඳහා නිල නිවාස ඉදි කිරීමේ කටයුතු 2014 වර්ෂයේදී සම්පූර්ණ කරන ලද අතර මෙම නිල නිවාස සම්බන්ධව මෙහෙයුම් හා නඩත්තු කටයුතු ඉටු කිරීම සඳහා මානව සම්පත් හා කාර්යාල කළමණාකරණ අංශයට භාර දෙනු ලැබූ අතර ඉදි කර තිබෙන මෙම නිල නිවාස අධිකාරියේ සේවකයන් සඳහා ලබා දෙන සුබසාධන පහසුකමක් ලෙස ද ප්‍රයෝජනයට ගත හැකිය. පරීක්ෂකවරුන්ට නියාමන ක්‍රියාකාරකම් ඉටු කිරීමේ දී නේවාසික නවාතැනක් ලෙස පරිහරණය කිරීමට පවතින හැකියාවට අමතරව මෙම නිල නිවාස විනෝදාස්වාදය සපයන සුබසාධක පහසුකමක් ලෙස ද උපයෝගී කර ගැනීමට අපේක්ෂා කෙරේ. ගෘහ භාණ්ඩ සැපයීම ඇතුළු මෙම ගොඩනැගිලිවල නවාතැන් ගැනීම සඳහා සැපයිය යුතු මූලික සැකසුම් කටයුතු සමාලෝචිත වර්ෂයේ අවසාන භාගයේ දී සම්පූර්ණ කරනු ලැබීය.

**ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ ලේඛනාගාර කළමනාකරණය**


වඩාත් ඉඩකඩ සහිතව ක්‍රමවත් සැලසුමකට අනුව ලිපි ලේඛන ගබඩා කිරීමේ පහසුකම ලබා ගැනීම සඳහා අධිකාරියේ ලේඛනාගාරය මත්තල කාර්යාලයට මාරු කරනු ලැබීය. ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ වාර්තා කළමනාකරණ අත් පොත ප්‍රකාරව අධිකාරියට ලේඛනාරක්ෂක කාර්ය පටිපාටියක් හඳුන්වා දෙනු ලැබීය.

**ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ සේවකයින් විසින් ලබා ගත් නිවාඩු**

අධිකාරියේ සේවයට වාර්තා කිරීමේදී සේවකයින්ට මුහුණ පෑමට සිදුවන අපහසුතා පිළිබඳව සලකා බලා සේවකයින් සඳහා පැමිණීම සම්බන්ධයෙන් ලබා දී ඇති සහන කාලයට අමතරව, ප්‍රමාද වී පැමිණීම සම්බන්ධ වාර්තා මෙන්ම කෙටි නිවාඩු වාර්තා ද පිළිබඳව සමීප අධීක්ෂණයක් සමාලෝචිත වර්ෂය තුළදී සිදු කරනු ලැබීය. පසුගිය වසරවලදී මෙන්ම 2014 වසර තුළදීත් ඉතිරි නිවාඩු සඳහා මුදල් ගෙවීමේ පහසුකම වැනි දිරි දීමනා ක්‍රම ලබා දීම තුළින් නිරන්තරයෙන්ම සේවයට පැමිණීම සඳහා සේවකයින් දිරි ගන්වනු ලැබීය.

ඒකාබද්ධ ශාඛාව

## ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය - කාර්‍ය බද්ධ වගකීම් සටහන




## ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය - කාර්‍ය බද්ධ වගකීම් සටහන

## මූල්‍ය කළමනාකරණ අංශය


ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය මගින් පූර්ව වර්ෂවල දී ඉටු කරන ලද අන්දමින් ම, මෙම වසරේදී ද සංවිධානයේ මූල්‍ය කළමනාකරණය කාර්යක්ෂමව ද, ඵලදායි හා සකසුරුවම් අන්දමින් ද ඉටු කිරීමට කටයුතු කරන ලදී.


**වැඩසටහන් අයවැය**

ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය මගින් මග පෙන්වීම හා කළමනාකරණය, ගුවන් නාවික සේවා, ගුවන් ගමන්වල සුරක්ෂිතතාව හා සංස්ථාපිත යනාදි ප්‍රධාන වැඩසටහන් සතර යටතේ වියදම් දැක්වෙන 2014 වසරේ වැඩසටහන් අයවැය පිළියෙළ කරනු ලැබීය. 2014 වසර සඳහා තක්සේරු කළ ආදායම රුපියල් මිලියන 1,263 ක් වූ අතර තක්සේරු කළ වියදම රුපියල් මිලියන 717 ක් විය. මෙම තක්සේරු කිරීම්වලට පටහැනි අන්දමින් තථ්‍ය ආදායම රුපියල් මිලියන 1,474 ක් වූ අතර ආදායම් බදු ඇතුළත්ව පුනරාවර්තන වියදම් රුපියල් මිලියන 640 ක් විය. ප්‍රාග්ධන වියදම රුපියල් මිලියන 127 ක් විය. ආදායම 25% ක වර්ධනයක් පෙන්නුම් කරන අතර 2013 වසර සමඟ සංසන්දනය කිරීමේ දී ආදායම් බදු ඉහළ යාම හේතුවෙන් පුනරාවර්තන වියදම් 13% කින් වැඩි වී තිබේ. විදේශ විකුණුම් තුළින් උත්පාදනය වූ ආදායම් මගින් ආදායමේ කැපී පෙනෙන වර්ධනයක් සිදු වී තිබේ.

**ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ ගාස්තු හා අයකිරීම්**

සපයනු ලබන එක් එක් සේවය සඳහා අවම වශයෙන් 10% ක වැඩි වීමක් සිදු වන පරිදි සමාලෝචිත වර්ෂය තුළ දී ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ ගාස්තු හා අයකිරීම් සංශෝධනය කරනු ලැබීය.



# කාර්ය සාධනය පිළිබඳ සාරාංශය - 2014

## ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ කාර්යසාධනය - 2014

| නිරුපද්‍රිතතා හා සුරක්ෂිතතා අධීක්ෂණ රාජකාරි සහ කාර්යයන් (නිකුත් කරන ලද රෙගුලාසි/දැන්වීම්/රීති සංඛ්‍යාව) | 2014 | 2013 |
|---|---|---|
| ගුවන් ප්‍රවාහණය | 03 | 03 |
| ගුවන් යෝග්‍යතාව | 03 | 03 |
| සංවිධාන/පුද්ගලයින් සඳහා මුල්වරට සහතික නිකුත් කිරීම | | |
| ගුවන් ප්‍රවාහණ සමාගම් | 02 | 01 |
| නඩත්තු සංවිධාන | 10 | 05 |
| ගුවන් නියමු | 255 | 268 |
| ගුවන් ගමන් පාලක | 12 | 00 |
| ගුවන් යානා නඩත්තු බලපත්‍ර | 32 | 73 |
| පියාසර පිටත් කරන්නන් | 01 | 14 |
| සහකාර පියසර උපදේශක | 10 | 00 |
| භූමි උපදේශක | 22 | 04 |
| මැදිරි පිරිස් සාමාජික | 77 | 229 |
| සහතික කල සංවිධාන/පුද්ගලයින් පිළිබඳ සෝදිසි කාර්යයන් | | |
| රැම්ප් පරීක්ෂණ - ගුවන් යෝග්‍යතාව | 187 | 263 |
| රැම්ප් පරීක්ෂණ - මෙහෙයුම් | 48 | 53 |
| ගගන යාත්‍රාංගණ පරීක්ෂණ | 38 | 39 |
| ගුවන් ප්‍රවාහණ සේවා පරීක්ෂණ | 35 | 32 |
| නඩත්තු සංවිධාන පරීක්ෂණ | 67 | 46 |
| පියසර පාසල් පරීක්ෂණ | 09 | 08 |
| ගුවන් සේවා සුරක්ෂිතතා පරීක්ෂණ | 25 | 21 |
| අනුකාරක පරීක්ෂණ | 02 | 01 |
| අතරමඟ පරීක්ෂණ - මෙහෙයුම් | 05 | 04 |
| අන්තරායකාරී භාණ්ඩ පරීක්ෂණ | 02 | 09 |
| ස්ථාන පහසුකම් පරීක්ෂණ - ගුවන් යෝග්‍යතා | 00 | 07 |
| ගගන නාවික තොරතුරු සේවා පරීක්ෂණ | 27 | 19 |
| ප්‍රධාන කඳවුරේ පරීක්ෂණ/උපදේශක නිරීක්ෂණ | 30 | 14 |
| නම් කරන ලද පරීක්ෂක නියමුවන් (DCP අධීක්ෂණය කිරීම) | 24 | 14 |
| සම්පූර්ණ කරන ලද විගණන | | |
| ගුවන් සංතරණ සේවා | 01 | 01 |
| ගුවන් සේවා සුරක්ෂිතතා | 00 | 01 |

## අංශ විශේෂිත කාර්යයන් - 2014

| වර්ගය | 2014 | 2013 |
|---|---|---|
| **මෙහෙයවීම සහ කළමනාකරණය** | | |
| පවත්වන ලද අධිකාරියේ රැස්වීම් | 09 | 09 |
| පවත්වන ලද විගණන කමිටු රැස්වීම් | 04 | 04 |
| පවත්වන ලද කාර්ය මණ්ඩල කමිටු රැස්වීම් | 07 | 03 |
| පවත්වන ලද සංවර්ධන සැලසුම් හා ක්‍රියාත්මක කිරීමේ කණ්ඩායම් රැස්වීම් | 02 | 04 |
| පවත්වන ලද කර්මාන්ත උපදේශන රැස්වීම් | 108 | 22 |
| බාහිර සංවිධාන/පුද්ගලයින් හමුවීම් | 255 | 136 |
| ලැබුණු ලිපි සංඛ්‍යාව | 5493 | 5518 |
| | | |
| **ගුවන් සේවා සුරක්ෂිතතා ශාඛාව** | | |
| ගුවන් තොටුපල පිවිසුම් අවසර පත්‍ර සඳහා නිර්දේශ | 33 | 30 |
| ගුවන් යානා තුළ/නැව් බඩු ගබඩා තුළ අවි ආයුධ රැගෙන යාමට අනුමැතිය | 250 | 139 |
| පියසර තට්ටුවේ ගමන් කිරීමට බලය පැවරීම | 00 | 01 |
| ජාතික ගුවන් සේවා සුරක්ෂිතතා වැඩසටහනට සංශෝධන/ප්‍රතිශෝධන | 02 | 02 |
| ඉටු කරන ලද සුරක්ෂිතතා සෝදිසි කටයුතු | 44 | 20 |
| කර්මාන්තය වෙනුවෙන් පවත්නා ලද සුරක්ෂිතතා පුහුණු පාඨමාලා | 00 | 09 |
| සහතික කරන ලද සුරක්ෂිතතා සෝදිසි කරුවන් (නිකුත් කිරීම+අළුත් කිරීම) | 571 | 349 |
| සහභාගී වූ සුරක්ෂිතතා පුහුණු පාඨමාලා/සම්මන්ත්‍රණ | 03 | 10 |
| පවත්වන ලද ගුවන් සේවා සුරක්ෂිතතා විභාග | 10 | 13 |
| ගුවන් සේවා සුරක්ෂිතතාව පිළිබඳව පවත්වන ලද ඉදිරිපත් කිරීම් | 07 | 02 |
| | | |
| **විශේෂ ව්‍යාපෘති අංශය** | | |
| ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ ප්‍රධාන කාර්යාලයීය | | |
| ගොඩනැගිල්ල ඉදිකිරීම | | |
| තාක්ෂණික ඇගයීම් කමිටු රැස්වීම් | 06 | 06 |
| උපදේශකවරයා සමඟ රැස්වීම් | 12 | 05 |
| පරිශ්‍රය අධීක්ෂණය | 1 | 05 |
| අභ්‍යන්තර රැස්වීම් | 10 | 11 |
| වීරවිල ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ නිල නිවාස ඉදිකිරීම | | |
| තාක්ෂණික ඇගයීම් කමිටු රැස්වීම් | 00 | 06 |
| කොන්ත්‍රාත්කරු සමඟ රැස්වීම් | 11 | 00 |
| පරිශ්‍රය අධීක්ෂණය | 18 | 01 |
| අභ්‍යන්තර රැස්වීම් | 12 | 07 |
| ප්‍රකාශයට පත් කල ගුවන්සර සඟරාව | 03 | 04 |
| පවත්වන ලද සිවිල් ගුවන් සේවා සංවර්ධන සහ අධ්‍යාපන කමිටුව | 02 | 19 |
| පාසැල්වල විදුහල්පතිවරුන් සඳහා වැඩමුළු | 00 | 02 |
| පාසැල් ශිෂ්‍ය/ශිෂ්‍යාවන් සඳහා වැඩමුළු | 00 | 06 |
| පාසැල් ශිෂ්‍ය සමාජ සඳහා වැඩමුළු | 00 | 08 |
| විශේෂ ක්‍රියාකාරකම් සිදු කිරීම | 02 | 01 |
| ජාතික කමිටු වැඩසටහන් | 00 | 02 |
| CAPSCA | 01 | 01 |
| වාර්ෂික එළිමහන් පුහුණු වැඩමුළු | 00 | 01 |
| දැයට කිරුළ ජාතික ප්‍රදර්ශනය | 01 | 01 |

| | | |
|---|---|---|
| ප්‍රදර්ශනවලදී ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ | | |
| ප්‍රදර්ශන කුටි සංවිධානය කිරීම | 02 | 02 |
| අධිකාරියේ වාර්ෂික වාර්තාව | 01 | 01 |
| වෙනත් ප්‍රකාශන/වාර්තා | 05 | 05 |
| ආශ්‍රිත සංඛ්‍යාලේඛන | 12 | 12 |
| අධිකාරියේ සංඛ්‍යාලේඛන | 121 | 121 |
| | | |
| **ගුවන් සංතරණ සේවා අංශය (ANS)** | | |
| උස් ගොඩනැගිලි ඉදි කිරීම සඳහා අනුමැතිය | 255 | 312 |
| NOTAM නිකුත් කිරීම්සඳහා අනුමැතිය | 240 | 186 |
| ගගන නාවික තොරතුරු චක්‍රලේඛ නිකුත් කිරීම | 08 | 08 |
| නිකුත් කරන ලද AIP අතිරේක | 05 | 07 |
| ඉහළින් පියාසර කිරීමට අනුමැතිය | 1033 | 929 |
| උප ලේඛනගත පියාසර සඳහා ගොඩබෑමේ අවසර | 868 | 586 |
| සහභාගී වූ පුහුණු පාඨමාලා/සම්මන්ත්‍රණ | 26 | 29 |
| ජල ගගන යාත්‍රාංගණ සඳහා අනුමැතිය | 02 | 01 |
| පවත්වන ලද ගගන යාත්‍රාංගණ සෝදිසි පරීක්ෂණ | 38 | 39 |
| පවත්වන ලද ATS සෝදිසි පරීක්ෂණ | 35 | 32 |
| | | |
| **පුද්ගල බලපත්‍ර අංශය (PL)** | | |
| ආධුනික ගුවන් නියමු බලපත්‍ර (SPL) (නිකුත් කළ/අළුත් කළ) | 211 | 231 |
| පෞද්ගලික ගුවන් නියමු බලපත්‍ර (PPL) (නිකුත් කළ/අළුත් කළ) | 151 | 110 |
| වාණිජ ගුවන් නියමු බලපත්‍ර (CPL) (නිකුත් කළ/අළුත් කළ) | 394 | 339 |
| ගුවන් ප්‍රවාහන ගුවන් නියමු බලපත්‍ර (ATPL) (නිකුත් කළ/අළුත් කළ) | 350 | 498 |
| ගුවන් ගමන් පාලක බලපත්‍ර (ATC) (නිකුත් කළ/අළුත් කළ) | 50 | 26 |
| ගුවන් යානා නඩත්තු ඉංජිනේරු බලපත්‍ර (නිකුත් කළ/අළුත් කළ) | 04 | 05 |
| ගුවන් යානා නඩත්තු බලපත්‍ර (නිකුත් කළ/අළුත් කළ) | 436 | 474 |
| ගුවන් යානා නඩත්තු බලපත්‍ර - වර්ග ප්‍රමාණනය (නිකුත් කළ) | 12 | 25 |
| ගුවන් යානා නඩත්තු බපපත්‍ර - ප්‍රවර්ග (නිකුත් කළ) | 06 | 10 |
| මැදිරි සේවක පිරිස් සහතික (නිකුත් කළ) | 134 | 229 |
| මැදිරි සේවක පිරිස් සහතික (යළි නිකුත් කළ) | 00 | 512 |
| පියාසර මෙහෙයුම් නිලධාරී බලපත්‍ර (නිකුත් කළ) | 01 | 14 |
| නිදහස් බැලුන් නියමු බලපත්‍ර (නිකුත් කළ/අළුත් කළ) | 01 | 00 |
| පියාසර ඉංජිනේරු බලපත්‍ර (නිකුත් කළ/අළුත් කළ) | 00 | 01 |
| වාණිජ ගුවන් නියමු බලපත්‍ර (CPL)/ගුවන් ප්‍රවාහන ගුවන් නියමු | | |
| බලපත්‍ර (ATPL)-වර්ග ප්‍රමාණන (නිකුත් කිරීම්) | 120 | 154 |
| සහකාර පියසර උපදේශක (AFI)/පියාසර උපදේශක (FI) | | |
| ප්‍රමාණන (නිකුත් කළ/අළුත් කළ) | 36 | 09 |
| පියසර පාසැල් බලපත්‍ර (අළුත් කළ) | 07 | 03 |
| භූමි උපදේශක බලපත්‍ර | 00 | 00 |
| භූමි උපදේශක අනුමත කිරීම් | 22 | 04 |
| ගුවන් ගමන් පාලක - ප්‍රමාණන (නිකුත් කළ/අළුත් කළ) | 145 | 201 |
| පියාසර පාසල් බලපත්‍ර (නිකුත් කළ) | 01 | 00 |
| වීසා නිර්දේශ (නිකුත් කළ) | 48 | 85 |
| හෂර් පැහැයුම් නිකුත් කිරීම | 75 | 159 |
| වෛද්‍ය පරීක්ෂණ | 972 | 958 |

| | | |
|---|---|---|
| පුද්ගල බලපත්කරණ විභාග | | |
| 1. PPL විභාග | 378 | 107 |
| 2. ගුවන් ගමන් මෙහෙයුම් නිලධාරි විභාග | 28 | 00 |
| 4. AML විභාග අයදුම්කරුවන් | 02 | 02 |
| | 521 | 414 |
| | අයදුම්කරුවන් | අයදුම්කරුවන් |
| 5. ATPL(A) විභාග | 1548 | 79 |
| 6. ATPL (H) විභාග | 20 | 03 |
| 7. විදේශ බලපත්‍ර පරිවර්තන විභාගය | 02 | 00 |
| 8. ඉංග්‍රිසි භාෂා ප්‍රවීණතා පරීක්ෂණ | 179 | 109 |
| 9. කල් ඉකුත් වූ බලපත්‍ර ප්‍රතිසක්‍රියන විභාග (CPL/IR) | 03 | 03 |
| 10. ගුවන් විදුලි දුරකථන ප්‍රායෝගික පරීක්ෂණ | 84 | 56 |
| 11. සහකාර පියසර උපදේශක විභාග | 11 | 00 |
| 12. පියාසර විභාග පරීක්ෂක විභාග | 00 | 01 |
| 13. AML පරිවර්තන විභාග | 00 | 414 |
| | | අයදුම්කරුවන් |
| | | |
| මෙහෙයුම් අංශය (OPS) | | |
| සහභාගි වූ පුහුණු පාඨමාලා/සම්මන්ත්‍රණ | 05 | 10 |
| විශේෂ මෙහෙයුම් | 26 | 12 |
| විදේශ ගුවන් යානා මෙහෙයුම්කරු සහතික - මුල්වර | 01 | 04 |
| විදේශ ගුවන් යානා මෙහෙයුම්කරු සහතික - අළුත් කිරීම් | 13 | 11 |
| අන්තරායකාරී භාණ්ඩ ප්‍රවාහන බලපත්‍ර - මුල්වර | 01 | 02 |
| අන්තරායකාරී භාණ්ඩ ප්‍රවාහන බලපත්‍ර - අළුත් කිරීම් | 13 | 13 |
| DCP - මුල්වර | 11 | 04 |
| DCP - අළුත් කිරීම් | 35 | 30 |
| ගුවන් යානා මෙහෙයුම්කරු සහතික - මුල්වර | 02 | 01 |
| ගුවන් යානා මෙහෙයුම්කරු සහතික - අළුත් කිරීම් | 09 | 08 |
| අනුකාරක අළුත් කිරීම් | 03 | 07 |
| පරීක්ෂණ (Check) සඳහා බලය පැවරීම් | 227 | 249 |
| ඉටු කරන ලද සෝදිසි කාර්යයන් | 115 | 106 |
| | | |
| ගුවන් යෝග්‍යතාව | | |
| නිකුත් කරන ලද නව ගුවන් සේවා නිරුපද්‍රිතතා නිවේදන | 00 | 02 |
| සහභාගී වූ පුහුණු පාඨමාලා/සම්මන්ත්‍රණ | 04 | 08 |
| ඉටු කරන ලද සෝදිසි කාර්යයන් (රැම්ප්, විගණන) | 192 | 238 |
| ගුවන් යානා පිළිබඳ ගුවන් යෝග්‍යතා සහතික - මුල්වර | 14 | 11 |
| ගුවන් යානා පිළිබඳ ගුවන් යෝග්‍යතා සහතික - අළුත් කිරීම් | 52 | 47 |
| ගුවන් යානා නඩත්තු සංවිධාන වැඩපොළ අනුමතිය (මුල්වර+අළුත් කිරීම්) | 43 | 46 |
| ගුවන් යානා ලියාපදිංචි කිරීමේ සහතිකය - මුල්වර | 16 | 09 |
| ගුවන් යානා ලියාපදිංචි කිරීමේ සහතිකය - අළුත් කිරීම් | 54 | 54 |
| පහසුකම් පරීක්ෂණය සමඟ නඩත්තු සංවිධාන අනුමත කිරීම් | | |
| (මුල්වර+ අළුත් කිරීම්) | 77 | 46 |
| ගුවන් සේවා සිදුවීම් නිශ්චය කිරීම් | 127 | 93 |
| | | |
| ගුවන් ප්‍රවාහණ සහ නීති කටයුතු අංශය (AT &LA) | | |
| සම්පාදන කරන ලද නව රෙගුලාසි කෙටුම්පත් | 03 | 03 |

| | | |
|---|---|---|
| සහභාගී වූ පුහුණු පාඨමාලා/සම්මන්ත්‍රණ | 01 | 04 |
| සම්පාදනය කළ නව මඟපෙන්වීම් ලේඛන | 03 | 03 |
| ප්‍රතිශෝධනය කරන ලද පවත්නා මඟපෙන්වීම් ලේඛන | 01 | 01 |
| දේශීය පියසර උපලේඛන අනුමත කිරීම් | 22 | 37 |
| ගුවන් ප්‍රවාහණ සැපයුම් කරුවන් සෝදිසි කිරීම සහ | | |
| පවත්වනු ලැබූ ඇගයීම් රැස්වීම් | 120 | 118 |
| ජාත්‍යන්තර පියසර උපලේඛන අනුමත කිරීම් | 175 | 185 |
| තාක්ෂණික නොවන විශේෂඥ කාර්යය මණ්ඩලය සඳහා | | |
| වීසා නිර්දේශ කිරීම | 41 | 21 |
| ශ්‍රී ලංකාවේ ලියාපදිංචි ගුවන් ප්‍රවාහණ සමාගම් සඳහා කුලී | | |
| ගුවන් ප්‍රවාහන බලපත්‍ර | 08 | 08 |
| ශ්‍රී ලංකාවේ ලියාපදිංචි ගුවන් ප්‍රවාහණ සමාගම් සඳහා ගුවන් | | |
| ප්‍රවාහන බලපත්‍ර | 04 | 03 |
| කුලී බලපත්‍ර - ජාත්‍යන්තර මෙහෙයුම් | 03 | 03 |
| කුලී බලපත්‍ර - දේශීය නිත්‍ය මෙහෙයුම් | 05 | 04 |
| ගුවන් ප්‍රවාහන සැපයුම්කරු බලපත්‍ර | 588 | 518 |
| පෞද්ගලික මෙහෙයුම් බලපත්‍ර | 02 | 02 |
| අත්සන් තබන ලද නව ගුවන් ප්‍රවාහණ සේවා ගිවිසුම් | 05 | 05 |
| ප්‍රතිශෝධනය කරන ලද පවත්නා ගුවන් ප්‍රවාහණ සේවා ගිවිසුම් | 10 | 09 |
| "විවෘත ගුවන් තල" ගුවන් සේවා ගිවිසුම් | 10 | 07 |
| | | |
| **මානව සම්පත් හා කාර්යාල කළමනාකරණය** | | |
| HR & OM සම්බන්ධයෙන් නිකුත් කරන ලද නව රීති | 07 | 21 |
| ප්‍රතිශෝධනය කරන ලද HR & OM සම්බන්ධයෙන් පවත්නා රීති | 01 | 00 |
| නිලධාරීන් බඳවා ගැනීම | 13 | 07 |
| සුදානම් කළ මුළු විදේශීය පුහුණු අවස්ථා | 23 | 32 |
| සුදානම් කළ මුළු දේශීය පුහුණු අවස්ථා | 25 | 50 |
| මුළු කාර්ය මණ්ඩලය | 143 | 146 |
| පවත්වන ලද කාර්ය සාධන ඇගයීම් | 28 | 56 |
| කාර්ය මණ්ඩල විශ්‍රාම ගැනීම් | 04 | 01 |
| කාර්ය මණ්ඩලය සඳහා ලබා දුන් ණය මුදල් | රු. මිලියන | රු.මිලියන |
| | 14.3 | 24.8 |
| තාක්ෂණික පුස්තකාලය සඳහා ලබා දුන් නව ලිපි ලේඛන | 18 | 21 |
| | | |
| **මූල්‍ය කළමණාකරණය** | | |
| රැස් කළ මුළු ආදායම | රු. මිලියන | රු. මිලියන |
| | 1,474 | 1.179 |
| දැරීමට සිදු වූ මුළු වියදම | රු. මිලියන | රු. මිලියන |
| | 661 | 593 |
| ගෙවූ කාර්යාල මණ්ඩල මුළු වැටුප් | රු. මිලියන | රු. මිලියන |
| | 169 | 157 |
| මිල දී ගත් වාහන | 03 | 00 |
| | | |
| **අභ්‍යන්තර විගණනය** | | |
| පවත්වන ලද විගණන | 39 | 30 |
| ඉදිරිපත් කළ සොයා ගැනීම් | 148 | 146 |

| ගුවන් යානා අනතුරු හා සිදුවීම් විමර්ශනය | | |
|---|---|---|
| වාර්තා වු සිදුවීම් | 04 | 05 |
| වාර්තා වු අනතුරු | 00 | 00 |
| වාර්තා වු සුළු සිදුවීම් | 239 | 186 |
| 86මගීන්ට හෝ සේවක පිරිසට හෝ බරපතල තුවාල සිදුවීම | 00 | 01 |
| ඔ000ගීන්ට හෝ සේවක පිරිසට හෝ සුළු තුවාල සිදුවීම් | 00 | 00 |
| සහභාගි වු පුහුණු පාඨමාලා/සම්මන්ත්‍රණ | 02 | 01 |
| ප්‍රතිශෝධනය කළ මඟපෙන්වීම් ලේඛන | 02 | 04 |

# ගුවන් ගමන් පිළිබඳ තොරතුරු

## ජාත්‍යන්තර ගුවන් ගමන්

| | 2014 | 2013 |
|---|---|---|
| මගීන් | | |
| පිටත් වූ | 3,926,447 | 3,621,822 |
| ගොඩ බසින ලද | 3,893,400 | 3,690,047 |
| සංක්‍රමණ | 1,237,513 | 1,231,903 |
| | | |
| ගුවන් භාණ්ඩ (මෙට්‍රික් ටොන්) | | |
| ගෙන ආ | 77,040 | 71,776 |
| ගෙන ගිය | 115,400 | 119,447 |
| ගුවන් යානා සංචලන | | |
| නිත්‍ය පියාසර | 51,897 | 48,413 |
| කුලී පියාසර | 3,391 | 2,556 |
| | | |
| මෙහෙයුම් සිදු කළ ගුවන් ප්‍රවාහණ සමාගම් සංඛ්‍යාව | 38 | 39 |
| නිත්‍ය සේවා | 26 | 27 |
| කුලී සේවා | 05 | 08 |
| නැව් බඩු ප්‍රවාහණ | 02 | 04 |

## දේශීය ගුවන් ගමන්

| | 2014 | 2013 |
|---|---|---|
| ගෙන ගිය මගීන් | 28,568 | 7,694 |
| ගුවන් යානා සංචලන | 3,296 | 1,842 |
| මෙහෙයුම් සිදු කල ගුවන් ප්‍රවාහණ සමාගම් සංඛ්‍යාව | 08 | 08 |
| නිත්‍ය සේවා | 02 | 02 |
| කුලී සේවා | 06 | 06 |

## ශ්‍රී ලංකා ගුවන් සේවා අධිකාරිය

# විස්තීරණ ආදායම පිළිබඳ ප්‍රකාශය

2014 දෙසැම්බර් 31 දිනට

| | සටහන | 2014.12.31<br>රු. ශත | 2013.12.31<br>රු. ශත |
|---|---|---|---|
| ආදායම | | 1,473,792,389.21 | 1,178,712,159.10 |
| මෙහෙයුම් ආදායම | (1) | 1,358,103,190.36 | 1,078,895,686.64 |
| මෙහෙයුම් නොවන ආදායම | (2) | 115,689,198.85 | 99,816,472.46 |
| වියදම | | 350,360,013.46 | 365,040,299.83 |
| කාර්ය මණ්ඩල වියදම් | (3) | 168,773,002.89 | 156,700,965.10 |
| රැස්වීම්, සම්මන්ත්‍රණ හා වැඩමුළු | (4) | 15,356,110.84 | 33,254,645.02 |
| පුහුණු කිරීමේ වියදම් | (5) | 9,363,595.94 | 11,269,722.26 |
| පරිපාලන සහ වෙනත් වියදම් | (6) | 130,856,730.45 | 136,960,888.79 |
| ක්ෂය වීම් | (8) | 26,010,573.34 | 26,854,078.66 |
| බදු ගෙවීමට පෙර සාමාන්‍ය කාර්යයන්ගෙන් ලද ලාභය/(අලාභය) | | 1,123,432,375.75 | 813,671,859.27 |
| බදු අය කිරීම | (7) | 311,354,961.35 | 228,159,304.45 |
| වසර සඳහා ශුද්ධ ලාභය / (අලාභය) | | | |
| වෙනත් විස්තීර්ණ ආදායම් | | 812,077,414.40 | 585,512,554.82 |
| දේපළ, පිරියත සහ උපකරණ ප්‍රත්‍යාගණනයෙන් ලද ලාභය | | - | - |
| නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් මත ආයුගණක ලාභය/(අලාභය) | | - | - |
| විදේශ මෙහෙයුමක මූල්‍ය වාර්තා පරිවර්තනය කිරීමෙන් ලද ලාභය/(අලාභය) | | - | - |
| විකිණීමට තිබෙන මූල්‍ය වත්කම්වලින් ලද ලාභය/(අලාභය) | | - | - |
| ලාභ/අලාභ අයිතමයන්ට අදාළ ආදායම් බදු | | - | - |
| වසර සඳහා වාර්ෂික විස්තීර්ණ ආදායම | | 812,077,414.40 | 585,512,554.82 |

## ශ්‍රී ලංකා ගුවන් සේවා අධිකාරිය

# මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

2014 දෙසැම්බර් 31 දිනට

| | සටහන | 2014.12.31<br>රු. ශත | 2013.12.31<br>රු. ශත |
|---|---|---|---|
| **වත්කම්** | | 2,556,206,402.31 | 1,931,531,245.45 |
| **ජංගම නොවන වත්කම්** | | 190,801,763.87 | 92,488,294.11 |
| දේපළ, පිරියත හා උපකරණ | (08) | 190,801,763.87 | 92,488,294.11 |
| **ජංගම වත්කම්** | | 2,365,404,638.44 | 1,839,042,951.34 |
| තොග | (09) | 21,775,643.12 | 79,146,992.92 |
| ලැබිය යුතු වෙළඳ මුදල් හා කාර්ය මණ්ඩල ණය | (10) | 273,542,079.65 | 219,721,394.16 |
| වෙනත් මූල්‍ය වත්කම් | (11) | 1,307,590,342.53 | 801,046,519.12 |
| අත්තිකාරම්, පෙර ගෙවුම් සහ වෙනත් ලැබිය යුතු මුදල් | (12) | 127,033,896.80 | 106,488,296.86 |
| මුදල් සහ මුදල් සමානතා | (13) | 635,462,676.34 | 632,639,748.28 |
| **හිමිකම් සහ වගකීම්** | | 2,556,206,402.31 | 1,931,531,245.45 |
| **මූල ධනය සහ සංචිත** | | 1,457,726,915.08 | 896,255,554.68 |
| රජයේ ප්‍රදාන | (14) | 7,350,272.05 | 7,956.326.05 |
| ප්‍රත්‍යාගණන අතිරික්ත | (15) | 8,764,840.44 | 13,485,465.44 |
| පොදු සංචිත | (16) | 1,200,000,000.00 | 485,000,000.00 |
| සමුච්චිත ලාභය | | 241,611,802.59 | 389,813,763.19 |
| **ජංගම නොවන වගකීම්** | | 287,716,099.81 | 277,799,071.34 |
| කල් තැබූ වගකීම් | (17) | 8,197,696.81 | 4,658,204.67 |
| ප්‍රතිපාදන සහ වෙනත් වගකීම් | (18) | 267,039,023.00 | 261,851,639.67 |
| විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම | (19) | 12,479,380.00 | 11,289,227.00 |
| **ජංගම වගකීම්** | | 810,763,387.42 | 757,476,619.43 |
| ගෙවිය යුතු වෙළඳ මුදල් | (20) | 587,018,009.15 | 616,588,928.22 |
| වෙනත් ගෙවිය යුතු මුදල් | (21) | 46,932,609.19 | 17,531,743.11 |
| ආදායම් බදු වගකීම් | (22) | 176,812,769.08 | 123,355,948.10 |

එච්.එම්.සී.නිමල්සිරි
සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජෙනරාල්
සහ ප්‍රධාන විධායක නිලධාරී

2015 පෙබරවාරි

ෂිබ්ලි අසීස් පී.සී.
සභාපති

# හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය

## 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය

| | රජයේ ප්‍රදාන | ප්‍රත්‍යාගණන සංචිතය | පොදු සංචිතය | සමුච්චිත ලාභය | එකතුව |
|---|---|---|---|---|---|
| | රු. ශත | රු ශත | රු ශත | රු ශත | රු ශත |
| 2013 ජනවාරි 1 වන දිනට ශේෂය | 8,562,380.05 | 13,485,465.44 | - | 489,301,208.37 | 511,349,053.86 |
| කාල පරිච්ඡේදය සඳහා ලාභය | | | | 585,512,554.82 | 585,512,554.82 |
| ශුද්ධ අතිරික්තයේ විසර්ජනය - ඒකාබද්ධ අරමුදල | | | | (200,000,000.00) | (200,000,000.00) |
| ශුද්ධ අතිරික්තයේ විසර්ජනය - ඒකාබද්ධ සංචිතය | | | 485,000,000.00 | (485,000,000.00) | - |
| වසර සඳහා ක්‍රමක්ෂය කිරීම | (606,054.00) | | | - | (606,054.00) |
| | | | | | |
| 2013 දෙසැම්බර් 31 වන දිනට ශේෂය | 7,956,326.05 | 13,485,465.44 | 485,000,000.00 | 389,813,763.19 | 896,255,554.68 |
| කාල පරිච්ඡේදය සඳහා ලාභය | | | | 812,077,414.40 | 812,077,414.40 |
| ශුද්ධ අතිරික්තයේ විසර්ජනය - ඒකාබද්ධ අරමුදල | | | | (250,000,000.00) | (250,000,000.00) |
| ශුද්ධ අතිරික්තය මාරු කිරීම - පොදු සංචිතය | | | 715,000,000.00 | (715,000,000.00) | - |
| ප්‍රත්‍යාගණන අතිරික්තයෙන් මාරු කරීම් | | (4,720,625.00) | | 4,720,625.00 | - |
| වසර සඳහා ක්‍රමක්ෂය කිරීම | (606,054.00) | | | - | (606,054.000) |
| | | | | | |
| 2014 දෙසැම්බර් 31 වන දිනට ශේෂය | 7,350,272.05 | 8,764,840.44 | 1,200,000,000.00 | 241,611,802.59 | 1,457,726,915.08 |

## ශ්‍රී ලංකා ගුවන් සේවා අධිකාරිය
# මුදල් ප්‍රවාහ ප්‍රකාශය
2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර

| | 2014 (රු) | 2013 (රු) |
|---|---|---|
| **මෙහෙයුම් කාර්යයන්ගෙන් උත්පාදනය වූ මුදල් ප්‍රවාහය** | | |
| බදු ගෙවීමට පෙර සාමාන්‍ය කාර්යන්ගෙන් ලද ලාභය/ අලාභය | 1,123,432,375.75 | 813,671,859.27 |
| **ගැළපුම්** | | |
| ක්ෂය වීම් | 26,010,573.34 | 26,854,078.66 |
| රජයේ ප්‍රදාන ක්‍රමක්ෂය කිරීම | (606,054.00) | (606,054.00) |
| ආයෝජනවලින් ලද ලාභය | (104,055,369.28) | (90,940,918.72) |
| රක්ෂණ අරමුදල සඳහා ප්‍රතිපාදන | (656,116.67) | 72,216.67 |
| දේපළ, පිරියත සහ උපකරණ විකිණීමෙන් ලද ලාභය / අලාභය | (3,328,979.04) | (63,865.00) |
| නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් සඳහා ප්‍රතිපාදන | 1,839,308.00 | 1,138,179.50 |
| **කාරක ප්‍රාග්ධන වෙනස්වීම්වලට පෙර මෙහෙයුම් ලාභය / අලාභය** | 1,042,635,738.10 | 750,125,496.38 |
| තොග අඩුවීම් | 57,371,349.80 | (72,212,736.49) |
| වෙළඳ ලැබිය යුතු මුදල් හා කාර්ය මණ්ඩලවල ණය වැඩි වීම් | (53,820,685.49) | (39,165,514.10) |
| අත්තිකාරම් පෙර ගෙවුම් හා අනෙකුත් ලැබිය යුතු මුදල් | (1,108,306.30) | 18,751,822.04 |
| ගෙවිය යුතු වෙළඳ සහ අනෙකුත් මුදල් | (170,052.99) | 307,974,046.45 |
| **මෙහෙයුම් වලින් උත්පාදනය වූ මුදල්** | 1,044,908,043.12 | 965,473,114.28 |
| ගෙවන ලද නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් පිරිවැය (පාරිතෝෂිතය) | (649,155.00) | (119,880.00) |
| ගෙවන ලද ආදායම් බදු | (254,358,648.23) | (195,508,111.94) |
| **මෙහෙයුම් කාර්යන්ගෙන් ලද /මෙහෙයුම් කාර්යන්හි යොදවනු ලැබූ ශුද්ධ මුදල්** | 789,900,239.89 | 769,845,122.34 |
| **ආයෝජන කාර්යන්ගෙන් ලද/ආයෝජන කාර්යන් සඳහා යොදවනු ලැබූ මුදල් ප්‍රවාහය** | | |
| දේපළ, පිරියත හා උපකරණ අත්පත් කර ගැනීම් තුළින් ලත් මුදල | (124,751,854.96) | (4,458,717.77) |
| දේපළ, පිරියත හා උපකරණ විකිණීමෙන් ලත් මුදල් | 3,756,790.90 | 71,700.00 |
| වෙනත් ආයෝජන අත්පත් කර ගැනීම් තුළින් ලත් මුදල | (506,543,823.41) | (257,518,412.69) |
| වෙනත් ආයෝජන විකිණීමෙන් ලත් මුදල් - කාර්ය මණ්ඩල සුබ සාධක අරමුදල | | (116,882.00) |
| ලැබුණු පොළිය | 84,618,075.64 | 102,149,662.89 |
| බැංකු ඇපකරය | 5,843,500.00 | 2,220,000.00 |

| | | |
|---|---|---|
| බැංකු ඇපකරය | 5,843,500.00 | 2,220,000.00 |
| ආයෝජන කාර්යන්ගෙන් ලද /ආයෝජන කාර්යන්වලට යොදවනු ලැබූ ශුද්ධ මුදල් ප්‍රවාහ | (537,077,311.83) | (157,652,649.57) |
| මූල්‍ය කටයුතුවලින් ලද /මූල්‍ය කටයුතුවල යොදවනු ලැබූ මුදල් ප්‍රවාහ | | |
| ඒකාබද්ධ අරමුදල | (250,000,000.00) | (200,000,000.00) |
| මූල්‍ය කටයුතුවලින් ලත් /මූල්‍ය කටයුතුවල යොදවනු ලැබූ ශුද්ධ මුදල් ප්‍රවාහ | (250,000,000.00) | (200,000,000.00) |
| මුදල් හා මුදල් සමානතාවල ශුද්ධ වැඩිවීම/(අඩුවීම) | 2,822,928.06 | 412,192,472.77 |
| වර්ෂය ආරම්භයේ මුදල් හා මුදල් සමානතා | 632,639,748.28 | 220,447,275.51 |
| වර්ෂය අවසානයේ මුදල් හා මුදල් සමානතා | 635,462,676.34 | 632,639,748.28 |
| මුදල් හා මුදල් සමානතා විශ්ලේෂණය | | |
| බැංකුවේ ඇති මුදල් | 504,462,676.34 | 488,639,748.28 |
| කෙටිකාලීන ආයෝජන | 131,000,000.00 | 144,000,000.00 |
| | 635,462,676.34 | 632,639,748.28 |

# මූල්‍ය ප්‍රකාශන - 2014

## මූල්‍ය වාර්තාකරණය පිළිබඳව අධිකාරියේ කළමනාකරණයේ වගකීම පිළිබඳ ප්‍රකාශය

2002 අංක 34 දරන ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය පනතේ 14 සහ 15 වන වගන්ති ප්‍රකාරව සිවිල් ගුවන් සේවා අධිකාරියේ සාමාජිකයින් පහත සඳහන් කරුණු සම්බන්ධව වගකීමට බැඳී ඇත.

i අධිකාරියේ ආදායම හා වියදම, වත්කම් හා වගකීම් සහ අනෙකුත් සියළුම මූල්‍ය ගනුදෙනු නිසි පරිදි ගිණුම්ගත කිරීම.

ii. අධිකාරියේ මූල්‍ය ක්‍රියාකාරීත්වය සහ මූල්‍ය තත්ත්වය පිළිබඳ සත්‍ය හා පැහැදිලි දසුනක් ඉදිරිපත් කිරීම සඳහා, 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිති පනත යටතේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය විසින් සම්මත කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව ගිණුම් සකස් කිරීම.

iii. අධිකාරියේ වත්කම් ආරක්ෂා කිරීමටත්, වංචා සහ වෙනත් අක්‍රමිකතා වැළැක්වීම සඳහා මෙන්ම ඒවා අනාවරණය කිරීම සඳහා ද උචිත අභ්‍යන්තර පාලන ක්‍රම පිහිටුවීමටත් නිසි පියවර ගැනීම.

**එච්.එම්.සී. නිමල්සිරි**

සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජෙනරාල් සහ ප්‍රධාන විධායක නිලධාරී

**ෂිබ්ලි අසීස් පී.සී.**

සභාපති

2015 පෙබරවාරි

# වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති

## 01. පොදු ප්‍රතිපත්ති

### 1.1 අනුකූලතා ප්‍රකාශය

අන්තර්ජාතික ගිණුම්කරණ ප්‍රමිති මණ්ඩලය විසින් නිකුත් කරන ලද අන්තර්ජාතික මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති (“IFRS”) නියෝජනය කරනු ලබන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිවලට (SLFRs) අනුකූලව, ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, විස්තීර්ණ ආදායම, සාමාන්‍ය කොටස්වල වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය, මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශය ද (“මූල්‍ය ප්‍රකාශ”) ඇතුළත් වන සටහන් ද පිළියෙළ කර ඇත.

#### මූල්‍ය ප්‍රකාශ පිළිබඳ වගකීම්

මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කිරීම සහ ඉදිරිපත් කිරීම පිළිබඳ වගකීම ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියෙහි කළමනාකරණය වෙත පැවරී ඇත.

### 1.2 සාර්ථක ව්‍යාපාරයක් බව හඳුනා ගැනීම

මෙම මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමේ දී, ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ කළමනාකාරීත්වය විසින් මෙම අධිකාරිය ලාභ ලබන, සාර්ථක ව්‍යාපාරයක් වශයෙන් අඛණ්ඩව පවත්වාගෙන යාමට ඇති හැකියාව පිළිබඳව තක්සේරු කර ඇත. සිවිල් ගුවන් සේවා අධිකාරියට නීත්‍යානුකූලව පැවරී ඇති කාර්යය සහ කර්තව්‍යය ඉටු කරමින් ඉදිරි අනාගතයේ දී ද එහි මෙහෙයුම් කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය වන සම්පත් ප්‍රමාණවත් පරිදි අධිකාරිය සතුව පවතින බවට සාධාරණ අපේක්ෂාවක් අධිකාරියේ කළමනාකාරීත්වය සතුව පවතී. අනාගතය පිළිබඳව ලබා ගත හැකි සියළු තොරතුරු සලකා බලන විට, එහි මෙහෙයුම් ඇවර කිරීමේ හෝ නවතා දැමීමේ අවශ්‍යතාවක් අධිකාරියට නොමැත. මේ අනුව, අධිකාරිය එහි මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමේ දී තව දුරටත් ලාභ ලබන සාර්ථක ව්‍යාපාරයක පදනම (Going Concorn Basic) යොදා ගැනීමට අදහස් කරයි.

### 1.3 අළුතෙන් නිකුත් කරන ලද, එහෙත් ශේෂ පත්‍රය දිනය වන විටත් බලාත්මක නොවුණු ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් නව ප්‍රමිති, පවත්නා ප්‍රමිතිවලට සිදු කර ඇති සංශෝධන සහ අර්ථ දැක්වීම් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය විසින් නිකුත් කර ඇති නමුත් ඒවා මෙම මූල්‍ය ප්‍රකාශ අනුමත කළ දිනය වන විටත් බලාත්මකව නොතිබුණි. මෙම නව ප්‍රමිති අදාළ කර ගැනීමෙන් මූල්‍ය ප්‍රකාශ කෙරෙහි ඇතිවිය හැකි බලපෑම මේ දක්වා තක්සේරු කර නොමැති අතර අධිකාරියේ මූල්‍ය ප්‍රකාශ වලට අදාළ වනු ඇතැයි අපේක්ෂා කරනු ලබන මෙම ප්‍රමිති, පවත්නා ප්‍රමිතිවලට සිදු කර ඇති සංශෝධන සහ අර්ථ දැක්වීම් ඒවා බලාත්මක වූ කල්හි අනුගමනය කිරීමට අධිකාරිය අපේක්ෂා කරයි.

| | |
|---|---|
| SLFR 9 | - මූල්‍ය මෙවලම් |
| SLFR 12 | - වෙනත් සංවිධාන සමඟ පවතින සම්බන්ධතා හෙළිදරව් කිරීම |
| SLFR 13 | - සාධාරණ අගය තක්සේරු කිරීම |

### 1.4 වැදගත් ගිණුම්කරණ විනිශ්චයන්, තක්සේරු කිරීම් හා උපකල්පන භාවිත කිරීම

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කිරීමේ දී, කළමනාකරණය විසින් වාර්තා කළ දිනට වාර්තා කළ ආදායම්, වියදම්, වත්කම්, වගකීම් සහ අසම්භාව්‍ය වගකීම් හෙළිදරව් කිරීම්වලට ද බලපාන තීන්දු තීරණ, තක්සේරු කිරීම් සහ උපකල්පනවලට ද එළැඹීම අවශ්‍ය වේ. කෙසේ වුව ද, මෙම උපකල්පන සහ තක්සේරු කිරීම්වල ඇති අවිනිශ්චිතතාව හේතුවෙන් අනාගතයේ දී යම් බලපෑමක් ඇති විය හැකි කිසියම් වත්කමක හෝ වගකීමක ධාරණ අගයට ප්‍රමාණාත්මක ගැළපීමක් සිදු කිරීමේ අවශ්‍යතාවක් ඇති විය හැකිය. මෙම සාධකවල විනිශ්චයන්, තක්සේරු කිරීම් හා උපකල්පන ඇතුළත් විය හැකිය.

#### විනිශ්චයන්

අධිකාරියෙහි ගිණුම්කරණ ප්‍රතිපත්ති යොදා ගැනීමේ ක්‍රියාවලියේ ඇතුළත් වන තක්සේරු කිරීම්

සහ උපකල්පන හැරුණු විට මූල්‍ය ප්‍රකාශයන් හි පිළිගෙන ඇති ප්‍රමාණයන් කෙරෙහි වඩාත්ම සැලකිය යුතු බලපෑමක් පවතින පහත සඳහන් විනිශ්චයන් කළමනාකරණය විසින් ගොඩ නගා තිබේ.

**තක්සේරු කිරීම් හා උපකල්පන**

එළඹෙන මූල්‍ය වර්ෂය තුළ වත්කම් සහ වගකීම්වල ධාරණ අගයට වැදගත් ගැළපුම් සිදු කළ යුතු සැලකිය යුතු අවදානමක් ඇති කරවන අනාගතයට අදාළ වන ප්‍රධාන උපකල්පන පිළිබඳව සහ වාර්තාකරණ දිනට තක්සේරුකිරීම්වල ඇති අවිනිශ්චිතතා සම්බන්ධ වෙනත් ප්‍රධාන ප්‍රභවයන් පිළිබඳ ද පහත සඳහන් කර තිබේ.

**(අ) මූල්‍ය මෙවලම්වල සාධාරණ අගය**

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි වාර්තා කර ඇති මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම්වල සාධාරණ අගය සක්‍රිය වෙළඳපොළෙන් ව්‍යුත්පන්න කර ගත නොහැකි වන විට, එම සාධාරණ අගය වට්ටම් කරන ලද මූල්‍ය ප්‍රවාහ මොඩලය සහ/හෝ ගණිත මොඩලඩල ඇතුළත් විවිධ ඇගයීමේ ශිල්පක්‍රම භාවිතා කිරීමෙන් ගණනය කරනු ලැබේ. මෙම මොඩලයන් සඳහා අවශ්‍ය යෙදවුම් නිරීක්ෂණය කළ හැකි වෙළඳපොළ දත්ත ලබා ගත හැකි අවස්ථාවලදී එමගින් ලබා ගන්නා ලබන අතර නිරීක්ෂණය කළ හැකි වෙළඳපොළ දත්ත ලබා ගත නොහැකි අවස්ථාවක දී, සාධාරණ අගය ස්ථාපනය කිරීම සඳහා විනිශ්චයන් අවශ්‍ය වේ.

මෙම සාධක පිළිබඳ උපකල්පනයන් හි වෙනස්කම් ඇති වීම නිසා මූල්‍ය මෙවලම්වල වාර්තා කරන ලද සාධාරණ අගයන් කෙරෙහි බලපෑම් ඇති විය හැකිය.

ශේෂ පත්‍ර දිනට මූල්‍ය වත්කම්වල ධාරණ අගය රු. 2,278,203,495/- කි.(2013 දී රු. 1,678,666,779/-)

**(ආ) නිශ්චිත ප්‍රතිලාභ වගකීම් ඇගයීම**

සූත්‍ර ක්‍රමය (Formuia Method) භාවිතා කිරීම මගින් නිශ්චිත ප්‍රතිලාභ විශ්‍රාම සැලසුම්වල පිරිවැය නිශ්චය කරනු ලබයි.

ශේෂ පත්‍ර දිනයට නිශ්චිත ප්‍රතිලාභ වගකීමේ ධාරණ අගය රු. 12,479,380/- කි ( 2013 - රු. 11,289,227/-)

**(ඇ) සාධාරණ අගය**

සාධාරණ අගය යනු ගනුදෙනුව පිළිබඳව දැනුවත්බවක් සහ කැමැත්තක් සහිත කුලුපඟතාවයක් නොමැති දෙපාර්ශ්වයක් අතර පිටස්තර බලපෑම්වලින් තොරව සිදු වන ගනුදෙනුවකදී එකඟතාවයට එළඹුණු ප්‍රතිෂ්ඨාවේ අගයයි. මූල්‍ය උපකරණ ආරම්භයේ දී පිළිගනු ලබන විට, එහි සාධාරණ අගය වනුයේ සාමාන්‍යයෙන් ඒ සඳහා ගෙවන ලද හෝ ලබා ගන්නා ලද හෝ ප්‍රතිෂ්ඨාවේ අගයයි. ආරම්භක පිළිගැනීමෙන් අනතුරුව, සක්‍රිය වෙළඳපොළක මිල සඳහන් කර ඇති මූල්‍ය වත්කමක සාධාරණ අගය වනුයේ එහි විකුණුම් මිල වන අතර සක්‍රිය වෙළඳපොළක මිල සඳහන් කර ඇති මූල්‍ය වගකීමක සාධාරණ අගය වනුයේ සාමාන්‍යයෙන් එහි ඉල්ලුම් මිලයි. මුදල් සමානතා සහ කෙටිකාලීන ආයෝජන වැනි කෙටි කාල සීමාවක් පවතින කෙටි කාලීන මූල්‍ය මෙවලම්වල ධාරණ අගය එහි සාධාරණ අගය ලෙස සාමාන්‍යයෙන් පිළිගත හැකිය.

**(ඈ) ආදායම් බදු**

අධිකාරිය ආදායම් බද්දට යටත් වන අතර ආදායම් බදු සඳහා අවශ්‍ය සමස්ත ප්‍රතිපාදන ප්‍රමාණය නිශ්චය කිරීම සඳහා සැලකිය යුතු විනිශ්චයක් සිදු කිරීම අවශ්‍ය වේ.

### 1.5 මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීමේ ව්‍යවහාර මුදල් වර්ගය

අධිකාරියේ ව්‍යවහාර මුදල් වර්ගය ශ්‍රී ලංකා රුපියල් බව නිශ්චය කර ඇති අතර මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කරනු ලබන්නේ ද ශ්‍රී ලංකා රුපියල්වලිනි.

## 2. විශේෂිත ගිණුම්කරණ ප්‍රතිපත්ති

### 2.1 මූල්‍ය වත්කම්

ණය සහ ලැබිය යුතු මුදල්, කල්පිරෙන තුරු තබාගන්නා වත්කම් සහ විකිණීමට තිබෙන වත්කම් වශයෙන් අධිකාරිය එහි මූල්‍ය වත්කම් වර්ගීකරණය කර තිබේ. කළමනාකාරණය විසින් ආරම්භක පිළිගැනීමේ දී මෙම වර්ගීකරණය පිළිබඳ නිශ්චය කරනු ලබන අතර එම වර්ගීකරණය අදාළ ආයෝජන අත්පත් කර ගත් අරමුණ මත රඳා පවතියි.

#### 2.1.1 වර්ගීකරණය

**අ) ණය සහ ලැබිය යුතු මුදල්**

ණය සහ ලැබිය යුතු මුදල් යනු සක්‍රිය වෙළඳපොළක මිල සඳහන් කර නොමැති නියමිත දිනට ගෙවිය යුතු හෝ ගණනය කළ හැකි ගෙවීම් සහිත ව්‍යුත්පන්න කළ නොහැකි මූල්‍ය වත්කම් ය. සාමාන්‍ය ගනුදෙනුවලින් ඇති වන ලැබිය යුතු මුදල් ද මෙම ප්‍රවර්ගය යටතේ වර්ගීකරණය කර ඇති අතර එවැනි වත්කම්වලට සිදුවන හානි පිළිබඳව සමාලෝචනය කරනු ලැබේ.

**ආ) කල් පිරෙන තුරු තබාගන්නා මූල්‍ය වත්කම්**

කල්පිරෙන තුරු තබා ගන්නා මූල්‍ය වත්කම් යනු නියමිත දිනට ගෙවිය යුතු හෝ ගණනය කළ හැකි ගෙවීම් සහිත ව්‍යුත්පන්න කළ නොහැකි

මූල්‍ය වත්කම් වන අතර කල් පිරෙන තුරු තබා ගැනීම පිළිබඳව අධිකාරියේ කළමනාකාරිත්වයට ධනාත්මක අභිප්‍රායක් සහ හැකියාවක් ඇති ස්ථාවර කල් පිරීම් වේ. එසේ වුවද, පහත සඳහන් මූල්‍ය වත්කම් මෙම ප්‍රවර්ගයට ඇතුළත් නොවේ.

- ආරම්භක පිළිගැනීමෙන් පසු අධිකාරිය විසින් ලාභය හෝ අලාභය තුළින් නිගමනය කරනු ලබන සාධාරණ අගය සහිත වත්කම් වශයෙන් නම් කරනු ලබන වත්කම්.
- අධිකාරිය විසින් විකිණීමට තිබෙන වත්කම් වශයෙන් නම් කරනු ලබන වත්කම්.
- ණය සහ ලැබිය යුතු මුදල් බවට අර්ථකථනය කළ හැකි වත්කම්.

කල් පිරෙන තුරු තබාගන්නා ආයෝජනවලින් ලැබෙන පොළිය ආදායම් ප්‍රකාශයෙහි ඇතුළත් කරනු ලබන අතර, එම ආදායම් "ආයෝජන ආදායම" වශයෙන් වාර්තා කරනු ලැබේ.

**ඇ) විකිණීමට තිබෙන මූල්‍ය වත්කම්**

විකිණීමට තිබෙන මූල්‍ය වත්කම් වශයෙන් හඳුන්වනු ලබන්නේ අවිනිශ්චිත කාල සීමාවක් සඳහා රඳවා ගැනීමට අපේක්ෂා කරනු ලබන, ඇවර කිරීමේ අවශ්‍යතාවට හෝ පොලී අනුපාත, විනිමය අනුපාත හෝ සාමාන්‍ය කොටස් මිල වෙනස් වීම නිසා හෝ උද්ගත වන අවශ්‍යතාවට ප්‍රතිචාරයක් වශයෙන් විකිණීමට සිදු විය හැකි, ණය සහ ලැබිය යුතු මුදල් ලෙස වර්ගීකරණය නොකරන ලද මූල්‍ය වත්කම්, කල්පිරෙන තුරු තබාගන්නා ආයෝජන හෝ ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයට පිළිගනු ලබන මූල්‍ය වත්කම් ය.

### 2.1.2 පිළිගැනීම සහ මානය

මූල්‍ය වත්කම් මූලික වශයෙන් ඒවායේ සාධාරණ අගයට සහ පිළි ගනු ලබන අතර ලාභය හෝ අලාභය හරහා සාධාරණ අගය මත පවත්වා ගනු නොලබන මූල්‍ය වත්කම් ඇත්නම් ඒ සියල්ල අත්පත් කර ගැනීම සඳහා සෘජුව වැය වූ ගනුදෙනු පිරිවැයේ ද එකතුවක් ලෙස හඳුනා ගනු ලැබේ. ලාභය හෝ අලාභය හරහා සාධාරණ අගය මත පවත්වා ගනු ලබන මූල්‍ය වත්කම් මූලික වශයෙන් සාධාරණ අගයට පිළි ගනු ලබන අතර ගනුදෙනු පිරිවැය ආදායම් ප්‍රකාශයේ වියදමක් වශයෙන් සටහන් කරනු ලැබේ.

මූල්‍ය වත්කම්වලින් ලැබෙන මූල්‍ය ප්‍රවාහයන් භාර ගැනීමේ අයිතිය අවසන් වූ කල්හි හෝ, මූල්‍ය වත්කම් මාරු කරනු ලැබීමෙන් අනතුරුව හිමිකමේ අවදානම් සහ වරප්‍රසාද සියල්ල ද අධිකාරිය විසින් සාරානුකූලව මාරු කරනු ලැබූ කල්හි හෝ එවැනි මූල්‍ය වත්කම් පිළිගැනීම අත්හැර දමනු ලැබේ. විකිණීමට තිබෙන මූල්‍ය වත්කම් පසුව සාධාරණ අගයට පවත්වාගෙන යනු ලැබේ. ණය සහ ලැබිය යුතු මුදල් සහ කල් පිරෙන තුරු තබාගන්නා මූල්‍ය වත්කම් ද බලාත්මක පොළී ක්‍රමය භාවිතා කිරීමෙන් ක්‍රමක්ෂය කළ පිරිවැයට පවත්වාගෙන යනු ලැබේ.

විකිණීමට තිබෙන මූල්‍ය වත්කම් වශයෙන් වර්ගීකරණය කර ඇති මුදල් සහ මුදල් නොවන ඇපවල සාධාරණ අගයේ වෙනස් වීම් වෙනත් විස්තීර්ණ ආදායම් යටතේ පිළි ගනු ලැබේ.

විකිණීමට තිබෙන වත්කම් වශයෙන් වර්ගීකරණය කර ඇති ඇප විකුණූ කල්හි හෝ ඒවාට හානි සිදු වූ කල්හි හෝ වෙනත් විස්තීර්ණ ආදායම යටතේ පිළිගෙන ඇති සමුච්චිත සාධාරණ අගය සඳහා ගැළපුම් මූල්‍ය වත්කම්වලින් ලද ශුද්ධ ලාභ/අලාභ ලෙස ආදායම් ප්‍රකාශයෙහි ඇතුළත් කරනු ලැබේ.

බලාත්මක පොළී ක්‍රමය භාවිත කරමින් ගණනය කරන ලද විකිණීමට තිබෙන ඇප සඳහා පොළී ප්‍රමාණය ආදායම් ප්‍රකාශනයෙහි පිළි ගනු ලැබේ.

### 2.1.3 සාධාරණ අගය නිශ්චය කිරීම

ණය මුදලේ තත්ත්වය, ද්‍රවශීලීතාව සහ පිරිවැය සැලකිල්ලට ගනිමින් ද, ගිවිසුම් මඟින් එකඟ වූ මුදල් ප්‍රවාහ පදනම් කර ගනිමින් ද, වර්තමාන වටිනාකම් මොඩලයක් භාවිතා කරමින් ණය සහ අත්තිකාරම්වල මෙන්ම බැංකු සහ පාරිභෝගිකයින් වෙත පවතින වගකීම්වල සාධාරණ අගය නිශ්චය කරනු ලැබේ.

ලැබිය යුතු වෙළඳ මුදල් සහ ගෙවිය යුතු මුදල්වල ධාරණ අගය හානි සඳහා ප්‍රතිපාදනවලින් අඩුකිරීමෙන් ලැබෙන අගය එකී වත්කම්වල සාධාරණ අගය වශයෙන් සාමාන්‍යයෙන් සැලකිය හැකිය.

### 2.1.4 පිළිගැනීම අත්හැරීම

පහත සඳහන් අවස්ථාවන් හි අදාළ වන පරිදි කිසියම් මූල්‍ය වත්කමක කොටසක හෝ සමාන මූල්‍ය වත්කම් කාණ්ඩයකින් කොටසක හෝ පිළිගැනීම අත්හරිනු ලැබේ.

- අදාළ වත්කමෙන් ලැබෙන මුදල් ප්‍රවාහයන් භාර ගැනීමේ අයිතිවාසිකම අවසන් වූ විට

- වත්කමෙන් ලැබෙන මුදල් ප්‍රවාහයන් භාරගැනීමේ අයිතිවාසිකම අධිකාරිය විසින් මාරු කර ඇති විට හෝ අධිකාරිය විසින් අධිකාරියට ලැබෙන සම්පූර්ණ මූල්‍ය ප්‍රවාහයන් "පසු කර යෑමේ" වැඩපිළිවෙළක් යටතේ සැලකිය යුතු ප්‍රමාදයකින් තොරව තුන්වන පාර්ශ්වයකට ගෙවීමට බැඳී ඇති අවස්ථාවක දී; සහ
**(අ) අධිකාරිය විසින් වත්කමේ අවදානම් සහ ප්‍රතිලාභ සියල්ල සාරානුකූලව මාරු කර ඇත්නම් හෝ**
**(ආ) අධිකාරිය විසින් වත්කමේ ප්‍රතිලාභ සහ අවදානම් සියල්ල සාරානුකූලව මාරු කිරීමක් හෝ රඳවා ගැනීමක් හෝ සිදු කර නොමැති වුව ද. වත්කමේ පාලනය මාරුකර ඇත්නම්; හෝ**
අධිකාරිය විසින් කිසියම් වත්කමකින් ලැබෙන මූල්‍ය ප්‍රවාහයන් භාර ගැනීමේ අයිතිය මාරු කර ඇත්නම්

හෝ "පසු කර යැමේ" වැඩ පිළිවෙලකට ඇතුළත් වී ඇත්නම් සහ අදාළ වත්කමේ සියළු ප්‍රතිලාභ සහ අවදානම මාරු කර හෝ සාරානුකූලව රඳවාගෙන හෝ නොමැතිව එහි පාලනය මාරු කිරීමක් ද සිදු නොකර ඇත්නම් හෝ එවැනි වත්කමක් පිළිගැනීම සිදු කරනු ලබන්නේ එම වත්කම පිළිබඳව අධිකාරිය සතුව පවතින සම්බන්ධතාවයේ ප්‍රමාණය මත පදනම් වෙමිනි. අධිකාරිය ඒ සම්බන්ධයෙන් ආශ්‍රිත වගකීමක් ද පිළි ගනියි. අධිකාරිය රඳවාගෙන ඇති වරප්‍රසාද සහ වගකීම් පිලිබිඹු වන පදනමක් මත මාරු කරන ලද වත්කම සහ ආශ්‍රිත වගකීම මනිනු ලැබේ. මාරු කරන ලද වත්කම් සඳහා වන ඇපයක ස්වරූපය ගත් අධිකාරියේ මැදිහත්වීම වත්කමේ ආරම්භක ධාරණ අගය සහ අධිකාරියට ආපසු ගෙවීමට සිදුවිය හැකි උපරිම ප්‍රතිෂ්ඨා අගය යන දෙකෙන් අඩුම අගය අනුව මනිනු ලැබේ.

## 03. දේපළ, පිරියත හා උපකරණ

### 3.1 පිරිවැය/ප්‍රත්‍යාගණනය

අයිතිකරු පදිංචි වී සිටින දේපළ ද ඇතුළු දේපළ සහ උපකරණ එදිනෙදා නඩත්තු වියදම් හැර සමුච්චිත ක්ෂයවීම් සහ සමුච්චිත හානිකරණ අලාභ අඩුකර පිරිවැයට දක්වනු ලැබේ. ප්‍රතිසම්පාදන හෝ ප්‍රධාන පෙලේ පරීක්ෂණ වියදම් ඒවා දුරු කල්හි සහ අදාළ අයිතමය ආශ්‍රිතව අනාගතයේ දී ආයතනයට ආර්ථික ප්‍රතිලාභ ලැබිය හැකි වේ නම් හෝ අයිතමයේ පිරිවැය විශ්වාසනීය ලෙස මිනිය හැකි වේ නම් හෝ ප්‍රාග්ධනීකරණය කරනු ලැබේ.

දේපළ සහ උපකරණ අත්පත් කර ගැනීමේ හෝ ඉදි කිරීමේ පිරිවැයත්, ඒවා අවශ්‍ය පරිදි පාවිච්චි කළ හැකි තත්වයට ගෙන ඒම සඳහා දරන ලද වියදමත් දේපළ සහ උපකරණවල පිරිවැය වශයෙන් සලකනු ලැබේ. ඉන් පසුව, දේපළ සහ උපකරණ ඒකක ප්‍රත්‍යාගණනය කරන විට අදාළ වත්කම් වර්ගයට අයත් එවැනි වත්කම් සියල්ල එක්වර ප්‍රත්‍යාගණනය කරනු ලැබේ. 2014 වසරේ සිට සෑම වසර තුනකට (3) සිට සෑම වසර පහකට (5) වරක් අධිකාරිය වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමේ ප්‍රතිපත්තිය වෙනස් කිරීමට තීරණය කර ඇත. කෙසේ වුවද, ප්‍රත්‍යාගණනයට යටත් වන වත්කම්වල සාධාරණ අගය ධාරණ අගයට සාපේක්ෂව විශාල වශයෙන් වෙනස් වුවහොත් එවැනි වත්කම් යළි ප්‍රත්‍යාගණනය කරනු ලැබේ.

ආදායම් ප්‍රකාශයෙන් වැඩිවීමක් ලෙස එම අවස්ථාවේ පිළි ගන්නා ලද, ආදායම් ප්‍රකාශයේ එම වත්කම සම්බන්ධයෙන් පූර්වයෙන් පිළි ගත් ප්‍රත්‍යගණන අඩුවීම ප්‍රතිවර්ත වන ප්‍රමාණය හැර වත්කම් ප්‍රත්‍යාගණනය කළ විට එහි ධාරණ අගයේ කිසියම් වැඩිවීමක් සිදු වුවහොත් එකී වැඩිවීම සෘජුවම ප්‍රත්‍යාගණන සංචිතයට බැර කරනු ලැබේ. කිසියම් වර්තමාන ප්‍රත්‍යගණන හිඟයක් නිසා එම වත්කමේම ඊට පෙර ප්‍රත්‍යගණන අතිරික්තයක් හිලව් වන්නේ නම්, ප්‍රත්‍යගණන සංචිතයේ ඇති අතිරික්තයට එරෙහිව එය සෘජුව හිලව් කරනු ලැබේ. කිසියම් ඉතිරියක් වෙතොත් එය වැයක් වශයෙන් පිළි ගනු ලැබේ. වත්කමක් විකුණූ විට හෝ ඉවත් කළ විට හෝ ඊට අදාළ ප්‍රත්‍යගණන සංචිතය රඳවාගත් ඉපැයුම්වලට මාරු කරනු ලැබේ.

### 3.2 භාණ්ඩාගාරයෙන්/රජයෙන් අධිකාරියට මාරු කරන ලද දේපළ, පිරියත සහ උපකරණ එකී වත්කම් ලැබුණු දිනට පැවති සාධාරණ අගයට ප්‍රකාශ කර ඇත. (ඇගයීම සිදු කරන ලද්දේ 2003 දීය.) ෂඤ්ඤී ප්‍රකාරව ඉදිරිපත් කිරීමේ අරමුණ වෙනුවෙන් එකී වත්කම්වල ප්‍රත්‍යගණන අගයන් 2011 ජනවාරි 01 දිනට තිබුණු පිරිවැය වශයෙන් සලකා කටයුතු කර ඇත.

### 3.3 ක්ෂය කිරිම.

දේපළ, පිරියත සහ උපකරණවල පිරිවැය/තක්සේරු වටිනාකම මත සරල රේඛීය ක්‍රමය පදනම් කර ගනිමින් (වත්කමේ පිරිවැයේ/තක්සේරු වටිනාකමේ අවශේෂ වටිනාකමින් 10% ක් අඩු කර) ක්ෂයවීම සඳහා ප්‍රතිපාදන ගණනය කරනු ලැබේ. ඉඩම් හැර සියළු දේපළ, පිරියත සහ උපකරණ ඒවායේ ඵලදායි ජීව කාලය පුරා ලියා හැරිය හැකි වන පරිදි පහත සඳහන් ප්‍රතිශතවලින් වාර්ෂිකව ක්ෂය කර ඇත.

| | |
|---|---|
| ගොඩනැගිලි | 6.66% |
| මෝටර් වාහන | 12.5% |
| පිරියත, යන්ත්‍ර සූත්‍ර හා උපකරණ | 25% |
| ගෘහ භාණ්ඩ සහ සවිකිරීම් | 25% |
| තොරතුරු තාක්ෂණ මෘදුකාංග | 50% |

වත්කම් මිලදී ගත් දිනයේ සිට ආරම්භ කර ලාභාලාභ ගිණුමට මාසික පදනමින් ක්ෂයකිරීම ගිණුම්ගත කර ඇති අතර එකිනෙක වත්කමේ ක්ෂය කළ යුතු මුල් අගය නිශ්චය කිරීමේදී එහි පිරිවැයෙන්/ප්‍රත්‍යාගණන අගයෙන් 10% ක් අවශේෂ වටිනාකම වශයෙන් රඳවාගෙන තිබේ. සමාලෝචනයට භාජනය වන වර්ෂය තුළ නියමිත පරිදි දේපළ, පිරියත සහ උපකරණවල ආර්ථික ජීව කාලය ලබා ගත හැකිව තිබූ වඩාත් වාසිදායක තොරතුරු මත පදනම්ව ලංකා ගිණුම්කරණ ප්‍රමිති 16 (LKAS 16) උපයෝගී කර ගනිමින් යළි තක්සේරු කරන ලදී. එහි ප්‍රතිඵලයක් වශයෙන් ඇතැම් දේපළ, පිරියත සහ උපකරණවල ක්ෂය කිරීමේ අනුපාත වෙනස් කරන ලදී. වත්කම්වල ආර්ථික ජීව කාල වෙනස් වීමෙන් ඇති වන බලපෑම අනුව 2012 වර්ෂයේ සිට ආරම්භ වන පරිදි මූල්‍ය ප්‍රකාශනවල ගැළපුම් යොදනු ඇත.

මෝටර් වාහනවල ඵලදායි ජීව කාලය නැවත තක්සේරු කරන ලද අතර 2008 වර්ෂයෙන් පසුව මිලදී ගන්නා ලද මෝටර් වාහනවල ක්ෂය කිරීමේ ප්‍රතිශතය වාර්ෂිකව 25% සිට 12.5% දක්වා අඩු කරනු ලැබීය. 2008 ට පෙර මිලදී ගන්නා ලද වාහන ගර්භිත කර අපහරණය කිරීමේ ක්‍රියාවලිය සිදු වෙමින් පවතින හෙයින් ක්ෂය කිරීමේ ප්‍රතිශතයේ කිසිදු වෙනසක් සිදු නොකරන ලදී.

2013 වර්ෂයේ දී ක්ෂය කිරීම් වැඩිපුර ගණනය කරනු ලැබූ බැවින් අධිකාරියේ ලාභය රු. 4,417,585.93 ක් ලෙස අඩුවෙන් දක්වා තිබුණි. ක්ෂය කිරීම් නිසි පරිදි ගණනය කර තිබුණේ නම්, සමාලෝචිත වර්ෂය තුළ අධිකාරියේ ලාභය රු. 589,930,140.75 ක් විය හැකිව තිබුණි.

### 3.4 පිළිගැනීම අත් හැරීම

දේපළ සහ උපකරණ අයිතම අපහරණය කළ විට හෝ ඒවා භාවිත කිරීමෙන් තවදුරටත් අනාගත ආර්ථික ප්‍රතිලාභ අපේක්ෂා කළ නොහැකි විට හෝ එවැනි දේපළ සහ උපකරණ අයිතම පිළිගැනීම අත්හරිනු ලැබේ. දේපළ, පිරියත සහ උපකරණ අයිතම පිළි ගැනීම අත් හැරීමෙන් සිදුවන ලාභය හෝ අලාභය වශයෙන් නිශ්චය කරනු ලබන්නේ එවැනි වත්කමක් විකුණා ලත් මුදලත් එහි ධාරණ අගයත් යන දෙකේ වෙනස වන අතර එය ආදායම් ප්‍රකාශයෙහි ගිණුම්ගත කරනු ලැබේ.

### 3.5 ස්පෘශ්‍ය වත්කම්වලට හානි සිදු වීම

අධිකාරිය සෑම වාර්තාකරණ කාලසීමාවක් අවසානයේදීම එහි ස්පෘශ්‍ය වත්කම්වලට හානි සිදු වීම හේතුකොටගෙන කිසියම් අලාභයක් සිදු වී ඇත්දැයි නිශ්චය කිරීම සඳහා එම වත්කම්වල ධාරණ අගයන් සමාලෝචනය කරයි. එවැනි අලාභයක් සිදු වී තිබේ නම් හානකරණ අලාභය නිශ්චය කිරීම සඳහා අදාළ වත්කමෙන් නැවත ලබා ගත හැකි අගය තක්සේරු කරනු ලැබේ. තනි වත්කමක නැවත ලබා ගත හැකි අගය තක්සේරු කළ නොහැකි අවස්ථාවකදී, එම වත්කම අයත් වන සම්පූර්ණ මුදල් උත්පාදන ඒකකය සඳහාම නැවත ලබා ගත හැකි අගය නිශ්චය කරනු ලැබේ. ඒ සඳහා යුක්ති සහගත සහ ස්ථාවර වෙන් කිරීමේ පදනමක් හඳුනා ගැනීමට හැකි වන අවස්ථාවන් හි වත්කම් තනි මුදල් උත්පාදන ඒකක වශයෙන්ද වෙන් කරනු ලැබේ. එසේ නැතහොත්, එවැනි යුක්ති සහගත සහ ස්ථාවර වෙන් කිරීමේ පදනමක් හඳුනාගත හැකි කුඩාම මුදල් උත්පාදන ඒකකවලට ද වෙන් කරනු ලැබේ.

නැවත ලබා ගත හැකි අගය වනුයේ විකිණුම් පිරිවැය අඩු කළ සාධාරණ අගය හෝ පාවිච්චි කරන අතරතුර අගය යන දෙකෙන් වැඩි අගයයි. පාවිච්චිය අතරතුර අගය තක්සේරු කිරීමේදී මුදලේ කාල අගය පිළිබඳ වර්තමාන වෙළඳපොළ තක්සේරුව සහ අනාගත මුදල් ප්‍රවාහ ඇස්තමේන්තු ගැළපුම් කර නැති වත්කමට විශේෂිත වූ අවදානම පිළිබිඹු කෙරෙන පූර්ව බදු වට්ටම් අනුපාතයක් යොදමින් ඇස්තමේන්තු කරන ලද අනාගත මුදල් ප්‍රවාහ ඒවායේ වර්තමාන අගයට වට්ටම් කරනු ලැබේ.

වත්කමක හෝ මුදල් උත්පාදන ඒකකයක නැවත ලබා ගත හැකි අගය එහි ධාරණ අගයට වඩා අඩු බව ඇස්තමේන්තු කර ඇති අවස්ථාවක, එකී වත්කමේ (මුදල් උත්පාදන ඒකකයේ) ධාරණ අගය නැවත ලබා ගත හැකි අගය දක්වා අඩු කරනු ලැබේ. ආදායම් ප්‍රකාශයෙහි හානිකරණ අලාභයක් ක්ෂණිකව පිළිගනු ලැබේ. එහෙත්, අදාළ වත්කම පවතින්නේ ප්‍රත්‍යාගණන අගයකට නම්, අදාළ හානිකරණ අලාභය ප්‍රත්‍යගණන අඩු වීමක් ලෙස සලකනු ලැබේ.

## 04 තොග

තොග අගය කර ඇත්තේ පිරිවැයට හෝ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගයටය. පිරිවැය නිශ්චය කරනුයේ "මුලින් පිවිසි මුලින් නිකුතු" පදනම මතය.

## 05 වෙනත් වත්කම්

වෙනත් වත්කම් අතරට වෙනත් ණය ගැතියෝ සහ ලැබිය යුතු මුදල්, අත්තිකාරම්, තැන්පතු, කලින් ගෙවීම් සහ ලැබිය යුතු බදු මුදල් ඇතුළත් වේ.

**(අ) අත්තිකාරම්, තැන්පතු, පෙර ගෙවූ වියදම්**

එක් මූල්‍ය වර්ෂයකට වැඩි කාලයකට ප්‍රතිලාභ ලැබෙන හෝ සම්බන්ධකමක් ඇති බවට සැලකිය හැකි වියදම් අත්තිකාරම්, තැන්පතු සහ පෙර ගෙවූ වියදම් වශයෙන් වර්ගීකරණය කරනු ලැබේ. එවැනි වියදම් ඒවාට අදාළ වන කාල සීමාව තුළ කාල සමානුපාතික පදනමකින් කපා හරිනු ලැබේ.

**(ආ) වෙනත් ණය ගැතියෝ**

වෙනත් ණය ගැතියෝ හානිකරණ අලාභ අඩු කළ පිරිවැයට පිළිගනු ලැබේ.

**(ඇ) ලැබිය යුතු බදු මුදල්**

ලැබිය යුතු බදු මුදල් පිරිවැයට පිළිගනු ලැබේ.

**(ඈ) පෙර ගෙවූ කාර්ය මණ්ඩල පිරිවැය**

අධිකාරියේ සේවකයින්ට සහන පොළී අනුපාත මත ලබා දී ඇති කාර්ය මණ්ඩල ණයවල ඉතිරිය මෙයින් නියෝජනය වේ.

## 06 මුදල් සහ මුදල් සමානතා

මුදල් සහ මුදල් සමානතා අත ඇති මුදල්වලින් සහ නිශ්චිත මුදල් ප්‍රමාණවලට ක්ෂණිකව පරිවර්තනය කළ හැකි සුළු වශයෙන් අගය වෙනස් වීමේ අවදානමකට පමණක් නිරාවරණය විය හැකි ඉහළ ද්‍රවශීලතාවක් සහිත කෙටිකාලීන ආයෝජනවලින් සමන්විත වේ. කෙටි කාලීන මුදල් අවශ්‍යතා සපුරා ගැනීම සඳහා මුදල් සහ මුදල් සමානතා පවත්වාගෙන යනු ලබයි.
මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ කාර්යයන් සඳහා මුදල් සහ මුදල් සමානතා වශයෙන් සලකනු ලබන්නේ අත ඇති මුදල් සහ බැංකු තැන්පතුය. කෙටි කාලයකින් කල් පිරෙන ආයෝජන ද මුදල් සමානතා වශයෙන්

සලකනු ලැබේ. ඒකාබද්ධ ශේෂ පත්‍රයේ ජංගම වගකීම් යටතේ ණය ගැනීම් ලෙස බැංකු අයිරා පෙන්වනු ලැබේ.

## 07 ප්‍රතිපාදන

අදාළ වගකීම් නිරවුල් කිරීම සඳහා ආර්ථික ප්‍රතිලාභ අන්තර්ගත සම්පත් ගලනයක් අවශ්‍ය විය හැකි එමෙන්ම වගකීමේ ප්‍රමාණය පිළිබඳ විශ්වාස කළ හැකි ඇස්තමේන්තුවක් ද සකස් කළ හැකි වර්තමාන වගකීමක් (නෛතික හෝ අනුමිත) අතීත සිදුවීමක ප්‍රතිඵලයක් වශයෙන් අධිකාරිය මත පැවරී ඇති විට ද ප්‍රතිපාදන පිළි ගනු ලැබේ. මුදලෙහි කාල අගයෙහි බලපෑම වැදගත් වන්නේ නම් මුදලෙහි කාල අගය පිළිබඳ වර්තමාන වෙළඳපොළ තක්සේරුව සහ උචිත අවස්ථාවන් හි වගකීමට විශේෂිත වූ අවදානම පිළිබිඹු කෙරෙන පූර්ව බදු වට්ටම් අනුපාතයකින් අපේක්ෂිත අනාගත මුදල් ප්‍රවාහ වට්ටම් කිරීමෙන් ප්‍රතිපාදන නිශ්චය කරනු ලැබේ.

### 7.1 සේවක ප්‍රතිලාභ

**නිශ්චිත දායක මුදල් සැලසුම්**

අදාළ වන ව්‍යවස්ථා සහ රෙගුලාසිවලට අනුකූලව සේවකයින්ට සේවක අර්ථසාධක අරමුදලට (EPF) සහ සේවක භාරකාර අරමුදලට (ETF) දායක වීමේ හිමිකම ලැබී ඇත. අධිකාරිය සේවකයින්ගේ දළ වැටුප අනුව නිශ්චිත දායක මුදල් ප්‍රමාණ සේවක අර්ථසාධක අරමුදලට (EPF) සහ සේවක භාරකාර අරමුදලට (ETF) ද ගෙවනු ලබන අතර එයට අමතරව කිසිදු මුදලක් ගෙවීමට අධිකාරිය නෛතික වශයෙන් හෝ සම්මුතික වශයෙන් හෝ බැඳී නැත.

**නිශ්චිත ප්‍රතිලාභ සැලසුම්**

නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් යනු නිශ්චිත දායක මුදල් සැලසුම්වලට අමතර පශ්චාත් රැකියා සැලසුම් ය. 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනත යටතේ අධිකාරිය සේවකයින්ට පාරිතෝෂික ගෙවීමට නීතියෙන් බැඳී ඇත. මෙම වගකීම ඉටු කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ප්‍රමාණය සේවකයෙකු සේවයෙහි යෙදෙන සෑම එක් වර්ෂයක් වෙනුවෙන් ම මාස භාගයක වැටුප බැගින් ගණනය කිරීමෙන් නිශ්චය කරනු ලැබේ.

### 7.2 අනතුරු විමර්ශන අරමුදල

ගුවන් යානා අනතුරුවලට අදාළ අනතුරු විමර්ශන පැවැත්වීම සහ සෙවීම් සහ මුදවා ගැනීම් පිළිබඳව රජයේ වගකීම පැවරී ඇත්තේ සිවිල් ගුවන් සේවා අධිකාරිය මතය. මේ සඳහා රුපියල් මිලියන 250 ක ප්‍රතිපාදන මූල්‍ය ප්‍රකාශනයන්හි වෙන් කර ඇත. මෙම ප්‍රතිපාදනයෙහි අගය නිශ්චය කර ඇත්තේ අධිකාරියේ කළමනාකරණයේ විනිශ්චය අනුවය.

### 7.3 කාර්ය මණ්ඩල සුබසාධන සහ සමාජ රක්ෂණ අරමුදල

2002 අංක 34 දරන ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය පනතේ 20(5) වගන්තය ප්‍රකාරව රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ලබා සිවිල් ගුවන් සේවා අධිකාරියට බැඳුනු රාජ්‍ය නිලධාරීන් වෙනුවෙන් කාර්ය මණ්ඩල සුබසාධන සහ සමාජ රක්ෂණ අරමුදල පිහිටුවා ඇත. එක් එක් විශ්‍රාමික නිලධාරියා නමින් මෙම අරමුදලෙහි තැන්පත්ව ඇති මුදල් ඒ ඒ නිලධාරියා සිවිල් ගුවන් සේවා අධිකාරියෙන් විශ්‍රාම ලබන විට සමුච්චිත පොළිය සමඟ නිදහස් කරනු ඇත.

## 08 මූල්‍ය වගකීම්

### 8.1 මූලික පිළිගැනීම සහ මිණුම

LKAS 39 විෂය පථය තුළට ගැනෙන මූල්‍ය වගකීම්, ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයට පිළි ගනු ලබන මූල්‍ය වගකීම් ලබන මූල්‍ය වගකීම් හෝ උචිත පරිදි ණය මුදල් සහ ණයට ගැනීම් වශයෙන් වර්ගීකරණය කරනු ලැබේ.

සියළු මූල්‍ය වගකීම් මූලික වශයෙන් සාධාරණ අගයට පිළි ගනු ලබන අතර ණය මුදල් සහ ණයට ගැනීම් ක්‍රමක්ෂය කළ පිරිවැයට පවත්වනු ලැබේ. මීට සෘජු ගනුදෙනු පිරිවැය ද ඇතුළත් වේ.

වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු මුදල් ද අධිකාරියේ මූල්‍ය වගකීම්වලට ඇතුලත් වේ.

## 9. වෙනත් වගකීම්

උපචිත වියදම් ඇතුළු වෙනත් ණය හිමියෝ වෙනත් වගකීම්වලට ඇතුළත් වේ. මෙම වගකීම් ඒවායේ සාධාරණ අගය වශයෙන් සලකනු ලබන ඒවායේ ඓතිහාසික අගයට ප්‍රකාශ කරනු ලැබේ.

## 10. පොදු සංචිතය

1971 අංක 38 දරන මුදල් පනතේ 10.2 (ඉ) වගන්තිය ප්‍රකාරව 95 වන සිවිල් ගුවන් සේවා අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී සම්මත වූ පරිදි අධිකාරියට අත්‍යවශ්‍ය වූ ප්‍රධාන කාර්යාලීය ගොඩනැගිල්ල සහ වීරවිල නිල නිවාසය ඉදි කිරීම සඳහා අවශ්‍ය ප්‍රාග්ධන වියදම සපුරාලීම සඳහා රු. මිලියන 1,200 ක මුදලක් පොදු සංචිතයේ පවත්වා ගනු ලැබේ.

## 11. ආදායම පිළිගැනීම

### 11.1 විදේශ විකුණුම් අධිභාරය/විගමන බදු සඳහා සේවා ගාස්තුව/බලපත්‍ර

මුල් වර නිකුත් කිරීම සහ අළුත් කිරීම/ගුවන් ප්‍රවාහණ සමාගම් සඳහා බලපත්‍ර ප්‍රතිශෝධන/ නියාමන සේවා ගාස්තු/විභාග ගාස්තු

බැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති

ඉහත සඳහන් සේවා ගාස්තුවලින් ලැබෙන ආදායම අදාළ සේවා සපයන ලද කාල සීමාව තුළ සාධාරණ අගයට පිළිගනු ලැබේ.

### 11.2 පොළී ආදායම

ලාභය හෝ අලාභය හරහා සාධාරණ අගයට මනිනු ලබන මූල්‍ය මෙවලම් ඇතුළත් පොළී ආදායම් ලබා දෙන සියළුම මූල්‍ය මෙවලම්වල පොළී ආදායම බලාත්මක පොළී අනුපාත ක්‍රමය යොදාගෙන ආදායම් ප්‍රකාශනයෙහි ''ආයෝජන ආදායම'' වශයෙන් පිළිගනු ලැබේ. ආයතනයට ලැබිය යුතු මුදලක් හානිකරණයට ලක් වුවහොත්, මූල්‍ය මෙවලමේ මුල් ඵලදායි පොළී අනුපාතයකින් වට්ටම් කරනු ලැබූ තක්සේරු කළ අනාගත මූල්‍ය ප්‍රවාහය ද වන නැවත අය කර ගත හැකි මුදලට අධිකාරියේ ධාරණ අගය අඩු කරනු ලබයි. එසේම, වට්ටම පොළී ආදායම ලෙස අඛණ්ඩව නිදහස් කර හැරීමට කටයුතු කරනු ලැබේ.

### 11.3 වෙනත් ආදායම් උපචිත පදනමකින් පිළිගනු ලැබේ

## 12 වියදම් පිළි ගැනීම

සියළු වියදම් ඒවා අදාළ වන කාලසීමාව තුළ දක්වන ලද සහ පිළිගන්නා ලද ප්‍රතිෂ්ඨාවේ සාධාරණ අගයට මනිනු ලැබේ.

වත්කමක ඵලදායි ජීව කාලයේ වෙනස් වීම් හෝ එහි අන්තර්ගත ආර්ථික ප්‍රතිලාභ පරිභෝජනය කිරීමට අපේක්ෂිත රටාවේ වෙනස්කම්වලට සරිලන පරිදි ක්ෂය කිරීමේ කාල පරාසය වෙනස් කරන අතර එවැනි වෙනස්කම් ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්කම් වශයෙන් ද සලකනු ලැබේ.

## 13 ණයට ගැනීමේ පිරිවැය

ණයට ගැනීමේ පිරිවැය වනුයේ අරමුදල් ණයට ගැනීමේ දී අධිකාරිය විසින් දරනු ලබන පොළිය සහ වෙනත් පිරිවැයයි. එකී වියදම් දරන ලද කාල සීමාව තුළ සිදු වූ වියදම් ලෙස පිළිගනු ලැබේ.

## 14 ප්‍රවර්තන සහ කල් තැබූ ආදායම් බදු

කාල සීමාව සඳහා වූ බදු වියදම්වලට ප්‍රවාර්තන බදු සහ කල් තැබූ බදු අයත් වේ. එහෙත් කිසියම් බදු මුදලක් වෙනත් විස්තීර්ණ ආදායමක් තුළ හෝ ස්කන්ධ තුළ සෘජුව පිළිගෙන ඇති අයිතමයන්ට අදාළ වන්නේ නම් හැර බදු ආදායම් ප්‍රකාශයෙහි පිළිගනු ලැබේ. මෙම අවස්ථාවේ එවැනි බදු පිළිවෙළින් වෙනත් විස්තීර්ණ ආදායම්වල හෝ සෘජු ලෙස ස්කන්ධයෙහි හෝ පිළිගනු ලැබේ.

ප්‍රවර්තන වර්ෂයේ දී මෙන්ම පූර්ව වර්ෂවලට අදාළව බදු අය කරනු ලබන බලධාරීන්ගෙන් අය කර ගැනීමට ඇති හෝ ඔවුනට ගෙවීමට ඇති මුදල් ප්‍රමාණයන්ගෙන් ප්‍රවර්තන බදු වත්කම් සහ වගකීම් සමන්විත වේ. මෙම බදු ප්‍රමාණ ගණනය කිරීමට යොදා ගනු ලබන්නේ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ දිනයට පෙර හෝ ඉන් පසුව හෝ සම්මත කරනු ලබන බදු නීති සහ බදු අනුපාතයන්ය. මේ අනුව, 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ සහ එහි සංශෝධනයන් හි විධිවිධානවලට අනුකූලව බදු කාර්යයන් සඳහා ගැළපුම් කරන ලද වාර්ෂික ලාභය මත පදනම්ව බදු ගෙවීම සඳහා ප්‍රතිපාදන සලසනු ලැබේ.

වත්කම් සහ වගකීම්වල බදු පදනම සහ මූල්‍ය ප්‍රකාශයන්හි ධාරණ අගයන් අතර පැන නගින තාවකාලික වෙනස්කම් මත වගකීම් ක්‍රමය යොදමින් කල් තැබූ ආදායම් බදු පිළිගනු ලැබේ. කෙසේ වුවද, අදාළ කල් තැබූ ආදායම් බදු පැන නගින්නේ ගනුදෙනුව සිදුකරන අවස්ථාවේ ගිණුම් තැබීම කෙරෙහි හෝ බදු අය කළ හැකි පොළිය කෙරෙහි හෝ බලපෑමක් සිදු නොවන ව්‍යාපාර හවුලක් නොවන ගනුදෙනුවකට අදාළ වත්කමක හෝ වගකීමක හෝ මූලික පිළිගැනීමේදී නම් එය ගිණුම් ගත කරනු නොලැබේ. කල් තැබූ ආදායම් බදු නිශ්චය කරනු ලබන්නේ වාර්තාකරන කාලය අවසන් වන විට අවසන් වන විට හෝ ඊට පසුව හෝ සම්මත කර තිබුණු සහ අදාළ කල් තැබූ ආදායම් බදු වත්කම් උපලබ්ධි වන විට හෝ අදාළ කල් තැබූ ආදායම් බදු වගකීම් නිරවුල් කරන විට හෝ අදාළව පවතී යයි අපේක්ෂා කරනු ලබන බදු අනුපාත (සහ නීති) උපයෝගී කරගෙනය.

කල් තැබූ ආදායම් බදු වත්කම් පිළිගනු ලබන්නේ, තාවකාලික කල් තැබීම් ඊට එරෙහිව භාවිත කළ හැකි අනාගත බදු අය කළ හැකි පොළියක් ලැබෙනු ඇතැයි බලාපොරොත්තු වන තාක් දුරකටය. තාවකාලික කල් තැබීම ප්‍රතිවර්ත කිරීමේ කාලය අධිකාරිය විසින් පාලනය කරන සහ ඉදිරි අනාගතයේදී එය ප්‍රතිවර්තන නොවිය හැකි බවට විශ්වාස කළ හැකි අවස්ථාවන්හිදී හැර පරිපාලිත සමාගම්වල සහ ආශ්‍රිත සමාගම්වල කරන ලද ආයෝජනයන්ගෙන් පැන නගින තාවකාලික කල් තැබීම් මත කල් තැබූ බදු ප්‍රතිපාදනය කරනු ලැබේ. ප්‍රවර්තන බදු වත්කම්වලට එරෙහිව ප්‍රවර්තන බදු වගකීම් හිලව් කිරීම සඳහා නීත්‍යානුකූලව ක්‍රියාත්මක කළ හැකි අයිතිවාසිකමක් තිබේ නම් සහ කල් තැබූ ආදායම් බදු වත්කම් සහ වගකීම් එකම බදු අයකිරීමේ බලධාරියෙකු බදු ගෙවිය යුතු එකම ආයතනයක් මත හෝ ශුද්ධ පදනමකින් ශේෂ නිරවුල් කිරීමට අපේක්ෂා කරන වෙන් වෙන් වූ බදු ගෙවිය යුතු ආයතන මත හෝ පනවන ලද බදු මුදල්වලට අදාළ වන්නේ නම් හෝ එවැනි වත්කම් සහ වගකීම් එකිනෙකට හිලව් කරනු ලැබේ.

කටයුතු නොකළ අලාභ සහ කටයුතු නොකළ බදු ණය ඉදිරියට ගෙන ආ ශේෂයන්හි බදු බලපෑම් එකී අලාභ හිලව් කිරීමට ප්‍රමාණවත් බදු ගෙවිය යුතු ලාභ අනාගතයේ දී ලැබෙනු ඇතැයි සිතිය හැකි නම් වත්කම් වශයෙන් පිළිගනු ලැබේ.

## 15. විදේශ ව්‍යවහාර මුදල් පරිවර්තනය / ගනුදෙනු

ක්‍රියාකාරී ව්‍යවහාර මුදල් නොවන වෙනත් ව්‍යවහාර මුදල් වර්ග යොදාගෙන සිදු කරනු ලබන සියලු ගනුදෙනු එකී ගනුදෙනු සිදු කරන අවස්ථාවේ පැවැති විනිමය අනුපාත යොදාගෙන ශ්‍රී ලංකා රුපියල් වලින් වාර්තා කරනු ලැබේ. සෑම මූල්‍ය තත්ත්ව ප්‍රකාශ දිනයකදීම විදේශ ව්‍යවහාර මුදලින් අගය දක්වා ඇති මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම් ශේෂ පත්‍ර දිනයේ බල පැවැත්වූ විනිමය අනුපාතය මත ශ්‍රී ලංකා රුපියල්වලට යළි පරිවර්තනය කරනු ලැබේ. විදේශ ව්‍යවහාර මුදලින් අගය දක්වා ඇති මූල්‍ය නොවන වත්කම් සහ වගකීම් අදාළ ගනුදෙනුව සිදු කළ දිනයේ පැවති විනිමය අනුපාත මත ශ්‍රී ලංකා රුපියල්වලට පරිවර්තනය කරනු ලැබේ. මූල්‍ය අයිතම නිරවුල් කිරීමේදී සහ මූල්‍ය අයිතම යළි පරිවර්තනය කිරීමේදි පැන නගින විනිමය වෙනස්කම් එකී වෙනස්කම් පැන නැඟුණු වර්ෂයේ ආදායම් ප්‍රකාශයෙහි පෙන්වනු ලැබේ.

## 16. ශේෂ පත්‍ර දිනට පසු සිදුවීම්

අධ්‍යක්ෂ මණ්ඩලය සියළු සිදුවීම් සමීපව නිරීක්ෂණය කරන අතර ශේෂ පත්‍ර දිනෙන් පසු වැදගත් සිදුවීම් සම්බන්ධයෙන් ප්‍රවර්තන මූල්‍ය ප්‍රකාශනයන්හි උචිත ගැළපුම් සහ හෙළිදරව් කිරීම් සිදු කරනු ලැබේ.

## 17. අසම්භාව්‍ය වගකීම්

පෙර සිදුවීමක ප්‍රතිඵලයක් වශයෙන් අනාගත වගකීමක් උද්ගත විය හැකි නම් හෝ පෙර සිදුවීමක ප්‍රතිඵලයක් වශයෙන් වර්තමාන වගකීමක් පැවරී ඇත්නම් සහ ඒ සඳහා ගෙවීමක් සිදු කළ නොහැකි නම් හෝ ගෙවිය යුතු මුදල සාධාරණ අන්දමින් ඇස්තමේන්තු කළ නොහැකි නම් හෝ ඒවා අසම්භාව්‍ය වගකීම් ලෙස හෙළිදරව් කරනු ලැබේ.

## 18 මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය

මූල්‍ය නොවන ස්වභාවයේ ගනුදෙනු, මෙහෙයුම් මුදල් ලැබීම් හෝ ගෙවීම් වල කල් තැබීම් කිසිවක් හෝ උපචිත වීම් කිසිවක් ද, එමෙන්ම මුදල් ප්‍රවාහයන් ආයෝජනය කිරීම හෝ මූල්‍යනය කිරීම ආශ්‍රිත ආදායම් හෝ වියදම් අයිතම ආදියෙහි බලපෑම මත ගැළපුම් කරන ලද ලාභය හෝ අලාභය මෙකී වක්‍ර ක්‍රමයෙන් හෙළිදරව් වේ.

## 19 රජයේ ප්‍රදාන

අධිකාරිය පිහිටුවන ලද අවස්ථාවේදි සිවිල් ගුවන් සේවා දෙපාර්තමේන්තුවෙන් මාරු කරන ලද වත්කම් වල සමුච්චිත ක්‍රමක්ෂය අඩුකර රජයේ ප්‍රදානයන්හි අගය වශයෙන් පෙන්වා ඇත.

| | |
|---|---|
| 2013.01.01 දිනට රජයේ ප්‍රදාන | රු. 8,562,380.05 |
| අඩු කළා - 2013 වර්ෂය සඳහා ක්‍රමක්ෂය | රු. (606,054.00) |
| 2013.12.31 දිනට රජයේ ප්‍රදාන | රු. 7,956,326.05 |
| අඩු කළා - 2014 වර්ෂය සඳහා ක්‍රමක්ෂය | රු. (606,054.00) |
| 2014.12.31 දිනට රජයේ ප්‍රදාන | රු. 7,350,272.05 |

# මූල්‍ය ප්‍රකාශවලට අදාළ සටහන්

| | | 2014.12.31<br>රු ශත | 2013.12.31<br>රු ශත |
|---|---|---|---|
| (1) | මෙහෙයුම් ආදායම | 1,358,103,190.36 | 1,078,895,686.64 |
| | විදේශීය විකුණුම් අධිභාරය | 1,159,989,676.52 | 893,284,113.90 |
| | විගමන බදු සඳහා සේවා ගාස්තු | 137,052,748.21 | 138,082,367.67 |
| | නියාමන සේවාවලින් ලද ආදායම | 59,569,577.63 | 44,302,181.52 |
| | වෙනත් මෙහෙයුම් ආදායම් | 1,491,188.00 | 3,227,023.55 |
| (2) | මෙහෙයුම් නොවන ආදායම් | 115,689,198.85 | 99,816,472.46 |
| | විවිධ ආදායම් | 837,805.35 | 1,213,048.77 |
| | කුලී ආදායම් | 87,053.75 | 87,673.25 |
| | ස්ථාවර වත්කම් විකිණීමෙන් ලබා ගත් ලාභය | 3,456,769.94 | 63,865.00 |
| | කාර්ය මණ්ඩල ණය සඳහා පොලි ආදායම (FFRS) | 5,239,523.07 | 6,317,926.22 |
| | රජයේ ප්‍රදාන ක්‍රමක්ෂය කිරීම | 606,054.00 | 606,054.00 |
| | පාරිභෝගිකයන්ගෙන් එකතු කරන ලද ජාතිය | | |
| | ගොඩනැගීමේ බදු | 1,043,373.46 | 586,986.50 |
| | ටෙන්ඩර් අයදුම්පත් ගාස්තු | 363,250.00 | - |
| | පොලී ආදායම | | |
| | කාර්ය මණ්ඩල ණය සඳහා පොළිය | 3,722,749.72 | 3,458,587.20 |
| | භාණ්ඩාගාර බිල්පත් පොළිය | 84,324,797.01 | 68,989,229.39 |
| | ස්ථාවර තැන්පතු පොළිය | 762,745.70 | 3,042,243.27 |
| | ඇමතුම් තැන්පතු පොළිය | 15,245,076.85 | 15,450,858.86 |
| (3) | කාර්ය මණ්ඩලය සඳහා වියදම් | 168,773,002.89 | 156,700,965.10 |
| | වැටුප් හා වේතන | 66,279,812.99 | 62,643,485.59 |
| | වෙනත් දීමනා | 54,303,667.26 | 48,482,451.35 |
| | සේවක අර්ථ සාධක අරමුදල | 16,892,280.46 | 15,520,351.56 |
| | සේවක භාරකාර අරමුදල | 3,378,108.08 | 3,103,619.98 |
| | උපයන විට ගෙවීම් බදු | 4,224,140.10 | 2,753,681.42 |
| | සේවකයින් සඳහා ලබා දෙන මරණාධාර | 328,536.00 | - |
| | ප්‍රසාද දීමනා | 3,415,645.41 | 3,405,590.69 |
| | සුබසාධන වියදම් | 8,535,304.23 | 9,562,626.17 |
| | පාරිතෝෂික | 1,839,308.00 | 1,138,179.50 |

| | | | |
|---|---|---|---|
| | අතිකාල හා නිවාඩු දින වැටුප් | 4,336,677.29 | 3,773,052.62 |
| | ණය ප්‍රතිලාභ සඳහා කාර්ය මණ්ඩල පිරිවැය (IFRS ගැළපුම්) | 5,239,523.07 | 6,317,926.22 |
| (4) | රැස්වීම්, සම්මන්ත්‍රණ හා වැඩමුළු | 15,356,110.84 | 33,254,645.02 |
| | වැඩමුළු හා සම්මන්ත්‍රණ වියදම් | | |
| | දේශීය | 50,000.00 | 2,683,340.70 |
| | විදේශීය | 15,306,110.84 | 30,571,304.32 |
| (5) | පුහුණු කිරීමේ වියදම් | 9,363,595.94 | 11,269,722.26 |
| | පුහුණු කිරීමේ වියදම් | | |
| | දේශීය | 1,168,112.95 | 1,086,540.00 |
| | විදේශීය | 8,195,482.99 | 10,183,182.26 |
| (6) | පරිපාලන හා වෙනත් වියදම් | 130,856,730.45 | 136,960,888.79 |
| | ගමන් වියදම් දේශීය | 20,770.00 | 42,882.00 |
| | අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා ගෙවීම් | 1,138,000.00 | 1,162,500.00 |
| | ලිපිද්‍රව්‍ය හා පාරිභෝගික ද්‍රව්‍ය සඳහා වියදම් | 5,976,940.78 | 6,368,207.83 |
| | වෙනත් සැපයුම් | 276,720.18 | 370,919.11 |
| | විදුලි සංදේශනය | 4,003,905.43 | 3,752,508.31 |
| | තැපැල් ගාස්තු | 200,902.02 | 227,480.08 |
| | දේශීය/විදේශීය සංවිධානවලට දායක මුදල් සහ වාරික මුදල් | 14,330,338.89 | 20,370,000.00 |
| | ප්‍රකාශන හා වෙළඳ දැන්වීම් සඳහා වෙළඳ දැන්වීම් ගාස්තු | 1,149,342.47 | 888,283.18 |
| | විභාග ගාස්තු | 115,563.72 | 418,415.96 |
| | මුද්‍රණ වියදම් | 2,938,063.71 | 2,414,167.89 |
| | ගුවන් ගාස්තු හා ප්‍රවේශ පත්‍ර පාඨමාලාවේ වියදම් | 381,004.50 | 132,197.00 |
| | බැංකු වියදම් | 4,498.40 | - |
| | ගෘහස්ත හා එළිමහන් රැස්වීම් වියදම් | 325,406.27 | 257,268.07 |
| | පරීක්ෂණ එළිමහන් රැස්වීම් වියදම් | 3,488,187.26 | 2,882,540.13 |
| | පරිවර්තන හා යතුරු ලියන වියදම් | 72,452.00 | 171,115.88 |
| | දේපළ, පිරියත හා උපකරණ නඩත්තු | 817,031.83 | 1,073,443.98 |
| | විගණන ගාස්තුව | 500,000.00 | 1,206,672.00 |
| | වත්කම් අපහරණය මත අලාභය | 37,790.90 | - |
| | ඉන්ධන | 9,665,986.55 | 9,151,441.72 |
| | වාහන නඩත්තුව | 10,631,579.75 | 9,020,533.77 |
| | කුලිය හා කුලි ගාස්තු | 1,024,704.00 | 851,780.84 |
| | කාර්යාල ගොඩනැගිල්ල හා නිල නිවාස සඳහා වියදම් | 58,520,290.17 | 53,838,364.50 |
| | පොදු සුබසාධන | 214,815.00 | 328,281.00 |
| | සුබ සාධන පහසුකම් - ක්‍රීඩා | 1,445,255.22 | 144,541.00 |
| | පාරිභෝගිකයන්ගෙන් අය කරන ලද ජාතික | | |

| | | | |
|---|---|---|---|
| | ගොඩනැගීමේ බදු මුදල් | 1,043,373.46 | 587,013.46 |
| | දැයට කිරුළ ප්‍රදර්ශනය | 609,285.20 | 7,376,143.00 |
| | ගුවන්සේවා සංවර්ධනය | 6,154,905.22 | 8,115,195.13 |
| | තොරතුරු තාක්ෂණ සංවර්ධනය | 1,081,676.78 | 549,428.06 |
| | ඒකාබද්ධ සමාජ වගකීම | 1,923,290.20 | 1,660,500.00 |
| | ගුවන් සේවා සමරු උත්සවය | - | 1,320,060.00 |
| | නියාමක සංවර්ධනය | 390,000.00 | 883,440.50 |
| | විවිධ වියදම් | 90,745.30 | 24,700.00 |
| | සංවිධානමය අවස්ථා | 2,283,905.24 | 1,370,864.39 |
| | | | |
| (7) | බදු ගෙවීම | 311,354,961.35 | 228,159,304.45 |
| | ආදායම් බදු 2014 වසර සඳහා 28% | 314,561,065.21 | 227,828,120.60 |
| | වැඩිපුර ගෙවීම් නැවත අය කර ගැනීම් | (6,745,596.00) | 435,173.62 |
| | කල් බදු | 3,539,492.14 | (103,989.77) |

(8) දේපළ පිරිවැය හා උපකරණවල පිරිවැය/

| තක්සේරු කිරීම | 2014.01.01 දිනට ශේෂය | එකතු කිරීම්/ මාරු කිරීම් | අපහරණය කිරීම් | 2014.12.31 දිනට ශේෂය | 2013.12.31 දිනට ශේෂය |
|---|---|---|---|---|---|
| ඉඩම් | 5,359,200.00 | - | - | 5,359,200.00 | 5,359,200.00 |
| ගොඩනැගිලි | 13,343,401.05 | 88,490,525.89 | - | 101,833,926.94 | 13,343,401.05 |
| වාහන | 87,928,633.15 | 25,686,680.14 | 3,300,000.00 | 110,315,313.29 | 87,928,633.15 |
| පිරියත හා යන්ත්‍රෝපකරණ | 54,036,028.72 | 4,093,422.53 | 258,000.00 | 57,871,451.25 | 54,036,028.72 |
| තොරතුරු තාක්ෂණ මෘදුකාංග | 8,680,747.51 | 5,483,000.00 | - | 14,163,747.51 | 8,680,747.51 |
| ලී බඩු හා සවි කිරීම් | 28,827,742.07 | 998,226.40 | - | 29,825,968.47 | 28,827,742.07 |
| වෙනත් ස්ථාවර වත්කම් | 999,079.00 | - | - | 999,079.00 | 999,079.00 |
| | 199,174,831.50 | 124,751,854.96 | 3,558,000.00 | 320,368,686.46 | 199,174,831.50 |

| ක්ෂය කිරීම් | 2014.01.01 දිනට ශේෂය | වසර සඳහා අයකිරීම් | අපහරණය කිරීම් සඳහා ක්ෂය කිරීම් | 2014.12.31 දිනට ශේෂය | 2013.12.31 දිනට ශේෂය |
|---|---|---|---|---|---|
| ගොඩනැගිලි | 7,041,264.05 | 2,595,060.63 | - | 9,636,324.68 | 7,041,264.05 |
| වාහන | 37,498,477.83 | 9,511,057.18 | 2,970,000.00 | 44,039,535.01 | 37,498,477.83 |
| යන්ත්‍ර සූත්‍ර | 37,699,478.30 | 5,823,521.17 | 160,188.14 | 43,362,811.33 | 37,699,478.30 |
| IT මෘදුකාංග | 5,910,349.90 | 3,102,959,55 | - | 9,013,309.45 | 5,910,349.90 |
| කාර්යාලීය උපකරණ | 17,587,931.31 | 4,977,974.81 | - | 22,565,906.12 | 17,587,931.31 |
| වෙනත් ස්ථාවර වත්කම් | 949,036.00 | - | - | 949,036.00 | 949,036.00 |
| | 106.686,537.39 | 26,010,573.34 | 3,130,188.14 | 129,566,922.59 | 106,686,537.39 |
| ලියා හල අගය | | | | 190,801,763.87 | 92,488,294.11 |

මූල්‍ය ප්‍රකාශවලට අදාළ සටහන්

| | 31.12.2014<br>රු ශත | 31.12.2013<br>රු ශත |
|---|---|---|
| (9) තොග | 21,775,643.12 | 79,146,992.92 |
| පාරිභෝගික අයිතම | 5,277,705.86 | 4,605,810.97 |
| මාර්ගස්ථ බඩු | - | 28,280,000.00 |
| සිදු කරමින් පවතින වැඩ | 16,497,937.26 | 46,261,181.95 |
| (10) වෙළඳ ලැබිය යුතු මුදල් හා කාර්ය මණ්ඩල ණය | 273,542,079.65 | 219,721,394.16 |
| විදේශ විකුණුම් අධිභාරය හා විගමන බදු මත සේවා | | |
| ගාස්තු මගින් ලැබිය යුතු ආදායම | 223,428,820.04 | 183,780,105.91 |
| වෙනත් ණය ගැතියෝ | 17,366,115.76 | 171,114.73 |
| කාර්ය මණ්ඩල ණය | 61,246,791.53 | 66,877,986.77 |
| අඩු කළා : කල් තැබූ කාර්ය මණ්ඩල පිරිවැය | (28,499,647.68) | (31,107,813.25) |
| (11) මූල්‍ය වත්කම් | 1,307,590,342.53 | 801,046,519.12 |
| ස්ථාවර තැන්පතු | 301,123.00 | 36,308,635.50 |
| භාණ්ඩාගාර බිල්පත් | 1,307,289,219.53 | 764,737,883.62 |
| (12) අත්තිකාරම්, පෙර ගෙවුම් හා වෙනත් ලැබිය යුතු මුදල් | 127,033,896.80 | 106,488,296.86 |
| අත්තිකාරම් | 1,342,750.00 | 4,263,304.46 |
| පෙර ගෙවුම් | 3,335,746.83 | 10,337,887.77 |
| ලැබිය යුතු වැට් බදු | 50,310,614.25 | 36,671,446.98 |
| ලැබිය යුතු පොළී ආදායම | 43,545,138.04 | 24,107,844.40 |
| පෙර ගෙවූ කාර්ය මණ්ඩල පිරිවැය | 28,499,647.68 | 31,107,813.25 |
| (13) මුදල් හා මුදල් සමානතා | 635,462,676.34 | 632,639,748.28 |
| බැංකුවේ ඇති මුදල් | 504,462,676.34 | 488,639,748.28 |
| ජංගම ගිණුම : 0002026666 | 4,396,540.80 | 54,435,041.25 |
| ජංගම ගිණුම : 0002026678 | 500,066,135.54 | 434,204,707.03 |
| කෙටි කාලීන ආයෝජන | 131,000,000.00 | 144,000,000.00 |
| (14) ලැබුණු ප්‍රදාන | 7,350,272.05 | 7,956,326.05 |
| ඉඩම් | 5,359,200.00 | 5,359,200.00 |
| ගොඩනැගිලි | 2,408,431.95 | 3,014,485.95 |
| වෙනත් ස්ථාවර වත්කම් | 188,694.10 | 188,694.10 |
| එකතුව | 7,956,326.05 | 8,562,380.05 |
| වර්ෂය සඳහා ක්‍රමක්ෂය | (606,054.00) | (606,054.00) |
| වසර අවසානයේ දී ශේෂය | 7,350,272.05 | 7,956,326.05 |
| (15) ප්‍රත්‍යාගණන අතිරික්තය | 8,764,840.44 | 13,485,465.44 |
| වාහන | | 4,720,625.00 |
| පිරියත, යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ | 3,855,992.93 | 3,855,992.93 |
| ගෘහ භාණ්ඩ සහ සවි කිරීම් | 4,908,847.51 | 4,908,847.51 |
| (16) පොදු සංචිතය | 1,200,000,000.00 | 485,000,000.00 |
| වසර ආරම්භයේදී ශේෂය | 485,000,000.00 | - |
| වසර තුළ මාරු කිරීම් | 715,000,000.00 | 485,000,000.00 |
| (17) කල් තැබූ වගකීම් | 8,197,696.81 | 4,658,204.67 |
| 2013 ජනවාරි 01 දිනට ශේෂය | 4,658,204.67 | 4,762,194.44 |
| වර්ෂය සඳහා ප්‍රතිවර්තනය | 3,539,492.14 | (103,989.77) |
| වසර අවසානයේ දී ශේෂය | 8,197,696.81 | 4,658,204.67 |
| (18) ප්‍රතිපාදන සහ වෙනත් වගකීම් | 267,039,023.00 | 261,851,639.67 |
| රක්ෂණය සඳහා ප්‍රතිපාදන | 46,400.00 | 702,516.67 |
| කාර්ය මණ්ඩල සුබසාධන අරමුදල | 301,123.00 | 301,123.00 |

| | | |
|---|---|---|
| අනතුරු විමර්ශන අරමුදල සඳහා ප්‍රතිපාදන | 250,000,000.00 | 250,000,000.00 |
| ලැබුණු තැන්පතු | 16,691,500.00 | 10,848,000.00 |
| (19) විශ්‍රාම ප්‍රතිලාභ වගකීම | 12,479,380.00 | 11,289,227.00 |
| 2013 ජනවාරි 01 දිනට ශේෂය | 11,289,227.00 | 10,270,927.50 |
| වර්ෂය සඳහා ප්‍රතිපාදන | 1,839,308.00 | 1,138,179.50 |
| වර්ෂය තුළ ගෙවීම් | (649,155.00) | (119,880.00) |
| වර්ෂය අවසානයේ ශේෂය | 12,479,380.00 | 11,289,227.00 |
| (20) ගෙවිය යුතු වෙළඳ මුදල් | 587,018,009.15 | 616,588,928.22 |
| තැන්පතු පරීක්ෂණ ගාස්තු සහ මෙහෙයුම් | 3,893,585.06 | 7,791,581.00 |
| ගුවන් තොටුපල සහ ගුවන් සේවා අධිකාරියට සහ භාණ්ඩාගාරයට ගෙවිය යුතු මුදල් | 576,066,135.04 | 578,204,706.53 |
| වෙනත් ණය හිමියෝ | 7,058,289.05 | 30,592,640.69 |
| (21) වෙනත් ගෙවිය යුතු මුදල් | 46,932,609.19 | 17,531,743.11 |
| උපචිත වියදම් | | |
| - කාර්ය මණ්ඩල වියදම් | 5,909,331.64 | 4,410,728.15 |
| - පොදු වියදම් | 41,023,277.55 | 13,121,014.96 |
| (22) ආදායම් බදු වගකීම් | 176,812,769.08 | 123,355,948.10 |
| 2013 ජනවාරි 01 දිනට ශේෂය | 123,355,948.10 | 90,600,765.82 |
| 2011- 2012 වසර සඳහා බදු ගැළපීම් | (6,745,596.00) | |
| වර්ෂය සඳහා ප්‍රතිපාදන | 314,561,065.21 | 228,263,294.22 |
| වර්ෂය තුළ ගෙවන ලද මුදල් | (254,358,648.23) | (195,508,111.94) |
| වර්ෂය අවසානයේ ශේෂය | 176,812,769.08 | 123,355,948.10 |

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

| | | | |
|---|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. | ටීසි/බී/සීඒඒඑස්එල්/එෆ්ඒ/2014 | ඔබේ අංකය / உமது இல. / Your No. | |
| දිනය / திகதி / Date | 2015 ඔක්තෝබර් 30 දින | | |

සභාපති,

ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය.

ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

---

ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරු වල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2002 අංක 34 දරන ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය පනතේ 14(4) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර අධිකාරියේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර මාගේ විස්තරාත්මක වාර්තාවක් අධිකාරියේ සභාපති වෙත යථා කාලයේ දී නිකුත් කරනු ලැබේ.

1.2 <u>මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම</u>

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, . - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.- No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිති වලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අධිකාරියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2. මූල්‍ය ප්‍රකාශන

2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර , මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 01 අනුව

(i) ඇතැම් දෑ සඳහා මූල්‍ය ප්‍රකාශනවල අතිරේක අනාවරණයන් කළ යුතු වුවත් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් අතිරේක අනාවරණයන් සිදු කර නොතිබුණි.

- අධිකාරිය ස්ථාපිත කිරීමේ නීතිමය පනත්, මූලාශ්‍ර, අධිකාරියේ ලියාපදිංචි ලිපිනය සහ ප්‍රධාන කාර්යාලයේ ලිපිනය.

- අධිකාරියේ ස්වභාවය සහ ප්‍රධාන මෙහෙයුම් කටයුතු පිළිබඳ විස්තර

(ii) මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී විකල්ප ගිණුම්කරණ පදනම් (Measurement basis used in preparing the financial statement) අතරින් එක් එක් අයිතමයන් සඳහා අධිකාරිය අනුගමනය කල ගිණුම්කරණ පදනම හා භාවිතා කළ ගිණුම්කරණ ප්‍රතිපත්තීන් හෙළිදරව් කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 10 ට අනුව 2008 වර්ෂයේ සිට ක්ෂය අනුපාත සංශෝධනය කිරිම හේතුවෙන් වූ රු.4,417,586ක් වූ අධි වෙන්කිරීම පූර්ව වර්ෂවලට හා අතීතානුයෝගීව ගැලපීම් කිරීමට කටයුතු කර නොතිබුණි,

(ඇ) මෙහෙයුම් නොවන ආදායම් ලෙස රු.87,053ක් කුලී ආදායමක් සමාලෝචිත වර්ෂය තුල උපයා තිබූ නමුත් ඊට අදාල දේපල වල සාධාරණ වටිනාකම ආයෝජිත දේපල ලෙස වෙනම හෙළිදරව් කර නොතිබුණි.

(ඈ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 12 ට අනුව බදු වියදම හා ආයතනයේ ගිණුම්කරණ ලාභය අතර ඇති සම්බන්ධතාවය හා අසම්භාව්‍ය බදු වගකීම් පිළිබඳව හෙළිදරව් කර නොතිබුණි.

(ඉ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 19 ට අනුව විශ්‍රාම ප්‍රතිලාභ ගිණුම් තැබීමේ දී විශ්‍රාම ප්‍රතිලාභ සැලසුම් පිළිබඳ විස්තරයක්, අගය ගැලපීම් පිළිබඳ විස්තර, වර්තමාන සේවා පිරිවැය, ආයෝජිත ලාභ හෝ අලාභ (Actuarial Gain or Loss) පසුගිය සේවා පිරිවැය යනාදී තොරතුරු හඳුනාගෙන ගැලපුම් සිදුකල ආකාරය මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි.

(ඊ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 20 ට අනුව රජයේ ප්‍රදාන සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශන වල ප්‍රමාණවත් හෙළිදරව් කිරීමක් සිදු කර නොතිබුණි.

(උ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 39 අනුව මූල්‍ය වත්කම් ලෙස හඳුනාගෙන තිබූ , ස්ථාවර තැන්පතු, සේවක ණය හා භාණ්ඩාගාර බිල්පත් මත ලැබිය යුතුව තිබූ රු.1,351,135,481 ක පොලිය ඇතුලත් කරමින් එම වත්කම් හායනය කරන ලද පිරිවැයට දැක්වීමට කටයුතු කර නොතිබුණි.

### 2.2.2 අනුචිත හෙළිදරව් කිරීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අධිකාරියේ ගොඩනැගිලි ඉදිකිරීම් කටයුතු සඳහා වැයකර තිබූ රු.16,497,937ක ප්‍රාග්ධන වියදමක් ජංගම නොවන වත්කම් යටතේ දැක්වීම වෙනුවට ජංගම වත්කම් යටතේ කෙරී ගෙන යන වැඩ (Working Progress) ලෙස මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි.

(ආ) ජාතිය ගොඩනැගීමේ බදු ලෙස ගෙවන ලද වියදම් විකුණුම් හා බෙදා හැරීමේ වියදම් ලෙස වර්ග කර දැක්වීම වෙනුවට පරිපාලන හා වෙනත් වියදම් ලෙස දක්වා තිබුණි.

2.3 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම | අනුකූල නොවීම |
|---|---|
| (අ) 2006 ඔක්තෝබර් 9 දිනැති අංක පීඊඩී 39 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | අධිකාරියේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් හතර දෙනෙකුට චක්‍රලේඛයේ සඳහන් සීමාව ඉක්මවා ඉන්ධන වෙනුවෙන් රු.1,955,330 ක් වැඩිපුර ගෙවා තිබුණි. |
| (ආ) 2000 අංක 38 දරන දේශීය ආදායම් පනතේ 111 (අ) වගන්තිය සහ 2011 අයවැය ප්‍රකාශය | සිවිල් ගුවන් සේවා අධිකාරියේ නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුප් සහ අනිකුත් ඉපයීම් වෙනුවෙන්, උපයන විට ගෙවීම් බදු මුදල් පුද්ගලික වැටුපෙන් ගෙවිය යුතු වුවද 2007 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා වසර 07ක් සඳහා එකතුව රු.21,219,419ක් වූ නිලධාරීන් විසින් ගෙවිය යුතු උපයන විට ගෙවීම් බදු මුදල් අධිකාරියේ අරමුදලින් ගෙවා තිබුණි. |
| (ඇ) 2008 ජුනි 26 දිනැති අංක 14/2008 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | (i) නිල වාහන සඳහා හිමිකම් නොමැති නිලධාරීන් 11 දෙනෙකුට මාසයකට රු.30,000 බැගින් එකතුව රු.3,780,000 ක් ද මාසයකට රු. 20,000 බැගින් නිලධාරීන් 43 දෙනෙකු සඳහා එකතුව රු.9,774,728ක් ද සහ නිලධාරීන් 100 දෙනෙකුට මාසයකට රු.13,250 බැගින් එකතුව රු.14,065,177 ක් ද වන පරිදි මාසික ප්‍රවාහන දීමනා ගෙවා තිබුණි. ඒ අනුව ඉකුත් වර්ෂය සඳහා රු. 27,794,875 ක් සහ සමාලෝචිත වර්ෂය සඳහා රු.27,619,905ක් චක්‍රලේඛයට පටහැනිව ගෙවා තිබුණි.<br>(ii) චක්‍රලේඛයේ උපදෙස් වලට පටහැනිව ඉන්ධන සීමාවන්ට අමතරව අධිකාරියේ එක් නිලධාරියකුට මාසයකට රු.50,000ක් බැගින් එකතුව රු.600,000ක් වූ ඉන්ධන දීමනා සමාලෝචිත වර්ෂය තුළ ගෙවා තිබුණි. |

(iii) චක්‍රලේඛ උපදෙස් වලට පටහැනිව නිල වාහන ලබාගැනීමට හිමිකම් නොමැති නිලධාරීන් දෙදෙනෙකුට මාසයකට රු.22,680 බැගින් එකතුව රු.544,320 ක් ද තවත් නිලධාරීන් 8 දෙනෙකුට මාසයකට රු.19,440 බැගින් එකතුව රු.1,749,600 ක් ද , තවත් නිලධාරියෙකුට රු.14,440 බැගින් රු.196,320ක් ද වශයෙන් මුළු එකතුව රු.2,490,240 ක් වූ මුදල් ඉන්ධන දීමනා ලෙස සමාලෝචිත වර්ෂය තුලදී ගෙවා තිබුණි.

(ඈ) 2014 නොවැම්බර් 21 දිනැති අංක 05 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය

(i) චක්‍රලේඛය ප්‍රකාර ව්‍යවස්ථාපිත මණ්ඩලවල නිලධාරීන්ට උපරිමය රු.15,000 කට සමාන ප්‍රසාද දීමනාවක් ගෙවිය හැකි වුවත් ඊට පටහැනිව එක් එක් නිලධාරියාගේ මාසික මූලික වැටුපට සමාන මුදලක් ප්‍රසාද දීමනා ලෙස ගෙවීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දී ප්‍රසාද දීමනා ලෙස රු.1,359,161ක් වැඩිපුර ගෙවා තිබුණි.

(ii) කොන්ත්‍රාත් පදනම මත බඳවාගත් නිලධාරීන් 05දෙනෙකුට සමාලෝචිත වර්ෂය තුල එකතුව රු.206,833ක් වූ ප්‍රසාද දීමනා ගෙවා තිබුණි.

(ඉ) 1994 ජුනි 14 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය

(i) චක්‍රලේඛයට පටහැනිව මාසිකව නිලධාරීන් 06 දෙනෙකුට රු.25,000 බැගින් වෘත්තිය දීමනා හා එක් නිලධාරියෙකුට රු.10,000 බැගින් විශේෂ දීමනා ලෙස එකතුව රු.1,860,000 ක් සමාලෝචිත වර්ෂයේ දී ගෙවා තිබුණි.

(ii) අධ්‍යක්ෂ ජනරාල් ධුරයේ වැඩ බැලීම වෙනුවෙන් ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂවරයාට 2010 මැයි මාසය දක්වා මාසයකට රු.17,625 ක් බැගින් වැඩ බැලීම් දීමනාවක් ගෙවා තිබූ අතර ඔහු තනතුරේ වැඩ බැලීමෙන් ඉවත් කිරීමෙන් පසුව ද වැඩ බැලීමේ දීමනා ලෙස

| | |
|---|---|
| | රු.953,750 ක් වෙනත් විශේෂ දීමනාවක් ලෙස සමාලෝචිත වර්ෂය අවසානය දක්වා විධිමත් භාණ්ඩාගාර අනුමැතියකින් තොරව ගෙවා තිබුණි. |
| (ඊ) 2010 සැප්තැම්බර් 01 දිනැති අංක 446 දරන මුදල් චක්‍රලේඛය | 2010 සහ 2011 වර්ෂ වලදී නිලධාරීන් දෙදෙනෙකු වෙනුවෙන් සීමාව ඉක්මවා ගෙවන ලද පිළිවෙලින් රු.150,149 ක සහ රු.6,846ක ජංගම දුරකථන බිල්පත් සමාලෝචිත වර්ෂය අවසානය වනතෙක්ම එම නිලධාරීන්ගෙන් අයකරගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (උ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.12 වගන්තිය | (i) චක්‍රලේඛ විධිවිධාන වලට පටහැනිව අධිකාරියේ සේවකයන් හා ඔවුන්ගේ සියළුම පවුලේ සාමාජිකයන් සඳහා රෝහල් හා ශල්‍යකර්මයන් වෙනුවෙන් පූර්ණ රක්ෂණ ආවරණයක් ලබාගැනීමට සමාලෝචිත වර්ෂයේ දී රු.7,551,640ක දායක මුදලක් වැය කර තිබුණි. මෙම රක්ෂණ ආවරණය සඳහා එක් සේවකයෙකු වෙනුවෙන් වාර්ෂික රක්ෂණ වාරිකය රු.38,400 සිට රු.60,600 දක්වා වූ ප්‍රමාණයක් විය. |
| | (ii) තවද කොන්ත්‍රාත් පදනම මත බඳවාගත් නිලධාරීන් 08 දෙනෙකු හා ඔවුන්ගේ පවුල්වල සියළුම සාමාජිකයින් සඳහා රෝහල් හා ශල්‍යකර්ම සඳහා රක්ෂණය කිරීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුලදී රු.385,540 ක් අධිකාරිය වැය කර තිබුණි. |
| (ඌ) 2007 පෙබරවාරි 28 දිනැති අංක සී.එස්.ඒ/පී.1/40 දරන ජනාධිපති චක්‍රලේඛය | චක්‍රලේඛ විධිවිධාන වලට පටහැනිව සිවිල් ගුවන් සේවා අධිකාරිය විසින් සමාලෝචිත වර්ෂය තුලදී විවිධ සම්මන්ත්‍රණ හා වැඩමුළු සුඛෝපභෝගී හෝටල්වල පැවැත්වීම වෙනුවෙන් එකතුව රු.1,938,240 ක වියදම් දරා තිබුණි. |

| | |
|---|---|
| (එ) 2006 පෙබරවාරි 10 දිනැති අංක සි එස් ඒ 1/1/2006 ජනාධිපති ලේකම් චක්‍රලේඛය | සමාලෝචිත වර්ෂය තුල දී අධිකාරියේ උප සභාපති , කොන්ත්‍රාත් පදනම මත බඳවාගත් විශ්‍රාමික නිලධාරින් ඇතුළු නිලධාරීන් 13 දෙනෙකුගේ විදේශ ගමන් වෙනුවෙන් එකතුව රු.4,737,836 ක් අධිකාරියෙන් වැය කර තිබූ අතර එම විදේශ සංචාර නිලධාරින්ගේ රාජකාරි කටයුතු වලට අදාල නොවන අතර එමගින් අධිකාරියට කිසිදු ප්‍රතිලාභයක් නොලැබෙන බව විගණනයේ දී නිරීක්ෂණය විය. |

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා අධිකාරියේ මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵලය රු.1,123,432,376 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.813,671,859 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.309,760,517 ක වාසිදායක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙහෙයුම් ආදායම හා මෙහෙයුම් නොවන ආදායම පිළිවෙලින් රු.279,207,504 කින් සහ රු.15,872,726කින් වැඩි වීම සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනයට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

(අ) සමාලෝචිත වර්ෂයේ අධිකාරියේ ප්‍රධාන මෙහෙයුම් කාර්යයන්ගේ ප්‍රගතිය පිළිබඳ විග්‍රහයක් ඉකුත් වර්ෂ සමග සසඳා පහත දැක්වේ.

| විෂයය | විස්තරය | 2014 | 2013 | 2012 | 2011 |
|---|---|---|---|---|---|
| (i) ගුවන් යානා චලන | * කුලී පියසර | 3,391 | 2,556 | 2,118 | 1,782 |
| | * නිත්‍ය පියසර | 51,897 | 48,413 | 46,616 | 41,891 |
| (ii) සම්පූර්ණ කරන ලද පරීක්ෂණ (සංඛ්‍යාව) | * ගුවන් සංතරණ සේවා | 35 | 32 | 01 | 01 |

| | | | | | |
|---|---|---|---|---|---|
| (iii) ඉටුකරන ලද නිරුපද්‍රිත/ සුරක්ෂිතව හා අධීක්ෂණ කාර්යයන් (සංඛ්‍යාව) | * රුම්ප් පරීක්ෂණ ගණන (ගුවන් යෝග්‍යතාවය) | 48 | 53 | -- | 65 |
| | * ගගන යාත්‍රාංගනය | 38 | 39 | 19 | 20 |
| | * අන්තරාකාරි භාණ්ඩ | 02 | 09 | 18 | 35 |
| | * පියාසර පාසැල් පරීක්ෂණ (පුද්ගල බලපත්‍ර) | 09 | 08 | 14 | 13 |
| | * ස්ථාන පහසුකම් මෙහෙයුම් | 00 | 07 | 02 | 04 |

- වසරින් වසර ක්‍රමිකව ශ්‍රී ලංකාවට පැමිණෙන ගුවන් යානා සහ ගුවන් මෙහෙයුම් වැඩි වී ඇති නමුත් සිවිල් ගුවන් සේවා නියාමනයට අදාළ පරීක්ෂණ ප්‍රමාණයේ ප්‍රගතිය ක්‍රමානුකූලව වර්ධනය වී නොමැති බව නිරීක්ෂණය විය.

- ගුවන් මෙහෙයුම් කටයුතු වල දී සිදුවන ගුවන් අනතුරු සිද්ධීන් වාර්තා කිරීම, පරීක්ෂණ පැවැත්වීම හා එම සිද්ධීන් අවම කිරීම සඳහා අධිකාරිය ගෙන තිබෙන ක්‍රියාමාර්ග පිළිබඳ විස්තර විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා අධිකාරියේ මෙහෙයුම් කාර්යසාධනය සම්බන්ධව පුළුල් විග්‍රහයක් කළ නොහැකි විය.

(ආ) සිවිල් ගුවන් සේවා අධිකාරිය විසින් ඉටුකරන සේවා සඳහා ගාස්තු

(i) ගාස්තු අයකිරීම්

අධිකාරිය විසින් ගුවන් නියමු බලපත්‍ර ලබාදීම, විදුලි සංදේශ සංඥා කුළුණු සඳහා අනුමැතිය ලබා දීම, උස් ගොඩනැගිලි සඳහා අනුමැතිය ලබාදීම ආදී වූ විවිධ සේවාවන් සැපයීම වෙනුවෙන් අයකරන ගාස්තු සහ බලපත්‍ර නිකුත් කිරීම් හා අළුත් කිරීම් වෙනුවෙන් අයකරන ගාස්තු ආයතනයේ ලිපිගොනු පවත්වා ගෙන යාමට හා ඒ වෙනුවෙන් පරීක්ෂණ හා මෙහෙයුම් කටයුතු සඳහා වැයවන මුදල පියවා ගැනීමට ප්‍රමාණවත් නොවන බව නිරීක්ෂණය විය. දැනට වැයකරන ගාස්තු පහත දැක්වේ.

| බලපත්‍ර වර්ගය | මූලික බලපත්‍ර ගාස්තුව | ඇගයීම් ගාස්තු | අළුත් කිරීම | අළුත් කිරීම ඇගැයීම් |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. |
| නියමු - ශිෂ්‍ය | 2,500 | 5,000 | 1,250 | 2,500 |
| නියමු- පෞද්ගලික | 3,000 | 6,000 | 1,500 | 3,000 |
| නියමු - වාණිජ | 3,500 | 7,000 | 1750 | 3,500 |
| නියමු-ගුවන් ප්‍රවාහන | 4,000 | 8,000 | 2,000 | 4,000 |
| ගුවන් සංඥා පාලන | 3,500 | 7,000 | 1,750 | 3,500 |
| ගුවන් යානා මෙහෙයුම් ඉංජිනේරු | 3,000 | 6,000 | 1,500 | 3,000 |

(ii) බලපත්‍ර නිකුත් කිරීම් හා අළුත් කිරීම්

ශ්‍රී ලංකාවේ සිවිල් ගුවන් සේවා ක්ෂේත්‍රය තුල විශාල රැකියා අවස්ථා වසරින් වසර ජනිත වී නොමැති බව අධිකාරිය බලපත්‍ර නිකුත් කිරීම් හා අළුත් කිරීම් කර ඇති සංඛ්‍යාව අනුව තහවුරු වේ.

| බලපත්‍ර වර්ගය | 2014 | 2013 | 2012 | 2011 | 2010 |
|---|---|---|---|---|---|
| නියමු - ශිෂ්‍ය | 211 | 231 | 155 | 115 | 142 |
| නියමු- පෞද්ගලික | 151 | 110 | 94 | 98 | 76 |
| නියමු - වාණිජ | 394 | 339 | 264 | 317 | 300 |
| නියමු-ගුවන් ප්‍රවාහන | 350 | 498 | 414 | 382 | 359 |
| ගුවන් සංඥා පාලන | 50 | 26 | 44 | 81 | 91 |
| ගුවන්යානා මෙහෙයුම් ඉංජිනේරු | 04 | 05 | 113 | 173 | 283 |

(ඇ) <u>ගුවන් යානා සිද්ධීන්</u>

ශ්‍රී ලංකාවේ සිවිල් ගුවන් සේවාවේ නියාමනය සඳහා පිහිටුවා ඇති සිවිල් ගුවන් සේවා අධිකාරිය තම නියාමන කටයුතු කාර්යක්ෂමව හා ජාත්‍යන්තර ප්‍රමිතීන් අනුව සිදුකරන්නේ ද යන්න තහවුරු කර ගැනීම සඳහා අධිකාරියට වාර්තා වූ ගුවන් යානා සිද්ධීන් සහ එම සිද්ධීන් සම්බන්ධයෙන් පරීක්ෂා කිරීම්, අධිකාරිය පවත්වාගෙන යනු ලැබූ ලිපිගොනු සහ අධිකාරිය කලින් කලට දන්වන ලද මග පෙන්වීම් හා නියෝගයන් පිළිබඳව තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම හේතුවෙන් අධිකාරියේ කාර්යසාධනය පිළිබඳ විග්‍රහයක් කළ නොහැකි විය.

4.2 <u>කළමනාකරණ අකාර්යක්ෂමතා</u>

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) නිවැරදිව ගණනය නොකර ගෙවීම් කිරීම නිසා ඉකුත් වර්ෂ තුනකට වඩා වැඩි කාලයක සිට එකතු කළ අගය මත බදු රු.32,688,455ක් වැඩිපුර ගෙවා තිබූ අතර එම බදු මුදල් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් ආපසු අයකර ගැනීමට හෝ හිලව් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ව්‍යවස්ථාපිත නීති රීති උල්ලංඝණය කිරීම් අනාවරණය වූ අවස්ථා පසුගිය විගණන වාර්තා මගින් ද පෙන්වා දුන් අතර පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් ද මේ සම්බන්ධයෙන් දැඩි අවධානයට යොමුකර තිබුණි. මෙම දුර්වලතාවය මගහැරවීම සඳහා සමාලෝචිත වර්ෂයේ දී ද කළමනාකරණයේ ප්‍රමාණවත් අවධානයක් යොමු වී නොතිබුණි.

4.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සිවිල් ගුවන් සේවා නියෝජ්‍ය අධ්‍යක්ෂ (ගගණ යාත්‍රා) හා නියෝජ්‍ය අධ්‍යක්ෂ (ගුවන් සංතරණ) යන තනතුරු වලට බඳවා ගැනීමේ පරිපාටිය අනුව ගුවන් ගමන් පාලන බලපත්‍රය (Air Traffic Controller) අනිවාර්යෙන්ම තිබිය යුතු වුවත් එම සුදුසුකම මත බඳවාගත් නිලධාරීන් සිව්දෙනෙකුට මාසයකට රු.25,000 බැගින් සමාලෝචිත වර්ෂය තුළ එකතුව රු.1,200,000ක දීමනා ගෙවා තිබුණි. කෙසේ වුව ද එම නිලධාරීන් විසින් ගුවන් ගමන් බලපත්‍රය වසරකට වරක් අලුත් කළ යුතු වුවද වර්ෂ ගණනාවක සිට අලුත් කිරීමක් කර නොතිබුණි.

(ආ) අමාත්‍ය කාර්ය මණ්ඩලයට බඳවාගත් නිලධාරියෙකු එහි සක්‍රීය සේවයේ යෙදී සිටියදීම අධිකාරියේ නිත්‍ය කාර්ය සඳහා වූ පත්වීමක් ලබා දී තිබුණ ද එකම දිනයක් වත් එහි සේවයට වාර්තා කර නොතිබිය දී වැටුප්, ඉන්ධන, වෛද්‍ය රක්ෂණ හා විදේශ ගමන් වෙනුවෙන් ඉකුත් වර්ෂ වලදී අධිකාරියේ අරමුදලින් එකතුව රු.3,261,983ක් ගෙවා තිබුණි. සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් අදාල පුද්ගලයාගෙන් එම මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) සිවිල් ගුවන් සේවා අධිකාරියේ කාර්ය මණ්ඩලයේ පරිපාටියේ ඇතුලත් නොවූ සහ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලබාගැනීමකින් තොරව රු.80,000 ක මාසික වැටුපකට කොන්ත්‍රාත් පදනම මත අලෙවි ප්‍රවර්ධන උපදේශකවරයෙකු බඳවාගෙන තිබුණි. මෙම නිලධාරියා එකම දිනයක් හෝ සේවයට පැමිණ නොතිබිය දී වැටුප් ලෙස සමාලෝචිත වර්ෂයේ දී එකතුව රු.720,000 ක් වූ මුදල් ගෙවා තිබුණි.

(ඇ) අමාත්‍යවරයාගේ ඉන්ධන බිල්පත් වෙනුවෙන් අමාත්‍යාංශයෙන් ප්‍රතිපූර්ණය කර තිබියදීත් ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියට කිසිදු අදාලත්වයක් නොමැති අමාත්‍යවරයාගේ ඉන්ධන බිල්පත් පියවීම වෙනුවෙන් 2012 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා රු.2,606,546ක මුදලක් අවිධිමත් ලෙස ගෙවා තිබුණි.

4.4 ආර්ථික නොවූ ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අධිකාරිය සඳහා කුලී පදනමට ලබාගෙන තිබූ ගොඩනැගිල්ලෙහි කුලී ගිවිසුමෙහි වාර්ෂිකව වැඩිවන වරිපනම් ගාස්තු අධිකාරිය විසින් දැරිය යුතු බවට අවාසිදායක කොන්දේසියක් ඇතුලත් කර තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දී රු.285,390 ක අතිරේක වරිපනම් බද්දක් අධිකාරියේ අරමුදලින් දරා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දී මත්තල ගුවන් තොටුපල විවෘත කිරීමේ උත්සවය සඳහා සහභාගිවීම වෙනුවෙන් නිලධාරීන් 19 දෙනෙකුට ගුවන් ටිකට්පත් සඳහා රු.88,300ක් සහ විදේශ නියෝජිතයින් කිහිපදෙනෙකු හට Collaborative Arrangement for the Prevention and Management of Public Health events in Civil Aviation සමුළුවේ ක්ෂේත්‍ර පරීක්ෂාවක් වෙනුවෙන් මත්තල යාම සඳහා ගුවන් ටිකට්පත් වෙනුවෙන් රු.153,000 ක් ලෙස එකතුව රු.241,300ක් ශ්‍රී ලන්කන් ගුවන් සේවා සමාගමට අධිකාරියේ අරමුදලින් ගෙවා තිබුණි.

(ඇ) 2011 වර්ෂයේ අධිකාරියේ ප්‍රධාන කාර්යාලය සඳහා කුලියට ගෙන තිබුණු ගොඩනැගිල්ලෙහි නව ඉදිකිරීම් සහ ගබඩා වැඩි දියුණු කිරීම් ගොඩනැගිලි අයිතිකරු මගින් ඉටුකර නොගෙන ඒ වෙනුවෙන් එකතුව රු.28,214,123ක් අධිකාරියේ අරමුදලින් වැය කර තිබුණි. එකී වියදම් අදාල ගොඩනැගිල්ල සඳහා ගෙවිය යුතු කුලියෙන් හිලව් කර ගැනීම පිළිබඳ 2015 ජූලි දක්වාම සලකා බලා නොතිබුණි.

4.5 හඳුනාගන්නා ලද පාඩු

නිවාඩු නිකේතනයක දොර ජනෙල් සඳහා තිර රෙදි ඇමීම වෙනුවෙන් ඉදිරිපත් කරන ලද අවම ලංසුව සාධාරණ හේතු දැක්වීමකින් තොරව ප්‍රතික්ෂේප කර දෙවෙනි අවම මිල ඉදිරිපත් කර තිබූ ආයතනය තෝරා ගැනීම නිසා අධිකාරියට රු.722,160ක පාඩුවක් සිදුවී තිබුණි.

4.6 <u>නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්</u>

සිවිල් ගුවන් සේවා අධිකාරියේ ස්ථාවර වත්කම් පරිගණකගත කිරීම සඳහා මෘදුකාංග පැකේජය වෙනුවෙන් රු.4,500,000ක් සයන්ස් ලැන්ඩ් ආයතනය වෙත ගෙවා තිබුණ ද එම පැකේජයෙන් අපේක්ෂිත අරමුණ ඉටුකර ගැනීමට නොහැකි වී තිබුණි.

4.7 <u>වෙනත් රාජ්‍ය ආයතන වලට ලබාදුන් අධිකාරියේ සම්පත්</u>

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 3.8.9 ඡේදයට පටහැනිව අමාත්‍යාංශයේ විවිධ වියදම් වෙනුවෙන් රු.994,805ක් අධිකාරිය විසින් දරා තිබුණු අතර අධිකාරිය සතු වාහන 05ක් හා නිලධාරීන් 09 දෙනෙකු අමාත්‍යාංශයට නිදහස් කර තිබුණි. සමාලෝචිත වර්ෂයේ එම නිදහස් කළ වාහන වෙනුවෙන් ඉන්ධන හා අලුත්වැඩියා වියදම් සඳහා පිළිවෙලින් රු.1,325,268ක් හා රු.3,222,906 ක් ද නිලධාරීන්ගේ වැටුප් හා දීමනා වෙනුවෙන් රු.4,485,808 ක් වශයෙන් එකතුව රු.9,033,982 ක් වූ වියදම් අධිකාරිය විසින් දරා තිබුණි.

4.8 <u>කාර්ය මණ්ඩල පරිපාලනය</u>

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අධිකාරියේ අනුමත කාර්ය මණ්ඩලය 167 ක් වූ අතර තථ්‍ය කාර්ය මණ්ඩලය 143 ක් වුයෙන් පුරප්පාඩු 24ක් පැවතුණි.

(ආ) වසර ගණනාවක සිට අධිකාරියේ කාර්ය මණ්ඩලයේ පැවති පුරප්පාඩු සඳහා කොන්ත්‍රාත් පදනම මත විශ්‍රාමලත් නිලධාරීන් 07 දෙනෙකු බඳවාගෙන 2014 වර්ෂය වෙනුවෙන් එකතුව රු.13,480,410 ක මුදලක්, වැටුප් හා දීමනා ලෙස ගෙවා තිබුණි. තවද අධිකාරියට අවශ්‍ය නොවන අලෙවිකරණ තනතුරු 02ක් ඇති කර ඒ සඳහා කොන්ත්‍රාත් පදනම මත විශ්‍රාමලත් නිලධාරීන් දෙදෙනෙකු බඳවාගෙන සමාලෝචිත වර්ෂය තුලදී එකතුව රු.1,590,333ක් ගෙවා තිබුණි. මෙම නිලධාරීන්ගේ සේවා කාලය වසරින් වසර දීර්ඝ කරමින් පුරප්පාඩු සපුරාගෙන තිබුණි.

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department

(ඈ) අනුමත බඳවා ගැනීමේ පරිපාටියට පටහැනිව සමාලෝචිත වර්ෂයේ දී නිලධාරීන් 13 දෙනෙකු බඳවාගෙන තිබුණු අතර සමාලෝචිත වර්ෂය සඳහා එම නිලධාරීන්ට එකතුව රු. 2,307,116 ක් වූ වැටුප් හා දීමනා ගෙවා තිබුණි.

5. <u>ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය</u>

5.1 <u>අයවැය ලේඛනමය පාලනය</u>

සමාලෝචිත වර්ෂයේ දී ඇස්තමේන්තුගත ආදායම් හා වියදම්, තථ්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේ දී සියයට 56.59 සිට සියයට 164.34 දක්වා වූ පරාසයක සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

6. <u>පද්ධති හා පාලනයන්</u>

විගණනයේ දී නිරීක්ෂණය වූ අඩුපාඩු පිළිබඳව වරින් වර අධිකාරියේ සභාපතිවරයා දැනුවත් කරන ලදී. පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුවිය යුතුවේ.

(අ) ගිණුම්කරණය.

(ආ ) ආදායම් හා වියදම් පාලනය

(ඇ) ගුවන් යානා සිද්ධි පරීක්ෂා කිරීම.

(ඈ) අයවැය පාලනය

(ඉ) කොන්ත්‍රාත් පරිපාලනය.

(ඊ) වත්කම් පාලනය

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති (වැඩබලන)

# විගණකාධිපති වාර්තාවට
# සිවිල් ගුවන් සේවා අධිකාරියේ පිළිතුරු

**ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරණ මුදල් පනතේ 14(2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

2.2.1

**(අ)**

**(i)** අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන, අධිකාරියේ වාර්ෂික වාර්තාවෙහි කොටසක් වන අතර අදාල සියලු කරුණු වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇත.

**(ii)** මෙම තොරතුරු වාර්ෂික වාර්තාවෙහි ගිණුම්කරණ ප්‍රතිපත්තී අංක 01 හා 02 යටතේ පිටු අංක 68 සිට 71 දක්වා සඳහන් කර ඇත.

(ආ) අදාල වෙනස ක්ෂය අනුපාත සංශෝධනය නිසා සිදු වූ වෙනසක් නොව 2013 වර්ෂයේ ක්ෂය ගණනය කිරීමේ අතපසු වීමක් නිසා සිදු වූවකි. 2013 වර්ෂයට අදාලව ස්ථාවර වත්කම් ක්ෂය සඳහා ඇතිව ඇති වෙනස එම වර්ෂයේ බදු වලට පසු ලාභය හා සසඳා බලන කළ 0.7% කටත් අඩු අගයක් ගන්නා බැවින් පෙර වර්ෂයේ ලාභයට ගැළපීම් නොකර ප්‍රවර්ථන වර්ෂයේ ලාභයට ගළපා ඇති අතර මෙම ක්ෂය වෙනස හේතුවෙන් පෙර වර්ෂයේ ලාභයට වූ බලපෑම ගිණුම්කරණ ප්‍රතිපත්ති යටතේ සටහනකින් හෙළිදරව් කර ඇත.

(ඇ) නිරීක්ෂණය පිළිගන්නා අතර 2015 වර්ෂයේ සිට අදාළ නිවැරදි කිරීම් සිදු කිරීමට කටයුතු කර ඇත.

(ඈ) අදාල තොරතුරු වාර්ෂික වාර්තාවෙහි ගිණුම්කරණ ප්‍රතිපත්තී අංක 14 යටතේ පිටු අංක 74 හි දක්වා ඇත.

(ඉ) මෙම අධිකාරියේ සේවකයින් සඳහා විශ්‍රාම වැටුප් ක්‍රමයක් නොමැති අතර 1983 අංක 12 චක්‍රලේඛය පරිදි සියලුම සේවකයින් වෙනුවෙන් පාරිතෝෂිත අරමුදලක් වෙන් කර, අදාල ගෙවීම් කිරීමට අවශ්‍ය මුදලට සමාන මුදලක් භාණ්ඩාගාර බිල්පත් වල ආයෝජනය කර ඇත.

(ඊ) අදාල තොරතුරු වාර්ෂික වාර්තාවෙහි ගිණුම්කරණ ප්‍රතිපත්ති අංක 19 යටතේ පිටු අංක 75 හි දක්වා ඇත.

(උ) මෙම නිරීක්ෂණය පිළිගන්නා අතර 2015 වර්ෂයේ සිට අදාළ නිවැරදි කිරීම් සිදු කිරීමට කටයුතු කර ඇත.

2.2.2

(අ) මෙම නිරීක්ෂණය පිළිගන්නා අතර 2015 වර්ෂයේදී අදාළ නිවැරදි කිරීම් සිදු කිරීමට කටයුතු කර ඇත.

(ආ) මෙම අධිකාරිය භාණ්ඩ විකිණීම හා බෙදා හැරීමේ කාර්යයන්හි නිරත නොවන බැවින් විකුණුම් හා බෙදා හැරීමේ වියදම් යටතේ වියදම් වර්ගීකරණය කර නොමැත.

2.3

(අ) අධිකාරියේ වාහන හිමි ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගෙන් කොටසක් භාවිත කරනු ලබන වාහන ආයතනයේ වෙනත් රාජකාරී කටයුතු සඳහා ද භාවිතා කරනු ලබන හෙයින් විගණන වාර්තාවෙහි සඳහන් ඉන්ධන වියදම් දරා ඇත්තේ එම වාහන යෙදවූ සමස්ථ කාර්යයන් උදෙසායි. තවද එහි සඳහන් නිලධාරීන්ට පෞද්ගලිකව ඉන්ධන වෙනුවෙන් කිසිදු ඉන්ධන දීමනාවක් ලබා දී නැත.

(ආ) කැබිනට් මණ්ඩලය විසින් අනුමත කර තිබූ සිවිල් ගුවන් සේවා අධිකාරියේ කාර්ය මණ්ඩල නීති රීති හා පරිපාලන පටිපාටි සංග්‍රහයෙහි (**SLCAP** 5000) හි පරිච්ඡේද අංක 9.7 හි ප්‍රතිපාදන අනුව එම ගෙවීම් සිදු කර ඇත. කෙසේ වුවද මෙම පරිච්ඡේදය කැබිනට් මණ්ඩලයේ නවතම අනුමැතිය අනුව සංශෝධනය වී ඇති හෙයින් 2015 ජූනි මස සිට උපයන විට ගෙවන බදු මුදල් නිලධාරීන්ගේ වැටුපෙන් අඩු කර ගෙවීමට කටයුතු කර ඇත.

(ඇ)

(**i**) කැබිනට් මණ්ඩලය විසින් අනුමත කරන ලද සිවිල් ගුවන් සේවා අධිකාරියේ කාර්ය මණ්ඩල නීති රීති හා පරිපාලන පටිපාටි සංග්‍රහයෙහි (SLCAP 5000) අංක 9.3.4 හි ප්‍රතිපාදන අනුව ගෙවීම් සිදු කර ඇත.

(**ii**) ගරු සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා විසින් සිවිල් ගුවන් සේවා පනතේ 31.1 වගන්තියට අනුව අධිකාරිය වෙත කරන ලද නියෝගයක් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද අතර ඒ අනුව එම ගෙවීම සිදුකර ඇත.

(**iii**)නිල වාහන සඳහා හිමිකම් ඇති නිලධාරීන් හට තම පෞද්ගලික වාහන පාවිච්චි කිරීම වෙනුවෙන් අදාල චක්‍රලේඛය අනුව මෙම දීමනාව ගෙවා ඇත. කැබිනට් මණ්ඩලය විසින් අනුමත කරන ලද සිවිල් ගුවන් සේවා අධිකාරියේ කාර්ය මණ්ඩල නීති රීති හා පරිපාලන පටිපාටි සංග්‍රහයෙහි (SLCAP 5000) අංක 9.6 හි ප්‍රතිපාදන අනුව ගෙවීම් සිදු කර ඇත.සිවිල් ගුවන් සේවා අධිකාරියේ කාර්ය මණ්ඩල නීති රීති හා පරිපාලන පටිපාටි සංග්‍රහය (SLCAP 5000) නැවත සමාලෝචනය කර 2014.09.18 දින කැබිනට් මණ්ඩලය විසින් අනුමත කර ඇති අතර එහි දී ද මෙම ප්‍රතිපාදනය අනුමත වී ඇත

(ඈ)

(**i**) සිවිල් ගුවන් සේවා අධිකාරියේ කාර්ය මණ්ඩල නීති රීති හා පරිපාලන පටිපාටි සංග්‍රහයෙහි (SLCAP 5000) පරිච්ඡේද අංක 9.4 හි ප්‍රතිපාදන අනුව ගෙවීම් සිදු කර ඇත. තවද කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක DMS/1748 හා 2015.10.28 දිනැති ලිපිය මගින් කාර්ය මණ්ඩල නීති රීති හා පරිපාලන පටිපාටි සංග්‍රහයෙහි (SLCAP 5000) හි ප්‍රතිපාදන අනුව 2014 වර්ෂයේ ගෙවීම් කිරීම අනුමත කර ඇත.

**ii**) අධිකාරියේ නිත්‍ය තනතුරු සඳහා කොන්ත්‍රාත් ගිවිසුම්වලට අනුව බඳවා ගත් නිලධාරීන්ට එම ගිවිසුම් වලට එළඹෙන අවස්ථාවේදී ප්‍රසාද මුදල් හිමි බවට එකගව ඇති බැවින් මෙසේ ගෙවීම් කර ඇත. තවද කාර්ය මණ්ඩල නීති රීති හා පරිපාලන පටිපාටි සංග්‍රහයෙහි (SLCAP 5000) හි ප්‍රතිපාදන අනුව එම දීමනාව ආයතනයේ සියලුම සේවකයින්ට හිමි වන අතර සේවකයින් යන්නට කොන්ත්‍රාත් පදනම මත බඳවා ගත් සේවකයින්ද ඇතුලත් වේ.

(ඉ)

(**i**) සිවිල් ගුවන් සේවා අධිකාරියේ කාර්ය මණ්ඩල නීති රීති හා පරිපාලන පටිපාටි සංග්‍රහයෙහ (SLCAP 5000) හි ඇමුණුම 7 හි ප්‍රතිපාදන අනුව ගෙවීම් සිදු කර ඇත.

(**ii**) සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා 2007.05.01 දින සිට අවුරුදු 03ක කාලයක් වැටුප් රහිත නිවාඩු ලබා තිබූ කාලය තුළ එම තනතුරේ වැඩ බැලීමට එවකට අධ්‍යක්ෂ (ගගන නාවික) තනතුර ඉසිලූ ඩී.එම්.පී. දිසානායක මහතා අමාත්‍ය මණ්ඩලය විසින් පත් කළ අතර සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා නැවත සේවයට පැමිණි පසු ඩී.එම්.පී. දිසානායක මහතාගේ තනතුර ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂ ලෙස උත්ශේණි ගත කොට එම තනතුර සංශෝධනය සඳහා අවශ්‍ය අනුමැතිය සලසන තුරු එකී ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂ තනතුරට පැවරූ වගකීම් ඉටුකිරීම වෙනුවෙන් ඔහුට මෙම දීමනාව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත ගෙවා ඇත.

මේ වන විට එම තනතුර ඇති කිරීම සඳහා අවශ්‍ය අනුමැතිය ලබා ගෙන ඇති අතර දිසානායක මහතා එම තනතුරට පත් කර ඔහුට ගෙවන මෙම දීමනාව නතර කර ඇත.

(ඊ) මේ වන විට මෙම මුදල පියවා ඇත.

(උ)

(**i**) ප්‍රස්තුත කරුණ සම්බන්ධයෙන් අධිකාරිය කටයුතු කර ඇත්තේ අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරනු ලැබ ඇති SLCAP-5000 සංග්‍රහයේ 9.1 ඡේදයට අනුකූලව ය.

(**ii**) ආයතනයේ සේවකයින් යන්නට කොන්ත්‍රාත් පදනම මත බඳවා ගත් සේවකයින් ද අයත් වේ.

(ඌ)ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා අධිකාරියේ ඉල්ලීම පරිදි විදේශ රටවල් රාශියක සහභාගිත්වයෙන් යුතුව ලංකාවේ පවත්වන ලද ජාත්‍යන්තර වැඩමුළු දෙකක් වෙනුවෙන් මෙම මුදලින් රු. 1,563,050 ක මුදලක් වැය වී ඇති අතර ඉතිරි මුදල වැය වී ඇත්තේ මත්තල උප කාර්යාලය විවෘත කිරීමේ අවස්ථාවට සහභාගී වීම වෙනුවෙනි.ජාත්‍යයන්තර වැඩමුළු පැවැත්වීමේදී රටෙහි කීර්තිනාමයට හානිකර නොවන පරිදි ඉහළ ගුණත්වයක් පවත්වා ගෙන යා යුතු හෙයින් මෙම වියදම දැරීමට සිදුව ඇත.

(එ) මෙම ආයතනයේ නිලධාරින්ගේ පුහුණු අවශ්‍යතා ආයතනය මගින් හඳුනාගෙන පුහුණු සැලැස්මක් (Training Plan) සකසා ඇති අතර එම පුහුණු අවශ්‍යතාවලට අදාල වැඩසටහන් වාර්ෂිකව හඳුනා ගෙන වාර්ෂික පුහුණු වැඩසහන්(Annual Training Programme) ආයතනයේ පුහුණුවීම් තේරීම් කමිටුවේ නිර්දේශ මත සකසනු ලබයි. එසේ හඳුනා ගත් වැඩසටහන් සඳහා නිලධාරින් සහභාගි කර ඇති අතර මෙම සියලු ගමන් සඳහා නිසි අනුමැතීන් ලබා ගෙන ඇත

4.(4.1)

විගණකාධිපති විසින් නිකුත් කළ කෙටුම්පත් විගණන වාර්තාවෙහි පරීක්ෂණ 14 ක් දක්වා තිබූ අතර ඉන් පරීක්ෂණ 10 කම ප්‍රගතියක් දක්නට තිබිණ. මෙහි දක්වා ඇති රැම්ප් පරීක්ෂණ, ගගන යාත්‍රාංගන පරීක්ෂණ,හා අන්තරාකාරී භාණ්ඩ පරීක්ෂණ අඩු වීමට හේතුව පරීක්ෂකවරුන්ගේ හිඟකම වන අතර ආයතනයේ විදේශ ගමන් සීමා වීම හේතුවෙන් ස්ථාන පහසුකම් පරීක්ෂණවල අඩු වීමක් සිදුව ඇත.

- සිවිල් ගුවන් සේවා වල නිරුපද්‍රිතතා ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් 2010 අංක 14 දරණ පනතේ 57 සහ 61 වගන්ති වලින් සහ එහි 2වන වගන්තියෙන් බලාත්මක කර ඇති අන්තර්ජාතික සිවිල් ගුවන් සේවා සම්මුතියේ 19 ඇමුණුම යටතේ සංරක්ෂණය කරනු ලැබ ඇති ගුවන් යානා අනතුරු සහ සිදුවීම් වලට අදාළ විමර්ෂණ දත්ත සහ තොරතුරු ඇතුළත් ලිපි ගොනු හැර ඉල්ලා තිබූ සියලු අනෙකුත් දත්ත සහ තොරතුරු විගණනය සඳහා සපයනු ලැබ ඇත.

  මෙම විමසුම සම්බන්ධයෙන් කරුණු රේඛීය අමාත්‍යාංශයේ ලේකම් වෙත ඉදිරිපත් කරන ලද අතර ඔහු විසින් මේ පිළිබඳව පැහැදිලි කිරීමක් විගණකාධිපති වෙත ඉදිරිපත් කර ඇත.

(ආ)

**(i)** රට තුළ පැවති යුද්ධය නිසා දිගු කාලයක් දැඩි පීඩනයකට ලක්වූ සිවිල් ගුවන් සේවා කර්මාන්තයට නැවත වර්ධනය වීමට අවස්ථාවක් ලබා දිය යුතුවූ හෙයින් සේවා සඳහා ගාස්තු අවුරුදු කීපයක් සංශෝධනය නොකෙරුණ අතර මේ වන විට එම ගාස්තු අවම වශයෙන් 10% කින් වැඩි කරනු ලැබ ඇත.
මෙම ආයතනය සේවා සපයනු ලබන ආයතනයක් වන අතර මෙහි සියලුම වියදම් සේවා ලාභියාගෙන් අය කළ නොහැක. සිවිල් ගුවන් සේවා නියාමන ආයතනය වශයෙන් ගාස්තු අය කිරීමේදී ගුවන්සේවා කර්මාන්තයේ ප්‍රගමනයට හානිකර නොවන අයුරින් කටයුතු කළ යුතුව ඇත.

2014 වර්ෂයේ වැඩි කරන ලද ගාස්තු සම්බන්ධයෙන් ශ්‍රී ලංකන් ගුවන් සමාගම හා මිහින් ලංකා සමාගම දැනටමත් සිය අප්‍රසාදය දක්වා ඇති අතර ඒ පිළිබඳව තීරණයක් ගැනීම සාකච්ඡා මට්ටමේ පවතී.

(ඇ) සිවිල් ගුවන් සේවා වල නිරුපද්‍රිතතා ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් 2010 අංක 14 දරණ පනතේ 57 සහ 61 වගන්ති වලින් සහ එහි 2වන වගන්තියෙන් බලාත්මක කර ඇති අන්තර්ජාතික සිවිල් ගුවන් සේවා සම්මුතියේ 19 ඇමුණුම යටතේ සංරක්ෂණය කරනු ලැබ ඇති ගුවන් යානා අනතුරු සහ සිදුවීම් වලට අදාළ විමර්ෂණ දත්ත සහ තොරතුරු ඇතුළත් ලිපි ගොනු හැර ඉල්ලා තිබූ සියලු අනෙකුත් දත්ත සහ තොරතුරු විගණනය සඳහා සපයනු ලැබ ඇත.

ඉහත විමසුම සම්බන්ධයෙන් කරුණු රේඛීය අමාත්‍යාංශයේ ලේකම් වෙත ඉදිරිපත් කරන ලද අතර ඔහු විසින් මේ පිළිබඳව පැහැදිලි කිරීමක් විගණකාධිපති වෙත ඉදිරිපත් කර ඇත.

4.2

(අ) එකතු කළ අගය මත බදු ගණනය කිරීමේ වරදක් සිදුව නැති අතර බදු මුදල් නිසි ලෙස ගණනය කර දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර/ වාර්තා යවා ඇත. ආයතනයේ යෙදවුම් බද්දට (**input tax**) වඩා නිමවුම් බද්ද (**output tax**) වැඩිවීම නිසා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් ආපසු ලැබිය යුතු මුදල (**Tax Refund**) වැඩි වී ඇත. ලැබිය යුතු මුදල් සම්බන්ධයෙන් සිහිකැඳවීම් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට කිහිප විටක් යොමු කළද මෙතෙක් මුදල් ලබා දීමට කටයුතු කර නොමැත.

(ආ) විගණනය විසින් පෙන්වා දුන් අඩු පාඩු නිවැරදි කිරීමට අවශ්‍ය පියවර නො පමාව ගනු ලැබ ඇති අතර රාජ්‍ය

ගිණුම් කාරක සභාවේ නිර්දේශ ලබා දුන් අවස්ථා වලදී ඒ පිළිබඳව විශේෂ අවධානයක් යොමු කර සියලුම නිර්දේශයන් ක්‍රියාත්මක කිරීමට කටයුතු කර ඇත

4.3

(අ) කැබිනට් මණ්ඩලය විසින් අනුමත කරන ලද සිවිල් ගුවන් සේවා අධිකාරියේ කාර්ය මණ්ඩල නීති රීති හා පරිපාලන පටිපාටි සංග්‍රහයෙහි (SLCAP 5000) ප්‍රතිපාදන අනුව ගෙවීම් සිඳු කර ඇත. ගුවන් සංතරන පාලකයෙක් ලෙස කටයුතු නොකරන අවස්ථාවල බලපත්‍රය අළුත් කරනු නොලබන අතර සිවිල් ගුවන් සේවා අධිකාරිය තුළ කරනු ලබන නියාමන කටයුතු වෙනුවෙන් බලපත්‍රය අළුත් කිරීමේ අවශ්‍යතාවයක් නොමැත.

(ආ) මේ සම්බන්ධයෙන් වූ පූර්ව විගණන වාර්තාවකට ප්‍රතිචාර වශයෙන් සහ ඒ සම්බන්ධයෙන් වූ COPE උපදෙස් අනුව සහ රේඛීය අමාත්‍යංශ ලේකම්වරයා ගේ උපදෙස් පරිදි එම කාරණය නිරාකරණය කර ඇත. නිලධාරියාගෙන් මුදල් අය කර ගත යුතු බව නිර්දේශ වී නොමැති බැවින් මුදල් ආපසු අය කර ගෙන නැත.

(ඇ) වර්තමානය වන විට මෙම තනතුර අහෝසි කර ඇති අතර එම තනතුරේ සේවය කළ නිලධාරියා ද ඉවත් කර ඇත.

(ඈ) විෂය භාර අමාත්‍යවරයා විසින් සභාපතිවරයා වෙත ලබා දුන් ලිඛිත නියෝග ප්‍රකාර අධ්‍යක්ෂ මණ්ඩල තීරණයකට අනුව මෙම ගෙවීම සිදු කර ඇත. විගණන විමසුමේ දැක්වෙන නිරීක්ෂණයන්/ අඩුපාඩු නිවැරදි කර ගැනීමටත් ඉදිරියේදී මෙවැනි ගෙවීම් සිදු වීම වැළැක්වීමට කටයුතු කිරීමටත් නිලධාරීන් දැනුවත් කරන ලදී.

4.4.

(අ) ඔබගේ නිරීක්ෂණයෙහි සඳහන් අවාසිදායක කරුණු ඉවත් කිරීමට බදු ගිවිසුම නැවත අළුත් කිරීමේදී සාකච්ඡා කළද එසේ කිරීමට ගොඩනැගිලි හිමියා එකඟ නොවීය. එසේ ඉවත් කරන්නේ නම් කුලී රේටයන් සංශෝධනය කිරීමට සිදුවන බව ඔහු දන්වන ලදී.

ගොඩනැගිලි සඳහා දැඩි වානිජ ඉල්ලුමක් ඇති කොළඹ නගරයෙන් වර්ග අඩියකට රු. 118/= වැනි මුදලකට නැවතත් ගොඩනැගිල්ලක් සොයා ගැනීම දුෂ්කර වීමත්, ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලක් ඉදි කිරීමට කටයුතු සම්පාදනය කර තිබියදී නැවතත් වෙනත් කුලී ගොඩනැගිල්ලකට යාම අර්ථ ශුන්‍ය බැවිනුත් මෙසේ කටයුතු කිරීමට සිදු විය.

(ආ) මත්තල උප කාර්යාලය විවෘත කිරීමේ උත්සවයට සහභාගී වූ ගරු අමාත්‍යතුමා ඇතුළු නිලධාරීන් හා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් වෙනුවෙන් මෙම වියදම දරා ඇත. මෙම කණ්ඩායම ගුවන් මගින් සහභාගී කරවන ලෙසට අමාත්‍යංශ ලේකම්වරයා උපදෙස් ලබා දී ඇත.

මෙම වැඩමුළුවේ කාලයෙන් එක් දිනක් පමණක් මත්තල ගුවන් තොටුපලේ පැවති වැඩසටහනට වෙන් කර තිබූ අතර ගොඩබිමින් ගමන් කළේ නම් කාලය ප්‍රමාණවත් නොවේ. තවද ගොඩබිමින් ගමන් කළේ නම් ප්‍රවාහන සේවා, ආහාර පාන , ගිමන් නිවීමේ පහසුකම් වෙනුවෙන් මෙයට වඩා පිරිවැයක් දැරීමට සිදුවේ. මෙම කාර්යය සඳහා වැය වන කාලය,මුදල,ශ්‍රමය පිළිබඳව තක්සේරු කිරීමෙන් අනතුරුව මෙම වියදම දරා ඇත.

(ඇ) මෙය 2011 වසරේ දරණ ලද වියදමකි. අධිකාරියේ කාර්ය, කර්තව්‍ය සහ වගකීම් ඉටු කිරීමට හැකි වන පරිදි පමණක් නොව මෙම අධිකාරියට නිතර පැමිණෙන විදේශිකයන් ඉදිරියේ රටේ ජාතික අනන්‍යතාව, අභිමානය සහ ආයතනික ප්‍රතිමූර්තිය සුරැකෙන ලෙස කටයුතු කළ හැකි වාතාවරණයක් කුලී ගොඩනැගිල්ල තුල ඇති කළ යුතු වූ බැවින් ආයතනික වටපිටාව දියුණු කිරීමට සිදු විය. තවද ප්‍රස්තුත "ඉදිකිරීම", අධිකාරියේ කටයුතු සඳහා අත්‍යවශ්‍ය ඉඩකඩ ලබාගැනීම සහ කළමනාකරණය සඳහා හුදෙක් තාවකාලිකව, අත්තිවාරමකින් තොරව කරන ලද බෙදා වෙන් කිරීමකි (**partition**).

4.5.

සිවිල් ගුවන් සේවා අධිකාරිය විසින් ඉදි කරනු ලැබූ වීරවිල නිවාඩු නිකේතනයන් සඳහා දොර ජනෙල් සඳහා තිර රෙදි දැමීම වෙනුවෙන් ආයතන 10කින් මිළ ගණන් කැඳවීම් සිදු කර ඇති අතර ආයතන 4කින් මිළ ගණන් ඉදිරිපත් කර තිබුණි. අවම මිළ ගණන් ඉදිරිපත් කළ ආයතන විසින් ඉදිරිපත් කර තිබූ සාම්පල හා තත්වයන් පිළිබඳව ඇගයීම් සිදු කර තිබූ අතර එම වාර්තාව AD/41/1/19/4 ලිපිගොනුවේ ගොනු අංක 51 යටතේ අමුණා ඇත. එකී කමිටුවේ නිර්දේශ මත දෙවන අවම මිළ ඉදිරිපත් කර තිබූ **Ideal Brite Home Decors** ආයතනයෙන් දොර ජනෙල් හා ඇඳන් සඳහා තිර රෙදි හා බෙඩ් ෂීට් මිලදී ගැනීමට දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව අනුමැතිය ලබා දී ඇත.

4.6

සිවිල් ගුවන් සේවා අධිකාරිය විසින් සයන්ස් ලෑන්ඩ් ආයතනය වෙතින් මිලදී ලබා ගන්නා ලද පරිඝණක මෘදුකාංග පද්ධතිය භාවිතා කරමින් 2013 වර්ෂයේ සිට මෙම ආයතනය ගිණුම් කටයුතු සිදු කරනු ලබන අතර එමගින් ආයතනය අපේක්ෂා කළ අරමුණු ඉටුව ඇත. එක් එක් අංශ විසින් ඉන්වොයිස් පිළියෙළ කිරීම, නිකුත් කිරීම, ලෙජර් ගිණුම් පවත්වාගෙන යාම, අවසාන ගිණුම් පිළියෙළ කිරීම, වැටුප් පිළියෙළ කිරීම හා ගිණුම් ගත කිරීම, ආයෝජන ලෙජර් පවත්වාගෙන යාම හා පොලී ගණනය කිරීම හා ගිණුම් ගත කිරීම, ගබඩා තොග ගිණුම් පිළියෙළ කිරීම හා ගිණුම් ගත කිරීම , බැංකු සැසඳුම් ඇතුළු විවිධ වාර්තා සැකසීම , ස්ථාවර වත්කම් ලේඛණය පවත්වා ගෙන යාම ආදි විවිධ අංග උපාංග වලින් සමන්විත වූවකි.එම සියළුම උපාංග අපේක්ෂා කල පරිදි 2013 වසරේ සිට ක්‍රියාත්මකව පවතින අතර වර්තමානයේදී භාවිතා කරනු ලබයි.

4.7

විෂය භාර ගරු අමාත්‍යවරයාගේ සහ ජනාධිපති ලේකම්වරයාගේ ලිඛිත නියෝග මත අදාළ නිලධාරීන් සහ සම්පත් කලින් කලට අධ්‍යක්ෂ මණ්ඩල තීරණ මත මුදා හැරීමට සිදු විය. කෙසේ වෙතත් එම නිලධාරීන් සහ සම්පත් අධිකාරිය වෙත ආපසු ලැබී ඇත.


4.8


(අ)/(ආ)
වසරින් වසර ප්‍රසාරණය වන දේශීය ගුවන් සේවා ක්ෂේත්‍රය නිසි පරිදි සමාලෝචනයට ඇවැසි තාක්ෂණික කාර්ය මණ්ඩල සේවක සංඛ්‍යාව වැඩි කිරීමට සහ ඔවුන් වෙනුවෙන් ගෙවනු ලබන වැටුප් සහ දීමනා වැඩි කිරීම සඳහා 2012 වසරේ දී කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කරණ ලද යෝජනා වලට අනුමැතිය නො ලැබීම සහ සේවයේ නියුතු කාර්ය මණ්ඩලය විදේශීය රැකියා සඳහා හෝ කර්මාන්තයේ ආකර්ෂණීය රැකියා සඳහා ඉවත් වීම මෙම තත්වයට බලපාන ලද ප්‍රධාන සාධකයකි. කෙසේ වුවද මේ වන විට මෙම යෝජනා වලට අනුමැතිය ලැබී ඇත.

(ඇ) බඳවා ගැනීමේ පටිපාටියට පටහැනිව කිසිදු බඳවා ගැනීමක් සිදු කර නොමැත.

5.1

ආයතනයේ ප්‍රධාන ගොඩනැගිල්ල ඉදිකිරීමේ කටයුතු අපේක්ෂිත පරිදි සිදු නොවීමත් ඒ හේතුවෙන් ආයෝජන ආදායමෙහි අඩු වීමක් සිදු නොවීමත් මෙම විචලනයට ප්‍රධාන වශයෙන් බලපා ඇත.





ආනන්ද විමලසේන
සභාපති
2015, ජූලි මස 07 දිනට

එච්.එම්.සී නිමල්සිරි
සිවිල් ගුවන් සේවා
අධ්‍යක්ෂ ජනරාල් හා ප්‍රධාන විධායක නිලධාරී

විගණකාධිපති වාර්තාවට සිවිල් ගුවන් සේවා අධිකාරියේ පිළිතුරු

Civil Aviation Authority Sri Lanka

" Safe skies for all "

ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය
අංක 04, හුණුපිටිය පාර, කොළඹ 02.